2.1 Instead of the four cases familiar from Colloquial, nouns and pronouns in Literary Sinhala may occur in five cases: NOMINATIVE, ACCUSATIVE, DATIVE, GENITIVE, and INSTRUMENTAL. In this lesson new case forms are given only for pronouns, and those for nouns will be dealt with later. The case forms of the pronouns that have occurred so far are:

1st Person	Singular	Plural
Nominative	මම	අපි
Accusative	මා	අප
Dative	මට	අපට
Genitive	මගේ	අපගේ
Instrumental	මගෙන්	අපගෙන්

3rd Person	Singular	Plural
Nominative	හෙතෙම , ඔහු	ඔව්හු, ඔවුහු
Accusative	ඔහු	ඔවුන්
Dative	ඔහුට	ඔවුන්ට
Genitive	ඔහුගේ	ඔවුන්ගේ
Instrumental	ඔහුගෙන්	ඔවුන්ගෙන්

Reflexive	Singular	Plural
Nominative	තෙමේ	තුමූ
Accusative	තමා , තම	තමන්
Dative	තමාට	තමන්ට
Genitive	තමාගේ	තමන්ගේ
Instrumental	තමාගෙන්	තමන්ගෙන්

Cases other than the Nominative may be referred to collectively as Oblique Cases. Notice that, except for the lengthened vowel in මා and some alternate forms, the Accusative is generally an Oblique stem to which the other case endings are added. Some modern writers do not distinguish between the nominative and accusative of the third person masculine pronoun, using ඔහු for both.

2.2 The chief use of the Nominative case is as subject of a simple sentence, and as predicate attribute of an equational sentence,

> මම ගොවිතැනින් ජීවත්වෙමි.
> I live by farming.
>
> හෙතෙම ගොවියෙක් ය.
> He is a farmer.

(Note that in the second example both the subject හෙතෙම and the predicate attribute ගොවියෙක් are in the nominative.) The uses of the Accusative will be given as they occur, but in general the uses of the Literary Nominative and Accusative taken together are equivalent to the range of uses of the Direct case in Colloquial. The remaining cases have much the same functions as in Colloquial.

3. THE PREDICATION MARKER

3.1 The alternate form යි of the predication marker is the usual form occurring after forms ending in ය (1,8)*, but it may also occur as a general alternate wherever ය occurs:

අපේ ගමේ නම සමනබැද්දය.

or අපේ ගමේ නම සමනබැද්දයි.

The name of our village is Samanabedda.

3.2 The -ඉ alternate which usually appears in words ending in consonants is sometimes found in words ending in vowels. In this case the final vowel is lost Thus පමණය , පමණයි or පමණි .

The student should learn to recognize this use of ඉ , but is advised not to use it himself since it is restricted to specific words.

4. EMPHATIC VERBS AND SENTENCES

4.1 In Literary Sinhala the emphatic form of the verb is always spelled with long -ඒ , never short -එ , but is otherwise identical with the Colloquial form:

Colloquial		Literary
යන්නෙ	go	යන්නේ
කරන්නෙ	do	කරන්නේ
දෙන්නෙ	give	දෙන්නේ

4.2 Literary emphatic sentences differ from those in Colloquial in two important ways:

1. One of the forms of the Predication Marker must always be added to the emphasized item:

වී වැවෙන්නේ කුඹුරුවල ය.
It is in the paddy fields that rice grows.

අපේ ගමෙහි රබර් වවන්නේ පොහොසත් අය පමණි.
It is only the rich people who grow rubber in our village.

කඩයෙහි තිබෙන්නේ පලතුරු ය.
It is fruit that is in the shop

2. A subject that would be in the Nominative in a simple sentence must be in the Accusative in an emphatic sentence. Thus:

---

*Cross-references to other lessons within this book will be given by the number of the lesson followed by the section referred to. Thus (1,8.3) means Lesson 1, Section 8.3.

මම වත්තෙහි වැඩකරමි.
I work in the estate.

ඔව්හු පිරිවෙනෙහි ඉගෙනගනිති.
They study in the Pirivena.

but:

මා වැඩකරන්නේ වත්තෙහි ය.
It is in the estate that I work.

ඔවුන් ඉගෙනගන්නේ පිරිවෙනෙහි ය.
It is in the Pirivena that they study.

Note that this rule still applies even if the subject is also the emphasized item:

වත්තෙහි වැඩකරන්නේ මා ය.
It is I who am working in the estate.

පිරිවෙනෙහි ඉගෙනගන්නේ ඔවුන් ය.
It is they who study in the Pirivena.

5. VERB FORMS

In addition to the third person singular forms ending in - යි, given in lesson 1, class 2 and 3 verbs have alternate forms made by lengthening the stem vowel without adding the යි . Thus:

තිබෙයි	or	තිබේ	exists
සිටියි	or	සිටී	exists - animate

These alternates are very commonly used.

6. VERB AGREEMENT

As stated in Lesson 1, Literary Sinhala verbs agree in number with their subjects in simple sentences. However, special agreement rules apply for certain types of subjects:

1. If the subject is inanimate the verb will always be singular regardless of the number of the subject.

අපේ ගමෙහි මහාවිද්‍යාලයක් තිබේ.
There is a high school in our village.

ලංකාවෙහි බොහෝ මහාවිද්‍යාල තිබේ.
There are many high schools in Sri Lanka.

2. Animate Indefinite pronouns (1.2 above), even though they are singular in form, take plural agreement:

සමහරෙක් වෙළඳාම් කරති.
Some are in business.

ඇතැමෙක් පුස්කොළපොත් කියවති.
Some read ola leaf books.

7. වෙනවා

7.1 වෙනවා may be used instead of the Predication Marker in Equational Sentences, and shows agreement with the subject:

මම ශිෂ්‍යයෙක් වෙමි.
I am a student.

අපි ශිෂ්‍යයෝ වෙමු.
We are students.

අපේ ගම අස්ගිරිය වෙයි.
Our village is Asgiriya.

7.2 One Literary equivalent for Colloquial වෙලා , the perfect participle of වෙනවා , is ව .

Colloquial: ඒ මිනිස්සු එකමුතුවෙලා වැඩකරනවා.

Literary: ඒ මිනිස්සු එකමුතුව වැඩකරති.

Those people get together and work.

8. NEGATIVE FORMATION

8.1 නො . In Colloquial Sinhala the simple verb is negated by changing it to the Emphatic form and adding නැ , and the form නො may be prefixed only to Emphatic verbs or verbs in subordinate constructions (C. S. 27,5).

In Literary Sinhala, the normal way of negating all verb forms, whether main or subordinate, is by prefixing නො-:

මම වී ගොවිතැන් කරමි.
I do paddy farming.

Negative:

මම වී ගොවිතැන් නොකරමි.
I don't do paddy farming.

අප යන්නේ පිරිවෙනට ය.
It is to the pirivena that we go.

Negative:

අප නොයන්නේ පිරිවෙනට ය.
It is to the pirivena that we do not go.

ගොවිතැන් කරන අය වී වවති.
Those who farm grow rice.

Negative:

ගොවිතැන් නොකරන අය වෙනත් රැකිරක්‍ෂා කරති.
Those who do not farm do other jobs.

8.2 නැත is නො plus ඇත (1,6) and thus means '(there) is not, are not':

මේ ගමේ පාඨශාලාවක් නැත.
There isn't a school in this village.

ඉගෙනීම අමාරු නැත.
Learning is not difficult.

It is thus the equivalent of Colloquial නෑ when the latter serves as the negative of ඉන්නවා or තියෙනවා.

8.3 නොවේ or නොවෙයි is 'no' plus the third person form of වෙනවා. Like Colloquial Sinhala නෙවි it may be used in Literary Sinhala to negate emphatic sentences (C.S. 25,3):

අප යන්නේ පන්සලට නොවේ.
It is not to the temple that we go.

මා කරන්නේ ලිපිකරුවැඩ නොවේ.
It is not clerical work that I do.

It is also used like Colloquial නෙවි to negate equational sentences with nouns:

මෙය කුඩා ගමක් නොවේ.
This is not a small village.

In this usage in Literary, however, it should agree as වෙනවා does, with the subject.

මම ශිෂ්‍යයෙක් නොවෙමි.
I am not a student.

අපි ශිෂ්‍යයෝ නොවෙමු.
We are not students.

9. හෙයින්, එහෙයින්.

Another Literary equivalent for Colloquial නිසා 'because,' besides බැවින් (1,14) is හෙයින් :

Colloquial: ඒ පොත් දුර්ලබ නිසා පොත්ගුලේ තියෙනවා.

Literary: ඒ පොත් දුර්ලභ හෙයින් පොත්ගුලෙහි ඇත.

Since those books are rare they are (kept) in the potgula.

Thus එහෙයින් , like එබැවින් , is an equivalent of Colloquial ඒ නිසා , 'because':

Colloquial: ඒ නිසා ඒවා කියවන්න මම පොත්ගුලට යනවා.

Literary: එහෙයින් ඒවා කියවීමට මම පොත්ගුලට යමි.

Therefore I go to the potgula to read them.

10. යන

යන is used in specifying, exemplifying or giving names and thus has the English equivalents like 'such as', or 'called':

ගුරුකම, ලිපිකරුවැඩ යන රක්ෂාවල්
occupations such as teaching and clerical work

සමනබැද්ද යන ගම
the village called Samanabedda

11. සෑම.....ම පාහේ

සෑම....ම 'every, all' has a Colloquial equivalent හැම...ම (C.S. 27,7). When පාහේ is added to such forms as සෑම....ම or සියළු....ම(1,13) it adds the sense of 'generally' or 'just about'. The Colloquial equivalent of පාහේ in this sense is වගේ .

Colloquial: හැම ගමක ම වගේ පන්සලක් තියෙනවා.

Literary: සෑම ගමක ම පාහේ පන්සලක් තිබේ.

In just about every village there is a temple.

Colloquial: මේ ගමේ මිනිස්සු හැමදෙනාම වගේ ගොවියෝ.

Literary: මේ ගමෙහි මිනිස්සු සියළුදෙනාම පාහේ ගොවියෝය.

Almost all the people in this village are farmers.

12. මාටින් අයියා

Kin terms, like other terms of status such as මහත්තයා or උන්නැහේ , may be added to a proper name to specify that person's relationship to the individual. Hence:

සීතා අක්කා
Sita, the older sister

විමල් අයියා
Wimal, the elder brother etc.

The words for 'father' and 'mother', තාත්තා and අම්මා are not used following the name but always by themselves, since it is disrespectful to call one's father or mother by name.

It is also customary in Ceylon to extend kin terms (with or without the name) to people who are not related by blood or marriage but stand in some relationship to the speaker resembling those kinship relations with regard to such factors as age, respect, or affection. මාටින් අයියා in this lesson exemplifies the extension of a kin term to someone who is not related. The term for father, තාත්තා , is never extended in this way.

13. ලැබෙනවා

ලැබෙනවා is a Literary equivalent of Colloquial හම්බවෙනවා in the sense of 'obtain, get', and like it takes the equivalent of the English subject in the dative case:

Colloquial: ගොවියන්ට හුඟක් වී හම්බවෙනවා.

Literary: ගොවියන්ට බොහෝ වී ලැබේ.

The farmers obtain a lot of rice.

Colloquial: අපිට සල්ලි හම්බවෙන්නේ නෑ.

Literary: අපට මුදල් නොලැබේ.

We don't get any money.

14. WRITING SYSTEM - ර BEFORE CONSONANTS

Another way of representing ර before a consonant is to write ර්‍ over the consonant symbol, and this is the usual way in Literary Sinhala.

වර්‍ෂ	or	වර්ෂ	varša 'years'
දුර්‍ලභ	or	දුර්ලභ	durlabha 'rare, scarce'

15. යටත්පිරිසෙයින්...වත් 'AT LEAST, EVEN'

15.1 යටත්පිරිසෙයින්...වත් has the general meaning 'at least', or, in negative statements or questions, 'even'. The form to which 'at least' or 'even' applies occurs between යටත්පිරිසෙයින් and වත්

සිරිපාල යටත්පිරිසෙයින් නවකථා වත් කියවයි.
Siripala reads novels at least.

මේ පන්සලෙහි යටත්පිරිසෙයින් පොත්ගුලක් වත් නැත.
There isn't even a library in this temple.

15.2 The Colloquial equivalent of this construction is අඩුගානෙ (or අඩුගනනෙ) ... වත් :

මේ පන්සලේ අඩුගානෙ පොත්ගුලක්වත් නෑ.
සිරිපාල අඩුගානෙ නවකතාවත් කියවනවා.

16. එහෙත්

16.1 එහෙත් has the sense 'nevertheless, however'. It always begins a sentence.

පුස්තකාලයෙහි නවකථා පොත් ඇත. එහෙත් සුනිල් ඒවා නොකියවයි.
There are novels in the library. Nevertheless Sunil does not read them.

16.2 The Colloquial equivalent of එහෙත් is ඒත් .

පුස්තකාලෙ නවකතාපොත් තියෙනවා. ඒත් සුනිල් ඒවා කියවන්නෙ නෑ.

17. තරම්

තරම් is the stem of තරම 'extent' (from which we also get තරමක් 'somewhat'). තරම් may occur as an adjective with the sense 'as much as, to that extent' and is then qualified by another form such as an adjective or one of the මේ set to indicate the extent. Before තරම් ; මේ , ඔය , and ඒ are shortened to මෙ , ඔ , and එ .

ඒ ගමෙහි එතරම් රබර් ඉඩම් නැත.
There is not that much rubber-land in that village.

ඔහු පුළුවන් තරම් වැඩ නොකරයි.
He does not do as much work as is possible.

SUPPLEMENTARY READINGS

1. වී ගොවිතැන

වී ගොවිතැන ලංකාවේ බොහෝ පළාත්වල ගම්මුන්ගේ ප්‍රධාන රක්ෂාවක් වෙයි. වී ගොවිතැන් කරන ගොවියෝ අවුරුද්ද කොටස් දෙකකට බෙදති. ඒ කොටස් දෙකට "යල" සහ "මහ ය"යි කියති. ඇතැම් පළාත්වල වී ගොවිතැන් කරන්නේ අවුරුද්දකට එකවරක් පමණි. වී ගොවිතැනට බොහෝ වතුර අවශ්‍ය වෙයි. තෙත් කලාපයෙහි අවශ්‍ය වතුර වැස්සෙන් ලැබෙයි. එහෙත් වියලි කලාපයෙහි වී ගොවිතැනට අවශ්‍යතරම් වැසි වතුර නැත. එහෙයින් ඒ කලාපයට අයිති පළාත්වල ගොවියෝ වී ගොවිතැනට වැව් වතුර පාවිච්චි කරති.

වී ගොවිතැන තරමක් අමාරු ය. ගොවියෝ පළමුවෙන් වෙල්යායෙහි ලියැදි කොටති. ඉන්පසු සීසාති. ලියැදි පෝරු ගාති. ලියැදිවල අගල් හරිති. ඉන්පසු වී වපුරති. ඇතැම් පළාත්වල ගොවියෝ, වැපිරීමට පාවිච්චිකරන වීවලට "බිත්තර වී ය"යි කියති.

දැන් ඇතැම් පළාත්වල ගොවියෝ සී සැමට ට්‍රැක්ටර් යන්ත්‍ර පාවිච්චි කරති. එහෙත්, තවම, ලංකාවේ බොහෝ පළාත්වල සී සාන්නේ නගුල්වලිනි.

2. අනෙක් ගොවිතැන්

බොහෝ පළාත්වල වී ගොවිතැන් කරන්නේ කුඹුරුවලය. කුඹුරුවල කරන ගොවිතැන්වලට, විශේෂ "මඩ ගොවිතැන් ය"යි කියති. ගොඩඉඩම්වල කරන ගොවිතැන්වලට "ගොඩගොවිතැන් ය"යි කියති. අපේ පළාතේ ප්‍රධාන ගොවිතැන්, පොල් වැවීම, රබර් වැවීම සහ එළවළු සහ පළතුරු වැවීම වෙයි. සෑම ගෙවත්තකම පාහේ පොල්ගස් කිහිපයක් වෙයි. ගැමියෝ ඒවායින් ලැබෙන පොල් තමන්ගේ ප්‍රයෝජනයට ගනිති. විකිණීමට පොල් වවන්නේ ටික දෙනෙකි. ඊට තරමක් විශාල ඉඩම් ප්‍රමාණයක් අවශ්‍ය වෙයි. යටත්පිරිසෙයින් ඉඩම් අක්කරයක්වත් අවශ්‍යය. අක්කරයක පොල්ගස් හැත්තෑපහක් පමණ සිටුවති. පොල් වගාව සරුසාර කිරීමට හොඳ පෝර අවශ්‍ය වෙයි. සරුසාර පොල් අක්කරයකින් වරකට පොල් ගෙඩි දහසක් පමණ ලැබෙයි. ඒවා විකිණීමෙන් පොල්වතු හිමියන්ට ලැබෙන්නේ හොඳ ආදායමකි.

රබර් වැවීමටද යටත්පිරිසෙයින් ඉඩම් අක්කරයක්වත් අවශ්‍ය වෙයි. මේ වගාවට

වැඩි මුදලක්ද වැයවෙයි. රබර් අක්කරයකින් දවසකට රබර් කිරි රාත්තල් හතරකට පහකට වඩා නොලැබේ. එහෙයින් රබර් වගාවෙන් සෑහෙන ආදායමක් ලබාගැනීමට සෑහෙන ඉඩම් ප්‍රමාණයක්ද ඕනෑ වෙයි.

අපේ පළාතේ අය එළවළු සහ පළතුරු වැවීම කරන්නේ තමන්ගේ ප්‍රයෝජනයට ය. වෙළඳාමට නොවෙයි. මිරිස්, බෝංචි, වට්ටක්කා, කැකිරි, බණ්ඩක්කා, වම්බොටු යන . එළවළු ජාති සහ නොයෙක් අල-බතල ජාති, ඔව්හු තමන්ගේ වතුවල වවා ගනිති. ඔවුන් වවන ප්‍රධාන පළතුරු ජාති අඹ, දෙඩම් සහ අන්නාසි වෙයි.

VOCABULARY FOR SUPPLEMENTARY READINGS

READING 1

අගල් හරිනවා	make small ditches
අවශ්‍ය	wanted, necessary
ඉන්පසු	after that
කලාපය	N2 zone; pl. කලාප
කොටනවා	dig
ගැමියා	N5 villager; pl. ගැමියෝ, ගම්මු
ට්‍රැක්ටර් යන්ත්‍රය	N2 tractor; pl. ට්‍රැක්ටර් යන්ත්‍ර
තෙත්	wet
තෙත් කලාපය	N2 wet zone
නගුල , නඟුල	N2 plough; pl. නගුල්, නඟුල්
පලාත or පළාත	N2 province, area; pl. පලාත් , පළාත්
පළමුවෙන්	at first
පෝරුගානවා	level the ground (of a paddy-field) with a plank
බිත්තර වී	paddy-seed for sowing; pl. only
බෙදනවා	divide
මහ	N2 the main rice growing season (roughly from mid August to mid February); no pl.; stem මාස්

යල	N2 the second rice-growing season (roughly from the latter part of February to the middle of August); no pl.; stem යල්
වපුරනවා	to sow
වර	N3 period, turn, time; pl. වාර
වැව	N2 tank; pl. වැව්
වැව් වතුර	N2 tank-water
වැසිවතුර	N2 rain-water; no pl.
වියළි	dry
වියළි කලාපය	N2 dry zone
වී ගොවිතැන	N2 paddy-farming; pl. වී ගොවිතැන්
සීසානවා	plough

READING 2

අක්කරය	N2 acre; pl. අක්කර
අන්නාසි (ගෙඩිය)	pineapple
අඹ (ගෙඩිය)	mango
ආදායම	N2 income; pl. ආදායම්
කැකිරි (ගෙඩිය)	cucumbers
කිහිපය	N2 a few, some (Coll. කිපෙ)
ටිකදෙනා	N5 a few people; pl. only
දොඩම් (ගෙඩිය)	orange
පෝර	manure, fertilizer; pl. only
ප්‍රමාණය	N2 measure, size; pl. ප්‍රමාණ
ප්‍රයෝජනය	N2 use; pl. ප්‍රයෝජන
බණ්ඩක්කා (කරල)	okra
බෝංචි (කරල)	beans
මඩ	N2 (sg. and pl.) mud

මඩ ගොවිතැන	N2 wet-land cultivation; pl. මඩ ගොවිතැන්
මිරිස් කරල	green pepper; pl. මිරිස් කරල්
රාත්තල	N2 pound; pl. රාත්තල්
වගාව	N2 growth, plantation; pl. වගා , වගාවල්
වට්ටක්කා (ගෙඩිය)	pumpkin, squash
වතුහිමියා	N5 garden-owner; pl. වතුහිමියෝ
වම්බොටු (කරල)	eggplant, brinjal
වවාගන්නවා	grow (for oneself)
විකිණීම	N2 selling; pl. විකිණීම් , විකිනීම්
සරුසාර	fertile
සරුසාර කරනවා	make fertile
සෑහෙන	sufficient, considerable
සිටුවනවා	plant
හිමියා	N5 owner; pl. හිමියෝ

LESSON 3

ලංකාවේ අධ්‍යාපනය

ලංකාවේ අධ්‍යාපනය මූලිකවශයෙන් රජය යටතේ පවතී. මේ සඳහා විශේෂ අමාත්‍යාංශයක් ඇත. එනම් අධ්‍යාපන අමාත්‍යාංශය යි. ලංකාවේ සෑම පාඨශාලාවක් ම පාහේ මෙම අමාත්‍යාංශය යටතේ පාලනය වෙයි. ලංකාවේ පාඨශාලා කොටස් කිහිපයකට අයත් වෙයි. ප්‍රාථමික පාඨශාලා, මහාවිද්‍යාල, සහ මධ්‍යමහාවිද්‍යාල යනුවෙනි. ප්‍රාථමික පාඨශාලාවල බාලාංශයේ සිට පස්වැනි ප්‍රමාණය තෙක් ශිෂ්‍යයෝ උගනිති. දැනට සෑම ගමක ම පාහේ ප්‍රාථමික පාඨශාලාවක් වෙයි. එම එම ගම්වල ශිෂ්‍යයන් යන්නේ එම එම ගම්වල පාසැල්වලට ය. විද්‍යාලයවල, සයවැනි ප්‍රමාණයේ සිට විශ්වවිද්‍යාලය ප්‍රවේශය දක්වා පංති පැවැත්වෙයි.

ශිෂ්‍යයෙක් වයස අවුරුදු පහේ දී පමණ ප්‍රාථමික පාඨශාලාවකට ඇතුල්වෙයි. එහි වර්ෂ හයක් පමණ උගෙනගනියි. ඉන්පසු හෙතෙම විද්‍යාලයකට ඇතුල්වෙයි. විද්‍යාලයවල පංති පිළිවෙල මෙසේ ය. සයවැනි ප්‍රමාණය, සත්වැනි ප්‍රමාණය, කනිෂ්ඨ ප්‍රවේශ පංතිය, කනිෂ්ඨ පංතිය, අධ්‍යයන පොදු සහතික පත්‍ර ප්‍රවේශය, අධ්‍යයන පොදු සහතික පත්‍ර පංතිය, විශ්විද්‍යාලය ප්‍රවේශ පංතිය යනුවෙනි. අධ්‍යයන පොදු සහතික පත්‍ර ප්‍රවේශයට සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර පංතියට, ඇතැම්හු ජ්‍යෙෂ්ඨ ප්‍රවේශ පංතිය සහ ජ්‍යෙෂ්ඨ පංතිය යන නම්ද පිළිවෙලින් භාවිතා කරති.

විද්‍යාලයවල උගන්වන වැඩ මූලිකවශයෙන් කොටස් දෙකකි. විද්‍යා අංශය සහ කලා අංශය යනුවෙනි. විද්‍යාලයවල ඉගෙනීම ලබන ශිෂ්‍යයන්ට ආණ්ඩුවේ විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන විභාග කිහිපයකට පෙනී සිටීමට සිදුවෙයි. එනම් අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගය සහ විශ්වවිද්‍යාලය ප්‍රවේශ විභාගය යි. විශ්වවිද්‍යාලය ප්‍රවේශ විභාගයට ශිෂ්‍යයන් පෙනීසිටින්නේ විශ්වවිද්‍යාලය ප්‍රවේශ පංතියෙහි වර්ෂ දෙකක් ඉගෙනගැනීමෙන් පසු ය. එම විභාගයෙන් සමත්වන ශිෂ්‍යයෝ විශ්වවිද්‍යාලයවලට ඇතුල්වෙති.

දැනට ලංකාවෙහි විශ්වවිද්‍යාල හතරක් ඇත. එනම් පේරාදෙණියේ ශ්‍රී ලඞ්කා විශ්වවිද්‍යාලය, කොළඹ ශ්‍රී ලඞ්කා විශ්වවිද්‍යාලය, කැළණියේ ශ්‍රී ලඞ්කා විද්‍යාලඞ්කාර විශ්වවිද්‍යාලය සහ ගංගොඩවිල ශ්‍රී ලඞ්කා විද්‍යෝදය විශ්වවිද්‍යාලය යි. විශ්වවිද්‍යාලයකට ඇතුළත්වන ශිෂ්‍යයන්ගේ ඉගෙනීමේ කාලප්‍රමාණ මෙසේ ය. කලා අංශයෙහි බී. ඒ. සාමාන්‍ය උපාධිය හෝ විද්‍යා අංශයෙහි බී. එස්. සී. සාමාන්‍ය උපාධිය හෝ කරන ශිෂ්‍යයකුගේ ඉගෙනීමේ කාලප්‍රමාණය වර්ෂ තුනකි. එම අංශවල විශේෂ උපාධියක් කරන ශිෂ්‍යයකුගේ ඉගෙනීමේ කාලප්‍රමාණය වර්ෂ හතරකි. වෛද්‍ය අංශයෙහි එම්.බී.බී.එස්. උපාධිය කරන ශිෂ්‍යයකුගේ ඉගෙනීමේ කාලප්‍රමාණය වර්ෂ පහක් පමණ වෙයි.

විශ්වවිද්‍යාලයකට ඇතුල්වීම තරමක් අපහසුය. ශිෂ්‍යයකුට විශ්වවිද්‍යාලය ප්‍රවේශ විභාගයට පෙනීසිටීමට ඉඩලැබෙන්නේ ද තුන්වරක් පමණය. සෑම වර්ෂයකම බොහෝදෙනෙක්

මෙම විභාගයට පෙනීසිටිති. එහෙත් ඔවුන් අතුරෙන් තෝරාගන්නේ ටිකදෙනකු පමණි.

බාලාංශයේ සිට උපාධි විභාගය තෙක් ලංකාවේ ශිෂ්‍යයන්ට නිදහස් අධ්‍යාපනය ලැබෙයි. සෑම දරුවකුට ම වයස අවුරුදු දහතරක් වනතෙක් අධ්‍යාපනය අනිවාර්ය වෙයි. ලංකාවේ අධ්‍යාපනය මිශ්‍ර අධ්‍යාපනයක්ද වෙයි. ලංකාවේ දරුවෝ සියළුදෙනා ම පාහේ නිදහස් අධ්‍යාපනයෙන් බොහෝ ප්‍රයෝජන ලබති.

VOCABULARY

අංශය	N2 section, division; pl. අංශ, අංශවල්
අතුරෙන්	among
අධ්‍යාපන අමාත්‍යාංශය	N2 ministry of education
අධ්‍යයන පොදුසහතික පත්‍ර පංතිය	N2 General Certificate of Education class
අධ්‍යයන පොදුසහතික පත්‍ර ප්‍රවේශය	N2 General Certificate of Education entrance
අනිවාර්ය	compulsory
අපහසු	difficult
අමාත්‍යාංශය	N2 ministry; pl. අමාත්‍යාංශ
අයත්	belonging (Coll. අයිති)
ආයතනය	N2 institution; pl. ආයතන
ඇතැම්හු	some (people). See grammar 11.
ඇතුලත්වෙනවා	enter, be included
ඇතුල්වෙනවා	enter
ඉගෙනගැනීම	N2 learning; pl. ඉගෙනගැනීම්
ඉඩලැබෙනවා	to get a chance, get an opportunity
උගන්නවා	learn
උපාධිය	N2 (academic) degree; pl. උපාධි
එම එම	various, respective. See grammar 3.
කනිෂ්ඨ පංතිය	N2 Junior School Certificate class; pl. කනිෂ්ඨ පංති

කනිෂ්ඨ ප්‍රවේශ පංතිය	N2 Junior School Certificate preparation class; pl. කනිෂ්ඨ ප්‍රවේශ පන්ති
කාලප්‍රමාණය	N2 period of time; pl. කාලප්‍රමාණ
කැලණිය	N2 place name - Kelaniya
කොටස	N2 group, type; pl. කොටස්
ගංගොඩවිල	N3 place name - Gangodawila
ජ්‍යෙෂ්ඨ පංතිය	S. S. C. (Senior School Certificate class)
ජ්‍යෙෂ්ඨ ප්‍රවේශ පංතිය	S. S. C. preparation class
තෙක්	up to, until. See grammar 4.2
දක්වා	up to, until. See grammar 4.2
දී	while, during (Coll. දි)
නිදහස්	free
පවතිනවා	to exist
පාලනය	N2 jurisdiction, management; pl. පාලන
පාලනය වෙනවා	to be under the jurisdiction (of)
පාසැල	N2 school; pl. පාසැල්
පැවැත්වෙනවා	be held, be conducted
පිළිවෙල	N2 order; pl. පිළිවෙලවල්
පිළිවෙලින්	in order, respectively
පෙනී සිටිනවා	appear, sit (for an exam)
පෙනී සිටීම	N2 appearance, sitting for examination
පේරාදෙණිය	N2 place name - Peradeniya
බාලාංශය	N2 kindergarten; pl. බාලාංශ
භාවිතා කරනවා	use
මගින්	by. See grammar 4.5.
මධ්‍ය මහා විද්‍යාලය	N2 central college; pl. මධ්‍ය මහා විද්‍යාල
මිශ්‍ර	mixed

මිශ්‍ර අධ්‍යාපනය	N2 "mixed-education", co-education
මූලික	basic, chief
මෙම	this
මෙසේ	thus, like this. See grammar 2.
යටතේ	under (the jurisdiction of)
යනුවෙන්	as, namely. See grammar 7.
යෙදෙනවා	be used, be employed, be engaged in
රජය	N2 government; stem රජය
වයස	N2 age
වර්ෂය	N2 year; pl. වර්ෂ
වශයෙන්	as, -ly
විභාගය	N2 examination; pl. විභාග
විශේෂ	special
විශ්වවිද්‍යාලය	N2 university; pl. විශ්වවිද්‍යාල
විශ්වවිද්‍යාලය ප්‍රවේශ පංතිය	N2 university entrance class; pl. විශ්වවිද්‍යාලය ප්‍රවේශ පංති
විෂය	N2 subject of study, major; pl. විෂයවල්, විෂයයන්
වෛද්‍ය	medical
ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය	N2 Vidyalankara University of Sri Lanka
ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලය	N2 Vidyodaya University of Sri Lanka
ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය	N2 University of Ceylon
සමර්ථ වෙනවා	to succeed, pass
සාමාන්‍ය	general
සෑම	every
සිට	from. See grammar 4.3.
සිදුවෙනවා	happen, come about. See grammar 9.

GRAMMAR

1. NOUN FORMS

1.1 Animate Nouns

1.11 Animate Gender: Animate nouns in Literary Sinhala may be masculine or feminine. Whether a noun is masculine or feminine can almost always be predicted from its meaning, with masculine nouns referring to male beings and feminine nouns referring to female beings. Thus පුතා 'son' and මාමා 'maternal uncle' are masculine and දුව 'daughter' and අක්කා 'older sister' are feminine.

Nouns that may refer to either males or females such as ළමයා 'child', ශිෂ්‍යයා 'student' and දරුවා 'child, offspring' are treated grammatically as masculine.

Masculine and feminine nouns have different sets of endings. Only the masculine endings are given in this lesson.

1.12 Animate Cases: Animate nouns, like pronouns (2,2), have five cases in Literary Sinhala: NOMINATIVE, ACCUSATIVE, DATIVE, GENITIVE and INSTRUMENTAL. They are formed as follows:

1.121 The nominative case of Literary masculine nouns has the same forms as the Colloquial animate direct case. Thus:

Sg. Definite	Sg. Indefinite	Plural
පුතා	පුතෙක්	පුත්තු
ශිෂ්‍යයා	ශිෂ්‍යයෙක්	ශිෂ්‍යයෝ

1.122 The dative, genitive and instrumental case forms are like the corresponding forms of Colloquial animate nouns with two major differences:

(1) The -එක් of the nominative indefinite changes to -අකු before the case-endings. Thus:

Colloquial	Literary
පුතෙකුට, ශිෂ්‍යයෙකුට	පුතකුට, ශිෂ්‍යයකුට
පුතෙකුගෙ, ශිෂ්‍යයෙකුගෙ	පුතකුගේ, ශිෂ්‍යයකුගේ
පුතෙකුගෙන්, ශිෂ්‍යයෙකුගෙන්	පුතකුගෙන්, ශිෂ්‍යයකුගෙන්

(2) If the noun is one of those that doubles the consonant in the plural such as පුතා , Pl. පුත්තු , that consonant doubles only in the nominative in Literary Sinhala and remains single in the plural oblique cases:

Colloquial	Literary
පුත්තුන්ට	පුතුන්ට
පුත්තුන්ගෙ	පුතුන්ගේ
පුත්තුන්ගෙන්	පුතුන්ගෙන්

(compare the nominative පුත්තු)

Other nouns generally have the same plural forms as in Colloquial Sinhala (except for the usual difference between -ගෙ and -ගේ):

Colloquial	Literary
ශිෂ්‍යයන්ට	ශිෂ්‍යයන්ට
ශිෂ්‍යයන්ගෙ	ශිෂ්‍යයන්ගේ
ශිෂ්‍යයන්ගෙන්	ශිෂ්‍යයන්ගෙන්

However, nouns ending in -අයා with a plural in -අයෝ , have an alternate form of the oblique affix -අයින් , as well as -අයන්. This alternate is more characteristic of Literary Sinhala, but may also be encountered in Colloquial:

Colloquial	Literary
ශිෂ්‍යයින්ට	ශිෂ්‍යයින්ට
ශිෂ්‍යයින්ගෙ	ශිෂ්‍යයින්ගේ
ශිෂ්‍යයින්ගෙන්	ශිෂ්‍යයින්ගෙන්

1.123 The accusative case form may be obtained simply by removing the case endings -ට , -ගෙ , -ගෙන් from the other oblique cases. Thus:

Definite	Indefinite	Plural
පුතා	පුතකු	පුතුන්
ශිෂ්‍යයා	ශිෂ්‍යයකු	ශිෂ්‍යයන්, ශිෂ්‍යයින්

The accusative is thus the oblique stem from which the other oblique cases are formed. Note that it will be identical with the nominative in the definite singular.

1.13 The full set of case and definiteness endings of Literary masculine nouns is thus as follows:

	Definite	Indefinite	Plural
Nom.	පුතා	පුතෙක්	පුත්තු
Acc.	පුතා	පුතකු	පුතුන්
Dat.	පුතාට	පුතකුට	පුතුන්ට
Gen.	පුතාගේ	පුතකුගේ	පුතුන්ගේ
Inst.	පුතාගෙන්	පුතකුගෙන්	පුතුන්ගෙන්

Nom.	ශිෂ්‍යයා	ශිෂ්‍යයෙක්	ශිෂ්‍යයෝ
Acc.	ශිෂ්‍යයා	ශිෂ්‍යයකු	ශිෂ්‍යයන් , -අයින්
Dat.	ශිෂ්‍යයාට	ශිෂ්‍යයකුට	ශිෂ්‍යයන්ට , -අයින්ට
Gen.	ශිෂ්‍යයාගේ	ශිෂ්‍යයකුගේ	ශිෂ්‍යයන්ගේ , -අයින්ගේ
Inst.	ශිෂ්‍යයාගෙන්	ශිෂ්‍යයකුගෙන්	ශිෂ්‍යයන්ගෙන් , -අයින්ගෙන්

1.14 As with pronouns, animate nouns serving as subjects in emphatic sentences must be in the accusative case (2,4.2).

> ගමෙහි දරුවන් ඉගෙනගන්නේ පිරිවෙනෙහි පමණ ය.
> The village children study only in the pirivena.

1.2 Inanimate Nouns

Except for the differences noted in Lesson 1, inanimate nouns in Literary Sinhala have the same forms as those in Colloquial. They thus do not distinguish between the nominative and accusative cases, but have only a direct case wherever animate nouns require either the nominative or accusative:

> ශිෂ්‍යයන් සිටින්නේ විජයබා පිරිවෙනෙහි ය.
> The students are in Vijayaba Pirivena.

but: විජයබා පිරිවෙන තිබෙන්නේ අපේ ගමෙහි ය.
Vijayaba Pirivena is in our village.

2. LOCATION SETS

2.1 මෙසේ 'thus', 'in this way', is essentially a Literary equivalent of Colloquial මෙහෙම . The other members of this set are එසේ 'thus', 'in that way' (the equivalent of the Colloquial එහෙම), and the interrogative කෙසේ 'how, in which way', (the equivalent of the Colloquial කොහොම):

Colloquial:	ගොවියො මෙහෙම වපුරනවා .	The farmers sow in this way
Literary:	ගොවියෝ මෙසේ වපුරති.	
Colloquial:	ගොවියො වපුරන්නේ කොහොමද?	How do the farmers sow?
Literary:	ගොවියන් වපුරන්නේ කෙසේද?	

2.2 මෙම 'this' is the Literary equivalent of Colloquial මේ . එම 'that (in question)' is the equivalent of Colloquial ඒ . In strict Literary writing the forms මෙම and එම are more frequently used than මේ and ඒ . There are no special Literary equivalents for ඔය and අර since their use, with 'pointing' implied, would normally be required only in conversational situations.

The interrogative forms associated with the මෙම set are කොයි 'which' and මොන 'what'.

3. එම එම.....එම එම

එම may be reduplicated as එම එම and then repeated before things that are linked in the sense 'those various...their respective':

> එම එම ගම්වල ශිෂ්‍යයන් යන්නේ එම එම ගම්වල පාසැල්වලට ය.
> The students in those various villages go to the schools of their respective villages.
>
> එම එම පන්සල්වල හාමුදුරුවරු එම එම පන්සල්වල ඉගෙන ගනිති.
> The monks of those various temples study in their respective temples.

4. POSTPOSITIONS

Although some postpositions, like යටතේ 'under', occur in both varieties, Literary Sinhala tends to use a different set of postpositions than Colloquial. Some Literary Sinhala postpositions have exact or nearly exact Colloquial equivalents. For example, Literary සිට 'from', is essentially an equivalent of Colloquial ඉඳලා . Others, however, have only partial equivalents or none at all in Colloquial Sinhala.

As in Colloquial Sinhala, Literary Sinhala postpositions may require specific cases of the nouns they follow. But there is one important difference. In Literary Sinhala nouns followed by postpositions never appear in the nominative case. Hence, if a postposition does not require the dative, genitive, or the instrumental case, a noun or a pronoun preceding it must be in the accusative. (Inanimate nouns, which have no nominative/accusative distinction, appear in the direct case in such a situation.)

When a new postposition is introduced in this text, the case which it requires will be specified only if it takes the genitive, dative, or instrumental. If no case is specified it may be assumed to require the accusative. In this lesson the following postpositions require special comment:

4.1 වශයෙන් with nouns generally means 'as' and is an equivalent of Colloquial හැටියට :

Colloquial: එයා ගුරුවරයෙක් හැටියට ප්‍රසිද්ධයි.

Literary: හෙතෙම ගුරුවරයකු වශයෙන් ප්‍රසිද්ධ ය.

He is well-known as a teacher.

With adjectives it commonly has the sense 'in a fashion' and thus may equate with English '-ly'. Thus, මූලික වශයෙන් 'chiefly, basically' ප්‍රධාන වශයෙන් 'mainly, chiefly'.

4.2 තෙක් and දක්වා both occur with nouns in the sense of 'up to' or 'as far as'.

ගම තෙක්	up to the village
පස්වැනි ප්‍රමාණය දක්වා	up to the fifth grade

තෙක් but not දක්වා may occur with verbal adjectives (like Colloquial කං) in the sense 'until':

> ගුරුවරයා පාඨශාලාවට එනතෙක් ශිෂ්‍යයෝ වැඩ නොකරති.
> The students do not study until the teacher arrives at the school.

4.3 සිට is essentially an equivalent of Colloquial ඉඳලා and like it requires the genitive case. සිට may be combined with තෙක් or දක්වා to form 'from.....to' constructions.

Colloquial: වැල්ලවත්තෙ ඉඳලා කොළඹට

Literary: වැල්ලවත්තේ සිට කොළඹ තෙක් (or දක්වා)

from Wellawatte to Colombo

4.4 පසු 'after' requires the instrumental case and often occurs with - ඊම verbal nouns in that case to form the equivalent of English 'after' clauses.

> ගොවියෝ සී සෑමෙන් පසු වපුරති.
> After ploughing the farmers sow.

ඉන්පසු , which appeared in the readings for Lesson 2, is actually a shortened form of එයින් plus පසු , and serves as a Literary equivalent for Colloquial ඊට පස්සෙ .

4.5 මඟින් has the sense 'by means of' or 'through' and is commonly used where something is carried out by an organization:

> විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වන විභාග....
> The examinations conducted by the examination department...

4.6 සඳහා has 'for' as its usual English equivalent. There is no equivalent Colloquial postposition, and the most common equivalent is the dative case:

Colloquial: මේ වැඩට හුඟක් මිනිස්සු ඉන්නවා.

Literary: මෙම වැඩ සඳහා බොහෝ මිනිස්සු සිටිති.
There are many men for this work.

4.7 අතුරෙන් occurs with a plural noun in the sense 'from among'.

ගුරුවරුන් අතුරෙන්
from among the teachers

විද්‍යාල අතුරෙන්
from among the colleges.

5. හෝ.....(හෝ)

හෝ is the Literary form 'or'. Like Colloquial හරි ...හරි (C. S. 22,12) it may be repeated after each form to which it pertains:

ගුරුවරයා හෝ ශිෂ්‍යයා හෝ
either the teacher or the student...

However, unlike හරි , the last හෝ in the series may be omitted:

ගුරුවරයා හෝ ශිෂ්‍යයා

6. COMPOUNDS

In Literary Sinhala, as in Colloquial, noun compounds may be formed by joining two nouns with the first in the stem form, but Literary Sinhala makes much freer use of such compounds than does Colloquial. Sometimes these compounds may be rendered in English by parallel compounds, such as 'estate-owner' for වතු හිමියා or 'university-entrance' for විශ්ව විද්‍යාලය ප්‍රවේශය . At other times they are rendered by a phrase, such as 'extent of time' for කාල ප්‍රමාණය . In Sinhala, as in English, compounds may enter into still larger compounds such as විශ්ව විද්‍යාලය ප්‍රවේශ පන්තිය 'university-entrance class'. Although the stem form cannot be predicted for all nouns in any simple regular way, very commonly the stem for inanimate nouns will be the same as the plural or, for a noun having the ending - වල්, as the plural with the - වල් removed. Thus:

Singular		Plural	Stem
වත්ත	estate	වතු	වතු-
කලාව	art	කලා	කලා-
ගෙදර	house	ගෙදරවල්	ගෙදර-
දොර	door	දොරවල්	දොර-

7. යනුවෙන් like යන (2,. [illegible] is used in marking specifications, names being given, etc., and like it has the equivalents 'namely, such as'. They differ in the kinds of constructions in which they are used. යන is adjectival, connecting the specification or

names preceding it to the more general noun which follows. Thus:

ගුණපාල යන ශිෂ්‍යයා....
The student called Gunapala...

වෙළඳාම, ගොවිතැන යන රක්ෂා......
Occupations such as trade and farming...

යනුවෙන් is adverbial and is usually used in constructions with verbs of naming, designating, etc.

පන්සලෙහි පුස්තකාලය පොත්ගුල යනුවෙන් හඳුන්වමු.
We designate the temple-library as 'potgula'.

යනුවෙන් may also be used as an equivalent of English 'namely, that is to say' in order to further specify something in the preceding sentence. It will then have the predication marker.

මෙම ගමෙහි මිනිස්සු රක්ෂාවල් තුනක් කරති. වෙළඳාම, ගොවිතැන, කුලීවැඩ යනුවෙනි.
The people in this village do three occupations.
That is, trade, farming and day-labor.

8. ස AND හ

In Colloquial Sinhala many forms with හ have alternants with ස . No general statement can be made for predicting these alternants since there is variation from speaker to speaker as well as from item to item. Thus one speaker may have සොයනවා 'seek' and හෝදනවා 'wash' while another may have හොයනවා and සෝදනවා , and still another හොයනවා , and හෝදනවා . On the other hand, all speakers have හතර for 'four' and සැර for 'strong' without alternants in Colloquial Sinhala.

Similar alternations occur in Literary Sinhala but the ස forms are more common than in Colloquial. This is true even for many items where Colloquial has only හ . Thus:

Colloquial		Literary
හතර	four	සතර or හතර
හානවා	plough	සානවා
හැම or හැම	every	සැම

9. සිදුවෙනවා

සිදුවෙනවා 'happen, come about' may be used with a dependent dative verbal noun and the equivalent of the English subject in the dative case as an equivalent of English 'have to, must'. The implication is that a situation either exists or comes about such that one must do something:

අපට සෑම මාසයකම ගමට යෑමට සිදුවෙයි.
We have to go to the village every month.

There is a Colloquial equivalent for this construction with සිද්දවෙනවා rather than සිදුවෙනවා , and a dependent infinitive:

අපට හැම මාසෙකම ගමට යන්න සිද්දවෙනවා.

10. - වැනි

The affix for forming the ordinal numerals in Literary Sinhala is commonly - වැනි instead of - වෙනි (C. S. 16,5) දෙවැනි , තුන්වැනි , හතරවැනි , පස්වැනි , හයවැනි , etc.

11. ඇතැම්හු

ඇතැම්හු is the plural of the indefinite pronoun ඇතැමෙක් (1,1.2), and thus means 'some (people)':

ඇතැම්හු කුලීවැඩ කරති.
Some people do manual labor.

අපේ ගමේ ඇතැම්හු වී ගොවිතැන් කරති. ඇතැම්හු රබර් වගා කරති.
Some people in our village do paddy-farming. Some grow rubber.

12. වන

Present tense verbal adjectives are formed for most verbs in Literary Sinhala in the same way as those in Colloquial (C. S. 8,5). Thus:

Stem		Verbal Adjective
කර-	do	කරන
අදි-	pull, draw	අදින
වැටෙ-	fall	වැටෙන

For a few verbs, however, the Literary form is different. For example, the usual present tense form of වෙනවා in Literary Sinhala is වන rather than වෙන . Others will be given as they occur.

13. වර

The stem of a numeral occurs with වර 'period, turn' to form expressions meaning 'two times, three times, etc.' In these, වර is characteristically in the indefinite:

එක්වරක්	once
දෙවරක්	twice
තුන්වරක්	three times, etc.

The Colloquial equivalent is the numeral stem plus සැරේ or පාර , also in the indefinite:

එකසැරයක්	or	එකපාරක්	once
දෙසැරයක්	or	දෙපාරක්	twice
තුන්සැරයක්	or	තුන්පාරක්	three times

Note that the Literary and Colloquial stems for 'one' differ in these forms.

14. WRITING SYSTEM

14.1 ඞ represents the sound of ng in English sing (i.e. ŋ). It generally occurs only before ක , ඛ , ග and ඝ , and is thus an alternate for ං in that position: ලංකා , or ලඞ්කා 'Ceylon', ගංගා or ගඞ්ගා 'rivers'.

14.2 In some words, usually taken directly from Sanskrit, the combination ර්ය is found written as ර්‍ය . The latter way of writing it is more formal: අනිවාර්‍ය or අනිවාර්ය 'compulsory', ආචාර්‍ය or ආචාර්ය 'teacher, doctor (Ph.D.)'.

14.3 When the symbol ෙ is doubled before a consonant it indicates ai following that consonant. At the beginning of a word the equivalent symbol is ඓ ai.

ඓතිහාසික	aitihāsika	'historical'
වෛද්‍ය	vaidya	'medical'

the pronunciation represented is the same as that for අය් or අයි , that is, ay.

SUPPLEMENTARY READINGS

1. අනෙක් අධ්‍යාපන ආයතන

විශ්වවිද්‍යාලය අධ්‍යාපනය ලබන්නේ ලංකාවේ ශිෂ්‍යයන්ගෙන් ටිකදෙනකු පමණය. විශ්වවිද්‍යාලයකට ඇතුලත්වීම තරමක් අපහසු ය. එහෙයිනි. එහෙත් තමන්ගේ අධ්‍යාපනය කිරීමට බලාපොරොත්තුවන ශිෂ්‍යයන් සඳහා වෙනස් අධ්‍යාපන ආයතන කිහිපයක්ද ඇත.

රක්ෂාවක් වශයෙන් ගුරුවෘත්තියෙහි යෙදීමට කැමති ශිෂ්‍යයන් සඳහා ගුරු අභ්‍යාස විද්‍යාල කිහිපයක් වෙයි. ගුරු අභ්‍යාස විද්‍යාලයවලට ඇතුළත්වීම සඳහා විභාගයක් ඇත. එය ගුරුඅභ්‍යාස විද්‍යාලය ප්‍රවේශ විභාගය යි. මෙම විභාගයට පෙනීසිටීම සඳහා ඉඩලැබෙන්නේ අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් හොඳින් සමත්වන ශිෂ්‍යයන්ට පමණකි. මෙම විභාගය පවත්වන්නේ ආණ්ඩුවේ විභාග දෙපාර්තමේන්තුව මගිනි.

බොහෝ අභ්‍යාස විද්‍යාලයවල ගැහැණු සහ පිරිමි දෙගොල්ල ම ඉගෙනගනිති. පිරිමි අය සඳහා පමණක් ම වන අභ්‍යාස විද්‍යාල කිහිපයක්ද, ගැහැණු අය සඳහා පමණක් ම වන අභ්‍යාස විද්‍යාල කිහිපයක්ද ඇත. ශිෂ්‍යයෝ අභ්‍යාස විද්‍යාලයකදී වර්ෂ දෙකක පුහුණුවක් ලබති. ඉන්පසු ඔව්හු ගුරුවෘත්තියෙහි යෙදෙති.

පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගයෙන් පසු ඇතැම් ශිෂ්‍යයෝ කාර්මික අධ්‍යාපනයක් ලබති. ඔවුන් සඳහා කාර්මික විද්‍යාලයක් වෙයි. ඇතැම්හු කෘෂිකර්මය උගනිති. ඔවුන් සඳහා කෘෂිකර්ම විද්‍යාලයක් වෙයි. මේ අධ්‍යාපන ආයතන සියල්ලම රජය යටතේ පවති යි.

2. පිරිවෙන් අධ්‍යාපනය

ලංකාවේ දැනට පවතින අධ්‍යාපන ආයතන අතුරෙන් පිරිවෙන් පැරණිම ආයතන වෙයි. සෑම පිරිවෙනක් ම පාහේ පන්සලකට සම්බන්ධව පවතී. පිරිවෙන් පවතින්නේ හාමුදුරුවරුන්ගේ පාලනය යටතේ ය. සෑම පිරිවෙනකට ම රජයෙන් වාර්ෂික ආධාර මුදලක් ලැබෙයි. එම මුදල් පිරිවෙන්වල නඩත්තුව සඳහා අවශ්‍යය. බොහෝ පිරිවෙන්වල නඩත්තුව සඳහා දායකවරුද ආධාර කරති.

පිරිවෙන්, මූලිකවශයෙන් කොටස් තුනකි. මූලික පිරිවෙන්, උපරිම පිරිවෙන් සහ විශ්වවිද්‍යාලය පිරිවෙන් යනුවෙනි. මූලික සහ උපරිම පිරිවෙන්වල හාමුදුරුවරු සහ පිරිමි ලමයි පමණක් උගනිති. මෙම පිරිවෙන්වල ශිෂ්‍යයන් පුහුණුව ලබන්නේ ප්‍රාචීන විභාග සඳහා පමණකි. එහෙයින් මෙම පිරිවෙන්වල ඉගෙනීම ලබන ශිෂ්‍යයන් සඳහා සිංහල, පාලි සහ සංස්කෘත යන වැඩ අනිවාර්ය වෙයි. ප්‍රාචීන විභාගය කොටස් තුනකි. ප්‍රාචීන ප්‍රාරම්භය , ප්‍රාචීන මධ්‍යමය

සහ ප්‍රාචීන අවසානය යනුවෙනි. ශිෂ්‍යයෝ මූලික පිරිවෙන්වල ප්‍රාචීන ප්‍රාරම්භය තෙක් පමණක් පුහුණුව ලබති. ප්‍රාචීන මධ්‍යම විභාගයේ සිට ප්‍රාචීන අවසාන විභාගය තෙක් ශිෂ්‍යයන් පුහුණුව ලබන්නේ උපරිම පිරිවෙන්වල පමණකි.

සෑම විශ්වවිද්‍යාලය පිරිවෙනක් ම පාහේ ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලයට හෝ ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයට හෝ සම්බන්ධව පවතී. විශ්වවිද්‍යාලය පිරිවෙන්වල ගැහැණු ලමයිද ඉගෙනීම ලබති. මෙම පිරිවෙන්වල ඉගෙනීම ලබන්නේ විශ්වවිද්‍යාලයවලට ඇතුල්වීමට බලාපොරොත්තු වන අය යි. එහෙයින් මෙම පිරිවෙන්වල මූලිකවශයෙන් උගන්වන්නේ විශ්වවිද්‍යාලයවලට ඇතුළත්වීම සඳහා අවශ්‍යවන වැඩ ය.

VOCABULARY FOR SUPPLEMENTARY READINGS

READING 1

අභ්‍යාසය	N2 exercise, training; pl. අභ්‍යාස
ඇතුළත් වෙනවා	= ඇතුලත් වෙනවා
එහෙයින්	that's why, that's the reason, therefore
කාර්මික	technical
කාර්මික අධ්‍යාපනය	N2 technical education
කෘෂිකර්මය	N2 agriculture, cultivation; stem කෘෂිකර්ම
ගැහැනිය	N5 woman; pl. ගැහැණු ; stem ගැහැණු
ගැහැණු	female, women (adjective)
ගුරු අභ්‍යාස විද්‍යාලය	N2 teacher-training college; pl. ගුරු අභ්‍යාස විද්‍යාල
දෙගොල්ල	N5 both groups (of people)
පුහුණුව	N2 training, practice; stem පුහුණු
ප්‍රවේශය	N2 entrance; stem ප්‍රවේශ
යෙදීම	N2 use, employment; pl. යෙදීම්
විද්‍යාලය	N2 college; pl. විද්‍යාල

READING 2

ආධාර මුදල	N2 grant, financial support; pl. ආධාර මුදල්

ආධාරය	N2 help,aid; pl. ආධාර
උපරිම	superior, high
දායකවරයා	N5 lay donor (respectful); pl. දායකවරු
නඩත්තුව	N2 maintenance, support; pl. නඩත්තු
පැරණි	old
ප්‍රාචින අවසානය	N2 Oriental Studies final examination; stem අවසාන
ප්‍රාචින ප්‍රාරම්භය	N2 Oriental Studies first examination; stem ප්‍රාචීන ප්‍රාරම්භ
ප්‍රාචින මධ්‍යමය	N2 Oriental Studies intermediate examination; stem ප්‍රාචීන මධ්‍යම
ප්‍රාචින විභාගය	N2 Oriental Studies examination
මූලික	primary
වාර්ෂික	annual
සම්බන්ධ	connected, in relation to

L E S S O N 4

ලංකාවේ උත්සව.

ලාංකිකයන් කොටස් කිහිපයකට බෙදිය හැකි ය. සිංහල, දෙමළ, මරක්කල, ලන්සි , මැලේ වශයෙනි. ආගම් අනුවද මොවුන් කොටස් කිහිපයකට බෙදිය හැක. බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි සහ මුස්ලිම් යනුවෙනි.

ලංකාවේ උත්සව ජාතික උත්සව සහ ආගමික උත්සව යනුවෙන් කොටස් දෙකකට බෙදමු. ලාංකිකයන් විසින් පොදුවේ කරනු ලබන උත්සව ජාතික උත්සව යනුවෙන් හඳුන්වනු ලැබෙයි. එක් එක් ආගම්වලට අයත් මිනිසුන් විසින් ඒ ඒ ආගම් පිළිබඳව කරනු ලබන උත්සවවලට "ආගමික උත්සව ය"යි කියමු.

ලාංකිකයන් සියළුදෙනාම විසින් විශාල උනන්දුවකින් පවත්වනු ලබන ජාතික උත්සවයක් වශයෙන් නිදහස් උත්සවය සැලකිය හැක. මෙය සෑම වර්ෂයකම පෙබරවාරි මාසයේ හතරවැනි දින පවත්වනු ලැබෙයි.

ලාංකිකයන් බොහෝදෙනකු විසින් පවත්වනුලබන අනෙක් වැදගත් ජාතික උත්සවය අළුත් අවුරුදු උත්සවය යි. මේ සඳහා විශේෂයෙන්ම සිංහල සහ දෙමළ මිනිස්සු සහභාගිවෙති. එහෙයින් මෙය සිංහල සහ දෙමළ අළුත් අවුරුද්ද යනුවෙන්ද හඳුන්වනු ලැබෙයි.

ආගමික උත්සව ලංකාවේ මිනිසුන්ගේ ආගම්වලට අනුව කොටස් කෙරිය හැක. බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි, සහ. මුස්ලිම් ආගමික උත්සව යනුවෙනි.

බෞද්ධයන්ගේ ආගමික උත්සව අතුරෙන් වෙසක් උත්සවය වැදගත් ම උත්සවය වශයෙන් සලකනු ලැබෙයි. මෙය පවත්වනු ලබන්නේ සෑම වර්ෂයකම මැයිමාසයේ පසළොස්වක දිනවලය.බෙහෙවින් වෙසක් උත්සවයට, අනෙක් ආගම්වල අයද සහභාගිවෙති. බෞද්ධයන්ගේ තවත් වැදගත් ආගමික උත්සව කිහිපයක් ඇත.

දීපාවලි, හින්දු අයගේ වැදගත් ආගමික උත්සවයකි. හින්දු මිනිසුන් විසින් මෙම උත්සවය විශාල උනන්දුවකින් පවත්වනු ලැබෙයි. හින්දු සහ බෞද්ධ දෙගොල්ල ම සහභාගි වෙන උත්සවයක් වශයෙන් කතරගම උත්සවය සැලකිය හැක. මෙය පවත්වනු ලබන්නේ අගෝස්තු මාසයෙහි දී ය.

මුස්ලිම් අය, මහම්මත් දිනය ඔවුන්ගේ වැදගත් ම ආගමික උත්සව දිනය වශයෙන් සලකති. ක්‍රිස්තියානි අයගේ වැදගත් ම ආගමික උත්සවය නත්තල් උත්සවය වෙයි. නත්තල් උත්සවය, මහම්මත් දිනය, දීපාවලි, වෙසක් උත්සවය යන උත්සව පවත්වන්නේ එම එම ආගම්වලට අයත් අය පමණක් ම නොවේ. අනෙක් ආගම්වලට අයත් මිනිස්සු ද, බෙහෙවින් එම උත්සවවලට සහභාගිවෙති. සෑම වැදගත් ජාතික හෝ ආගමික උත්සව දිනයක් ම රජයේ නිවාඩු දිනයක් ද වෙයි.

VOCABULARY

අනුව	according (to). See grammar 9.
අලුත් අවුරුදු උත්සවය	N2 New Year festival; pl. අලුත් අවුරුදු උත්සව
ආගම	N2 religion; pl. ආගම්
ආගමික	religious
උත්සවය	N2 festival, ceremony; pl. උත්සව
උනන්දුව	N2 eagerness
කතරගම	N2/3 a famous shrine in S.E. Sri Lanka and an epithet of a god of that shrine (the Hindu Skandha Kumara)
කතරගම උත්සවය	N2 the Kataragama festival
ක්‍රිස්තියානි	Christian
ජාතික	national
දීපාවලී	Deepavali, a Hindu festival
දෙමළ	Tamil
නත්තල	N2 Christmas; stem නත්තල්
නත්තල් උත්සවය	N2 Christmas festival
නිදහස	N2 freedom, independence
නිදහස් උත්සවය	independence festival
පවත්වනවා	hold, carry out
පසළොස්වක	N2/3 full moon day; pl. පසළොස්වක, පසළොස්වක
පසළොස්වක දිනය	N2 full moon day; pl. පසළොස්වක දින
පිළිබඳව	concerning
පොදුවේ	in common
බෙහෙවින්	greatly, mostly
බොදු	Buddhist

Lesson Four

බෞද්ධයා	N5 a Buddhist; pl. බෞද්ධයෝ
මරක්කල	Moor, Muslim (stem)
මහම්මත් දිනය	N2 birthday of prophet Mohammed
මැලේ	Malay (stem)
මුස්ලිම්	Muslim (stem)
මොවුන්	pl of මොහු
ලන්සි	Burgher (stem)
ලාංකිකයා	N5 a Ceylonese; pl. ලාංකිකයෝ
වැදගත්	important
විශේෂයෙන්	specially, particularly
විසින්	by. See grammar 7.
වෙසක් උත්සවය	N2 Vesak festival (a Buddhist festival commemorating the birth, enlightment and passing away of the Buddha)
සලකනවා	consider, regard
සහභාගිවෙනවා	participate
හඳුන්වනවා	designate, denote
හින්දු	Hindu

GRAMMAR

1. WRITING SYSTEM

1.1 ෙ-ෟ , usually transliterated as au, is found in words taken from Sanskrit, and is pronounced in the same way as අව් or අවු . When it begins a word, the form is ඖ .

ඖෂධ aušǎdha 'medicine'

බෞද්ධ bauddha 'Buddhist'

1.2 Joined Consonants: So far (as in C. S.), consonant combinations and double consonants have been written by removing the inherent vowel from the first symbol. In written Sinhala they are often written by writing the two consonant symbols together without space and without the vowel-removing mark. In most combinations, the combined symbols are unaltered or only very slightly altered so that the parts are easily recognizable as in the following:

ලඞ්‍කාව or ලඞ්කාව (ලංකාව) laŋkāva 'Sri Lanka'

බෞද්‍ධ or බෞද්ධ bauddha 'Buddhist'

වස්‍තු or වස්තු vastu 'treasures'

හින්‍දු or හින්දු Hindu 'Hindu'

රක්‍ෂා or රක්ෂා rakṣā 'occupations'

අන්‍ධ or අන්ධ andha 'blind'

In a few cases the constituent consonant symbols are not easily recognizable, and these will be described as they occur.

2. POTENTIAL PARTICIPLE

Literary Sinhala has a potential participle, which may be formed for regular verbs of all classes by the following two steps:

1. The vowels within the stem are changed as for the past tense in Colloquial Sinhala (C. S. 17,3). That is:

අ	(representing a)	becomes	ඇ
ආ		becomes	ඇ
අ	(representing ə)	becomes	ඉ
එ		becomes	ඉ
ඒ		becomes	ඊ
ඔ		becomes	එ
ඕ		becomes	ඊ

2. The final - අ , - එ or - ඉ of the stem is replaced by ඉය . Thus:

Stem		Potential Participle
කර-	do	කෙරිය
කප-	cut	කැපිය
අදි-	pull	ඇදිය
බඳි-	tie, build	බැඳිය
වැටෙ-	fall	වැටිය

For class 2 verbs, there is an alternate form which can be made by removing ා from the Colloquial past tense simple form. It is thus identical with the past tense verbal adjective (C. S. 28,4). Thus: ඇදිය or ඇද්ද , බැඳිය or බැන්ද . For verbs which have a stem of one syllable of the form C + a or C + ā such as ක 'eat', සා 'plough' the regular formation of the potential participle is by changing the a or ā vowel to æ without adding -iya. Thus:

ක- > කැ

සා- > සැ

Irregular verbs have the following forms:

Stem		Potential Participle
එනවා	come	ආ
ඉඳිනවා (ඉන්නවා)	be	ඉඳින
ගන්නවා	take	ගත
ගෙනයනවා	take away	ගෙනගිය, ගෙනයත, ගෙනයා

ගේනවා	bring	ගෙන
දෙනවා	give	දිය
පේනවා	see, be seen	පෙනිය
බොනවා	drink	පිව, බිව
යනවා	go	යා, යන, ගිය
වෙනවා	be, become	විය
දන්නවා	know	දත

3. CAN, CAN'T

In Literary Sinhala, the 'can' construction with පුලුවන් and the infinitive is not generally used. Instead Literary Sinhala uses a potential participle dependent upon the form හැක . As with පුළුවන් , the subject when expressed is in the dative case:

ළමයාට මෙම පොත කියවිය හැක.
The child can read this book.

මෙම කෑම දරුවාට කෑ හැක.
The child can eat this food.

3.1 In simple sentences හැක may occur as හැක alone (as in the examples above) or in the form හැකි followed by the predication marker ය . Thus:

ළමයාට මෙම පොත කියවිය හැකි ය.
The boy can read this book.

මෙම කෑම දරුවාට කෑ හැකි ය.
The child can eat this food.

3.2 Like පුළුවන් , හැක may be used preceding a noun to form the equivalent of an English relative clause. In this usage it takes the form හැකි . Thus:

මට කියවිය හැකි පොත්...
The books which I can read...

3.3 In Literary Sinhala the negative of හැක may be formed by simply prefixing නො-to හැක in any of its forms. Thus:

මට මෙම පොත් කියවිය නොහැකි ය. / මට මෙම පොත් කියවිය නොහැක.
I cannot read these books.

මට කියවිය නොහැකි පොත්....
The books which I cannot read...

4. THIRD PERSON PRONOUNS

The third person singular masculine pronoun හෙතෙම and the third person plural pronoun ඔව්හු, (2,1) are actually part of a location set in which they correspond to the ඒ members. The other members are මෙතෙම 'he, this male person' and මොව්හු 'these people'. The case forms are:

	Singular	Plural
Nominative	මෙතෙම, මොහු	මොවුහු
Accusative	මොහු	මොවුන්
Dative	මොහුට	මොවුන්ට
Genitive	මොහුගේ	මොවුන්ගේ
Instrumental	මොහුගෙන්	මොවුන්ගෙන්

5. ACCUSATIVE CASE

In Literary Sinhala the direct object of a verb must be in the accusative case. Thus:

> අපි ගුරුවරුන් දකිමු.
> We see the teachers.
>
> මෙම පාසැලෙහි ශිෂ්‍යයන් කොටස් දෙකකට බෙදිය හැක.
> One can classify the students of this school in two groups.

A more general rule for the use of the nominative and the accusative cases in Literary Sinhala can now be given:

> If a form has both the nominative and accusative cases in Literary Sinhala, it will appear in the nominative case only:
>
> 1. when it is in an equational sentence, as subject or predicate attribute.
> 2. when it is the subject of a verb which shows agreement with it, by the occurrence of one of the person-number affixes.
>
> In all other uses it will appear in the accusative case (unless the construction requires one of the other oblique cases such as the dative, instrumental or genitive).

6. THE PASSIVE PARTICIPLE

Literary Sinhala verbs have a passive participle which is formed by adding -නු to the stem of the verb. Examples:

Stem		Passive Participle
ය-	go	යනු
බො-	drink	බොනු
වැටෙ-	fall	වැටෙනු

Note that if the stem ends in -න් the -න් is dropped when -නු is added. Example:

Stem		Passive Participle
ගන්-	take	ගනු

7. PASSIVE VOICE

Literary Sinhala has a passive construction (the equivalent of English 'is done, is divided', etc.) made by using the passive participle with the Class 1 verb ලබනවා 'to get, obtain' or the Class 3 verb ලැබෙනවා 'to be gotten, obtained'. In simple sentences ලැබෙනවා , is usually used and it agrees with the subject in number and person:

> මෙම වැඩ කරනු ලැබේ.
> This work is done.
>
> ලාංකිකයෝ කොටස් කිහිපයකට බෙදනු ලැබෙති.
> Ceylonese are divided into several groups.

If the actor is expressed (the equivalent of English 'by the boy', 'by us', etc.) it is in the accusative case followed by the postposition විසින් 'by':

> ළමයා විසින් වැඩකරනු ලැබේ.
> The work is done by the boy.
>
> අප විසින් ලාංකිකයෝ කොටස් කිහිපයකට බෙදනු ලැබෙති.
> The Ceylonese are divided by us into several groups.

In emphatic sentences or subordinate constructions ලබනවා is more common and takes the usual endings without agreement.

> ළමයා විසින් වැඩ කරනු ලබන්නේ වත්තෙහි ය.
> It is in the estate that the work is done by the boy.
>
> අප විසින් කියවනු ලබන පුස්කොළ පොත් පන්සලෙහි ඇත.
> The ola-leaf manuscripts read by us are in the temple.

8. එක් එක්

එක් එක් preceding a plural noun has the sense '(the) various, (the) different':

එක් එක් ආගම්වලට අයත් මිනිස්සු...
People belonging to different religions...

එක් එක් ගම්වල ළමයි...
The children of various villages...

Like එම එම , 'those various' (3,4) එක් එක් can be followed by another expression with එම එම or ඒ ඒ in the 'respective' sense.

එක් එක් ගම්වලට අයත් ළමයි ඒ ඒ ගම්වල පාසැල්වලට යති.
The children in the various villages go to the schools in their respective villages.

9. අනුව 'ACCORDING TO'

අනුව 'according to' can take a dependent noun in either the accusative or the dative case.

ආගම් අනුව *or* ආගම්වලට අනුව
according to the religions

ඒ අනුව *or* ඊට අනුව
according to that

10. දී 'DURING'

As in Colloquial Sinhala (C. S. 14,7), දී may be added to genitive case nouns to add the sense 'during', or 'while (in a place)'.

නිවාඩු කාලයේදී නවකතා කියවිය හැක.
During the holidays one can read novels.

පිරිවෙනෙහිදී ශිෂ්‍යයෝ සිංහල, පාලි, සහ සංස්කෘත උගෙනගනිති.
While in the pirivena, the students learn Sinhala, Pali and Sanskrit.

SUPPLEMENTARY READINGS

1. සිංහල අවුරුද්ද

සෑම වර්ෂයකම, අප්‍රියෙල් මාසයේ දහතුන්වැනි දින "සිංහල අවුරුද්ද" වශයෙන් සැලකෙයි. මෙම දිනය අලුත්අවුරුද්ද වශයෙන් සලකන්නේ සිංහලයන් පමණක් නොවෙයි. දෙමළ මිනිසුන් විසින් ද, මෙම දිනය ඔවුන්ගේ අළුත්අවුරුද්ද වශයෙන් සලකනු ලැබේ. එහෙයින් මෙම දිනය "හිඳු අලුත්අවුරුද්ද " යනුවෙන් ද හැඳින්වෙයි.

විශේෂයෙන්ම, කුඩාදරුවෝ අවුරුදුදිනයට බොහෝ ප්‍රියකරති. ඔවුන්ට බෙහෙවින් මෙම දිනයෙහි සතුටුවිය හැකි ය. කෙළිසෙල්ලම් කෙරිය හැකි ය. එහෙයිනි. වැඩිමහල් නෑදෑයෝ, මෙම දිනයෙහි, කුඩා දරුවන්ට නොයෙක් තෑගි බෝග දෙති. පොඩි දරුවෝ අවුරුද්දට අලුත් ඇඳුම් සහ නොයෙක් රසකැවිලි ජාති ලබති. බොහෝ දරුවන් අවුරුද්ද ගතකරන්නේ කෙලිසෙල්ලම් කිරීමෙනි. විශේෂයෙන්ම, අවුරුදු දවස් කිහිපයේදි වෙඩිපත්තු කිරීමෙන් දරුවෝ ලොකු සතුටක් ලබති. මෙදින, ඔවුන්ගේ මුහුණුවල විශාල ප්‍රීතියක් දැකිය හැක.

සිංහල අවුරුද්ද ප්‍රීතියට පත්වන්නේ පොඩිදරුවන් පමණක් නොවේ. වැඩිහිටියෝද, මෙම දිනයෙහි ලොකු සතුටක් ලබති. තමන්ගේ දරුවන්ට නොයෙක් තෑගි දීමෙන්, දෙමව්පියෝ සතුටුවෙති. අවුරුද්ද ප්‍රීතියෙන් සෙල්ලම්කරන පොඩිදරුවන් දැකීමද වැඩිහිටි අයට මහත් සතුටකි. අවුරුද්දට ඉස්සර දවස් කිහිපය මව්වරුන් විසින් ගතකරනු ලබන්නේ, තමන්ගේ දරුවන්ට දීමට එක් එක් රසකැවිලි සෑදීමෙනි. මෙම දිනයෙහි සෑම ගෙදරකම පාහේ ප්‍රීතිමත් මුහුණු දැකිය හැකි ය.

අලුත්අවුරුදු දින කිහිපයේ දි, සිංහල ජනයා විසින් අනුගමනය කරනු ලබන සිරිත්විරිත් කිහිපයක් ද වෙයි. මේවා "අවුරුදු සිරිත්විරිත් " යනුවෙන් හඳුන්වනු ලැබේ. සාමාන්‍යයෙන් අනිත් දවස්වලට සිංහල මිනිසුන් කන්නේ බත් ය. බත් කෑම සිංහලයාගේ සාමාන්‍ය පුරුද්ද ය. නමුත්, අවුරුද්දට , සිංහල මිනිසුන් කන්නේ කිරිබත් ය. මෙය එක අවුරුදු සිරිතකි. මෙදාට අලුත් ඇඳුම් ඇඳීමද අවුරුදු සිරිතකි. වැඩිහිටි අයට බුලත්හුරුල දීමද, බුලත්හුරුල දීමෙන් පසු ඔවුන්ට වැඳීමද අවුරුදු සිරිතකි. මෙම අවුරුදු සිරිත්විරිත් ලිත්වල සඳහන් වෙයි.

"පරණ අවුරුද්ද" ගෙවෙන වේලාවත්, "අලුත් අවුරුද්ද" ලබන වේලාවත් ලිත්වල දැක්වෙයි. සාමාන්‍යයෙන්, මෙම දිනයෙහි, ගම්වල, පන්සල්වල සණ්ඩාර ගැසීමෙන් අලුත්අවුරුද්ද ලබන වේලාව ජනයාට දන්වනු ලැබෙයි. මෙම වේලාවට පොඩිදරුවෝ වෙඩිපත්තු කිරීමට පටන් ගනිති. ඔවුන් පත්තුකරන වෙඩි ශබ්දවලින් අළුත් අවුරුද්ද ලබන වේලාව වඩාත් හොඳින් දැනගත හැකි වෙයි.

2. කතරගම දෙවියෝ

කතරගම, ලංකාවේ ගිනිකොණදිග ස්ථානයක පිහිටි. කතරගම, ලාංකිකයන් අතරත්, විශේෂයෙන් ම දකුණු ඉන්දියාවේ දෙමළ හින්දු මිනිසුන් අතරත් ප්‍රසිද්ධ, කතරගම දෙවියන්ගේ දේවාලය නිසා ය. හින්දු දෙවිවරුන් අතුරෙන් "ස්කන්ධකුමාර" සහ "කාර්ත්තිකේය" යනුවෙන් හැඳින්වෙන දෙවියන්ට, ලංකාවේ සිංහල මිනිස්සු "කතරගම දෙවියෝ ය"යි කියති. ඇතැම්හු, මෙම දෙවියන් "කඳකුමරු" යනුවෙන්ද හඳුන්වති. විශේෂයෙන් ම, සිංහල සාහිත්‍යයට අයත් පොත්පත්වල, කතරගම දෙවියන් හැඳින්වෙන්නේ "කඳකුමරු" යනුවෙනි. කතරගම දෙවියන් අදහන අය, මෙම දෙවියන් විස්තර කරන්නේ මෙසේ ය: "කතරගම දෙවියන්ට මුහුණු සයක් ඇත. අත් දොළසක් ඇත. වාහනය මයුරා වෙයි. ඊශ්වර දෙවියෝ මෙම දෙවියන්ගේ පියා ය. මව පාර්වතිය. ගණ දෙවියෝ සහෝදරයා ය."

දෙමළ හින්දු ජනයා, බෙහෙවින් මෙම දෙවියන් හඳුන්වන්නේ "මුරුගන්" යනුවෙනි. "කඳසාමි" සහ "කදිරදේවන්" යන නම්ද ඔවුහු මෙම දෙවියන් හැඳින්වීමට යොදති. මෙම දෙවියන් හැඳින්වීමට තවත් නම් කිහිපයක්ම ඇත.

අවුරුද්දකට වරක්, මෙම දෙවියන්ගේ දේවාලයෙහි විශාල උත්සවයක් පවත්වනු ලැබෙයි. එයට "කතරගම උත්සවය ය"යි කියමු. කතරගම උත්සවය, හින්දු සහ බෞද්ධ ජනයාවිසින් පොදුවේ පවත්වනු ලැබේ. මෙම උත්සවය පවත්වන්නේ අගෝස්තු මාසයෙහිදිය. මෙම උත්සව දිනයෙහිදී එයට සහභාගිවන ජනයා කතරගම දෙවියන්ට නොයෙක් පුදපූජා පවත්වති. ඇතැම්හු නොයෙක් ලාභ බලාපොරොත්තුවෙන් භාර ඔප්පු කරති.

හින්දු දෙවිවරුන් අතරෙහි ස්කන්ධකුමාර දෙවියන් සේනාධිපතියකු හැටියට ප්‍රසිද්ධය. මොහු තේජස්වනා දෙවිකෙනෙකි. බිහිසුණු ස්වරූපයක්ද දරයි. එහෙයින්, බොහෝ සිංහල බෞද්ධ මිනිසුන්, කතරගම උත්සවයට සහභාගිවන්නේත්, මෙම දෙවියන්ට නොයෙක් පුදපූජා පවත්වන්නේත්, දෙවියන්ට ගෞරව කිරීමට ම නොවෙයි. තමන්ගේ නොයෙක් බලාපොරොත්තු ඉෂ්ට කරගැනීමට ය. ඇතැම්විට සතුරන්ගෙන් පළි ගැනීමට ය. ඇතැම්විට තමා අකමැති කෙනකුට උවදුරු කිරීමට ය.

බෞද්ධයෝ ඇතැම් හින්දු දෙවිවරුන්ට පුදපූජා පවත්වති. ලාංකික බෞද්ධයන්ගෙන් පුදපූජා ලබන ප්‍රධාන හින්දු දෙවිවරුන් දෙදෙනා වශයෙන් "විෂ්ණු දෙවියන්" සහ "කතරගම දෙවියන්" සැලකිය හැක. එහෙත් බෞද්ධයෝ මෙම දෙවිවරුන් නොඅදහති. හින්දු මිනිස්සු මෙම දෙවිවරුන් අදහති. එහෙයින් බෞද්ධයන් දක්වන භක්තියට වඩා භක්තියක් හින්දු මිනිස්සු දෙවිවරුන්ට දක්වති.

කතරගම උත්සව දිනයෙහිදී එයට සහභාගිවන අය එක් එක් පුදපූජා පවත්වති.

"කාවාඩී නැටීම" මෙදින බොහෝ දෙනකු විසින් කරනු ලැබේ. මෙය භාර ඔප්පුකිරීම සඳහා කරනු ලැබෙයි. විශේෂයෙන්ම, හින්දු ජනයා මෙදින භාර ඔප්පුකිරීමට, ශරීරයට වධදෙන නොයෙක් දේ කරති. ඇතැම්හු යකඩ උල් ඇඟේ ඇනගනිති. ඇතැම්හු ඇඟේ යකඩ කොකු අමුණාගනිති. එම කොකුවලින් කරත්ත අදිති. ඇතැම්හු බිම පෙරළෙති. සමහරු හිස මුඩුකරගනිති. තවත් සමහරෙක් යකඩ කොකුවලින් එල්ලෙති. ඇතැම්හු භක්ති පාඨ කියති. කැගසති. ඇතැම්හු ගිනිපාගති. ගිනිපෑගීම කතරගම උත්සවයෙහි විශේෂ ලක්ෂණයක් වෙයි. මෙම සියළුදේ ඔවුන් කරන්නේ තමන්ගේ භක්තිය කතරගම දෙවියන්ට දැක්වීම සඳහාය.

VOCABULARY FOR SUPPLEMENTARY READINGS

READING 1

අඳිනවා	dress
අනුගමනය කරනවා	follow
අවුරුදු ද	Sinhala New Year
අවුරුද්ද ලබනවා	new year starts/dawns
ඇඳීම	N2 dressing; pl. ඇඳීම්
ඇඳුම	N2 clothes, dress; pl. ඇඳුම්
කැවිලි	sweetmeats; pl. only
කිරිබත්	milk-rice
කෙළිසෙල්ලම් or කෙළිසෙල්ලම්	play, games and play; pl. only
ගතකරනවා	spend time
ගෙවෙනවා	get spent, be finished
ඝණ්ටාර ගැසීම	ringing of temple bell
ඝණ්ටාරය	N2 temple bell; pl. ඝණ්ටාර
ජනයා	N5 person, man. Also used with a plural or collective sense, 'the people'; stem ජන
තෑගිබෝග	gifts and presents; pl. only
තෑග්ග	N2 gift, present; pl. තෑගි
දකිනවා	see
දන්වනවා	inform
දැක්වෙනවා	be indicated, be mentioned
දින	N2/3 (commonly in compounds) day, date; pl. දිනවල්

Lesson Four

දිනය	N2 day; pl. දින
දෙමව්පියෝ	N5 parents; pl. only
පත්තු කරනවා	light, ignite
පත්වෙනවා	come to a state (of)
පරණ	old
පිපිරෙනවා	explode (intransitive)
පුරුද්ද	N2 habit; pl. පුරුදු
ප්‍රීතිමත්	joyful, happy
ප්‍රීතිය	N2 pleasure, joy
බුලත්දුංකොළ දීම	N2 offering of betel leaves and tobacco
මව	N5 mother; pl. මව්වරු
මහත්	big, great, large, much
මුහුණ	N2 face; pl. මුහුණු
රසකැවිලි	sweetmeats, delicacies; pl. only
ලිත	N2 almanac, calendar; pl. ලිත්
වදිනවා	worship, show respect to
වැඩිමහල්	old, older
වැඩිහිටි	older (of people)
වැඩිහිටියා	N5 adult, older person; pl.වැඩිහිටියෝ ; stem වැඩිහිටි
වැදීම	N2 worshipping, paying respects to; pl. වැදීම්
වෙඩිපත්තු කරනවා	light fireworks
වේලාව	N2 time; pl. වේලා, වේලාවල්
ශබ්දය	N2 sound, noise; pl. ශබ්ද
සතුටුවෙනවා	enjoy
සඳහන් වෙනවා	be described, set forth, be mentioned
සාමාන්‍යයෙන්	generally
සැලකෙනවා	be regarded, be considered

සැදීම	N2 preparation, making; pl. සැදීම්
සිරිත් විරිත්	customs and observances; pl. only
හඬ	N2 sound; no pl.
හැඳින්වෙනවා	be designated, be known

READING 2

අතරෙහි	among (Coll. අතරේ C. S. 19,10)
අදහනවා	accept, believe in (a god or religion)
අමුණාගන්නවා	see අමුනාගන්නවා
අමුනාගන්නවා	stick through, gather with a hook
ඇතැම්විට	sometimes
ඇනගන්නවා	to pierce oneself, to stick
ඉෂ්ටකරගන්නවා	get (a desire) fulfilled
ඊශ්වර	epithet for god Śiva
උල	N2 skewer, spear; pl. උල්
උවදුර	N2 harm, obstacle; pl. උවදුරු
උවදුරුකරනවා	do harm to
එල්ලෙනවා	be suspended, be hung
ඔප්පු කරනවා	to make a vow, fulfill (a vow)
කතරගම දෙවියෝ	god of Kataragama. Note: names of gods are commonly in the plural out of respect
කදිරදෙවන්	N5 epithet for the god of Kataragama
කඳසාමි	epithet for the god of Kataragama
කරත්තය	N2 cart; pl. කරත්ත
කාර්තිකේය	an epithet for the god of Kataragama
කාවඩි නැටීම	N2 a kind of religious dance
කෑගසනවා	shout

Lesson Four

කොක්ක	N2 hook; pl. කොකු
ගණදෙවියෝ	N5 Ganesh (Hindu god)
ගිනිකොණ or **ගිනිකොන**	southeast
ගිනිපාගනවා	walk on fire, firewalk
ගිනිපෑගීම	N2 firewalking
ගින්න	N2 fire; pl. ගිනි
ගෞරව කරනවා	respect, honor
තවත්	further, additional
තේජස්වන්ත	majestic, glorious
දකුණු ඉන්දියාව	N2 South India
දක්වනවා	show
දරනවා	bear, hold, wield
දිග	N3 direction, quarter; pl. දික්
දෙවියෝ	N5 god (grammatically plural); pl. දෙවිවරු
දේවාලය	N2 Devalaya, shrine or temple to a god; pl. දේවාල
දෙළස	twelve
පළි ගන්නවා	take revenge
පාගනවා	tread, trample
පාර්වතී	Parvati (wife of Śiva)
පියා	N5 father; pl. පියවරු
පුදපූජා	various kinds of offerings; pl. only
පෙරළෙනවා	roll, turn over
පොත්පත්	books; pl. only
ප්‍රසිද්ධ	famous, well-known
බලාපොරොත්තුව	N2 expectation, hope; pl. බලාපොරොත්තු
බිම	N2/3 ground, earth, floor; pl. බිම්
බිම පෙරළෙනවා	roll on the ground
බිහිසුණු	frightful

භක්ති පාඨය	N2 devotional verse, devotional saying; pl. භක්ති පාඨ
භක්තිය	N2 devotion; no pl.; stem භක්ති
භාරය	N2 vow, pledge; pl. භාර
මයුරා	N5 peacock; pl. මයුරෝ
මුඬුකරගන්නවා	shave one's hair
මුරුගන්	epithet for the god of Kataragama
යකඩය	N2 (piece of) iron; pl. and stem යකඩ
යොදනවා	employ, use
ලක්ෂණය	N2 feature, sign; pl. ලක්ෂණ
ලාභය	N2 gain, profit; pl. ලාභ
වධ දෙනවා	torture
වධය	N2 torture; pl. වධ
වාහනය	N2 vehicle, vehicle associated with a god; pl. වාහන
විෂ්ණු	god Visnu, a Hindu god
විස්තර කරනවා	describe, explain
ශරීරය	body; pl. ශරීර
සතුරා	N5 enemy; pl. සතුරෝ
සහෝදරයා	N5 brother; pl. සහෝදරයෝ
සාහිත්‍යය	N2 literature; pl. සාහිත්‍ය
සියලු or සියළු	all
සේනාධිපතියා	N5 commander in chief, general
ස්කන්ද	an epithet for the god of Kataragama
ස්ථානය	N2 place; pl. ස්ථාන
ස්වරූපය	N2 form, appearance; pl. ස්වරූප
හැඳින්වීම	N2 designation; pl. හැඳින්වීම්
හිස	N2 head; pl. හිස්

LESSON 5

වෙසක් උත්සවය.

බෞද්ධයන්ගේ ආගමික උත්සව අතුරෙන් ඉතාමත් වැදගත් ආගමික උත්සවය වෙසක් උත්සවය යි. බුදුරජාණන්වහන්සේගේ ඉපදිම, බුදුවීම සහ පිරිනිවන්පෑම යන කරුණු නිමිතිකරගෙන මෙම උත්සවය පැවැත්වෙයි. ලෝකයේ සෑම රටකම බෞද්ධ ජනතාව විසින් මෙම දිනය සිහිකරනු ලැබෙයි. බෞද්ධයන්ගේ පෝයදින අතුරෙන් වෙසක් දිනය වැදගත්ම පෝය දිනයද වෙයි.

ලාංකික බෞද්ධයෝ මෙම උත්සවය ඉතා අලංකාරලෙස පවත්වති. බොහෝ බෞද්ධයෝ මෙදින පන්සල්වලට ගොස් සිල් සමාදන්වෙති. පෝයදාට ඔවුන් සමාදන්වන්නේ තිසරණ සහිත අටසිල් ය. "සිල්සමාදන්වීම" යනුවෙන් සාමාන්‍යයෙන් අදහස් කරන්නේ අටසිල් සමාදන්වීමයි. සෙසු දිනවල බෞද්ධයෝ තිසරණ සහිත පන්සිල් සමාදන් වෙති. මෙය "පංචශීලය" යනුවෙන්ද හැඳින්වෙයි. සිල් සමාදන්වීම සඳහා උපාසක අය උදයෙන්ම අවදිවී, නා පිරිසිදුවී, සුදුරෙදි හැඳ, තෙල්මල් ආදී ද්‍රව්‍ය රැගෙන පන්සල්වලට යති. සිල් ගැනීමෙන් පසු උපාසක අය මල්පහන් පූජා කරති. ඉන්පසු මොව්හු භාවනාකරමින් හෝ බණපොත් කියවමින් හෝ, හාමුදුරුනමකගෙන් බණ අසමින් හෝ උදයකාලය පන්සලෙහි ගතකරති. මෙදින උපාසක අය ගෙදර යන්නේ දවල් ආහාරගැනීම සඳහා පමණක්. ආහාර ගැනීමෙන් පසු නැවතත් පන්සලට අවුත් මොව්හු බණපොත් කියවීම, බණ ඇසීම, භාවනා කිරීම ආදී කටයුතුවල යෙදෙති. ඔව්හු ඒවා පින්කම් ලෙස සලකති. ලොකු කුඩා සියළුදෙනාම පාහේ මෙදින සිල් ගනිති. ආගමික කටයුතුවල යෙදෙති.

කුඩා දරුවන්ට වෙසක් දිනය ප්‍රීතිය සහ සතුට ගෙනදෙන දිනයක්ද වෙයි. වෙසක් දිනයට පෙර දවස් කිහිපයේදී කුඩා දරුවෝ වෙසක් කූඩු සාදති. මෙසේ මෙම දිනවල වෙසක් කූඩු සාදමින් කල්ගතකරන්නේ පොඩි දරුවන් පමණක් නොවේ. පන්සල්වල පොඩි හාමුදුරුවරුද මෙම දිනවල වෙසක් පහන් සාදමින් මහත් සතුටක් ලබති. වෙසක් පෝයදා ගෙවල් සරසා, වෙසක් පහන් එල්වා දල්වනතුරු පොඩි දරුවන් සිටින්නේ මහත් නොඉවසිල්ලෙනි. මෙදින ලංකාවේ ප්‍රධාන නගර, තොරන් ආදිය සාදා අලංකාර කරනු ලැබෙයි. මෙම කටයුතුවලට අනෙක් ආගම්වලට අයත් අයද සහභාගිවෙති.

වෙසක් දිනයෙහි ඇතැමෙක් වන්දනාවෙහි යති. මෙදින මොවුන් යන්නේ වැදගත් බෞද්ධ සිද්ධස්ථාන බලා වැඳපුදා ගැනීම සඳහාය. වන්දනාවේ යන අය සඳහා සමහරෙක් දන්සැල් පවත්වති.

Lesson Five

VOCABULARY

අටසිල්	the 8 precepts; pl. only
අදහස් කරනවා	mean, intend
අලංකාර	beautiful
අවදිවෙනවා	wake up, get up
අසනවා	listen
ආදි, ආදිය	etcetera. See grammar 7.
ආහාර ගන්නවා	eat food
ආහාරය	N2 food; pl. ආහාර
ඉතාමත්	the best, most
ඉපදීම	N2 birth; pl. ඉපදීම්
ඉවසිල්ල	N2 patience; pl. ඉවසිලි
උදය	N2 morning; no pl.
උදයෙන්ම	(in the) early morning
උපාසක අය	N5 lay devotees (especially when they observe sil); pl. only
එල්ලනවා	hang, suspend
කටයුත්ත	N2 activity, cause, duty; pl. කටයුතු
කරුණ	N2 factor, cause; pl. කරුණු
කල්ගෙවනවා	spend time
කිහිපය	N2 the few number (of something); no pl.
ගෙනදෙනවා	provides
ගොස්	past part. of යනවා. See grammar 1.1
ජනතාව	N5 populace, public; stem ජනතා
තිසරණ	N2 the 3 refuges: Buddha, Dhamma, and Sangha (i.e. the Buddha, his doctrine, and the order of Buddhist monks respectively); no pl.

Lesson Five

තුරු	till, until. See grammar 6.
තෙල්මල්	oil and flowers; pl. only
තොරණ	N2 decorated arch, pandal; pl. තොරණ්
දන්සැල	N2 dansala, a booth where food and refreshments are given free to pilgrims; pl. දන්සැල්
දල්වනවා	light, kindle
දැල්වෙනවා	burn, be lit
ද්‍රව්‍යය	N2 thing, item, material; pl. ද්‍රව්‍ය
නගරය	N2 city; pl. නගර
නානවා	bathe
නැවතත්	again
නිමිතිකරගන්නවා	take as the cause, having as the base
නිමිත්ත	N2 cause, base; pl. and stem නිමිති
නොඉවසිල්ල	N2 impatience; pl. නොඉවසිලි
පචශීලය	N2 = පන්සිල් ; no pl.
පන්සිල්	the 5 precepts; pl. only
පහන	N2 (coconut) oil lamp; pl. පහන්
පිරිනිවන් පෑම	N2 death of a Buddha; pl. පිරිනිවන් පෑම්
පිරිසිදුවෙනවා	become clean
පින්කම	N2 act of merit; pl. පින්කම්
පුදනවා	worship, offer flowers, etc.
පෙර	early, prior, before. See grammar 8.1.
පෝය දා	N3 Poya day (full moon or lunar quarter day)
බණ	N2 doctrine, sermon; no pl.
බණපොත	N2 book on doctrine; pl. බණපොත්
බුදුරජාණන්වහන්සේ	N5 the Buddha. See grammar 4.
බුදුවීම	N2 enlightenment; pl. බුදුවීම්

භාවනා කරනවා	meditate
මල් පහන් පූජාව	N2 worship with flowers and lamps; pl. මල්පහන් පූජා
මෙදින	this day
රට	N2 country; pl. රටවල් ; stem රට
රෙද්ද	N2 cloth; pl. රෙදි
ලාංකික	Ceylonese
ලෙස	as, like, in the manner of. See grammar 5.
ලෝකය	N2 world; pl. ලෝක
වන්දනාව	N2 pilgrimage; pl. වන්දනා, වන්දනාවල්
වැඳපුදගන්නවා	to worship, offer flowers, etc.
වෙසක් කූඩුව	N2 Vesak lanterns; pl. වෙසක් කූඩු
වෙසක් පහන	N2 Vesak lamp; pl. වෙසක් පහන්
සතිය	N2 week; pl. සති
සරසනවා	decorate
සලකනවා	consider
සහිත	with. See grammar 8.
සාදනවා	make
සිද්ධස්ථානය	N2 holy place; pl. සිද්ධස්ථාන
සිල්	(religious) precepts; pl. only
සිල් සමාදන්වෙනවා	observe sil
සිහිකරනවා	remember, observe
සුදු	white
සෙසු	other, remaining
හඳිනවා	dress, put on, wear

DOCUMENT RESUME

ED 091 935   95   FL 006 091

AUTHOR	Gair, James W.; Karunatilaka, W. S.
TITLE	Literary Sinhala.
INSTITUTION	Cornell Univ., Ithaca, N.Y. Dept. of Modern Languages and Linguistics.
SPONS AGENCY	Office of Education (DHEW), Washington, D.C.
BUREAU NO	BR-2-2055
PUB DATE	74
CONTRACT	OEC-0-72-1106
NOTE	453p.
AVAILABLE FROM	South Asia Program and Department of Modern Languages and Linguistics, Cornell University, Ithaca, New York
EDRS PRICE	MF-$0.75 HC Not Available from EDRS. PLUS POSTAGE
DESCRIPTORS	*Composition (Literary); *Grammar; Indo European Languages; Reading Instruction; Reading Skills; *Singhalese; *Textbooks; Written Language
IDENTIFIERS	National Defense Education Act Title VI; NDEA Title VI; Sri Lanka

ABSTRACT

The present text is an introduction to the literary form of Sinhala, the official language of Sri Lanka. It is intended for those students who have a basic command of the colloquial language, specifically the equivalent of at least 24 lessons of "Colloquial Sinhalese" by G. H. Fairbanks, J. W. Gair, and M. W. S. De Silva (South Asia Program, Cornell University, 1968). Literary features of the language are often described in terms of their colloquial equivalents as presented in the earlier book. Each of the 15 lessons here includes a main reading and a glossary. These are graded for grammatical features so that they must be done in order. The grammar section of each lesson deals with new features found in the main reading. Each lesson concludes with two supplementary readings which introduce no new grammatical features but give further practice on ones already studied. A cumulative glossary, Sinhala-English, concludes the text. (Author/PM)

GRAMMAR

1. PAST PARTICIPLE

1.1 The past participle (the equivalent of the -ලා participle in Colloquial Sinhala), is formed for regular verbs as follows:

Class 1 verbs lengthen the final -අ of the stem to -ආ .

Stem		Past Participle
සරස-	decorate	සරසා
එල්ව-	suspend, hang	එල්වා
බල-	look	බලා
සාද-	make	සාදා

Note that the verb කරනවා is irregular in its formation of the Literary past participle for which there are two alternate forms, කර and කොට . කොට is more common in formal style.

The Literary past participle for Class 2 verbs will be the same as the Colloquial past participle without -ලා (C. S. 20,7).

Stem		Past Participle
හඳි-	dress	හැඳ
වඳි-	worship	වැඳ

Class 3 verbs replace the final -එ of the stem by -ඊ . They are thus like the past participle of these verbs in Colloquial Sinhala without -ලා and with -ඊ rather than -ඉ .

Stem		Past Participle
වැටෙ-	fall	වැටී

Irregular verbs have the following Literary past participle forms:

Stem		Past Participle
ගන්-	take	ගෙන or රැගෙන
වෙ-	be	වී or ව
දෙ-	give	දී
එ-	come	අවුත්, ඇවිත්, අවුදින් or වුත්
ය-	go	ගොස් or ගොසින්
බො-	drink	බී
කර-	do	කොට or කර

Many verbs which are irregular in Colloquial Sinhala have Literary equivalents that are regular, or for which the participles are predictable because the parts of which the verb is composed are readily apparent. For example, පේනවා 'to see, be seen' has the Literary equivalent පෙනෙනවා which has the regular Class 3 past participle form පෙනී-, and ගෙනියනවා 'take away' has the Literary equivalent ගෙනයනවා for which the past participle is ගෙනගොස් . Some other pairs of equivalents for which the Literary member has regular or predictable forms are:

Colloquial		Literary	Literary Participle
දානවා	to put	දමනවා	දමා
ඉන්නවා	to be	හිඳිනවා	හිඳ
		or සිටිනවා	සිට
තියෙනවා	to exist	තිබෙනවා	තිබී
ගේනවා	to bring	ගෙනඑනවා	ගෙනඅවුත්
			or ගෙනවුත්

1.2 In Literary Sinhala as in Colloquial, the past participle is used to form constructions indicating a series of actions or the manner of an action (C. S. 20,7; 22,3.2):

> ගොවියෝ කුඹුරු කොටා , සී සා , වී වපුරති.
> The farmers dig the fields, plough and then sow paddy seeds.

බුදුරජාණන්වහන්සේගේ ඉපදීම, බුදුවීම සහ පිරිනිවන් පෑම යන කරුණු නිමිති කොට, බෞද්ධයෝ වෙසක් උත්සවය පවත්වති.
The Buddhists hold the Vesak festival commemorating (literally, taking as basis the facts of) the birth, enlightenment and passing of the Buddha.

1.3 The Literary past participle, like the past participle stem in Colloquial Sinhala, may be used to form complex verbs with ගන්නවා or දෙනවා (C. S. 22,3.1) with the sense 'do for oneself, do for someone else' respectively:

ගොවියෝ වැඩ කරගෙන ගෙදර යති.
The farmers do their work and go home.

ගොවියෝ වැඩකර දී ගෙදර යති.
The farmers do the work (for someone else) and go home.

2. CONCURRENT PARTICIPLE

2.1 Literary Sinhala has a concurrent participle formed for verbs of all classes by adding -මින් to the present tense stem:

Class 1

Present Tense Stem		Concurrent Participle
බල-	look	බලමින්
කර-	do	කරමින්
කිය-	say	කියමින්

Class 2

Present Tense Stem		Concurrent Participle
හඳි-	dress	හඳිමින්
වඳි-	worship	වඳිමින්
හිඳි-	be	හිඳිමින්

Class 3

Present Tense Stem		Concurrent Participle
වැටෙ-	fall	වැටෙමින්
තේරෙ-	understand	තේරෙමින්

Irregular

Present Tense Stem		Concurrent Participle
ය-	go	යමින්
බො-	drink	බොමින්
ගනි-	take	ගනිමින්
දනි-	know	දනිමින්

2.2 The concurrent participle is used to indicate an action concurrent with that of the main verb. The subject of the participle and the main verb must be identical.

උපාසක අය බණ අසමින් පන්සලෙහි සිටිති.
The lay-devotees are in the temple listening to the sermon.

ගැණු ළමයි වෙසක් කූඩු සාදමින් කතාකරති.
The girls talk while making the Vesak lanterns.

2.21 The Colloquial equivalent of the concurrent participle is the reduplication of the past participle stem.

උපාසක අය බණ අහ අහ පන්සලේ ඉන්නවා.
The lay-devotees are in the temple listening to the sermon.

ගැනු ළමයි වෙසක් කූඩු හද හද කතාකරනවා.
The girls talk while making the Vesak lanterns.

3.0 CO-ORDINATE CONSTRUCTIONS

In Sinhala the equivalent of some English co-ordinate constructions with 'and' may be formed by simply putting together the units to be combined, without any equivalent of 'and'. Two such constructions occur in this lesson.

3.1 Noun-noun compounds may be formed signifying a combination of the two or more elements involved. The nouns combined are in the nominative (direct) case form:

තෙල් මල්	oil and flowers
මල් පහන්	flowers and lamps
තෙල් මල්පහන්	oil, flowers and lamps

Such compounds may in turn enter as units into larger compounds of the type described in Lesson 3.

මල්පහන් පූජා	worship with flowers and lamps

3.2 The equivalent of English adjectives joined by 'and' before a plural noun is formed in Sinhala simply by joining the adjectives:

ලොකු කුඩා අය	big and small people
හොඳ නරක ළමයි	good and bad children

This may also be done with the verbal adjective phrases that are the equivalent of English relative clauses:

යනඑන උපාසකවරු	the lay-devotees that come and go
පාසැල්යන, පොත්කියවන ශිෂ්‍යයෝ.	the students who go to school and read books

4. RESPECTFUL FORMS

4.1 **වහන්සේ** : වහන්සේ forms a part of many forms in Sinhala that indicate very high respect, particularly for clergy or religious figures. Thus බුදුරජාණන්වහන්සේ literally 'Buddha-king-vahansē' is one epithet for the Buddha, as is ජේසුස්වහන්සේ for Jesus. Similarly, ඔබවහන්සේ and තමුන්වහන්සේ are pronouns used in addressing clergy.

4.2 When Buddhist monks are referred to, special forms are used in forming the indefinite, either of nouns or numerals. These use නම following the stem form in place of කෙනා or දෙනා :

ස්වාමීන්වහන්සේනමක් හාමුදුරුනමක්	a (Buddhist) monk
හාමුදුරුවරු තුන්නමක්	three (Buddhist) monks

5. ලෙස

ලෙස is a postposition which may follow either adjectives or nouns in the oblique case and has the sense 'as, in such a manner':

මෙම පාඨශාලාවෙහි ළමයි ප්‍රයෝජනවත් ලෙස වැඩකරති.
The students in this school work in a useful way.

ඔහුට මෙය කලු ලෙස පෙනේ.
He sees this as black.

6. තුරු

තුරු is used with the present tense verbal adjective to form the equivalent of English 'until' clauses:

> මා එනතුරු ළමයි වැඩ නොකරති.
> The children don't work until I come.
>
> හාමුදුරුවන් බණකියා ඉවර වෙනතුරු අපි පන්සලෙහි සිටිමු.
> We stay in the temple until the monk has finished preaching (literally, having preached, finished) the sermon.

Note that the subject of තුරු clauses will be in the accusative case according to the rule given in 4,5, since the verb does not show agreement.

7. ආදිය , ආදි 'ET CETERA'

ආදිය , 'et cetera, and so forth' may, like English 'et cetera', follow one thing or a series:

> මෙදින තොරන් ආදිය සාදනු ලැබෙයි.
> On this day decorated arches, etc. are made.
>
> බණ ඇසීම, සිල්ගැනීම ආදිය පින්කම් ලෙස සලකති.
> They consider listening to sermons, observing sil, etc. to be meritorious acts.

ආදි is the adjectival form of ආදිය . It thus occurs before a noun and forms the equivalent of English 'such as' phrases:

> අඹ කෙසෙල් ආදි පලතුරු මෙහි නැත.
> There aren't fruits such as mangoes and bananas here.

8. POSTPOSITIONS පෙර AND සහිත

8.1 පෙර 'before' usually occurs with a dependent noun or pronoun in the dative case. මේ and ඒ occur as මීට and ඊට before පෙර:

> වෙසක් දිනයට පෙර
> before Vesak day

මීට පෙර before this	ඊට පෙර before that

Note that පෙර is commonly used with a verbal noun to form the equivalent of English 'before' clauses:

සිල් ගැනීමට පෙර
before taking 'sil'

Optionally, but less usually, the dependent noun with පෙර may occur in the instrumental case with no change in meaning. මේ and ඒ then occur as මින් and ඉන් :

මින් පෙර
before this

ඉන් පෙර
before that

සිල් ගැනීමෙන් පෙර
before taking 'sil'

8.2 සහිත has the sense 'with, along with, having' and the entire සහිත phrase occurs as an adjective. Thus 'Y සහිත X' has the sense 'X (along) with Y':

කරදර සහිත දවසක්.
a day with troubles

තිසරණ සහිත පන්සිල්.
the five precepts along with the three refuges

9. WRITING SYSTEM: ඤ්ච AND ද්‍ර

9.1 ඤ්ච

The symbol (is combined with ච to represent a consonant cluster ñc. ñ is pronounced as a palatal nasal like the one in Spanish señor :

පඤ්ච pañca 'five (Sanskrit)'

This combination can also be written ංච . Thus පංච . NOTE: Sinhala does have a separate letter ඤ to represent the nasal ñ, but it has not yet occurred.

9.2 ද්‍ර

When the r symbol ්‍ර is written with ද in Literary Sinhala, they combine as ද්‍ර :

ද්‍රව්‍ය	things, items, material
උපද්‍රව	harm

SUPPLEMENTARY READINGS

1. පෝය සිරිත්

අවුරුද්දේ, සෑම මාසයකම පසළොස්වක ද පසළොස්වක පෝය යනුවෙන් හැඳින්වෙයි. සාමාන්‍ය ගැමියෝ මෙම දිනය "පාලොස්සක පෝය" යනුවෙන් හඳුන්වති. මෙම දවස "පෝය" යනුවෙන් හැඳින්වීමද බොහෝ ගැමියන්ගේ සිරිත ය. සෑම මාසයකම පෝය දවස් හතරකි. එහෙත් මේ අතුරින් පසළොස්වක පෝය දිනය විශේෂවෙයි. බොහෝ බෞද්ධයන් සිල්ගන්නේ මෙදින පමණක් හෙයිනි. බොහෝ ගැමියන් විසින් මේ දිනය "පෝය" යනුවෙන් හඳුන්වනු ලබන්නේද ඒ නිසායයි කිව හැක.

පසළොස්වක පෝය දවස් අතුරින්, බෞද්ධයන් වඩාම වැදගත් ලෙස සලකන්නේ වෙසක් පෝය දිනය යි. මෙදින බොහෝ බෞද්ධයෝ සිල් ගනිති. සිල් සමාදන් වී, බෙහෙවින් පන්සල්වලට වී ඔවුහු එම දවස ගතකරති. ඔවුන් එම දවස ගතකරන්නේ නොයෙක් ආගමික කටයුතුවල යෙදීමෙනි.

උදේම පන්සල්වල ඝණ්ටාර ගැසීමෙන්, පෝය දවස බෞද්ධ ජනයාට දන්වනු ලැබෙයි. මෙසේ පෝය දැන්වීමේ සිරිත බොහෝකොට පවතින්නේ ගම්වල ය. ගම්බද පළාත්වල බොහෝ මිනිස්සු සෑම පසළොස්වක පෝය දිනකම පාහේ, පන්සල්වලට ගොස් සිල් ගනිති. සුදුරෙදි හැඳ , මල් වට්ටි රැගෙන, ප්‍රියකරු මුහුණින් යුක්ත වී උදෑසන පන්සල්වලට යන උපාසක පිරිස දැකීම සතුටකි. සිල් සමාදන්වෙන සෑම දෙනාම මෙදින බණදහමට සිත යොමුකරති. භාවනාවෙහි යෙදෙති. බණපොත් කියවති. කය, සිත, වචනය රැකීමට උත්සාහ කරති. මෙදින, මුළුදවසම ශාන්තභාවයක් උසුලයි.

2. වෙසක් සැරසිලි

බොහෝ මිනිසුන් අතර වෙසක් උත්සවය ප්‍රසිද්ධ, වෙසක් සැරසිලි නිසා ය. සෑම බෞද්ධ ගෙදරකම පාහේ මෙදින වෙසක් සැරසිල්ලක් දැකිය හැක. කුඩා දරුවෝ, තමන්ගේ ගෙවල් අලංකාර කිරීම සඳහා, වෙසක් කූඩු සාදමින්, වෙසක් දවසට පෙර දවස් කිහිපය ගතකරති. වෙසක් කූඩුවලට "වෙසක් පහන් ය"යිද කියනු ලැබේ. ලමයි නොයෙක් වර්ගවල වෙසක් කූඩු සාදති. "අටපට්ටම් කූඩු", "තාරකා", "නෙළුම් මල්", "අහස්යාත්‍රා", "කැරකෙනකූඩු", ඒවායින් සමහරක නම් ය. මේවා සෑදීමට, උණ හෝ බට පතුරු අවශ්‍යය. පළමුවෙන්, බට පතුරු කපා, ඒවා ඇඳට කොට, ගැළපෙන පිළිවෙලට යොදා කූඩු බඳිති. බොහෝකොට කූඩු බඳින්නේ රබර්පටි වලිනි. මේ සඳහා නූල්ද පාවිච්චි කෙරිය හැක. කූඩු

බැඳ, ඒවා මත ඔවුනු අලංකාර ලෙස සැවිකඩදාසි අලවති. ඇතැම් කූඩු ඉතා විශාල ය. ඇතැම් ඒවා කුඩා ය. විශාල අටපට්ටම් කූඩු හෝ තාරකා හෝ සාදා ඒවාට තව කුඩා කූඩු සවි කිරීමද කරනු ලැබෙයි. මෙසේ විශාල වෙසක් සැරසිල්ලක් සෑදිය හැක. කුඩා කූඩු සහිත විශාල කූඩුවට "රජ කූඩුව ය"යි දරුවෝ පවසති. වෙසක් කූඩු ඇතුළෙහි ඉටිපන්දම් දැල්වීම සඳහා කුඩා ලි පතුරු රඳවති. ඇතැම්විට කුඩා පොල්තෙල් පහන් ද මේවා තුළ දල්වනු ලැබෙයි. ඇතැම්විට විදුලිය බුබුළුවලින්ද මේවා ආලෝකමත් කරනු ලැබෙයි. දැල්වෙන ඉටිපන්දම් හෝ පහන් හෝ විදුලිය බුබුළු හෝ සහිත වෙසක් කූඩු රෑට ඉතාමත් අලංකාර ලෙස පෙනෙයි.

වෙසක් සැරසිලි අතුරෙන් වෙසක් තොරන්වලට විශේෂ තැනක් අයත් වෙයි. වෙසක් තොරන් වැඩිකොට සාදනු ලබන්නේ නගරබද පළාත්වල ය. ලංකාවේ බෞද්ධයන් වසන සෑම නගරයකම පාහේ මෙදින යටත්පිරිසෙයින් එක තොරණක්වත් දැකිය හැක. වෙසක් තොරන්වලින්, බොහෝකොට, ජාතක කථා චිත්‍රයට නගා, විදුලිය බුබුළුවලින් ආලෝකමත් කොට දක්වනු ලැබෙයි. වෙසක් තොරන් වඩා ලස්සන රෑටය. තොරන් බැලීම සඳහා රාත්‍රියට ඒවා සමීපයට බොහෝ ජනයා රැස්වෙති. තොරන් සහ වෙසක් කූඩු, වෙසක් සැරසිලි අතුරෙන් කිහිපයක් පමණකි. තවත් නොයෙක් සැරසිලි විශේෂද මෙදින දැකිය හැක. බොහෝ අය මෙදින වෙසක් සැරසිලි බලා සිත පහදා ගනිති. සතුටුවෙති. වෙසක් සැරසිලි බැලීම, සාමාන්‍ය ගැමියා පිංකමක් ලෙස සලකයි. වෙසක් සැරසිලි බැලීමෙන් සිදුවන්නේ සිත පැහැදීමය. සිත පහදා ගැනීම ම මහත් පිංකමකි.

VOCABULARY FOR SUPPLEMENTARY READINGS

READING 1

උත්සාහ කරනවා	make efforts, strive, attempt, try
උදෑසන	N3 early morning; no pl.
උසුලනවා	bear, carry
කය	N2 body; no pl.
පිරිස	N2 group (of people), multitude, retinue, following; pl. පිරිස්
ප්‍රියකරු	happy, joyful
බණදහම	N2 (Buddhist) doctrine, religious matters; pl. බණදහම්
බොහෝකොට	greatly, mostly, largely
භාවනාව	N2 meditation; pl. භාවනා
මල් වට්ටිය	N2 a tray of flowers; pl. මල් වට්ටි

යුක්ත වෙනවා	accompanied by, associated with (with instr.), connected with
යොමුකරනවා	concentrate, apply, direct towards
රැකීම	N2 safeguarding, watching, taking care of, restraining; Pl. රැකීම්
රැගෙන	having taken. See grammar 1.1.
වචනය	N2 word; pl. වචන
වට්ටිය	N2 woven tray, shallow basket; pl. වට්ටි
වඩාත්ම	most(ly) (වඩා-ත්-ම)
ශාන්ත භාවය	N2 state of serenity, peaceful condition; no pl.
සිත	N2 mind; pl. සිත් (Coll. හිත)
සිරිත	N2 custom, manner; pl. සිරිත්
සිල් ගන්නවා	take/observe Sil

READING 2

අටපට්ටම් කූඩුව	N2 eight-sided lantern; pl. අටපට්ටම් කූඩු
අයත් වෙනවා	have (with dative), belong to (Coll. අයිතිවෙනවා)
අලංකාර කරනවා	decorate
අලවනවා	stick, paste
අහස්යාත්‍රාව	N2 airplane; pl. අහස්යාත්‍රා
ආලෝකමත් කරනවා	illumine
ඇතැම්	some (Coll. සමහර)
ඇතුළ	N2 inside; no pl.
ඉටිපන්දම	N2 candle; pl. ඉටිපන්දම්
උණ	bamboo (plural and stem)
කැරකෙනවා	rotate
ගැළපෙනවා	be suitable, fit, agree

චිත්‍රය	N2 picture, painting; pl. චිත්‍ර
චිත්‍රයට නගනවා	paint, make a picture
ජාතක කථාව	N2 birth stories of Buddha; pl. ජාතක කථා
තබනවා	keep, put
තාරකාව	N2 star; pl. තාරකා
තුල	in, inside
නගරබද	urban
නැවත	again
නූල	N2 thread; pl. නූල්
නෙළුම් මල	N2 lotus; pl. නෙළුම් මල්
පතුර	N2 thin stick; pl. පතුරු
පහදුගන්නවා	make (the mind) happy
පැහැදෙනවා	become clear, tranquil
පිංකම	N2 act of merit, meritorious act; pl. පිංකම්
පොල් තෙල් පහන	N2 coconut oil lamp; pl. පොල් තෙල් පහන්
බට	reeds (pl. and stem)
මත	top of, on
යොදනවා	apply, put, place, use
රජකුඩුව	N2 the major lantern; pl. රජකුඩු
රඳවනවා	set
රබර් පටිය	N2 rubber bands; pl. රබර් පටි
රාත්‍රිය	N2 night; pl. රාත්‍රි
රැස්වෙනවා	gather together, meet
ලී පතුර	N2 thin piece of stick; pl. ලීපතුරු
වසනවා	live
විදුලිය බුබුල	N2 electric bulb; pl. විදුලිය බුබුලු
විශේෂය	N2 variety, special type; pl. විශේෂ

ශුද්ධ කරනවා	clean
සමීපය	N2 vicinity; no pl.
සවිකරනවා	attach, fasten
සැරසිල්ල	N2 decoration; pl. සැරසිලි
සැවි කඩදාසිය	N2 tissue paper; pl. සැවි කඩදාසි

LESSON 6

විජය පුවත 1.

ලංකාවේ මිනිසුන්ගෙන් වැඩිකොටස සිංහලයන් වශයෙන් හඳුන්වනු ලැබෙයි. සිංහලයන් විජය කුමාරයාගෙන් පැවත එන අය ලෙස ලංකාවේ වංශකථාවල සඳහන් වෙයි. දීපවංශය සහ මහාවංශය යන පාලි වංශකථාවල විජයකුමාරයා පිළිබඳ ප්‍රවෘත්තිය මෙසේ සඳහන් වෙයි.

ඉන්දියාවේ සිංහපුරයෙහි සිංහබාහු නම් රජකෙනෙක් සිටියේය. එම රජතුමාට පුත්තු තිස්දෙදෙනෙක් සිටියෝය. එම පුතුන් අතුරෙන් විජයකුමාරයා වැඩිමහල් පුත්‍රයා වූයේය. බාල කාලයේදීම විජයකුමාරයා හිතුවක්කාර ළමයින්ගේ ආශ්‍රයට වැටුණේය. එහෙයින් තෙමේ ද හිතුවක්කාරයෙක් වූයේය. මෙසේ, හිතුවක්කාර පිරිසක් හා වැඩෙමින් තරුණවයසට පත්වීමෙන් පසු හෙතෙම සිංහපුරයෙහි මිනිසුන්ට හිරිහැර කරන්නට පටන්ගත්තේය. විජය මෙසේ සිංහපුරයෙහි වැසියන්ට හිරිහැර කරන්නට පටන්ගත්තේ තම පිරිසද සමග ය. විජයකුමාරයා සිංහබාහු රජතුමාගේ පුතකු හෙයින් රටවැසියෝ මෙම කරදර තරමක් කල් ඉවසා සිටියෝය. "කුමාරයාගේ සහ පිරිසගේ මෙම හිතුවක්කාරකම් ටිකින්ටික අඩුවිය හැකි ය"යි ඔව්හු සිතුවෝය. එහෙත් කුමාරයාගේ හා පිරිසගේ හිතුවක්කාරකම් මඳක්වත් අඩුවූයේ නැත. විජයගේ සහ පිරිසගේ මෙම ක්‍රියාවලින් මිනිස්සු බොහෝ අසතුටට පත්වූවෝය. "පුත්‍රයාගේ මෙම හිතුවක්කාරකම් පිළිබඳව රජතුමාට දැන්විය යුතු ය"යි ඔව්හු තීරණය කෙරුවෝය. ඉන්පසු රජතුමා සමීපයට ගොස් මෙය දන්වා සිටියෝය.

තම පුත්කුමාරයා ගැන මෙම පුවත අසා රජතුමා කෝපවූයේය. පුත්කුමාරයා හා ඔහුගේ පිරිස රටින් නෙරපා දමන්නට රජතුමා තීරණය කෙරුවේය. ඉන්පසු ඔවුන් නැවක දමා රටින් නෙරපා දැමුවේය.

විජයකුමාරයා සහ පිරිස තම නැවෙන් ක්‍රමයෙන් ලක්බිමට ළඟාවූවෝය. ඔව්හු ලංකාවෙහි ගොඩබැස්සෝය. මුහුදෙහි දින කිහිපයක් යාත්‍රා කිරීමෙන් ඔවුහු මහත් විඩාවට පත්ව සිටියෝය. මෙසේ ගොඩ බිමකට ළඟාවීමෙන් ඔව්හු මහත් සතුටට පත්වූවෝය.

"අපි මුහුදෙහි බොහෝ දිනක් යාත්‍රා කෙරුවෙමු. එහෙයින් බෙහෙවින් විඩාවට පත්වූයෙමු. අප බොහෝ විඩාවට පත්ව සිටින හෙයින්, මඳක් මෙහි වාඩිවී ගිමන් හරිමු ය"යි විජයකුමාරයා තම පිරිස අමතා කිවුවේය.

VOCABULARY

අඩුවෙනවා	become less, decrease

අමතනවා	address, speak to
අසතුට	N2 unhappiness, displeasure; no pl.
ආශ්‍රය	N2 company, association; no pl.
ඉවසනවා	be patient, tolerate
කුමාරයා	N5 prince; pl. කුමාරයෝ
කෝපවෙනවා	become angry
ක්‍රමයෙන්	gradually
ක්‍රියාව	N2 action, deed, behavior; pl. ක්‍රියා , ක්‍රියාවල්
ගිමන්හරිනවා	relax, rest
ගොඩබහිනවා	land
ගොඩබිම	N2 land; pl. ගොඩබිම්
තම	one's own. See grammar 8.
තරුණ වයස	N2 young manhood, youth; no pl.
තීරණය කරනවා	decide
තෙමේ	oneself
දීපවංශය	N2 name of a Pali chronicle
නම්	named, called. See grammar 4.
නැව	N2 ship, boat; pl. නැව්
නෙරපනවා	banish
නෙරපා දමනවා	banish, exile, throw out
පැමිණෙනවා	arrive at, become, reach a point
පැවත එනවා	continue, be descended (from)
පිළිබඳ	about. See grammar 7.
පුත්කුමාරයා	N5 prince who is the son; pl. පුත්කුමාරයෝ
පුත්‍රයා	N5 son; pl. පුත්‍රයෝ
පුවත	N2 story, news, rumor; pl. පුවත්
ප්‍රවෘත්තිය	N2 news story, rumor; pl. ප්‍රවෘත්ති

Lesson Six

බාල කාලය	N2 young age, boyhood
මදක්	a little
මහාවංශය	N2 name of a Pali chronicle
මුහුද	N2 sea, ocean; pl. මුහුදු
යාත්‍රාකරනවා	travel, sail
යුතු	must. See grammar 5.
රජතුමා	N5 king (honorific); pl. රජවරු ; stem රජ
ලක්බිම	N2 land of Lanka
ළඟාවෙනවා	approach, reach
වංශ කථාව	N2 chronicle; pl. වංශ කථා
වැඩිකොටස	N2 majority, greater part; pl. වැඩිකොටස්
වැවෙනවා	grow up
වැසියා	N5 resident; pl. වැසියෝ
විජය	Vijaya, the legendary founder of Ceylon
විඩාව	N2 fatigue; no pl.
සමඟ or සමග	along with. See grammar 6.
සමීපයට	to the vicinity, to
සිංහපුරය	N2 name of an ancient city in India
සිතනවා	think
හා	with, and. See grammar 6.
හිතුවක්කාර	naughty, mischievous
හිතුවක්කාරකම	N2 misdeed, mischievous deed; pl. හිතුවක්කාරකම්
හිතුවක්කාරයා	N5 mischievous one; pl. හිතුවක්කාරයෝ
හිරිහැරකරනවා	harm, hurt, torture, trouble
හිරිහැරය	N2 annoyance, trouble; pl. හිරිහැර

GRAMMAR

1. PAST TENSE

1.1 Simple Past

Literary Sinhala past tense forms agree with the subject in simple sentences. The forms are made as follows:

(1) First Person: For regular verbs of all classes, and most irregular verbs, a past tense stem is formed in the same way as in Colloquial Sinhala (C. S. 17,3). To this is added -එ (always short) followed by the endings -මි and -මු for first person singular and plural respectively. Thus:

	Present Stem		Past Stem	1st Person Sg. Past	1st Person Pl. Past
Class 1	කප-	cut	කැපුව්-	කැපුවෙමි	කැපුවෙමු
Class 2	අදි-	pull	ඇද්ද්-	ඇද්දෙමි	ඇද්දෙමු
Class 3	වැටෙ-	fall	වැටුණ්-	වැටුණෙමි	වැටුණෙමු
Irregular	ය-	go	ගිය්-	ගියෙමි	ගියෙමු
	දන්-	know	දත්ත්-	දත්තෙමි	දත්තෙමු

Note that the form to which the -මි and -මු are added is like the past emphatic form in Colloquial Sinhala except for those verbs that have -ඒ in Colloquial for which the form in Literary Sinhala has a short -එ .

Those class 1 verbs with present stems in -ය or -ව and thus Colloquial past stems in -ව්ව- may have alternate Literary past stems in -වුව- instead of -ව්ව-.

Present Stem		Past Stem		1st Person Sg. Past		1st Person Pl. Past
කිය-	say	කිව්ව-		කිව්වෙමි		කිව්වෙමු
	or	කිවුව-	or	කිවුවෙමි	or	කිවුවෙමු
කියව-	read	කියෙව්ව-		කියෙව්වෙමි		කියෙව්වෙමු
	or	කියෙවුව-	or	කියෙවුවෙමි	or	කියෙවුවෙමු

---

*Note that this verb does not have a simple past in Colloquial Sinhala (C.S. 15,3.1).

In Literary Sinhala, as in Colloquial, some verbs of Class 2 form their past tense stem by changing the vowels within the stem in the usual fashion but without losing the final -ඉ- of the stem and doubling the consonant. Thus with Colloquial ඇරිනවා 'open', past tense ඇරියා , we may compare the following:

Present Stem		Past Stem	1st Person Sg. Past	1st Person Pl. Past
හරි-	open	හැරිය්-	හැරියෙමි	හැරියෙමු
සිටි-	be	සිටිය්-	සිටියෙමි	සිටියෙමු

As a general rule, such Class 2 verbs are those ending in ටි , ඩි , රි , or ළි .

(2) Third Person: A past stem is formed in the same way as above to which are added -ඒ (always long) for the singular and -ඕ for the plural. These forms are virtually always followed by the predication marker in the form -ය , so that the -ය may for all practical purposes be considered to form an integral part of the third person forms.

	Present Stem		Past Stem		1st Person Sg. Past		1st Person Pl. Past
Class 1	කප-	cut	කැපුව්-		කැපුවේය		කැපුවෝය
	කිය-	say	කිව්ව්-		කිව්වේය		කිව්වෝය
		or	කිවුව්-	or	කිවුවේය	or	කිවුවෝය
Class 2	ඇදි-	pull	ඇද්ද්-		ඇද්දේය		ඇද්දෝය
	සිටි-	be	සිටිය්-		සිටියේය		සිටියෝය
Class 3	වැටෙ-	fall	වැටුණ්-		වැටුණේය		වැටුණෝය
Irregular	ය-	go	ගිය්-		ගියේය		ගියෝය

The past tense simple forms are used in the equivalent of Colloquial past tense simple sentences, but show agreement with their subjects:

මම වැඩ කෙරුවෙමි. I did the work.	අපි වැඩ කෙරුවෙමු. We did the work.
හෙතෙම වැඩ කෙරුවේය. He did the work.	ඔව්හු වැඩ කෙරුවෝය. They did the work.

1.2 Emphatic Past

The Literary Emphatic past is formed in the same way as its Colloquial equivalent except that the ending is always long ඒ .

		Colloquial Past Emphatic	Literary Past Emphatic
Class 1			
කප-	cut	කැපුවෙ	කැපුවේ
කිය-	say	කිව්වෙ	කිව්වේ or කිවුවේ
Class 2			
ඇදි-	pull	ඇද්දෙ	ඇද්දේ
සිටි-	be	උන්නෙ හිටියෙ	සිටියේ
Class 3			
වැටෙ-	fall	වැටුනෙ	වැටුණේ
Irregular			
ය-	go	ගියේ	ගියේ
දෙ-	give	දුන්නෙ	දුන්නේ

In past tense emphatic sentences, as in present tense ones, the subject is in the accusative case and the emphasized item must be followed by the predication marker. Examples:

> මා වැඩ කෙරුවේ වත්තෙහි ය.
> It was in the estate that I worked.
>
> අප කියවුවේ නවකථා පොත් ය.
> It was novels that we read.
>
> ඔහු ළමයාට දුන්නේ පුස්කොළ පොතකි.
> It is an ola leaf manuscript that he gave the boy.
>
> ඔහු ගියේ කළුතරට ය.
> It is to Kalutara that they went.

2. PAST TENSE OF වෙනවා 'BE'

The Literary past tense stem of වෙනවා 'be' is not like the Colloquial one, but occurs in two forms වුව්-and වුය්- . වුව්- may occur before any of the past tense affixes. වුය්- is an alternate which can occur only when the next vowel is -එ or -ඒ. Thus:

	Singular	Plural
1st Person	වුවෙමි, වුයෙමි	වුවෙමු, වුයෙමු
3rd Person	වුවේය, වුයේය	වුවෝය
Emphatic	වුවේ, වුයේ	

3. INFINITIVE

The Literary Sinhala infinitive may be formed by adding -ට to the Colloquial infinitive in -න්න.

Colloquial		Literary
කපන්න	to cut	කපන්නට
අදින්න	to pull	අදින්නට
වැටෙන්න	to fall	වැටෙන්නට
යන්න	to go	යන්නට
දෙන්න	to give	දෙන්නට

One sometimes encounters an alternate form ending in -න්ට (like one of the variants in Colloquial Sinhala C. S. 29). The infinitive is never used as an imperative in Literary Sinhala.

4. CALLED, NAMED

In Literary Sinhala, 'an x called (or named) y', may be expressed, using the form නම් as 'y නම් x':

සිංහබාහු නම් රජකෙනෙක්
a king called Sinhabahu

ගුණපාල නම් පුතෙක්
a son named Gunapala

සුමන නම් හාමුදුරුනමක්
a Buddhist monk named Sumana

One Colloquial equivalent for නම් in this usage is කියලා :

සිංහබාහු කියලා රජකෙනෙක්
a king called Sinhabahu

5. යුතු 'MUST'

යුතු occurs with verbs in the potential participle form (4,2). The nearest Colloquial equivalent is ඕන with the infinitive, in its 'must' usage.

As expected from the general accusative rule (4,5), the subject of යුතු should be in the accusative case, since it does not agree:

> මා එහි යා යුතුය.
> I must go there.

Where යුතු is used with a noun equational sentence, both subject and predicate attribute should be in the accusative:

> ඔහු ගුරුවරයකු විය යුතුය.
> He must be a teacher.

However, some modern writers do not observe this rule strictly, and allow either or both of the nouns to appear in the nominative:

> ඔහු ගුරුවරයෙක් විය යුතුය.
>
> හෙතෙම ගුරුවරයෙකු විය යුතුය.
>
> හෙතෙම ගුරුවරයෙක් විය යුතුය.

If the verb has an object but no subject expressed, the English equivalent is likely to be passive ('must be done' or 'one must do').

> මෙය රජතුමාට දැන්විය යුතුය.
> This must be told to the king.

> බණ ඇසිය යුතුය.
> One must listen to sermons.

6. සමග, සහ, හා, 'WITH' OR 'AND'

6.1 සමග (sometimes සමඟ) is a postposition with the sense 'with (along or together)'. The Colloquial equivalent is -ත් එක්ක , and සමග sometimes appears as ද සමග .

> මා සමග ගුණපාල ගියේය.
> Gunapala went along with me.

> ශිෂ්‍යයන් සමග මම වැඩ කරමි.
> I work together with the students.

> කුමාරයා ගියේ තම පිරිස ද සමග ය.
> The prince went along with his band.

Note that, as the examples show, the form with සමග does not enter into agreement with the verb.

6.2 සහ in addition to its more common use as a conjunction 'and' (1,10) is sometimes used as a postposition with the sense of සමග. Thus

ගුණපාල මා සහ වැඩකරයි.
Gunapala works together with me.

6.3 හා is an alternant for both සමග and සහ , and is thus both 'with' and 'and':

ගුණපාල මා හා ගියේය. (= මා සමග)
Gunapala went along with me.

හෙතෙම රට හා ආගම ගැන කථා කරයි. (= රට සහ ආගම)
He talks about the country and the religion.

In summary: සමග is a postposition 'with'. සහ and හා can be either a conjunction 'and' or a postposition 'with'.

7. ABOUT

පිළිබඳව and පිළිබඳ are both postpositions meaning 'about, concerning'.

පිළිබඳ is used when the phrase modifies a noun:

ලංකාවේ ඉතිහාසය පිළිබඳ පොතක්.
a book about the history of Sri Lanka

Otherwise පිළිබඳව is used.

හෙතෙම ලංකාවේ ඉතිහාසය පිළිබඳව උගන්වයි.
He teaches about the history of Sri Lanka.

The Colloquial equivalent of both පිළිබඳ and පිළිබඳව is ගැන .

ලංකාවෙ ඉතිහාසෙ ගැන පොතක්.
a book about the history of Sri Lanka

එයා ලංකාවේ ඉතිහාසෙ ගැන උගන්නනවා.
He teaches about the history of Sri Lanka

8. තම 'ONE'S OWN'

තම is one of the oblique forms of the reflexive pronoun තෙමේ (2,2). It may also be used modifying a noun as an alternate for either තමාගේ , 'one's own', or තමන්ගේ , 'their own':

විජය කුමාරයා තම පිරිස සමග ලංකාවට ළඟාවූවෝය.
Prince Vijaya reached Sri Lanka along with his (own) band.

රජවරු තම රටවැසියන්ගේ දියුණුව සඳහා වැඩ කරති.
Kings work for the welfare (development) of their subjects.

9. හෙයින් , බැවින්, 'BECAUSE'

හෙයින් (2,9) and බැවින් (1,14) are both equivalents of Colloquial නිසා . Thus both can be used with the present verbal adjective to form 'because' clauses:

ළමයා පොතක් කියවන හෙයින් ළමයා පොතක් කියවන බැවින්	ඔහුට කරදර නොකළ යුතුය.

Because the child is reading a book, he should not be disturbed.

10. QUOTATION MARKER

As stated in Lesson 1, Section 12, the predication marker is sometimes inserted before the quotation marker යි even though the form of the quotation does not require it. This is often the case when the quotation ends in a verb form having one of the person-number endings showing agreement. This alternant occurs with all persons, but is most common with the third person endings:

"මම එය කරමි ය"යි රජකුමාරයා කියයි.
I do that, says the prince.

"අපි පොත් කියවමු ය"යි ශිෂ්‍යයා කීවේය.
We read books, the student said.

"එම ළමයා එම පිරිවෙනෙහි ඉගෙනගනීය"යි ගුණපාල කීවේය.
That child is studying in that pirivena, Gunapala said.

"එම පන්සලෙහි පොත්ගුලක් තිබේය"යි ගමේ අය කියති.
The villagers say that there is a potgula in that temple.

As the examples show, the alternate third person endings of Class 2 and 3 verbs with long vowels (2,5) generally occur before ය in this usage.

11. PRESENT WITH FUTURE MEANING

In Sinhala, as in English, present tense forms are often used in a future sense:

"නිවාඩු කාලයේදී එහි යමි"යි ගුණපාල කියයි.
I am going (will go) there during the vacation, Gunapala says.

In some cases, however, Sinhala present tense forms have a future sense where their apparent English equivalents would not:

"ටිකින්ටික කරදර අඩුවේය "යි හෙතෙම සිතුවේය.
He thought that the troubles would decrease gradually.

Context will usually make such cases clear.

12. DURATIVE PAST

In describing past events, a combination of the past participle with the past of සිටිනවා (for animate subjects) or තිබෙනවා (for inanimate subjects) is frequently used. The difference in meaning between this construction and the ordinary past tense cannot be simply stated, and is often not reflected directly in the English translation. But in general it suggests an action which is less abrupt or extends over a longer period of time. The past participle of වෙනවා is particularly common in this construction and the reference is then to a state extending over a period of time:

රටවැසියෝ මෙම කරදර ඉවසා සිටියෝය.
The citizens put up with this trouble (for some time).

එහෙයින් රජතුමා බොහෝ සතුටුව සිටියේය.
Because of that the king was very happy.

ඒ කාලයෙහි සිංහපුරය වැදගත් නගරයක් වී තිබුණේය.
In that time, Sinhapura was an important city.

13. RESPECTFUL FORMS - තුමා AND -වරයා

-තුමා is an honorific form added to titles to indicate respect (C. S. 33,14):

ගුරුතුමා teacher

රජතුමා king

It also combines with ඒ and මේ to form the respectful pronouns එතුමා and මෙතුමා .

-වරයා is used similarly, but is much more restricted in its application. It never occurs with ඒ and මේ , and it only applies to a restricted set of titles, which must be learned as they occur:

ගුරුවරයා	teacher
ඇමතිවරයා	minister (of a government)

-තුමා does not generally occur in the indefinite, but -වරයා does. Thus ගුරුවරයෙක්, ඇමතිවරයෙක් .

Note also that a respectful indefinite can be formed with කෙනෙක් (C. S. 6,2.2). Hence රජකෙනෙක් .

14. නැත WITH VERBS

Like Colloquial නෑ, Literary නැත may be used with the present or past emphatic form of the verb to form a negative. In Literary this is an alternate for the negative with නො- (2,8).

මා එම පාසැලට යන්නේ නැත.
මම එම පාසැලට නොයමි.
I do not go to that school.

සුනිල් තම වැඩ කෙරුවේ නැත.
සුනිල් තම වැඩ නොකෙරුවේය.
Sunil did not do his work.

In strict Literary Sinhala, when the verb is negated with නැත, the subject should be in the accusative case, though some modern writers do not adhere to this rule:

ඔහු ආපසු ආවේ නැත. or හෙතෙම ආපසු ආවේ නැත.
He did not come back.

SUPPLEMENTARY READINGS

1. අන්දරේ:

සිංහල ගැමියෝ බොහෝ කටකථා දනිති. මෙම කථා අතර නොයෙක් රසවත් කථාද ඇත. උපහාසාත්මක කථාද රාශියකි. "මහදැනමුත්තා සහ ගෝල පිරිස" පිළිබඳ කථා සහ "අන්දරේ" පිළිබඳ කථා මෙම ගැමි කටකථා අතුරින් සමහරකි. එම කථා බොහෝ රසවත් ඒවා වශයෙන් සැලකිය හැක. ගැමියෝ මෙම කථා කියමින් හෝ අසමින් හෝ සතුටුවෙති. මෙම කටකථා රාශිය පරම්පරාවකින් තවත් පරම්පරාවකට උරුමවෙයි.

මෙම අතිරේක කියවීමෙන් අන්දරේ පිළිබඳ කුඩා කථාන්තරයක් දක්වමු.

අන්දරේ පිළිබඳ කථාන්තර සැම එකක්ම පාහේ, ඒවා අසන අය තුළ සිනහ උපදවයි. හාස්‍යරසය එම කථාවල මූලික රසය වෙයි.

අන්දරේ රාජසභාවෙහි කවටයා වශයෙන් ප්‍රසිද්ධ වී සිටියේය. රජතුමාද අන්දරේට බොහෝ කැමතිය. රජතුමා සමග අන්දරේ නොයෙක් විට විහිළුකරයි. බිසව හා විහිළුකිරීමටද, කැමති වේලාවක මාලිගාවට යෑමටද අන්දරේට බාධාවක් නැත. අන්දරේ එනතුරු රජතුමා බලාසිටින්නේද මහත් නොඉවසිල්ලෙනි. අන්දරේගෙන් කවටකමක් අසා සිනහසී විනෝදවීම රජතුමාගේ සිරිත ය. අන්දරේද මෙය හොඳින් දනියි. ඇතැම්විට රජතුමාද, උපහාසයට ලක්වෙන කවටකථා, අන්දරේ රසවත්ලෙස ගලපා කියයි. අන්දරේ ගැන හොඳින් දන්න රජතුමා ඒවා ගණන්නොගනියි. ඇතැම් දවස්වල අන්දරේ මාලිගාවට එන්නේ තම පුතාද සමග ය.

දිනක් මාලිගාවේ මිදුලෙහි, සීනි වගයක් වට්ටියක දමා අව්වේ තබා තිබුණේය. මෙදින අන්දරේ මාලිගාවට ආවේ පුතා ද සමග ය. රජතුමාද මාලිගාවේ පසෙක සිටියේය. අන්දරේ සීනි වට්ටිය දැක්කේය. බඩ පිරෙනතුරු සීනිකෑමට අන්දරේ සිතාගත්තේය. අන්දරේ ඉල්වන ඕනෑම දෙයක් රජතුමා අන්දරේට දෙයි. අන්දරේද එය දනියි. හෙතෙම මාලිගාවට අවුත්,

"වට්ටියේ තිබෙන්නේ මොනවා ද?" යි රජතුමාගෙන් ඇසුවේය.

" 'වට්ටියේ තිබෙන්නේ සීනි ය' යි අන්දරේට කීම නුවණට හුරු නැත " යි, රජතුමාට වැටහුණේය. බොරුවක් කියා අන්දරේ රැවටීමට සිතාගෙන,

"වට්ටියේ තිබෙන්නේ මාලිගාව ඇතුලෙහි පිළිමයක් සෑදීමට ගෙන ආ සුදුවැලි වගයක් ය"යි රජතුමා පැවසුවේය.

රජතුමාගේ උපාය අන්දරේට තේරුම් ගියේය. අන්දරේගේ කපටි නුවණ රජතුමාද දනියි.

අන්දරේගේ පුතාද අන්දරේ ළඟ සිටියේය. දෙදෙනාම සීනි වට්ටිය ළඟින් වාඩිවුවෝය .

"අද පුතාගේ කටෙත් වැලි. ඔගේ කටෙත් වැලි ය"යි කියමින් අන්දරේ පුතාටද සිනි කවමින්, තෙමේද බඩ පිරෙනතුරු සිනි කෑවේය.

2. සංස්කෘත කථාපොත්

සංස්කෘත භාෂාවෙහි රසවත් කථාපොත් රාශියක් ඇත. පංචතන්ත්‍රය , හිතෝපදේශය, කථාසරිත්සාගරය, යන පොත් ඒවා අතුරෙන් කිහිපයක් පමණි. මෙම කථාපොත් කුඩා දරුවෝද, වැඩිමහළු අයද කියවා රසවිඳිති. මෙම පොත්වල නොයෙක් රසවත් කථා ඇත. කුඩා දරුවන්ටද, ලොකු අයටද මෙම කථාන්තර කියවීමෙන් ලොකු රසයක් ලැබිය හැක. හිතෝපදේශයෙහි දැක්වෙන කථාන්තරයක් පහත සිංහලෙන් දක්වමු.

කපුටාගේ මුවාගේ සහ සිවලාගේ කථාව:

පුරාණ කාලයෙහි "සපුවන ය"යි වනයක් වුවේය. එහි බොහෝ කලක් මුවෙක් සහ කපුටෙක් යහළුව මහත් සතුටින් ජීවත් වූවෝය. මෙම වනයෙහි සපුගසක් වුවේය. කපුටා එම ගසෙහි අත්තක ලැගීමට පුරුදුව සිටියේය. මුවා එම ගසමුල වාසය කෙරුවේය. එම මුවාද, කැමති ලෙස වනයෙහි ඇවිද කොළ ජාති කමින් වැඩුණේය. එක්තරා සිවලෙක් මෙසේ වැඩෙන මුවා දැක්කේය. දැක මුවා මරා මස් කන්නට සිතුවේය.

"හොඳයි. මම මුව මස් කෑමට උපායක් යොදමි. පළමුවෙන් මෙම මුවා සමග යාළුවෙමි "යි සිවලා කල්පනා කෙරුවේය. මෙය හොඳ උපායකි. දැන් සිවලාගේ බලාපොරොත්තුව මුවා සමග කෙසේ හෝ යාළුවීමට ය. මෙසේ සිතා සිවලා දිනක් මුවා ලඟට ගොස් කතාබහකොට මුවා සමග යාළුවුවේය. මෙසේ මුවා සමග යාළුවී, සවස සිවලාද මුවා සමග මුවා වසන තැනට ගියේය. මෙතෙක් කල් මුවාට සිටි යාළුවා කපුටා පමණ ය. මෙදා කපුටා, මුවා සමග එන සිවලා දැක්කේය. සිවලුන් සහ මුවන් අතර සාමාන්‍යයෙන් යාළුකමක් නැත. මෙය කපුටා දනියි. එහෙත් අද මෙන පුදුමයකි. මුවා සිවලකු සමග එයි. ඔවුන් එන්නේද හොඳ යහළුවන් දෙදෙනකු ලෙස ය. කපුටා මෙය සැක කෙරුවේය.

ටිකෙන් ටික මුවා සහ සිවලා ගසමුලට ආවෝය. මුවා සමග පැමිණ සිටින අමුත්තා දැක,

"මේ කවුද "යි කපුටා මුවාගෙන් ඇසුවේය.

මුවාද සියළු ප්‍රවෘත්තිය කිවුවේය.

කපුටා තවදුරටත් සිවලාගේ ගමන සැකකෙරුවේය. සිවලාටද මෙය වැටහී ගියේය. කෙසේ හෝ කපුටාගේ සිත් දිනාගැනීමට ඉතාමත් අවශ්‍ය යයි සිවලා කල්පනා කෙරුවේය. මෙසේ කල්පනා කොට චාටු උපාය යොදා කපුටා සමගද සිවලා මිත්‍රවුවේය. මොවුහු ටිකකලක් මිත්‍රයන් වශයෙන් ජීවත්වුවෝය.

මුවා උදෑසන නැගිට වනයෙහි කොළ ජාති කමින් ඇවිදියි. කපුටා කෑම සෙවීම සඳහා පියාඹා

යයි. සිවලාද තමා කැමති තැනකට යයි. සවස තුන්දෙනාම සපුගසමුලට ආපසු පැමිණෙති. මෙසේ ටික දවසක් ගතවුවේය. සිවලාගේ බලාපොරොත්තුව තවම හරිගියේ නැත.

දිනක් සිවලා මෙසේ සිතන්නට පටන්ගත්තේය. "දවසින් දවස කාලය ගෙවී යයි. මුවා මරාගැනීමට තවම ඉඩක් ලැබුණේ නැත. මේ සඳහා ඉක්මනට උපායක් යෙදිය යුතුය. හොඳයි. මම මේ වනය අසල තිබෙන කුඹුරට මුවා ගෙනයමි. මෙම උපායෙන් මුවා මැරිය හැකිය." එසේ සිතා, දවසක් තනිවම තණකමින් සිටින මුවා ලගට සිවලා ගියේය. ගොස්, කුඹුර පිළිබඳව ද, එහි ගොයම් පැල පිළිබඳව ද මුවාට කිවුවේය. මෙසේ කියා, සිවලා, මුවා එහි ගෙනගොස් කුඹුර පෙන්වුවේය. ගොයම් කන සතුන් ඇල්ලීමට ගොවියෝ උගුල් අටවති. එය සිවලා දනියි. මෙම උපාය යෙදුවේ එහෙයිනි.

මුවාද ටිකෙන් ටික කුඹුරට යන්නටත්, එහි ගොයම් කන්නටත් පටන්ගත්තේය. කුඹුරෙහි ගොයම් පැලද ටිකෙන් ටික අඩුවන්නට පටන්ගත්තේය. ගොවියෝ මෙය දැක්කෝය. ගොයම් පැල කන සතුන් ඇල්ලීමට ඔව්හු උගුලක් ඇටවුවෝය. මුවාද මෙම උගුලට අසුවුවේය. සිවලාගේ උපාය හරිගියේය.

සිවලා, උගුලට අසුවී දගලන මුවා දැක්කේය.

"කුඹුරට එන ගොවියෝ මේ මුවා දකිති. දැක මුවා මරති. මරා, මස්කොට, ඔවුහු මස් පමණක් ගෙනයති. ඉතිරි කොටස් මෙහිම දමා යති. ඒවා මට කෑ හැකි ය"යි සිතමින් සිවලා පැත්තකට වී සිටියේය. මුවා, තමාගේ යහළුවා දැක, උගුලෙහි බැමිකපා, තමා බේරාගැනීමට කිවුවේය.

"දැන් මගේ ඇස් දෙක හොඳට නොපෙනෙයි. හෙට උදෙන්ම අවුත් බැමි කපමි "යි කියා, සිවලා මුවාට නොපෙනෙන තැනකට ගොස්, සැගවී සිටියේය.

සවස සපුගසමුලට එකතුවීමටද, රෑවෙනතුරු, කතාබහ කරමින් සිටීමටද, කපුටා මුවා සහ සිවලා පුරුදුවී සිටියෝය. මෙදා ආපසු ආවේ කපුටා පමණ ය. මුවා සහ සිවලා එනතුරු කපුටා පාරබලමින් සිටියේය. මුළු රැයම ගතවුවේය. මුවා ආවේ නැත. සිවලාද නැත. වෙන දවස්වල මුවා ප්‍රමාද නොවෙයි. අද මුවා තවම නොඑන්නේ මොකද? මෙය සමහරවිට සිවලාගේ උගුලක් නිසා වියහැකිය යි කපුටා සිතුවේය. සිතා උදෙන්ම මුවා සෙවීමට ගියේය. කුඹුරෙහි, උගුලට අසුවී දගලන මුවා දැක්කේය. සැගවී සිටින සිවලාද, දැක්කේය.

කපුටා මුවා ලගට ගියේය. කපුටාගේ සැකය හරියයි මුවාටද තේරුම් ගියේය. කපුටා මුවා බේරාගැනීමට උපායක් සිතා, මුවාට මෙසේ කිවුවේය.

"තව ටික වේලාවකින් ගොවියෝ කුඹුරට එති. එවිට ඇස් උඩ හිඳුවා, බඩ පුම්බාගෙන, නොදගලා සිටිය යුතුය. මමද ලගටවී ඇගට කොටමින් සිටිමි. 'මුවා උගුලට අසුවී මැරුණේ ය'යි සිතා ගොවියෝ උගුලෙහි බැමි ගලවති. බැමි ගලවා මුවා මස්කිරීමට අවශ්‍ය දේ සෙවීමට එහාමෙහා යති. එවිටම මම ශබ්දයක් කරමි. එවිට වහාම නැගිට පැන දිවිය යුතුය." මුවාද මෙයට එකග වුවේය.

ගොවියෝද සුළුවේලාවකින් පසු කුඹුරට ආවෝය. ඔවුහු උගුලට අසුවී සිටින මුවා දැක්කෝය. මුවාගේ ආකාරය දැක 'මුවා මැරුණේ ය'යි සිතා, ඔව්හු උගුලෙහි බැමි ගැලවුවෝය. බැමි ගලවා, මුවා එතනම දමා, මුවා මස්කිරීමට අවශ්‍ය දේ සෙවීමට ඔවුහු එහාමෙහා යන්නට පටන්ගත්තෝය. මෙවිටම කපුටා ශබ්දයක් කෙරුවේය. එම ශබ්දයෙන්,

මුවා වහාම නැගිට වනය ඇතුලටම පැන දිවුවේය.

මුවාගේ උපාය දැන, ගොවියෝ බොහෝ කෝපවුවෝය. ඔව්හු සැඟවී සිටින සිවලා දැක්කෝය. දැක, ඔවුන් ගෙන ආ පොලුවලින් ගසා සිවලා මරාදැමුවෝය.

කපුටාගේ නුවණ හරිගියේය. කපුටා සහ මුවා නැවතත් සපුවනයෙහි වසමින් සතුටින් කල්ගතකෙරුවෝය.

VOCABULARY FOR SUPPLEMENTARY READINGS

READING 1

අතිරේක	additional, supplementary
අන්දරේ	Andare, a proper name
අවුත්	having come
අව්වේ තබනවා	put in the sun (to dry)
ඇතුලෙහි or ඇතුළෙහි	inside
ඉල්ලනවා	ask, request, demand
උපදවනවා	generates, gives birth to, causes to arise
උපහාසය	N2 satire; pl. උපහාස
උපහාසාත්මක	satirical, sarcastic
උපාය	N2 trick, cunning; pl. උපාය, උපායවල්
උරුමවෙනවා	be inherited, become an inheritance
ඕනෑම	any, whatever one desires
කටකථාව	N2 fable; pl. කථා, කථාවල්
කථාන්තරය	N2 story, tale; pl. කථාන්තර
කපටි	shrewd, cunning
කවටකථාව	N2 joke, humorous story; pl. කවටකථා
කවටකම	N2 joke; pl. කවටකම්
කවටයා	N5 jester, comedian, joker; pl. කවටයෝ ; stem කවට
කවනවා	feed, cause one to eat, give to eat
ගණන්ගන්නවා	take account of, mind
ගලපනවා	arrange, organize, put together, compose

Lesson Six

ගෝලයා	N5 pupil, student; pl. ගෝලයෝ ; stem ගෝල
තේරුම් යනවා	understood by, to be intelligible (to) (with dative)
දමනවා	put, throw
නුවණ	N2 wit, cunning, intellect, wisdom; no pl.
නුවණට හුරු	advisable, wise
නොයෙක් විට	many a time, many times
පරම්පරාව	N2 generation; pl. පරම්පරා
පසෙක	on a side, on one side
පිරෙනවා	become full
පිළිමය	N2 image, statue; pl. පිළිම
ප්‍රසිද්ධ වෙනවා	be famous, well-known
බඩ	N2 stomach, belly; pl. බඩවල්
බලාසිටිනවා	expect, wait for
බාධාව	N2 hindrance, disturbance, obstacle; pl. බාධා, බාධාවල්
බිසව	N5 queen; pl. බිසෝවරු
බොරුව	N2 lie, falsehood; pl. බොරු
මහදැනමුත්තා	Mahadenamutta, a name
මාලිගාව	N2 palace; pl. මාලිගා, මාලිගාවල්
මිදුල	N2 yard, compound, court yard; pl. මිදුල්
මුල	N3 bottom, foot (of a tree); no pl.
යෑම	N2 going; pl. යෑම්
රවටනවා	cheat, trick
රසය	N2 aesthetic sentiment, aesthetic pleasure, taste; pl. රස
රාජසභාව	N2 royal council, royal assembly; pl. රාජසභා
රැවටීම	N2 getting cheated, cheating; pl. රැවටීම්
ලක්වෙනවා	be subject to, be a target for
ළඟින්	near, by way of
වැටහෙනවා	understand, realize

වැලි	sand; pl. only
විනෝදවෙනවා	enjoy
විහිලුකරනවා or විහිළුකරනවා	joke
සමහරක්	some
සිතාගන්නවා	think (for oneself)
සිනහව	N2 laugh, smile; pl. සිනහ or සිනා
සිනහසෙනවා	laugh, smile
හාස්‍යරසය	N2 sentiment of humor; no pl.

READING 2

අටවනවා	set, arrange
අත්ත	N2 branch; pl. අතු
අල්වනවා	touch, catch
අසල	near, in the vicinity
අසුවෙනවා	fall in (a trap, etc.), be caught
ආකාරය	N2 mode, manner; pl. ආකාර
ඇවිදිනවා	walk (about)
ඇස	N2 eye; pl. ඇස්
ඇස්උඩ හිලුවනවා	turn up the eyeballs
ඉඩ	space, chance, time (to spare); no pl.
ඉතිරි	remaining
උගුල	N2 trap, noose; pl. උගුල්
එකඟවෙනවා	agree
එකතුවෙනවා	gather, come together
එක්තරා	a certain, some
එවිට	then
එහා මෙහා	here and there, to and fro
කතා බහ කරනවා	talk, exchange greetings

Lesson Six

කථාසරිත්සාගරය	N2 the Kathāsaritsāgara, a Sanskrit work
කපුටා	N5 crow; pl. කපුටෝ
කල	N3 time, period; no pl.; stem කල්
කෙසේ හෝ	somehow or other
කොටනවා	peck, dig
කොළය	N2 leaf; pl. කොළ
ගතවෙනවා	get spent (time)
ගමන සැකකරනවා	suspect one's motives in coming
ගලවනවා	untie, remove
ගසනවා	beat, hit
ගෙනයනවා	take, lead
ගෙවීයනවා	get spent (time)
ගොයම්	paddy plant; pl. only
චාටු	shrewd, cunning
ටිකෙන්ටික	gradually
තණ	grass; pl. only
තනිවම	alone
තවදුරට	further
දඟලනවා	thrash about, run about
දිනාගන්නවා	win, conquer
දෙය	N(irreg) thing; pl. දේ or දේවල්
නැගිටිනවා	get up, rise up, wake up
පංචතන්ත්‍රය	N2 the Panchatantra, a Sanskrit work
පහත	below
පාර බලනවා	await, expect
පැන දුවනවා	flee, run away
පැමිණ සිටිනවා	has arrived

පැලය	N2 plant, seedling; pl. පැල
පියාඹනවා	fly (of a bird)
පුදුමය	N2 wonder, surprise; pl. පුදුම
පුම්බනවා	inflate, expand, distend
පුම්බාගන්නවා	inflate/expand (for oneself)
පෙනෙනවා	see
පෙන්වනවා	show, indicate, point out
පොල්ල	N2 stick, club; pl. පොලු
ප්‍රමාද වෙනවා	be late
බැම්ම	N2 bondage, knot; pl. බැමි
බේරාගන්නවා	rescue, save oneself
මරනවා	kill
මරාගන්නවා	kill (for oneself)
මරාදමනවා	kill
මස්කරනවා	(to) butcher
මහ	big, great
මිත්‍රයා	N5 friend; pl. මිත්‍රයෝ ; stem මිත්‍ර
මිත්‍රවෙනවා	become friends
මුවා	N5 deer; pl. මුවෝ ; stem මුව
මෙතෙක්	so much, this much
මෙතෙක් කල්	so long, up to this time
මෙදා	today, this day
මේ සඳහා	for this
යහළුකම, යාළුකම	N2 friendship; pl. යහළුකම්, යාළුකම්
යහළුවා, යාළුවා	N5 friend; pl. යහළුවෝ, යාළුවෝ ; stem යහළු, යාළු
රසවිඳිනවා	enjoy

Lesson Six

රෑය	N2/3 night; pl. රෑ
ලගිනවා	perch
වනය	forest, woods; pl. වන
වහාම	immediately, quickly
වාසය කරනවා	live
වැටහී යනවා	understand, realize
වැඩිමහළු, වැඩිමාළු	old, adult (of human beings)
විඳිනවා	experience
සතා	N5 animal; pl. සත්තු
සපුගස	a kind of tree (Michelia Champaca); pl. සපුගස්
සපුවනය	Sapuvanaya, a name
සවස	N3 afternoon, evening; no pl.
සැක කරනවා	guess, suspect
සැකය	N2 guess, suspicion; pl. සැක
සැඟවෙනවා	hide, be concealed
සිවලා	N5 fox, jackal; pl. සිවල්ලු
සුළු	little
සෙවීම	N2 searching, finding; pl. සෙවීම්
හරියනවා	be successful, come out all right, be all right
හිතෝපදේශය	N2 the Hitopadeśa, a Sanskrit work

LESSON 7

විජය පුවත 2.

විජයකුමාරයා සහ පිරිස ගොඩබැස්සේ ලංකාවෙහි වයඹදිග වෙරළෙහි වූ තම්මැන්නා නම් පෙදෙසට ය. ගොඩබිමකට පැමිණීමෙන් මහත්සේ ප්‍රීතියට පත්වූ මොවුහු, වෙරළ අසල වාඩි වී, ගිමන් හරින්නට වූවෝය. මෙසේ ගිමන් හරින මොවුන්ට මහත් පිපාසයක් ඇතිවූයේය. පෙනෙන අසලක බීමට ගැළපෙන දිය නැති බව ඔවුන්ට වැටහී ගියේය. ඔව්හු බීමට දිය ගෙන ඒම සඳහා උපායක් සිතන්නට පටන්ගත්තෝය. මේ අතර ඔවුන් අසලින් දුවන බැල්ලියක ඔව්හු දුටුවෝය. බැල්ලිය දුටු ඔව්හු, ඒ නුදුරෙහි ගම්මානයක් විය යුතු යයි සිතුවෝය. බැල්ලිය පසුපසින් ගියහොත් ගම්මානයට ලඟාවිය හැකි යයි සිතූ ඔව්හු පිරිසෙන් කෙනකු දිය ගෙන ඒම සඳහා යැවූවෝය. බැල්ලිය පසුපසින් තරමක්දුර ගමන්කළ හෙතෙම, පාර අසළ ගසක් මුල, කපුකටිමින් සිටි ගැහැණියක දුටුවේය. ඇය දැක,

"මැය මෙම ගම්මානයෙහි ගැහැණියක විය යුතුය. ජලය පිළිබඳව මැයගෙන් ඇසුවහොත් මැනවි "යි හෙතෙම සිතුවේය.

ඕ තොමෝද මොහු දුටුවාය. දැක,

"තෝ කවරෙක්ද?" යි ඔහුගෙන් ඇසුවාය.

"මම විජයකුමාරයාගේ පිරිසෙන් කෙනෙක් වෙමි "යි හෙතෙම පිළිතුරු දුන්නේය.

"තා මෙහි ආවේ කවරහෙයින්ද?" යි ඕ තොමෝ කෝපයෙන් ඇසුවාය.

"කුමාරයාට සහ පිරිසට පැන් ගෙන යෑම සඳහා මෙහි පැමිණියෙමි "යි හෙතෙම පිළිතුරු දුන්නේය.

"මගේ අඩවියට අවසර නැතිව පැමිණි හෙයින් තා සිරකර තබමි "යි ඕ තොමෝ පැවසුවාය. මෙසේ පවසා ඔහු සිරකර තැබුවාය.

දිය ගෙන ඒම සඳහා ගිය තැනැත්තා ප්‍රමාදවන හෙයින් පිරිසෙන් තව කෙනෙකුට ඔහු සොයායන්නට සිදුවූයේය. ඔහු ආවේද පළමු තැනැත්තාගේ අඩිසටහන් අනුව ය. තම මිතුරා සොයා ආ මොහුද, කපුකටිමින්, ගසමුලවූ ගැහැණිය දුටුවාය. මොහුද, විජයගේ පිරිසෙන් කෙනකු බව ඕ තොමෝ දැනගත්තාය. මේ බව දැනගන, ඕ තොමෝ මොහුද සිරකර තැබුවාය.

මෙසේ පිරිසෙහි සියළුදෙනාම, දිය ගෙන ඒමට ගිය අය සෙවීම සඳහා ක්‍රමයෙන් එන්නට පටන්ගත්තෝය. පැමිණි සියළුදෙනාම ඕ තොමෝ සිරකර තැබුවාය. ඔවුන් සිරකර තබා තොමෝ කපුකටිමින් සිටියාය. පිරිසෙන් කිසිවකුට ආපසු ඒමට නොහැකිවූවේය.

VOCABULARY

අඩවිය	N2 domain; pl. අඩවි
අඩිය	N2 foot; pl. අඩි
අඩි සටහන	N2 footprint; pl. අඩි සටහන්
අවසරය	N2 permission; pl. අවසර
අසනවා	ask, hear
ඇතිවෙනවා	arise, happen
උපාය	N2 method, device; pl. උපා, උපායවල්
ඒම	N2 coming
ඕතොමෝ	she; pl. ඔව්හු . See grammar 10.
කපු කටිනවා	spin cotton
කවර	what, which. See grammar 12.
කවර හෙයින්	why. See grammar 12.
කවරෙක්	who. See grammar 12.
කෝපය	N2 anger, rage; no pl.; stem කෝප
ක්‍රමය	N2 system, method; pl. ක්‍රම, ක්‍රමවල්
ගම්මානය	N2 village (area); pl. ගම්මාන
තම්මැන්නාව	place name; no pl. ; stem තම්මැන්නා
තැනැත්තා	N5 person; pl. තැනැත්තෝ
තොමෝ	she (herself). See grammar 10.
තෝ	you; pl. තොපි . See grammar 9.
දිය	N2 water
දුටුවේය	saw
දුවනවා	run
නුදුර	N2 proximity, vicinity, neighborhood; no pl.
පවසනවා	say, speak
පසුපසින්	after
පැන්	water; pl. only

පිපාසය	N2 thirst; pl. පිපාස
පිළිතුරු දෙනවා	answer
පෙදෙස	N2 province, region; pl. පෙදෙස්
පෙනෙන අසලක	within sight, within visible distance
බව	See grammar 6.
බැල්ලිය	bitch; pl. බැල්ලියෝ
මැනවි	good. See grammar 5.
මැය	this woman. See under මෝතොමෝ in grammar 10.
මිතුරා	friend; pl. මිතුරෝ
මේ අතර	meanwhile
මෝතොමෝ	she (this woman); pl. මොවුහු . See grammar 10.
වයඹදිග	N2 Northwest quarter
වැටහෙනවා	realize, become apparent (with dative subject)
වෙරළ	N2 seacoast; pl. වෙරළවල්
සටහන	N2 note; pl. සටහන්
සිරකර තබනවා	imprison
සේ	like, as. See grammar 7.
සොයනවා	search

GRAMMAR

1. FEMININE GENDER

As mentioned in Lesson 3, animate (Class 5) nouns fall into two gender groups, masculine and feminine, but only the masculine forms were given there. Feminine nouns differ from masculine in their endings and in verb agreement.

1.1 Feminine Noun Endings

The only general way in which feminine nouns differ from masculine is in their indefinite forms, as follows:

1. In the nominative case the indefinite feminine ending is -අක් rather than එක් . Thus දුවක් 'a daughter' (compare පුතෙක් 'a son').

2. The accusative indefinite is formed by adding -අක rather than -අකු . Thus දුවක විසින් 'by a daughter' (compare පුතකු විසින් 'by a son').

3. As with masculine nouns, the other case forms are made by adding the usual case endings to the accusative form.

Thus the feminine noun endings in the singular are as follows, with දුව as an example:

	Singular	Indefinite
Nominative	දුව	දුවක්
Accusative	දුව	දුවක
Dative	දුවට	දුවකට
Genitive	දුවගේ	දුවකගේ
Instrumental	දුවගෙන්	දුවකගෙන්

1.2 Agreement

Some verb forms show agreement for feminine gender. Of the verb forms that have occurred so far, the only one showing this characteristic is the third person singular simple past tense. The feminine of this form is made by adding -ආ to the past tense stem (the form with -ඒ , given in Lesson 6, is thus only a masculine form). Thus:

හෙතෙම ගියේය.
He went.

but ඕතොමෝ ගියාය.
She went.

Similarly in the negative:

ඒ මිනිසා හිතුවක්කාරකම් නොකෙරුවේය.
That man did not make any mischief.

ඒ ගැහැනිය හිතුවක්කාරකම් නොකෙරුවාය.
That woman did not make any mischief.

Note that this agreement applies only in the singular past tense. Like pronouns, verbs do not show any distinction for masculine-feminine gender in the plural, or in other than the third person. Thus:

ඔව්හු බණ ඇසීමට පන්සලට ගියෝය.
They (masculine or feminine) went to the temple to listen to the sermon.

2. දකිනවා 'SEE'

දකිනවා in addition to the regular past tense stem දැක්ක්- has an alternant past tense stem දුටුව්-. Thus in addition to the past tense forms දැක්කේ- (masculine), දැක්කා (feminine) there are forms දුටුවේ- (masculine) and දුටුවා (feminine). The latter are the preferred ones in Literary Sinhala.

3. PAST TENSE VERBAL ADJECTIVE

3.1 Formation

In Literary Sinhala, the past tense verbal adjective has two forms with different, though over-lapping, ranges of use. These are the GENERAL and PRE-NOMINAL forms, and are made as follows:

3.11 The general form is made in the same way as the first alternant of the past tense verbal adjective in Colloquial Sinhala, with -අ added to the past tense stem (C. S. 28,4):

	Stem		Past Tense Verbal Adjective
Class 1	බල-	look	බැලුව
Class 2	ඇදි-	pull	ඇද්ද
	සිටි-	be	සිටිය
Class 3	වැටෙ-	fall	වැටුණ

Irregular			
	කා-	eat	කෑව
	එ-	come	ආව
	ගන්-	take	ගත්ත

Verbs like කියනවා with past tense stems in -ව්ව- or -වුව- (6,1) usually use the වුව stem in the Literary general forms. Hence කිවුව. Note also that for Class 3, the ending is generally spelled with -ණ rather than -න we have used for Colloquial Sinhala.

3.12 The pre-nominal form is made as follows:

Class 1: The pre-nominal form is made by removing the -ව of the general form and lengthening the resulting -ු :

Stem		General Form	Pre-nominal Form
බල-	look	බැලුව	බැලූ
කිය-	say	කිවුව	කිවූ
කර-	do	කෙරුව	කෙරූ
මර-	kill	මැරුව	මැරූ
තම්බ-	boil	තැම්බුව	තැම්බූ
නවත්ත-	stop	නැවැත්තුව	නැවැත්තූ

Note that this form is like the second alternant in Colloquial Sinhala (C. S. 30,9) except that the final ු is always long in Literary.

Class 2: For those Class 2 verbs which double the last consonant, the general and pre-nominal forms are the same. For those which do not double the consonant and do not lose -ඉ- in forming the past stem the pre-nominal form is made by removing the -ය of the general form:

Stem		General Form	Pre-nominal Form
ඇදි-	pull	ඇද්ද	ඇද්ද
සිටි-	be (anim.)	සිටිය	සිටි

Class 3: The pre-nominal form is made by changing the -ණ of the general form to -ණු. Thus:

Stem		General Form	Pre-nominal Form
වැටෙ-	fall	වැටුණ	වැටුණු
තේරෙ-	understand	තේරුණ	තේරුණු

Note that this is like the second alternant in Colloquial Sinhala (C. S. 30,9) but spelled with ත rather than න .

Irregular: For most irregular verbs, the following rules will serve to obtain the pre-nominal from the general form:

1. If the general form ends in -ව , remove it. Thus:

General Form	Pre-nominal Form
කෑව	කෑ
ආව	ආ

2. If the general form of an irregular verb is one with a double consonant, i.e. ends in VCCa remove the second consonant (and inherent vowel), leaving the first in final position:

General Form	Pre-nominal Form
ගත්ත	ගත්
දුන්න	දුන්
උන්න	උන්

3. For දකිනවා 'see', the දුටු- past stem is used to form the past tense verbal adjective pre-nominal form, but the final is not lengthened as with other verbs:

General Form	Pre-nominal Form
දුටුව	දුටු

4. The Literary past tense verbal adjective forms of වෙනවා and දන්නවා are:

General Form	Pre-nominal Form
වුව	වු
දත	දත්

3.2 Use

3.21 In Literary Sinhala, either form may modify a following noun. However, the pre-nominal form is considered preferable in this usage and this is the chief use of that alternant:

ශිෂ්‍යයන් කෙරූ වැඩ or ශිෂ්‍යයන් කෙරූව වැඩ
The work the students did

අප දුටු කුමාරයා or අප දුටුව කුමාරයා
The prince we saw

3.22 The general form has a number of uses in which it is most common. One is in forming the past conditional discussed in the next section. Others will be given subsequently.

3.23 The pre-nominal form of වෙනවා has special uses. One such is in forming the equivalent of English past tense relative clauses indicating location, i.e. 'who (or which) was in such and such a place':

හෙතෙම පිරිවෙණෙහි වූ පුස්තකාලයට ගියේය.
He went to the library which was in the pirivena.

සිංහපුරයෙහි වූ සිංහබාහු නම් රජතුමා.
The king named Sinhabahu who was in Sinhapura.

4. PAST CONDITIONAL

The Literary equivalent of the Colloquial past conditional form such as කැපුවොත් 'if one cuts', වැටුනොත් 'if one falls', etc. (C. S. 20,6) is formed by adding හොත් to the general form of the past tense verbal adjective. Thus:

කැපුවහොත්	if one cuts
වැටුණහොත්	if one falls
කැවහොත්	if one eats
ගත්තහොත්	if one takes

5. මැනවි 'GOOD IF'

A conditional clause may be followed by මැනවි to form a sentence with the meaning 'it would be good if someone did whatever is indicated by the conditional clause'.

ගොවියන් කුඹුරු වැපුරුවහොත් මැනවි.
It would be good if the farmers were to sow the fields.

ශිෂ්‍යයන් හොඳින් පොත් පාඩම් කෙරුවහොත් මැනවි.
It would be good if the students studied their lessons well.

The Colloquial equivalent is a conditional clause plus හොඳයි . Thus:

ගොවියෝ කුඹුරු වැපුරුවොත් හොඳයි.

ශිෂ්‍යයෝ හොඳින් පොත් පාඩම් කෙරුවොත් හොඳයි.

6. බව

බව is used to form clauses serving as objects of verbs of saying, perceiving, thinking, etc. The closest English equivalent is the conjunction 'that'. It forms clauses in the following ways:

1. For verbal clauses, බව is added to a verbal adjective form in the appropriate tense. For the past tense, either the general or the pre-nominal form may be used.

ඒ ළමයින් මල්කඩන බව මම දනිමි.
I know that those children are picking flowers.

හරකුන් ගොයම් කෑබව ගොවියෝ දැනගත්තෝය.
or හරකුන් ගොයම් කෑව ගොවියෝ දැනගත්තෝය.
The farmers knew that the cattle ate the rice plants.

Note that the subject of the බව clause occurs in the accusative case, since there is no verbal agreement.

2. For clauses with a predication marker, whether equational or emphatic, the predication marker is removed and බව is added. Here also the subject will appear in the accusative case:

හෙතෙම හොඳයි.
He is good.

ඔහු හොඳ බව දනිමි.
I know that he is good

ඔහු යන්නේ කොළඹට ය.
He is going to Colombo.

ඔහු යන්නේ කොළඹට බව දනිමි.
I know that he is going to Colombo.

3. If the clause is an equational one with a noun as the predicate attribute, both that noun and the subject will appear in the accusative case:

ඔවුහු ගොවියෝ වෙති.
They are farmers.

ඔවුන් ගොවියන් බව දනිමි.
(I know) that they are farmers.

Some modern authors, however, observe the last rule only partially or not at all, putting only the subject or neither noun in the accusative:

ඔවුන් ගොවියෝ බව දනිමි.

ඔවුහු ගොවියෝ බව දනිමි.

7. සේ

සේ like ලෙස (5.5) is added to adjectives, or nouns in the oblique case, to form adverbs of manner with the sense 'as', 'in such a way':

ඔවුහු මහත්සේ ප්‍රීතියට පත්වූහ.
They became very happy.

හෙතෙම ගුරුවරයකුසේ වැඩකරයි.
He works as a teacher.

8. අසලින්

In Literary Sinhala, as in Colloquial, some postpositions inflect for case. When a postposition indicating location such as අසල occurs in the instrumental case, the sense may be either 'from' or 'by way of' that place, depending on the context:

හෙතෙම පොල්ගස මුලින් පොල්ගෙඩියක් ගත්තේය.
He took a coconut from the foot of the coconut tree.

ගසමුල අසලින් බල්ලෙක් දිවුවේය.
A dog ran by way of the foot of the tree.

9. තෝ

තෝ is a second person pronoun with the following forms:

	Singular	Plural
Nominative	තෝ	තොපි, තෙපි
Accusative	තා	තොප
Dative	තට	තොපට
Genitive	තගේ	තොපගේ
Instrumental	තගෙන්	තොපගෙන්

In Literary Sinhala, තෝ is a familiar rather than respectful pronoun, and is thus used for intimates or inferiors.

10. තොමෝ, ඕතොමෝ, AND මෝතොමෝ

10.1 තොමෝ 'Oneself, Herself'

තොමෝ is the feminine reflexive pronoun corresponding to තෙමේ (2,1.3). Here Sinhala distinguishes between masculine and feminine only in the nominative singular and the other case forms and the plural are the same as those for තෙමේ (2,2.1).

10.2 ඕතොමෝ '(that) she' and මේතොමෝ '(this) she' (sometimes written divided as ඕ තොමෝ and මේ තොමෝ) are the feminine equivalents of හෙතෙම and මෙතෙම 'he' (2,1.1).

The case forms of these pronouns are given below. Sinhala does not distinguish between the masculine and feminine in the plural so that the forms given for හෙතෙම and මෙතෙම (2,2.1) are used for both genders.

	ඕතොමෝ	මේතොමෝ
Nominative	ඕතොමෝ, ඇය, ඈ	මේතොමෝ, මැය, මෑ
Accusative	ඇය, ඈ	මැය, මෑ
Dative	ඇයට, ඈට	මැයට, මෑට
Genitive	ඇයගේ, ඈගේ, ඇගේ	මැයගේ, මෑගේ, මැගේ
Instrumental	ඇයගෙන්, ඈගෙන්, ඇගෙන්	මැයගෙන්, මෑගෙන්, මැගෙන්

Note that there are variants for each form. Those given first are traditionally considered preferable.

11. INFINITIVE PLUS සිදුවෙනවා

With සිදුවෙනවා in the sense 'have to' the infinitive may be used in place of the dative verbal noun (3,9); the construction is otherwise unchanged.

> ඔහුට ගමට යන්නට සිදුවෙයි.
> He has to (or will have to) go home.
>
> සිරිල්ට පොත කියවන්නට සිදුවුවේය.
> Siril had to read the book.

12. කවර AND කවරෙක්

12.1 කවර 'which, what' is a more formal equivalent of කොයි or මොන and like them modifies a noun.

> කවර ස්ත්‍රියක්?
> Which (or what) woman?

The phrase කවර හෙයින් (ද) means 'what for, why?'.

12.2 කවරෙක් is an animate interrogative pronoun referring only to humans. Its Colloquial equivalent is කවි or කවුරු (C. S. 27,3). Like other interrogatives it is usually followed by the question marker:

> ඒ මිනිසා කවරෙක්ද?
> Who is that man?

The case forms are as follows (the first alternates are traditionally preferred):

Nominative	කවරෙක්
Accusative	කවරකු, කවරෙකු
Dative	කවරකුට, කවරෙකුට
Genitive	කවරකුගේ, කවරෙකුගේ
Instrumental	කවරකුගෙන්, කවරෙකුගෙන්

13. හෙයින්, බැවින්, නිසා WITH THE PAST VERBAL ADJECTIVE

When හෙයින්, බැවින් or නිසා are used with a past, rather than a present verbal adjective (6,9), the action of the 'because' clause is usually prior to that of the main verb. It is usually the pre-nominal form of the past verbal adjective that appears with these forms.

> ගුරුවරයා පැවසූ හෙයින් ශිෂ්‍යයා එම වැඩ කෙරුවේය.
> The student did that work because the teacher had told him to.

> අළුත් රටකට පැමිණි බැවින් ඔව්හු ප්‍රීති වූවෝය.
> They felt happy because they had come to a new country.

SUPPLEMENTARY READINGS

1. මහදැනමුත්තා සහ ගෝල පිරිස

ලංකාවේ ගැමිජනතාව අතර කටකථාවශයෙන් පැවත එන කථාන්තර රාශියකි. මෙයින් සමහරක්'මහදැනමුත්තා සහ ගෝල පිරිස පිළිබඳ කථා' යනුවෙන් හැඳින්වෙයි. සාමාන්‍ය ගැමියා මෙම කථා හඳුන්වන්නේ 'මහදැනමුත්තයි ගෝලපිරිසයි ගැන කටන්දර' යනුවෙන් හෝ 'මහදැනමුත්තගෙයි ගෝලයන්ගෙයි කටන්දර' යනුවෙනි. 'කථාන්තරය' යන වචනය සඳහා 'කටන්දරේ' හෝ 'කතන්දරේ' යන වචන ඔව්හු යොදති.

ලංකාවේ කුඩා ගැමිදරුවෝ සියාකෙනකු ළඟට වී හෝ ආච්චිකෙනකු ළඟට වී හෝ ඔවුන්ගෙන් මෙම කථා අසාගෙන සිටීමට ප්‍රියකරති. එම කථාන්තර ඇසීමට ප්‍රියකරන්නේ කුඩාදරුවන් පමණක් නොවේ. විවේක වේලාවල මෙම කථා කුඩාදරුවන්ට කියාදීම වැඩිමහල් අයටද ලොකු සතුටක් ගෙනදෙයි. සැන්දෑවරුවෙහි හෝ ඇතැම්විට වැසිවසින වේලාවල හෝ අහලපහළ කෝපිකඩයකට රැස්වීම ඇතැම් වැඩිමහළු ගැමියන්ගේ සිරිතවෙයි. එම අවස්ථාවලදී කෝපි බොමින් හෝ බුලත්විට සපමින් හෝ සුරුට්ටුවක් බොමින් හෝ කථාන්තර කීමටත් ඇසීමටත් ගැමියෝ ප්‍රියකරති. ඔව්හු මෙම අවස්ථා වලදී මහදැනමුත්තා පිළිබඳ කථාවලින්ද මහත් රසයක් ලබති.

සයවැනි පාඩමෙහි දෙවැනි අතිරේක කියවීම වශයෙන් අන්දරේ පිළිබඳ කථාවක් දැක්වුවෙමු. අන්දරේ ගැන කථාන්තරවලින් ඉස්මතුවෙන රසය උපහාසය සහ හාස්‍ය රසය යි. ගැමි කටකථාවල අන්දරේ සඳහන්වන්නේ දක්ෂ කවටයකු වශයෙනි. එම කථාවලින් ඉස්මතුවන්නේද අන්දරේගේ කපටි බුද්ධියත් තැනට ගැළපෙන නුවණත් ය. ගැමි සිංහලයාගේ සියුම් හාස්‍යරසය අන්දරේ පිළිබඳ කථාන්තරවලින් මැනවින් නිරූපනයවෙයි.

වැඩිහිටියකු කිවූ දෙය හෝ, පොතපතින් උගෙනගත් දෙය හෝ වැඩිදුර විමසා නොබලා ක්‍රියාවෙහි යෙදීමේ ලක්ෂණය මහදැනමුත්තා පිළිබඳ කථාවලින් සියුම් උපහාසයට ලක්වෙයි. මහදැනමුත්තා මෝඩකමෙහි ප්‍රතිමූර්තියකි. මහදැනමුත්තා වැදගත් ගමනක්බිමනක් යන්නේ ගෝලපිරිසද සමග ය. මහදැනමුත්තාගේ ගෝලපිරිසද ඔහුටම ගැලපෙන මෝඩ පිරිසකි. නිතරම මහදැනමුත්තාගේ අතෙහි පුරාණ පොතක් ඇත. ඔහු සෑම දෙයක්ම කරන්නේ එම පොතෙහි දැක්වෙන හැටියට ය. ගෝලයන් වැඩකරන්නේද පොතට අනුව ය. ගැමියෝ බොහෝවිට අවවාද ගැනීම සඳහා මහදැනමුත්තා ළඟට පැමිණෙති. ඔහුගේ අවවාදවලින් ඔවුහු පාඩුවිඳිති.

මහදැනමුත්තා පිළිබඳ එක් කෙටි කථාන්තරයක් පහත දක්වමු.

පුරාණ කාලයේ මහදැනමුත්තා සිටි ගමේ එක්තරා දුප්පත් ගොවියෙක් සිටියේය. ගැමියෝ ඔහු හැඳින්වූයේ 'ගමරාළ' යන නමිනි. කුඹුරු ගොවිතැන්කර එයින් ලැබෙන ආදායමෙන් ගමරාළ ජීවත්වූයේ බොහෝ අමාරුවෙනි.

Lesson Seven

ගමරාළට පුතෙක් සහ දුවක්ද වූවෝය. බිරිඳත් දරුවන් දෙදෙනාත්, තමාත් සඳහා තමාගේ ගොවිතැන්වලින් ගමරාළට ලැබුණේ ඉතා සුළු ආදායමකි. මෙම සුළු ඇදායමෙන් ජීවිකාව කිරීම අපහසුබව හෙතෙම වටහාගත්තේය. හෙතෙම තම පවුලේ නඩත්තුව සඳහා අමතර ආදායමක් සෙවීමට මාර්ගයක් සිතන්නට පටන්ගත්තේය. එළබානක් ගෙන අවහොත් තමාගේ ආදායම වැඩිකර ගතහැකි යයි දිනක් ගමරාළට කල්පනා වූවේය. ගොවිතැන්කොට බොහෝ වෙහෙසමහන්සිවී සොයාගත් මුදල්වලින්, සුළු මුදලක් ගෙදර ඉතුරුවී තිබුණේය. එළබානක් ගෙනඒම පිළිබඳ අදහස ගමරාළ බිරිඳට කිව්වේය. ඕ තොමෝද ඊට කැමතිවූවාය. ගමරාළ එළදෙනක සහ එළවකු ගෙන ආවේය. එළදෙනගෙන් ලැබෙන කිරි විකුණා හෙතෙම සුළු අමතර ආදායමක් ලබාගත්තේය.

ගමරාළ සෑමදාම කුඹුරට යයි. ඔහු කුඹුරට එළවන්ද රැගෙන යයි. එළවන් ගෙනයන්නේ කැවීම සඳහාය. එක් දිනක් එළවන් කුඹුරට දක්කාගෙනයෑමට ගමරාළට අමතක වුයේය. මෙදා ගමරාළගේ පුතා එළවන් ලිහාහැරියේය. එළවෝ ගෙවත්තෙහි තණකොළ සහ කොළජාති කමින් සිටියෝය. මිදුලෙහි ටිකක් වතුර පිරුණු මුට්ටියක් තිබුණේය. එළවා වතුර බීම සඳහා මෙම මුට්ටිය ඇතුළට හිස දැමුවේය. වතුර බීමෙන් පසු එළවාට මුට්ටියෙන් හිස ගලවා ගැනීමට නොහැකිවුවේය. ගමරාළගේ බිරිඳ සහ පුතා මුට්ටිය ගලවා ගැනීමට මහන්සි දැරුවෝය. මේ අතරේදී ගමරාළද කුඹුරේසිට ගෙදර ආවේය. එළවාගේ හිසින් මුට්ටිය ගළවා දැමීමට ගමරාළද බොහෝ මහන්සි දැරුවේය. එහෙත් ඔවුන්ගෙන් එක්කෙනකුටවත් එය කෙරිය නොහැකි වුවේය.

මේ ගැන මහදැනමුත්තාගෙන්වත් අවවාදයක් ගතහොත් මැනවිය යි ගමරාළ සිතුවේය. සිතා මහදැනමුත්තා හමුවීමට ගියේය. එළවා නොබලා, මුට්ටිය ගැලවීම පිළිබඳව අවවාදයක් දිය නොහැකිය යි මහදැනමුත්තා ගමරාළට කිවුවේය. එහෙයින් ගමරාළට මහදැනමුත්තා කැඳවා ගෙන ඒමට සිදුවුයේය. මහදැනමුත්තා ආවේ ඇතකුගේ පිටේය. මහදැනමුත්තා සමග ගෝලයෙක්ද ආවේය.

එළවා සිටින තැනට ඇතාගේ පිටෙන් නොබැසම තමා යායුතුය යි මහදැනමුත්තා ගමරාළට පැවසුවේය. ගමරාළගේ ගෙහි වහලය තරමක් පාතය. එහෙයින් මහදැනමුත්තාට ඇතාගේ පිටේ නැගී මිදුල ඔස්සේ යෑම තරමක් අපහසු වුවේය. වහලයෙහි පැත්තක් කැඩිය යුතුය යි මහදැනමුත්තා ගමරාළට කිවුවේය. ගමරාළ වහලයෙන් පැත්තක් කඩා දැමුවේය. මහදැනමුත්තා ඇතාගේ පිටින්ම එළවා සිටි තැනට ගියේය. ගොස් එළවා දෙස බැලුවේය. එළවාගේ හිසින් මුට්ටිය ගලවාගැනීම සඳහා එළවාගේ බෙල්ල කපා දැමිය යුතුය යි මහදැනමුත්තා කිවුවේය. මහදැනමුත්තාගේ ගෝලයා වහාම එළවාගේ බෙල්ල කපා දැමුවේය. දැන් එළවාගේ හිස මුට්ටියෙන් ගළවා ගැනීම සඳහා මුට්ටිය බිඳිය යුතුය යි මහදැනමුත්තා පැවසුවේය. ගෝලයාද පොල්ලකින් ගසා මුට්ටිය බිඳදැමුවේය.

මහදැනමුත්තාගේ "නුවණෙහි අගය" ගමරාළට වැටහුණේ එවිටය.

2. පටාචාරා

ඉන්දියාවේ "සැවැත්" නම් නුවරක් තිබුණේය. එහි "සිරිවඩ්ඪන" නම් සිටුවරයෙක් වාසය කෙරුවේය. ඔහුට දරුවෝ දෙදෙනෙක් වූවෝය. වැඩිමහල් දරුවා දුවකි. බාල දරුවා පුතෙකි. දුවගේ නම "පටාචාරා"ය.

පටාචාරා ඉතා රූපත් වූවාය. දෙමව්පියෝ බොහෝ ආදරයෙන් ඇය රැකබලා ගත්තෝය.

සිටුගෙදර සේවකයෝ බොහෝ ය. ඔවුන් අතර "පුණ්ණ" නම් එක්තරා හුරුබුහුටි තරුණයෙක් වූයේය. ඔහුද බාලකල සිටම සිටුගෙදර සේවයකරමින් වැඩුණේය.

පටාචාරාද කුඩාකල සිටම ඔහු දුටුවාය. ඔහු දැකීමෙන් ඇය තුළ ඔහු පිළිබඳව ක්‍රමයෙන් ප්‍රේමයක් ඇතිවූවේය. ඔහු හමුවීම පිළිබඳ අදහස ක්‍රමයෙන් ඇය තුළ වැඩෙන්නට පටන්ගත්තේය.

පටාචාරාට සේවය කරන්නේ මහළු සේවක ගැහැණු පමණකි. මේ නිසා පුණ්ණ හමුවීමට යාම ඇයට තවතවත් අපහසු වූවේය. ඇයට ඉඩක් ලැබුණහොත් ඕ තොමෝ කෙසේ හෝ පුණ්ණ හමුවීමට පුරුදුව සිටියාය.

පොහොසත් තරුණයකුට පටාචාරා විවාහකරදීමට ඇයගේ දෙමව්පියෝ තීරණය කෙරුවෝය. එසේ තීරණය කොට, ඒ බව ඇයට දැන්වූවෝය. දෙමව්පියන්ගේ තීරණයට අකමැතිවීම අපහසුබව ඇයට වැටහුණේය. එහෙත් එම තීරණයට ඇයට කැමතිවීමද කෙරිය නොහැක. ඇය ප්‍රේමකරන්නේ පුණ්ණට පමණක් බව ඇයගේ සිත දනියි.

කෙසේ හෝ පුණ්ණ සමග රහසින් තම නිවසින් පලා යා යුතුය යි පටාචාරා සිතුවාය. මෙසේ සිතා ඇය විවාහකරදීමට නියමව තිබුණු දිනයට පෙරදිනයෙහි ඕ තොමෝ රහසින් ගොස් පුණ්ණ හමුවී ඔහු සමග පලාගියාය.

එදින රාත්‍රිය ගෙවා, පසුදින උදේ පටාචාරා සහ පුණ්ණ එක්තරා ගමකට ළඟාවූවෝය. එම ගමෙහි ඔවුහු පදිංචි වූවෝය. පුණ්ණ කුලීවැඩ කිරීමෙන් ලැබෙන සුළු ආදායමෙන් තමාගේ පවුල නඩත්තු කෙරුවේය. පටාචාරාද ක්‍රමයෙන් දුප්පත් ජීවිතයකට පුරුදුවූවාය. ටිකකලක් ගතවීමෙන් පසු පටාචාරා ගැබ්ගත්තාය. දරුවකු ප්‍රසූතකිරීමට සුදුසුකාලය ළඟාවූයේය. එහෙයින් ඕ තොමෝ තමාගේ දෙමව්පියන් දැකීමට යායුතුය යි සැමියාට දැන්වූවාය. එහෙත් පුණ්ණ එයට කැමතිවූයේ නැත. පටාචාරා සමග ඇයගේ ගෙදරට යාමට හෙතෙම බියවූයේය. සැමියා තමා හා නොඑනබව දැනගත් පටාචාරා, තනිවම තමාගේ දෙමව්පියන්ගේ නුවරට යන්නට පිටත්වූවාය. දෙමව්පියන් දැකීමට යාමට ඇයට ඉඩක් ලැබුණේ නැත. අතරමගදී ඇයට විලිරුදා ඇතිවූයේය. ඕ තොමෝ අසලවූ ගෙදරකට ගියාය. ගොස් ඒ බව දන්වා, එහි

රැකවරණ ලබා, පුතකු ප්‍රසූත කෙරුවාය. ඇයගේ සැමියාටද ඇය සොයා එන්නට සිදුවුයේය. ඇය නැවතී සිටි ගෙය ගැන තොරතුරු අසා දැනගත හෙතෙම එම ගෙදරට ආවේය. අවුත් දරුවාද රැගෙන ඇය සමග තම ගෙදරට ගියේය.

ක්‍රමයෙන් කාලය ගතවීමෙන් පසු පටාවාරා නැවතත් ගැබ්ගත්තාය. දරුවකු ප්‍රසූතකිරීමට සුදුසු කාලය ළඟාවුයේය. ඕ තොමෝ තම දෙමව්පියන් දැකීමට යා යුතුය යි සැමියාට දැන්වූවාය. මෙවරද ඇගේ සැමියා එයට කැමති නොවුයේය. සැමියා තමා හා නොඑන බව දැනගත ඕ තොමෝ තම පුතාද සමග දෙමව්පියන් දැකීමට යන්නට පිටත්වුවාය.

ඇගේ සැමියාටද ඇය සොයාඑන්නට සිදුවුයේය. ඔහුට අතරමගදී ඇය හමුවී ඇය සමග හෙතෙම යන්නට පටන්ගත්තේය. මෙසේ ඔවුහු ටිකදුරක් ගියෝය. ඔවුන්ට වැඩිදුරක් යන්නට ඉඩ ලැබුනේ නැත. අතරමගදීම පටාවාරාට විලිරුදා ඇතිවුවේය. ඕ තොමෝ ඒ බව සැමියාට කිවුවාය. එම වේලාවෙහිම මහා වැස්සක්ද වසින්නට පටන්ගත්තේය. පෙනෙන අසලක ගෙයක් නොතිබුනේය. පටාවාරාට ආවරණයක් සෑදීම සඳහා ඇගේ සැමියා කොළ අතු කපාගෙන ඒමට කැළයට ගියේය.

හෙතෙම කැළයෙහි එක් තුඹසක් අසල ගස් කිහිපයක් දැක, එම ගස්වල අතු කපන්නට පටන්ගත්තේය. අතුවල තිබුණු වතුරබිංදු ක්‍රමයෙන් තුඹස ඇතුළට වැටුනේය. තුඹස ඇතුලෙහි නයෙක් වුයේය. වතුරබිංදු නයාගේ ඇඟට වැටුනේය. වතුරබිංදු ඇඟට වැටීමෙන් කෝපවූ නයා තුඹසින් එලියට අවුත්, තුඹස උඩ සිටි මිනිසා දැක, ඔහු දෂට කෙරුවේය. එයින් පටාවාරාගේ සැමියා එතනම මියගියේය.

පටාවාරාද සැමියා එනතුරු බලාගෙන සිටියාය. ඔහු ආවේ නැත. වැස්ස තවතවත් වැඩිවුවේය. වැස්සේ තනිවූ ඇයගේ විලිරුදාද ක්‍රමයෙන් වැඩිවන්නට පටන්ගත්තේය. මැදියම් රාත්‍රියද ළඟාවුයේය. මෙවේලෙහි ඕ තොමෝ දරුවකු ප්‍රසූත කෙරුවාය. මුළුරාත්‍රියම ඕ තොමෝ තම දරුවන් දෙදෙනාද සමග එම කැළයෙහිම ගතකෙරුවාය.

පසුදින උදේ දරුවන්ද රැගෙන ඕතොමෝ තම සැමියා සෙවීමට කැලය ඇතුලට ගියාය. එහි තුඹසක් අසල මියගොස් සිටි තමාගේ සැමියා දුටුවාය. මෙය ඉවසාගත නොහැකිවූ ඕ තොමෝ හඬමින් දරුවන්ද රැගෙන දෙමව්පියන්ගේ නුවරට යන්නට පටන්ගත්තාය.

අතරමග එක් ගඟක් වුවේය. එදින රෑවැස්සෙන් ගඟද තරමක් පිරී තිබුනේය. පෙරදින ඉපදුණු දරුවා වඩාගෙන, වැඩිමල් දරුවා අතින් ගෙන ගඟින් එතෙරට යාම අපහසු බව ඇයට වැටහුනේය. ඕ තොමෝ වැඩිමල් දරුවා ගඟෙහි මෙතෙර හිඳුවා බාලදරුවා වඩාගෙන ගඟින් එතෙරට ගොස් කොළඅතු කිහිපයක් උඩ ඔහු තැබුවාය. තොමෝ ආපසු හැරෙමින් බිළිඳු දරුවා දෙස බලමින්, වැඩිමල් දරුවා එතෙර කිරීම සඳහා ගඟෙහි මෙතෙරට එන්නට පටන්ගත්තාය. මේ අතරේදී එක් උකුස්සෙක් බිළිඳුදරුවා දැක ඔහු ඩැහැගැනීමට පියාඹා ආවේය. උකුස්සා බයගැන්වීමට පටාවාරා කෑගැසුවාය. එහෙත් උකුස්සා අවුත් එම බිළිඳුදරුවා ඩැහැගෙන පියාඹා ගියේය.

ගඟෙහි මෙතෙර සිටි වැඩිමල් දරුවාටද මවගේ කෑගැසීම ඇසුනේය. ඇයි මව තමාට හඬගසන බව එම දරුවා සිතුවේය. මෙසේ සිතා දුවගෙන ආ එම දරුවා ගඟේ වැටී මියගියේය.

තම සැමියාත් දරුවන් දෙදෙනාත් හදිසියේ මියයෑම නිසා බොහෝ දුකට පත්වූ

පටාචාරා හඬමින් තනිවම තමාගේ දෙමව්පියන්ගේ නුවරට යන්නට පටන්ගත්තාය. මෙසේ යන ඕතොමෝ අතරමගදී, මග යන කෙනකුගෙන් තමාගේ දෙමව්පියන් පිළිබඳ තොරතුරු ඇසුවාය. පෙරදිනයෙහි වූ වැස්සෙන් පටාචාරාගේ දෙමව්පියන්ගේ නිවෙස කැඩී වැටුණු බවද, ඇයගේ දෙමව්පියනුත් සහෝදරයාත් එයින් මරණයට පත්වූබවද හෙතෙම කිවුවේය. මෙම පුවත ඇසූ ඕතොමෝ අපමණ ලෙස දුක්වූවාය. කල්පනා මඳවූවාය. හඬමින්, කෑගසමින් දුවන්නට පටන්ගත්තාය.

ඕතොමෝ මහමග දුවමින් ක්‍රමයෙන් බුදුරජාණන්වහන්සේ ධර්ම දේශනාකරමින් වැඩසිටි ධර්මශාලාව අසලට ආවාය. කිසි පිහිටක් නොලැබූ ඕතොමෝ එම ධර්මශාලාව ඇතුලට දුවගෙන ගියාය. බුදුරජාණන්වහන්සේ දේශනාකරන ධර්ම අසාගෙන සිටියාය. ධර්ම අසන ඇයගේ දුක ටිකින්ටික සංසිඳුණේය. ඇයට ජීවිතයෙහි යථාතත්වය වැටහී ගියේය.

ඕතොමෝ බුදුරජාණන්වහන්සේගෙන් පැවිදි බව ඉල්ලා සිටියාය. පසුව පැවිදි වූ ඕතොමෝ තමාගේ ජීවිතයෙහි ඉතිරිකාලය සතුටින් ගතකෙරුවාය.

VOCABULARY FOR SUPPLEMENTARY READINGS

READING 1

අගය	N2 value; no pl.
අමතර	additional
අවවාදය	N2 advice; pl. අවවාද
අවස්ථාව	N2 occasion, time, moment; pl. අවස්ථා
අහලපහල or අහලපහළ	in the neighborhood
ආච්චි	N5 grandmother; pl. ආච්චිලා
ඇතා	N5 elephant (tusker); pl. ඇත්තු ; stem ඇත්
ඉතුරුවෙනවා	remain, be left over
ඉස්මතුවෙනවා	become apparent, surface
එළදෙන	N5 she-goat; pl. එළදෙන්නු
එළුවා	N5 goat, he-goat; pl. එළුවෝ ; stem එළු
ඔස්සේ	through, along, by way of
කටන්දරය	N2 story, fable, gossip; pl. කටන්දර
කඩනවා	break
කඩාදමනවා	break completely
කපාදමනවා	cut off

Lesson Seven

කල්පනාවෙනවා	occur to one's mind, think
කැඳවාගෙනඑනවා	bring (a person)
කැවීම	N2 feeding, grazing; pl. කැවීම්
කියාදෙනවා	narrate, teach
කිරිදොවනවා	to milk
කැමතිවෙනවා	like, agree
කෙටි	short, brief
ක්‍රියාවෙහි යොදනවා	put into action
ගමනබිමන	journey, etc.; pl. ගමන්බිමන්
ගලවාගන්නවා	remove, take out (off)
ගලවාදමනවා or ගළවාදමනවා	remove, take out (completely)
ගැලවීම	N2 removing, taking out; pl. ගැලවීම්
ගොවිපල	N2 farm, field; pl. ගොවිපලවල්
ජීවිකාව	N2 livelihood; no pl.
දක්කාගෙනයනවා	lead (cattle, etc.)
දක්ෂ	clever, skilled, smart
දෙස	at, in the vicinity
නිරූපණයවෙනවා	be revealed, be portrayed
පාඩුවිඳිනවා	suffer loss, lose
පාත	low, below
පාන්දර	N3 early morning; no pl.
පාන්දරින්	early in the morning
පිට	N2/3 back (of the body); no pl.
පොතපත	N2 books, etc.; pl. පොත්පත්
ප්‍රතිමූර්තිය	N2 personification; pl. ප්‍රතිමූර්ති
බසිනවා	descend, get down
බාන	N2 pair (of animals like bullocks, etc.); pl. බාන්

බිඳිනවා	break (something earthen or glass, etc.)
බිරිඳ	N5 wife; pl. බිරින්දෑ
බුද්ධිය	N2 wit, intelligence; no pl.; stem බුද්ධි
බුලත්විට	N2 betel chew; pl. බුලත්විට් ; stem බුලත්විට
බෙල්ල	N2 neck; pl. බෙලි
බොහෝවිට	many a time, mostly
මහන්සිදරනවා	strive, make efforts
මාර්ගය	N2 way, means, road; pl. මාර්ග
මැනවින්	well, beautifully
මුට්ටිය	N2 pot; pl. මුට්ටි
මේ අතරේදී	meanwhile
මෝඩකම	N2 stupidity; pl. මෝඩකම්
ලිහනවා	untie, remove
ලිහාහරිනවා	let loose, untie
වටහාගන්නවා	realize, understand
වරුව	N2 a part of the day; pl. වරු
වහලය	N2 roof; pl. වහල
වැඩිකරගන්නවා	increase/multiply (for oneself)
වැසිවසිනවා	rain
විකුණනවා	sell
විමසාබලනවා	investigate, look into
විවේකය	N2 leisure; no pl.; stem විවේක
වෙහෙසමහන්සිවෙනවා	exert, struggle hard
සපනවා	chew, bite
සැන්දෑව	N2 evening (i.e. from roughly around 4 P.M. to 6 P.M.); no pl.; stem සැන්දෑ
සියුම්	subtle, fine, keen

සීයා	N5 grandfather; pl. සීයලා
හමුවෙනවා	meet

READING 2

අතරමගදී	on the way
අපමණ	boundless, limitless
අසාගෙන සිටිනවා	remain listening to
ආදරය	N2 affection, love; no pl.; stem ආදර
ආපසු හැරෙනවා	turn back
ආවරණය	N2 shelter, cover; pl. ආවරණ
ඇසෙනවා	hear
ඉගිල්ලෙනවා	fly (of birds, etc.)
ඉපදෙනවා	be born
ඉල්ලාසිටිනවා	request, ask for
ඉවසනවා	bear up with
උකුස්සා	N5 hawk; pl. උකුස්සෝ ; stem උකුසු
උඩ	on
එලිය or එළිය	N2 outside, open (space), light; no pl.
කල්පනාවදවෙනවා	lose the power of thinking
කැඩී වැටෙනවා	crumble down
කැළය or කැලය	N2 forest, wood; pl. කැළැ, කැලැ or කැළෑ, කැලෑ
කොළ අත්ත	N2 branch with leaves; pl. කොළ අතු
ගැබ්ගන්නවා	become pregnant
ගෙවනවා	spend
ඩැහැගන්නවා	snatch away, grab away
තරුණයා	N5 youth; pl. තරුණයෝ ; stem තරුණ

තවතවත්	more and more, the more
තුඹස	N2 anthill; pl. තුඹස්
තෙර	N2/3 bank (of a river, etc.); pl. තෙරවල් ; stem තෙර
එතෙර	the further side of a river
මෙතෙර	the hither side of a river
දෂ්ට කරනවා	sting, bite (of a venomous creature, serpent, etc.)
දැනගන්නවා	know, realize, get to know
දුක	N2 grief, sadness, sorrow; pl. දුක්
දුක්වෙනවා	grieve, be sad
දේශනාකරනවා	preach
ධර්මය	N2 doctrine; pl. ධර්ම
ධර්මශාලාව	N2 sermon hall; pl. ධර්මශාලා
නයා	N5 cobra; pl. නයි
නියමවෙනවා	be fixed, be determinined
නිවස or නිවෙස	N2 house, residence, abode; pl. නිවෙස්
පත්වෙනවා	be subject to, undergo (with dat.)
පලායනවා	run away, elope
පැනයනවා	run away, elope
පැවිදිබව	N2 state of being ordained; no pl.
පිටත්වෙනවා	set out, start off
පිහිට	N2 refuge, protection; no pl.; stem පිහිට
ප්‍රසූත කරනවා	give birth (to a child)
ප්‍රේම කරනවා	love
ප්‍රේමය	N2 love; no pl.; stem ප්‍රේම
බයගන්වනවා	frighten, scare away
බාල	young, younger
බිංදුව	N2 drop; pl. බිංදු

Lesson Seven

බිය වෙනවා	be afraid, become frightened
බිළිඳු	infant (adjective)
මග or මඟ	N2/3 road; pl. මං
මරණය	N2 death; pl. මරණ
මහමග	N2/3 road, highway; pl. මහමං
මහලු	old
මැදියම් රාත්‍රිය	N2 midnight
මැදුර	N2 mansion, house; pl. මැදුරු
මිය යනවා	die
යථාතත්වය	N2 reality; no pl.; stem යථාතත්ව
යාම or යෑම	N2 going; pl. යාම්, යෑම්
රහස	N2 secret; pl. රහස්
රැකබලාගන්නවා	look after, protect
රැකවරණය	N2 shelter, protection; pl. රැකවරණ
රූපත්	beautiful
වඩාගන්නවා	carry a child in one's arms
විලිරුදුව	N2 labor pain ; pl. විලිරුදු
විවාහකර දෙනවා	give in marriage, marry
වේලෙහි	at the time
මෙවේලෙහි	at this time
එවේලෙහි	at that time
සංසිඳෙනවා	lessen, ease
සැමියා	N5 husband; pl. සැමියෝ ; stem සැමි
සිටුවරයා	N5 millionaire; pl. සිටුවරු ; stem සිටු
සුදුසු	fit, proper
සේවකයා	N5 attendant, servant; pl. සේවකයෝ ; stem සේවක
සේවය	N2 service; pl. සේවා

සොයා එනවා	come in search of
හඬගසනවා	call
හඬනවා	cry, weep
හදිසියේ	suddenly
හැරෙනවා	turn, change to
හිඳුවනවා	make one stay, keep, make one sit
හුරුබුහුටි	clever, smart, engaging

LESSON 8

විජය පුවත 3.

දියගෙනඒම සඳහා ගිය අයගෙන් කිසිවකු ආපසු නොපැමිණි බව විජයකුමාරයා දුටුවේය. මෙයින් හේ මහත්සේ මවිතයට පත්වූයේය. තම පිරිසට කිසියම් අනතුරක් සිදුවූයේදැයි සංවේගයට පත්වූ හෙතෙම, ඔවුන් සොයා යෑමට පිටත්වූයේය. පිරිස සොයා ඔහු ගියේ ආයුධ සන්නද්ධව ය. මෙසේ පිරිස සොයායන හෙතෙම, පෙර සඳහන් කළ, ගසක්මුල කපුකටිමින් සිටි කාන්තාව දුටුවේය. ඕ තොමෝද මොහු දැක්කාය. පෙර පැමිණි පුරුෂයන්ට වඩා ස්වරූපයෙන් තරමක් වෙනස්වූ, ආයුධ සන්නද්ධවූ ඔහු දුටු ඕ මොහු පිරිසෙහි නායකයා විය යුතු යැයි කල්පනා කළාය.

ඇයගෙන් පිරිස පිළිබඳව විමසිය යුතු යැයි විජයකුමාරයා සිතුවේය. මෙසේ සිතා, ඇය සිටි ගසමුල අසලට ගියේය. ගොස්,

"තී රූපත් කාන්තාවක් වෙහි. කුමාරිකාවගේ ස්වරූපය උසුලහි. කවරහෙයින්, මෙම ගසමුලට වී කපු කටිහි දැ"යි පළමුවෙන් ඇයගෙන් ඇසුවේය.

"තෝද තේජස්වන්ත තරුණයෙක් වෙහි. කවර හෙයින් තනිව මෙම මගින් ආවෙහි දැ"යි ඕ කුමාරයාගෙන් ප්‍රශ්න කළාය.

"මගේ පිරිසෙහි අය සොයා මෙහි පැමිණියෙමි. තී මේ මගින් ගිය කිසියම් පුරුෂයකු දුටුවෙහිදැ"යි කුමාරයා ඇසුවේය.

"මෙම මගින් ගිය සියළුදෙනාම දුටුවෙමි. එම සියළුදෙනාම මම සිරකර තැබුවෙමි"යි ඕ පිළිතුරු දුන්නාය.

"මෙම මගින් ආ එම සියළුදෙනාම මගේ පිරිසෙහි අය වෙති. තී ඔවුන් සිරකර තැබුවේ ඇයි දැ"යි කෝපයට පත්වූ විජය ඇයගෙන් නැවතත් ප්‍රශ්න කෙළේය.

"මම යක්ෂ ගෝත්‍රයට අයත් කුවේණි නම් කුමාරිකාව වෙමි. මගේ අවසර නැතිව, මගේ අඩවියට පැමිණෙන සෑම කෙනකුම සිරකර තබන්නට මට බලය ඇතැ"යි ඕ දර්පයෙන් පිළිතුරු දුන්නාය.

ඇයගේ මෙම වචනයෙන් වඩාත් කෝපයට පත්වූ කුමාරයා,

"වහා මගේ පිරිස ආපසු දෙව. නැතහොත් එක කඩු පහරින් තිගේ ගෙල සිඳලමි"යි, ඇය කෙස් වැටියෙන් ගෙන, තර්ජනය කළේය.
කුමාරයාගේ මෙම වචනයෙන් බියපත්වූ කුවේණී,

"කුමාරයාණෙනි, මා නොමැරුව මැනව. තොපගේ පිරිස තොපට ආපසු පවරා දෙමි. එපමණක් නොවෙයි. මෙම මුළු ද්වීපයෙහි රාජ්‍යයද තොපට ලබාගැනීමට ක්‍රමයක් සලසමි"යි බැගෑපත් ලෙස පැවසුවාය.

ඇයට අනුකම්පාකළ කුමාරයා, ඇය මිදුවේය. කුවේනිද, විජයකුමාරයාගේ සියළු පිරිස ඔහුට පාවාදුන්නාය. විජයකුමාරයා, තමාගේ බිසව වශයෙන් ඇය සරණ පාවා ගත්තේය. හෙතෙම, ලක්දිව විසූ යක්ෂ නායකයන්, කුවේනියගේ ආධාරයෙන් විනාශකොට, ලක්දිව ආර්ය ජනපදයක් බවට පත් කළේය.

VOCABULARY

අනතුර	N2 trouble, danger, accident; pl. අනතුරු
අනුකම්පාව	N2 sympathy, pity; no pl.; stem අනුකම්පා
ආයුධය	N2 weapon; pl. ආයුධ
ආයුධ සන්නද්ධව	armed, equipped with weapons
ආර්යයා	N5 Aryan; pl. ආර්යයෝ ; stem ආර්ය
ආර්ය ජනපදය	N2 Aryan colony; pl. ආර්ය ජනපද
ඕ	she. See grammar 4.
කඩුව	N2 sword; pl. කඩු
කාන්තාව	N5 woman; pl. කාන්තාවෝ ; stem කාන්තා
කිසියම්	whatsoever, whosoever
කිසිවෙක්	anyone
කුමාරිකාව	N5 princess; pl. කුමාරිකාවෝ
කෙස් වැටිය	N2 tresses; pl. කෙස් වැටි
ගෙල	N2/3 neck, throat; no pl.
ගෝත්‍රය	N2 clan (tribe); pl. ගෝත්‍ර
ජනපදය	N2 country, colony, province; pl. ජනපද
තර්ජනය	N2 threat; pl. තර්ජන
තර්ජනය කරනවා	threaten
තී	you (feminine); pl තොපි . See grammar 2.
දර්පය	N2 arrogance, pride; no pl.; stem දර්ප
ද්වීපය	N2 island; pl. ද්වීප
නායකයා	N5 chief, leader; pl. නායකයෝ ; stem නායක

Lesson Eight

නැතහොත්	or else, otherwise, if not
පවරා දෙනවා	turn over to, entrust, give over to
පහර	N2 stroke, blow; pl. පහරවල්, පහර
පාවාදෙනවා	hand over, give over to
පැහැදිලි	clear
පිළිතුර	N2 answer; pl. පිළිතුරු
පුරුෂයා	N5 man; pl. පුරුෂයෝ ; stem පුරුෂ
ප්‍රශ්න කරනවා	question, ask
ප්‍රශ්නය	N2 question; pl. ප්‍රශ්න
බලය	N2 power; pl. බල
බව	N2 state, status; no pl.
බැගෑපත්	humble, penitent
බියපත් වෙනවා	become afraid
මවිතය	N2 surprise, astonishment; no pl.
මුදවනවා	release
යක්ෂයා	N5 Yaksha, a kind of demon; pl. යක්ෂයෝ ; stem යක්ෂ
රාජ්‍යය	N2 kingdom, sovereignty; pl. රාජ්‍ය
ලක්දිව	N3 island of Lanka
ලබාගන්නවා	get for oneself
වහා	quickly, immediately
විනාශ කරනවා	destroy
විමසනවා	investigate, ask
සංවේගය	N2 apprehension, anxiety, worry; no pl.; stem සංවේග
සන්නද්ධ	equipped (with)
සන්නද්ධව	having been equipped (with). See grammar 2.
සඳහන් කරනවා	mention
සරණපාවා ගන්නවා	marry (applies only to men)

සලස්වනවා	arrange
සිඳලනවා	cut off, sever
හේ	he. See grammar 4.

GRAMMAR

1. IRREGULAR VERBS

New irregular forms of five verbs occur in this lesson.

1.1 කරනවා

කරනවා has the irregular past tense stem කළ්- as an alternative for regular කෙරු- Thus:

කෙරුවේය or කළේය (he) did

කෙරුවාය or කළාය (she) did

The adjective form from this stem is කළ , which serves both as the general and prenominal form. Thus:

අප කෙරු වැඩ or අප කළ වැඩ
The work we did.

අප වැඩ කෙරුවහොත් or අප වැඩ කළහොත්
If we work

As stated earlier (5,1.1), කරනවා has alternate past participle forms කර and කොට , with the latter more formal.

1.2 පැමිණෙනවා

The verb පැමිණෙනවා 'come, arrive' has alternate past tense and past participle forms: one set, built on the stem පැමිණි- has Class 2 endings, the other, built on පැමුණුන්- (note the මු rather than මි) has Class 3 endings. Hence:

පැමිණියේය or පැමුණුනේය he came

පැමිණියාය or පැමුණුනාය she came

පැමිණ or පැමිණී having come

1.3 වෙනවා

වෙනවා has the past participle form වී as well as වි (2,7). They are not quite alternates. In general, වී is more limited in occurrence and is used when වෙනවා is a part of a verb phrase like පත්වෙනවා 'be appointed', එකතුවෙනවා 'get together, unite', etc.

වී is not thus limited. Hence:

either: ගොවියෝ එකමුතු වී වැඩකරති.

or: ගොවියෝ එකමුතුව වැඩකරති.
The farmers get together and work.

but only: ඕ තොමෝ ගසමුලට වී සිටියාය.
She was at the foot of the tree.

1.4 වසනවා

වසනවා 'live' has an irregular past tense stem විසුව්- , from which the past tense forms are made in the usual way. Thus:

විසුවේය	he lived
විසුවාය	she lived

විසුව and විසු are the past adjectival forms.

වසනවා also has an irregular past participle වැස as an alternant with the expected regular form වසා . The irregular form is more frequent.

1.5 දෙනවා

In addition to the regular past tense forms of දෙනවා , there is an alternate set built on the stem දුන්- , with endings as follows:

	Singular	Plural
1st Person	දුනිමි	දුනිමු
2nd Person	දුනිහි, දුන්හි	දුන්හු
3rd Person	දුනි	දුන්හ

2. SECOND PERSON

2.1 The Feminine Pronoun තී

The second person familiar pronoun තෝ (7,9) has a feminine form තී in the singular. Masculine and feminine are not distinguished in the plural, so that the forms given in 7,9 are used for both:

	Singular
Nominative	තී
Accusative	තී
Dative	තිට
Genitive	තිගේ
Instrumental	තියෙන්

Sometimes the masculine singular තෝ is also found with feminine reference.

2.2 Simple Verb Agreement

2.21 Present Tense: The verb forms for the second person in simple present sentences are made by taking the present tense stem (1,5.1) and adding the affixes -හි singular and -හු plural. Masculine and feminine are not distinguished:

	Stem		Singular	Plural
Class 1	බල-	look	බලහි	බලහු
Class 2	අදි-	pull	අදිහි	අදිහු
Class 3	වැටෙ-	fall	වැටෙහි	වැටෙහු
Irregular	ය-	go	යහි	යහු
	ගනි-	take	ගනිහි	ගනිහු

These forms show agreement with subjects in the usual way:

තෝ තේජවත් කුමාරයෙක් වෙහි.
You are a majestic prince.

තොපි පොත් කියවහු.
You read books.

තී රූපත් කුමාරිකාවක් වෙහි.
You (feminine) are a beautiful princess.

තී ශිෂ්‍යයන්ට උගන්වහි.
You (feminine) teach the students.

තොපි රූපත් කුමාරියෝ වෙහු.
You (feminine) are beautiful princesses.

තොපි තේජවත් කුමාරයෝ වෙහු.
You are majestic princes.

2.22 The second person past tense forms for simple sentences are made as follows:

1. In the singular -ව- (always short as for the first person (6,1.1)) is added to the past tense stem followed by හි .
2. In the plural -ආ- is added to the past tense stem followed by හු .

	Past Tense Stem	Singular	Plural
Class 1	බැලුව්-	බැලුවෙහි	බැලුවාහු
Class 2	ඇද්ද්-	ඇද්දෙහි	ඇද්දාහු
	සිටිය්-	සිටියෙහි	සිටියාහු
Class 3	වැටුණ්-	වැටුණෙහි	වැටුණාහු
Irregular	ගත්ත්-	ගත්තෙහි	ගත්තාහු
	ගිය්-	ගියෙහි	ගියාහු

Masculine and feminine are not distinguished, and these forms agree in the usual manner with the subject:

තෝ පොත කියවුවෙහි.
You read the book.

තී වැඩ කෙරුවෙහි.
You (feminine) did the work.

තොපි වැඩ කෙරුවාහු.
You did the work.

2.3 Familiar Imperative

2.31 The second person singular Imperative that goes with the familiar pronouns තෝ , තී has two alternative forms.

2.311 The first alternant is formed as follows:

1. For verbs of Class 1, the present tense stem is used. Thus:

Present Tense Stem		Imperative
බල-	look	බල
කර-	do	කර

2. For verbs of Class 2, the -ඉ of the present tense stem is changed to -උ :

Present Tense Stem		Imperative
අදි-	pull	අදු
වඳි-	worship	වඳු

3. For verbs of Class 3, the -එ of the present tense stem is replaced by -ඉය :

Present Tense Stem		Imperative
පෙනෙ-	see	පෙනිය
වැටෙ-	fall	වැටිය

4. Irregular Verbs

a. Those irregular verbs with a Literary present tense stem in -ඉ, such as ගනි- 'take', දනි- 'know' behave like regular Class 2 verbs.

Present Tense Stem		Imperative
ගනි-	take	ගනු
දනි-	know	දනු

b. Verbs with one-syllable present tense stems in -අ, such as ය- 'go' and ක- 'eat', form the first alternant by lengthening the stem vowel. Those with stems in -ආ, such as ගා 'apply', use the base stem.

Present Tense Stem		Imperative
ය-	go	යා
ක-	eat	කා
ගා-	apply	ගා

2.312 The second alternant is formed as follows:

For verbs of Class 1 and 2, -ව is added to the first alternant.

First Alternant	Second Alternant
බල	බලව
කර	කරව
අඳු	අඳුව
වඳු	වඳුව

2. For verbs of Class 3, -ව is added to the present tense stem:

Present Stem	Second Alternant
පෙනෙ-	පෙනෙව
වැටෙ-	වැටෙව

3. Irregular Verbs

a. Those with -උ in the present stem again act like regular Class 2 verbs.

First Alternant	Second Alternant
ගනු	ගනුව
දනු	දනුව

b. Those monosyllabic verbs with a long vowel in the first alternant, shorten the vowel and add ව .

First Alternant	Second Alternant
කා	කව
යා	යව

2.32 The plural Imperative for the plural second person familiar pronoun තොපි may be formed for verbs of all classes by adding -ව් (or -වු) to the present tense stem.

	Present Tense Stem		Imperative Plural
Class 1	බල-	look	බලව්
	කර-	do	කරව්
Class 2	ඇදි-	pull	ඇදිව්
	වඳි-	worship	වඳිව්
Class 3	වැටෙ-	fall	වැටෙව්
	පෙනෙ-	see	පෙනෙව්

For verbs of Class 3 there is an alternate plural form made by adding -ව් to the -ඉය alternate of the singular.

Present Tense Stem		First Alternant	Imperative Plural
පෙනෙ-	see	පෙනිය	පෙනියව්
වැටෙ-	fall	වැටිය	වැටියව්

Irregular verbs add -ව් (or -වු) to the present tense stem.

Present Tense Stem		Imperative Plural
ය-	go	යවි
ක-	eat	කවි
ගා-	apply	ගාවි
බො-	drink	බොවි
ගනි-	take	ගනිවි

2.33 Summary

The above statements on the formation of the Imperative are summarized in the following chart:

	Singular			Plural
	Alternant 1		Alternant 2	
Class 1	බල	look	බලව	බලවි
	කර	do	කරව	කරවි
Class 2	අදු	pull	අදුව	අදිවි
	වඳු	worship	වඳුව	වඳිවි
Class 3	පෙනිය	see	පෙනෙව	පෙනෙවි, පෙනියවි
	වැටිය	fall	වැටෙව	වැටෙවි, වැටියවි
Irregular	ගනු	take	ගනුව	ගනිවි
	යා	go	යව	යවි

2.4 Honorific Imperative

An Honorific Imperative in Literary Sinhala is formed by adding either මැනව or මැනවි to the general form of the past tense verbal adjective. This form is both singular and plural.

මා නොමැරුව මැනව or මා නොමැරුව මැනවි.
Please do not kill me.

මෙම වැඩ කෙරුව මැනව or මෙම වැඩ කෙරුව මැනවි.
Please do this work.

2.5 Second Person Polite Plural

The plural forms තොපි , තෙපි , etc. of the second person pronouns තෝ and තී (7,9; and 2.1 above) may be used with singular reference to add a degree of politeness or respect:

"තොපගේ පිරිස තොපට ආපසු පවරා නොදෙමි"යි ඕ රජතුමාට කීවාය.
"I will not give back your retinue," she said to the king.

For some verbs the past tense verbal adjective may be changed slightly in form before මැනව/මැනවි . These are:

Verb		General Form	Form before මැනව/මැනවි
එනවා	come	ආව	අව , ආ
ගේනවා	bring	ගෙනාව, ගෙන ආව	ගෙන අව, ගෙන ආ
ගන්නවා	take	ගත්ත	ගත
දෙනවා	give	දුන්න	දුන
බොනවා	drink	බීව්ව	බීව
කියනවා	say	කිව්ව, කිවුව	කිව

3. QUOTATION MARKER යි AND යයි

When the quotation marker -යි (1,13) follows a form ending in -අ , the -අ may be optionally changed to -ඇ .

"මට බලය ඇතැ"යි හෙතෙම කීවේය.
"I have power," said he.

"මෙය පොත්ගුලයැ"යි මම දනිමි.
I know that this is the library.

"තී කවරහෙයින් කපුකටිහිදැ"යි කුමාරයා ඇසුවේය.
"Why are you spinning," the prince asked.

As stated earlier (6,10), there is a great deal of variation with regard to the writing of quotation marks and the quotation marker. In quoting, Literary Sinhala sometimes uses double quotation marks ("), sometimes single ('), and sometimes none at all, but the quotation marker always appears in some form. When quotation marks are used, the quotation marker characteristically appears outside of them, as in the examples above. Sometimes a predication marker -ය at the end of a quotation is joined to the quotation marker -යි and the whole placed outside the quotation marks. This may be done whether or not අ is also changed to ඇ . Compare the following with the second example above:

"මෙය පොත්ගුල"යයි මම දනිමි or "මෙය පොත්ගුල"යැයි මම දනිමි.
I know that this is the library.

As a result of the latter convention some modern authors take යයි or යැයි as the quotation marker using it as such even where there is no predication marker:

> "මම යමි" යයි (යැයි) මල්ලී පැවසුවේය.
> "I go," said the younger brother.

4. THIRD PERSON PRONOUNS

The third person pronouns හෙතෙම 'he' and ඕතොමෝ 'she' have alternate forms හේ 'he' and ඕ 'she' which are used interchangeably with them.

> හෙතෙම ගුරුවරයෙකි. or හේ ගුරුවරයෙකි.
> He is a teacher.

> ඕතොමෝ පාසැලෙහි උගන්වයි. or ඕ පාසැලෙහි උගන්වයි.
> She teaches in the school.

5. ඇත, නැත

5.1 ඇත and නැත appear before හොත් to form the equivalent of conditional verb forms (7,4), and like them are used in the equivalent of English 'if' clauses:

> එහි මල් ඇතහොත් කඩාගෙන අව මැනව.
> If there are flowers there, please pick them.

> එහි මල් නැතහොත් කරදර නොවුව මැනව.
> If there are no flowers there, do not trouble yourself.

නැතහොත් may be used by itself to mean 'otherwise', 'if not' like Colloquial නැත්නම් :

> වහා මගේ පිරිස ආපසු දෙව. නැතහොත් තී මරා දමමි.
> Return my retinue immediately. Otherwise I will kill you.

5.2 ඇත and නැත appear in the forms ඇති and නැති plus -ව to make participial forms with the senses 'being' or 'having' and 'without' or 'not having' respectively:

> විජය කුමාරයා අතේ කඩුවක් ඇතිව, තම පිරිස සොයා ගියේය.
> Prince Vijaya, with sword in hand, went in search of his retinue.

> පොත් නැතිව ඉගෙන ගැනීම අමාරුය.
> It is difficult to learn without books.

6. FEMININE NOUNS IN -ඊ

Literary Sinhala has many feminine nouns in -ඊ. These generally form the singular accusative by changing -ඊ to -ඉය. As with other animate nouns the accusative form serves as an oblique stem on which the other cases are built. Some writers use this accusative as a nominative, and some also use an alternate definite accusative form made by shortening the -ඊ of the nominative to -ඉ without adding -ය. (Note these alternates in the paradigm below).

The indefinite of these words has the usual feminine ending -අක්, and -ඊ shortens to -ඉ and adds -ය්- before this ending. The plural must be given for each noun since there is no one plural for all nouns of this type, but very often it is ඕ, before which the -ඊ again becomes -ඉය්-. කුමාරී 'princess' will serve as an example for nouns of this type:

	Singular	Indefinite	Plural
Nominative	කුමාරී, කුමාරිය	කුමාරියක්	කුමාරියෝ
Accusative	කුමාරිය, කුමාරි	කුමාරියක	කුමාරියන්
Dative	කුමාරියට, කුමාරිට	කුමාරියකට	කුමාරියන්ට
Genitive	කුමාරියගේ, කුමාරිගේ	කුමාරියකගේ	කුමාරියන්ගේ
Instrumental	කුමාරියගෙන්, කුමාරිගෙන්	කුමාරියකගෙන්	කුමාරියන්ගෙන්

7. HONORIFIC IN -ආණෝ

Literary Sinhala has an affix -ආණෝ which may be added to masculine nouns referring to people of very high status to indicate respect. When so added it replaces the final vowel of the direct singular. Thus කුමාරයා 'prince' කුමාරයාණෝ 'prince (honorific)', and පියා 'father', පියාණෝ 'father (honorific)'.

Although usually singular in meaning, nouns in -ආණෝ are plural in form, and thus inflect as follows:

Nominative	කුමාරයාණෝ	පියාණෝ
Accusative	කුමාරයාණන්	පියාණන්
Dative	කුමාරයාණන්ට	පියාණන්ට
Genitive	කුමාරයාණන්ගේ	පියාණන්ගේ
Instrumental	කුමාරයාණන්ගෙන්	පියාණන්ගෙන්

8. VOCATIVE

Literary Sinhala has vocative forms of animate nouns in both singular and plural.

8.1 Singular

For the major classes of animate nouns, the vocative singular is formed as follows:

1. Masculine nouns in -ආ , change final -ආ to -අ . Thus, මිනිසා 'man' මිනිස 'man (vocative)', ගැමියා 'villager' ගැමිය 'villager (vocative)'.
2. Feminine nouns in -ඊ , have alternate vocative forms which are the same as the accusative singular (see 6 above): ගැහැනී or ගැහැනිය 'woman (vocative)'.

8.2 Plural

The vocative plural is formed by adding -ඉ to the accusative plural (which will always end in -න්). If the accusative is one in -අන් there is an optional variant which changes -අන් to -එන් when -ඉ is added. Thus:

Direct Singular		Accusative	Vocative Plural
පුතුයා	son	පුතුයන්	පුතුයනි or පුතුයෙනි
කුමාරයා	prince	කුමාරයන්	කුමාරයනි or කුමාරයෙනි
ගැහැනී	woman	ගැහැනුන්	ගැහැනුනි

8.3 Use

The vocative is used in direct address. The singular vocative has implications of familiarity and the plural is used both in singular and plural senses. When used in the singular sense it indicates respect or politeness.

9. කිසි, කිසිවෙක්

9.1 කිසි preceding a noun has the meaning '(any)... at all, whatsoever'. It is restricted almost entirely to negative sentences and questions, and the noun following is usually in the indefinite:

මෙම පාසැලෙහි අද කිසි ශිෂ්‍යයෙක් නැත.
Today, there is not a single student in this school.

එම වැඩ කිරීමට කිසි කෙනකු ගියේ නැත.
No one at all went to do that work.

කිසි කුමාරියක් එම කුමාරයාට කැමති නොවූවාය.
No princess liked that prince.

මෙම පුස්තකාලයෙහි කිසි පුස්කොළ පොතක් නැත.
There is no ola-leaf manuscript at all in this library.

9.2 කිසිවෙක් and කිසිවක් are animate and inanimate indefinite pronouns formed from කිසි . They have the sense 'anyone at all' and 'anything at all' and are restricted in use in the same way as කිසි .

එම වැඩ කිරීමට කිසිවෙකු ගියේ නැත.
No one at all went to do that work.

මෙම පුස්තකාලයෙහි කිසිවක් නැත.
There is nothing at all in this library.

10. කිසියම් 'SOME...OR OTHER'

කිසියම් is an adjectival form with an indefinite sense like English 'some...(or other)'. It occurs with both animate or inanimate nouns, usually indefinite.

කිසියම් ගැහැනියක් කුඹුරට ගියාය.
Some woman went to the field.

හෙතෙම කිසියම් පොතක් කියවමින් සිටී.
He is reading some book (or other).

11. ව

In both Literary and Colloquial Sinhala ව is added to some adjectives to form an adverb, and is thus roughly an equivalent of English -ly. Thus:

එම අකුරු පැහැදිලිය.
Those letters are clear.

එම ශිෂ්‍යයා පැහැදිලිව අකුරු ලියයි.
That student writes letters clearly.

12. AFRAID THAT, HAPPY THAT

In expressing an emotional state such as fear, apprehension or happiness resulting from something thought or imagined, the latter may be expressed as a quotation with or without any expressed verb of thinking, imagining or saying. Compare the following pairs:

'තම පිරිසට අනතුරක් සිදුවිය හැකි යැ'යි සිතා කුමාරයා බියවූයේය.

or: 'තම පිරිසට අනතුරක් සිදුවිය හැකි යැ'යි කුමාරයා බියවූයේය.

The prince feared that some danger might befall his retinue (i.e. 'Thinking that...he was afraid').

'අලුත් අවුරුද්දට දෙමව්පියන්ගෙන් නොයෙක් තෑගිබෝග ලැබිය හැකි ය'යි සිතමින් කුඩා දරුවෝ සතුටුවෙති.

or: 'අලුත් අවුරුද්දට දෙමව්පියන්ගෙන් නොයෙක් තෑගිබෝග ලැබිය හැකි ය'යි කුඩා දරුවෝ සතුටුවෙති.

Small children are happy that they can get various gifts and presents from the parents on New Year's day.

13. WRITING SYSTEM

In Literary Sinhala ද්‍ව indicates the combination of ද් and ව and is an equivalent of ද්ව.

14. ඇයි AND කවර හෙයින් 'WHY'

'Why' in Literary Sinhala can be expressed by කවර හෙයින් which may or may not be the emphasized item immediately followed by ද :

තී කවර හෙයින් එසේ කෙරුවෙහිද? or තා එසේ කෙරුවේ කවර හෙයින්ද?
Why did you do thus?

Note that the oblique form තා occurs in the second sentence since it is the subject of an emphatic sentence.

'Why' may also be expressed by ඇයි , which is usually the emphasized item immediately followed by ද :

තා එසේ කෙරුවේ ඇයිද?

ඇයි is also used in Colloquial Sinhala, as an alternant for මොකද, but in that variety usually occurs without ද :

ඇයි එහෙම කෙරුවේ?

SUPPLEMENTARY READINGS

1. කුවේණිය පළවාහැරීම

විජයකුමාරයා මුළුලංකාවම අත්පත්කරගත්තේ කුවේණියගේ ආධාරයෙනි. දිවයින ආර්ය ජනපදයක් බවට පත්කිරීමෙන් පසු, කුවේණිය බිසව වශයෙන් තබාගැනීම නුසුදුසු බව විජයගේ පිරිසෙහි ජනයා විජයකුමාරයාට පැවසුවෝය. කුවේණිය විජයගේ බිසව වශයෙන් තබාගැනීම නුසුදුසුයැයි ඔවුන් කිවුවේ, ඇය යක්ෂ ගෝත්‍රයට අයත්වූ නිසා ය. ඇය පළවාහැර, ආර්ය ගෝත්‍රයට අයත් කුමාරිකාවක විවාහ කරගත යුතු බව විජයගේ පිරිසෙහි අය කුමාරයාට කිවුවෝය. කුමාරයාටද තම පිරිසගේ ඉල්ලීමට එකඟවීමට සිදුවූයේය. එහෙයින් හෙතෙම දිනක් කුවේණිය කැඳවා,

"තී යක්ෂ ගෝත්‍රයට අයත් කාන්තාවක් වෙහි. එබැවින් තී මගේ බිසව වශයෙන් සිටීම ගැන මගේ පිරිසෙහි අය විරුද්ධවෙති. එම නිසා දරුවන් දෙදෙනා පමණක් මෙහි නවත්වා තී ඉවත්ව යව"යි ඇයට පැවසුවේය.

"මගේ නෑදෑයන් වන යක්ෂයන් විනාශකිරීමට මම තොපට ආධාර දුනිමි. එහෙයින් මා යක්ෂයන්ගේ අඩවියට ගියහොත් ඔවුහු මා විනාශකර දමති. දැන් කෙසේනම් එහි යම් දැ"යි කුවේණි ඇසුවාය.

"තී බිය නොවව. තීගේ ජීවිතය ආරක්ෂාකිරීම සඳහා මම විධිවිධාන යොදමි යැ"යි විජය කිවුවේය.

එහෙත් එම පොරොන්දුවෙන් කුවේණි සතුටකට පත්නොවූවාය. තම දරුවන් දෙදෙනාද කැටුව, විජයගෙන් වෙන්ව යෑමට ඕ තීරණය කරගත්තාය. මෙසේ තීරණය කොට, දරුවන් දෙදෙනා තමා ළඟට කැඳවා,

"දරුවෙනි, තොපගේ පියා අප අත්හැරදමයි. එහෙයින් අප ඔහුගෙන් වෙන්ව, වෙන පෙදෙසකට යායුතු යැ"යි කිවුවාය.

"එසේනම් අපි කවර පෙදෙසකට යමුද මෑණියෙනි"යි කුවේණියගේ දරුවෝ ඇයගෙන් ඇසුවෝය.

"අපට නැවත අපගේ නෑදෑයින්ගේ නුවරට යාහැකැ"යි කුවේණි පිළිතුරු දුන්නාය.

"අපගේ පියාණන් අපගේ නෑදෑයන් විනාශ කළේ මෑණියන්ගේම ආධාරයෙනි. එසේ හෙයින් කෙසේ නම් අපි බිය නැතිව ඔවුන්ගේ නුවරට යමුදැ"යි කුවේණියගේ පුත්‍රයා ඇසුවේය. නෑයන් වසන පෙදෙසට යාමට තමාද බිය බව කුවේණියගේ දියණිය කිවුවාය.

තම දරුවන්ගේ මෙම වදන් ඇසූ කුවේණිය ඔවුන් අස්වසා, ඔවුන් සමග තම නෑයන් වසන යක්පුරයට යාමට පිටත්වූවාය. ඇයගේ දරුවන් දෙදෙනා ඇය හා ගියේ නොකැමැත්තෙනි. තම නෑයන්ගෙන් මැරුම්කෑමට සිදුවන බව ඔවුන් දැන සිටි හෙයිනි. කුවේණි,

දරුවන්ද කැටුව යක්පුරයට ගොස්, දරුවන් දෙදෙනා නගරයෙන් පිටත නවතා, තොමෝ නුවරට ඇතුල්වූවාය.

නුවරට ඇතුල්වුණු ඇය දුටු යක්ෂයෝ "නැවතත් තී අප විනාශ කරදැමීමට පැමිණියෙහිදැ"යි අසා, කෝපයෙන් ඇයට පහරදී ඇය මරා දැමූවෝය.

කුවේණියගේ මාමා කෙනෙක් වූ එක් යක්ෂයෙක් නුවරින් පිටතට පැමිණ, නුවරින් පිටත සිටි කුවේණියගේ දරුවන් දෙදෙනා දුටුවේය. දැක,

"තොපි කාගේ දරුවෝ වෙහුදැ"යි ඔවුන්ගෙන් ඇසුවේය.

"අපි කුවේණියගේ දරුවෝ වෙමු යැ"යි ඔවුහු පිළිතුරු දුන්නෝය.

"නගරයට ඇතුල් වූ තොපගේ මව යක්ෂයෝ මරා දැමූවෝය. මෙහි සිටියහොත්, කෝප වූ යක්ෂයෝ තොපද මරාදමති. එහෙයින් මින් පලා යව් යැ"යි එම යක්ෂයා පැවසුවේය. ඔහුගේ බස් පිළිගෙන කුවේණියගේ දරුවෝ දෙදෙනා ඉන් පලාගියෝය.

දැනට "වැද්දෝ" යනුවෙන් හැඳින්වෙන මනුෂ්‍ය කොට්ඨාශය මොවුන්ගෙන් පැවතඑන බව වංශකථාවල සහ ජනකථාවල සඳහන්වෙයි.

2. සිංහබාහු

විජයකුමාරයාගේ පියා සිංහබාහු නම් රජකෙනකු බව, මීට පෙර සඳහන් කෙරුවෙමු. මෙම කියවීමෙන් දැක්වෙන්නේ එම සිංහබාහු පිළිබඳ කථා ප්‍රවෘත්තියයි. මෙම කථාප්‍රවෘත්තියද මෙහි දැක්වෙන්නේ ලංකාවේ වංශකථාවල සඳහන්වෙන ආකාරයටයි. එම කථාප්‍රවෘත්තිය මහාවංශයෙහි මෙසේ දැක්වෙයි.

පෙර ඉන්දියාවෙහි වඟුරට වඞ්ගනම් නගරයක් වූයේය. එම රටේ රජතුමාගේ දුව ඉතාමත් රූපත් වූවාය. ඕ නිදහස්ව හැසිරීමට ලොල් වූවාය.

දිනක් ඕතොමෝ මාලිගයෙන් පලාගියාය. මෙසේ යන ඕතොමෝ කරත්තවල බඩුපුරවා වෙළඳාමෙහි යන වෙළඳුන් කණ්ඩායමක් දුටුවාය. එවිට වෙළෙන්දන් පසුපසින් ඕ ගියාය. මෙසේ යන මොවුහු ලාළ නම් රටෙහි එක්තරා වනයකට පැමිණියෝය. එම වනයෙහි සිටි එක් සිංහයෙක් මොවුන් දැක, ඔවුන් ඉදිරියට දුව ආවේය. සිංහයා දුටු වෙළෙන්දෝ බිය වී එතැනින් පලාගියෝය. ඕ තොමෝ පමණක් ඉතිරිවූවාය.

සිංහයා ඇය දැක, ඈ පිළිබඳ සෙනෙහසින් ඇය ඉදිරියට දිව ආවේය. ඕද කිසි බියක් නැතිව සිංහයා ඉදිරියෙහි සිටියාය. සිංහයා ඇය තම පිට උඩ තබාගෙන තමාගේ ගුහාවට ගෙනගියේය. ගෙනගොස් ගල්ගුහාවෙහි තබාගෙන ඇයට කෑම සඳහා පළතුරු ආදිය ගෙනැවිත් දෙමින් ඇය රැකබලාගත්තේය.

ඕතොමෝ ක්‍රමයෙන් දරුවන් දෙදෙනකු වැදුවාය. වැඩිමහල් දරුවා පුතෙක් වූයේය. බාල දරුවා දුවක් වූවාය. පුතාගේ නම "සිංහබාහු" ය. දුවගේ නම "සිංහසීවලී" ය.

ක්‍රමයෙන් සොළොස්වියට පත් වූ සිංහබාහු තම මවගෙන් මෙසේ ඇසුවේය:

"අපගේ පියා ස්වරූපයෙන් අපට වඩා කවරහෙයින් වෙනස්ද?"

සිංහබාහුගේ මවද සියළු පුවෘත්තිය ඔහුට සැළකෙරුවාය.

"එසේ නම් අප මෙතැනින් පලානොයන්නේ ඇයිදැ"යි සිංහබාහු තම මවගෙන් ඇසුවේය.

"තොපගේ පියා මේ ගල්ලෙන, ගල්පියනකින් වසාතබයි. එහෙයින් මින් පලාගිය නොහැකි යැ"යි සිංහබාහුගේ මව පිළිතුරු දුන්නාය.

මෙය ඇසූ සිංහබාහු, ගල්ලෙන වසාතිබුණු ගල්පියන තම බාහුවෙන් තල්ලුකර දමා, තම මව දකුණු බාහුවෙහිද, නැගනිය වම් බාහුවෙහිද තබාගෙන එම ගල්ලෙනින් පලාගියේය. පලාගොස් නැවත වඟුරටට පැමිණ එහි "සිංහපුර" යන නමින් නගරයක් පිහිටුවා එහි රාජ්‍යය ලබාගත්තේය. තමාගේ බිසව වශයෙන් තම නැගනිය වූ සිංහසීවලී කුමරිය පාවාගත්තේය.

මොවුන් දෙදෙනාට දරුවන් තිස්දෙදෙනකු ලැබුණු බවද ඔවුන් අතුරෙන් විජය වැඩිමල් දරුවා වූ බවද වංශකථාවල සඳහන් වෙයි

VOCABULARY FOR SUPPLEMENTARY READINGS

READING 1

අත්පත්කරගන්නවා	bring under one's power/control, take possession of
අත්හැර දමනවා	discard, give up, cast aside
අස්වසනවා	console
ඉල්ලීම	N2 request, demand; pl. ඉල්ලීම් ; stem ඉල්ලුම්
ඉවත්ව යනවා	go away
කැටුව	with, along with (only humans)

Lesson Eight

කැඳවනවා	call a person, summon
කැමැත්ත	N2 wish, desire; no pl.; stem කැමති
කෙසේ නම්	somehow, anyhow, how (on earth!)
කොට්ඨාශය	N2 group, division; pl. කොට්ඨාශ
ගෝත්‍රික	belonging to a clan/tribe
ජනකථාව	N2 fable, folk-tale; pl. ජනකථා
ජීවිතය	N2 life; pl. ජීවිත
තබාගන්නවා	keep (for oneself)
තීරණය කරගන්නවා	decide (for oneself), determine
දැන සිටිනවා	be aware of, know
දියණිය	N5 daughter; pl. දියණියෝ ; stem දියණි
දිවයින	N2 island; pl. දිවයින්
නවතනවා	See නවත්වනවා
නවත්වනවා	stop, cause to stay
නෑයා	N5 relative, kinsman; pl. නෑයෝ ; stem නෑ
නුසුදුසු	not fit, improper
නොකැමැත්ත	dislike
පත්කරනවා	bring to a state of
පහරදෙනවා	hit, beat
පළවාහරිනවා	drive away
පිටත	N3 outside; no pl.; stem පිටත්
පිළිගන්නවා	accept, receive (a person)
පුරය	N2 city; pl. පුර
පොරොන්දුව	N2 promise, pledge; pl. පොරොන්දු
බස (also බහ)	N2 word, saying; pl. and stem බස්
බිය	N2 fear; no pl.; stem බිය
මනුෂ්‍යයා	N5 man, human being; pl. මනුෂ්‍යයෝ ; stem මනුෂ්‍ය

මැරුම් කනවා	get killed
මෑණියෝ	N5 mother (honorific); pl. in form; stem මෑණි
යකා	N5 demon, devil; pl. යක්කු ; stem යක්
යක්පුරය	N2 city of the demons
වදන	N2 word; pl. වදන්
වැද්දා	N5 Vedda; pl. වැද්දෝ ; stem වැදි
විධි විධාන	arrangements (usually plural)
විනාශකර දමනවා	destroy (completely)
විරුද්ධ වෙනවා	disagree, oppose, dislike
විවාහ කරගන්නවා	marry
වෙන්ව යනවා	separate, leave
සේනාව	N2 army, multitude; pl. සේනා

READING 2

ඉතිරිවෙනවා	be left
ඉදිරියට	to the front, forward
ඉදිරියෙහි	in front of
කණ්ඩායම	N2 group, band (of people); pl. කණ්ඩායම්
කථා ප්‍රවෘත්තිය	N2 story; pl. කථා ප්‍රවෘත්ති
කුමරිය	N5 princess; pl. කුමරියෝ ; stem කුමර
ගල් ලෙන	N2 rock-cave; pl. ගල් ලෙන්
ගුහාව	N2 den, cave; pl. ගුහා
ගෙනැවිත් දෙනවා	bring (and give), fetch
තල්ලුකර දමනවා	push (out)
දකුණ	N2 right (side); no pl.; stem දකුණු
දිව එනවා	come running
දුව එනවා	come running

නැඟණිය / නැගණිය	N5 younger sister; pl. නැඟණියෝ ; stem නැඟණි
නිදහස්ව	freely
පාවා ගන්නවා	marry, take possession of
පියන	N2 lid, door; pl. පියන්
පිහිටුවනවා	establish
පුරවනවා	fill
බාහුව	N2 arm; pl. බාහු
මාලිගය	N2 palace; pl. මාලිග
ලොල්වෙනවා	be eager for, desire, crave
වඟු රට	N2/3 Vagu country
වදනවා	give birth to
වම	N2 left (side); no pl.; stem වම්
වසා තබනවා	close, keep closed
විය	N2 age; no pl; stem විය
වෙළඳුන් සමාගම	N2 a group of merchants; pl. වෙළෙඳුන් සමාගම්
වෙළෙන්දා	N5 merchant; pl. වෙළෙන්දෝ ; stem වෙළඳ
සැළ කරනවා	inform
සිංහයා	N5 lion; pl. සිංහයෝ ; stem සිංහ
සෙනෙහස	N2 love, affection; no pl.
සොළස	sixteen; stem සොළොස්
හැසිරෙනවා	behave

LESSON 9

ජාතකකථා

මෙම පාඩමෙන් ජාතක කථා පිළිබඳ කාරණා කිහිපයක් දැක්වීමට බලාපොරොත්තුවෙමු. සිංහල ජාතක පොත ගැන මඳක් විස්තර කිරීමෙන් පසු, එම පොතෙන් එක කථාවක් දක්වමු. අප තෝරාගත් කථාව තරමක් දිගහෙයින් එය එක පාඩමකින් දැක්වීම පහසු නැත. එහෙයින් එය කොටස් දෙකකට බෙදා පාඩම් දෙකකින් දක්වමු.

පළමුවෙන් අපි සිංහල ජාතක පොත යනු කුමක්දැයි ඔබට විස්තර කර දෙමු. සිංහල ජාතක පොත වනාහි වැදගත් බෞද්ධ ග්‍රන්ථයකි. මෙය කුරුණෑගල යුගයේදි, එනම් ක්‍රි: ව: දහහතරවැනි ශතවර්ෂයේදි පමණ, ප්‍රතිරාජදෙව නැමැති ඇමතිවරයා විසින් සකස් කරන ලදි. මෙම පොත පාලිජාතකට්ඨකථා නැමැති පොතෙහි සිංහල පරිවර්තනයයි. පාලිජාතකට්ඨකථාව වූකලි බුද්ධඝෝෂහිමියන් විසින් ලියන ලද එකකි. බුද්ධඝෝෂ ස්වාමින්වහන්සේ මෙම පොත සකස් කෙළේ අනුරාධපුර යුගයෙහිදි ය. එනම් ක්‍රි. ව. පස්වැනි ශතවර්ෂය හරියේදි ය. සිංහල ජාතක පොත "පන්සිය පනස් ජාතක පොත්වහන්සේ" යනුවෙන්ද හැඳින්වෙයි. සාමාන්‍ය කථාව්‍යවහාරයේදි "ජාතකපොත" යනුවෙන්ද සිංහල බෞද්ධයෝ මෙය හඳුන්වති. ජාතක පොතෙහි ඇත්තේ ගෞතම බෝධිසත්ත්වයන්වහන්සේගේ පෙර චරිතකථා ය. නූතන කෙටිකථා බඳු කථාරාශියක්ද මෙහි ඇත. නූගත් ගැමියාට මෙන්ම උගත් විචාරකයාටද ජාතකකථා කියවීමෙන් ලොකු රසයක් විඳිය හැක.

සාමාන්‍ය සිංහල බෞද්ධයා ජාතකපොත කියවීමෙන් එසේ නැතහොත් කිසිවකු කියවනවිට එය ඇසීමෙන් ලොකු සතුටක් ලබයි. ජීවිතය පිළිබඳ ආදර්ශ ලබාගනියි. ජාතකකථා කියවීම මෙන්ම ඇසීමද ඔවුහු පින්කමක් ලෙස සලකති. බෞද්ධ පොත්පත් අතුරින් සාමාන්‍ය බෞද්ධයන් විසින් වඩාත්ම අගයකරනු ලබන පොත වශයෙන් සැලකිය හැක්කේ ජාතක පොතයි.

පහත සඳහන්වන කථාව ජාතක පොතෙන් තෝරාගත්තෙමු. එය "සත්තුභස්තජාතකය" නමින් හැඳින්වෙයි. එම කථාව, ජාතකපොතෙහි එන ස්වරූපයෙන් තරමක් වෙනස්කොට දක්වමු. ජාතකපොතෙහි සිංහල භාෂාව තරමක් අපහසු ය. එහෙයින් මෙම කථාවෙහි ඇතැම් තැන් වෙනස් කෙළෙමු. එසේ වෙනස් කළේ ඔබට එය තේරුම්ගැනීම පහසුවනු පිණිස ය. අප එම කථාවෙහි වෙනස්කළ තැන් මොනවාදැයි, පසුව ඔබට සිංහල ජාතක පොත කියවා දැනගත හැකිවෙයි. දැන් ඔබ කළයුත්තේ අප දක්වන පරිදි එම කථාව කියවීම ය.

සත්තුභස්තජාතකය 1.

පෙර බරණැස් නම් නුවර ජනක නම් රජකෙනෙක් රාජ්‍යය කෙළේය. එසමයෙහි බෝධිසත්ත්වයෝ බමුණු කුලයක ඉපදුණෝය. දෙමව්පියෝ, එතුමාට "සේනක" යැයි නම් තැබුවෝය. කුඩා වියේදි සිටම එතුමා සඥානවන්තයකු ලෙස ප්‍රසිද්ධ වූයේය. එතුමාගේ ප්‍රඥාව ගැන බොහෝදෙනා

පැහැදුණේය. එතුමා දිසාපාමොක් නම් ගුරුතුමා වෙත ගොස් එතුමාගෙන් ශිල්පශාස්ත්‍ර ඉගෙනගත්තේය. ශිල්පශාස්ත්‍ර ඉගෙන රජතුමා කරා අවුත්, රජතුමාට අනුශාසනා කරමින් වාසය කළේය.

එකල කිසියම් මහළු බමුණෙක් සිඟා ඇවිද මසුරන් දහසක් ලැබ වෙනත් බමුණකු වෙත ගොස්, එම මසුරන් දහස ඔහු ළඟ තබා, දුරගමනක් ගියේය. දවස් බොහෝ ගණනක් ගතවුනේය. මසුරන් අයත් බමුණා පැමිණියේ නැත. එහෙයින් මසුරන් තබාගත් බමුණා තම ප්‍රයෝජනය පිණිස ටිකෙන්ටික එම මසුරන් වියදම් කරන්නට පටන්ගත්තේය. ගතවුනේ ටිකදිනකි. මසුරන් සියල්ලම වියදම් වුනේය. මසුරන් අයත් බමුණාගේ ආපසු ඒමක් මසුරන් තබාගත් බමුණා බලාපොරොත්තු වූයේ නැත. හේ මසුරන් සියල්ලම ටිකෙන්ටික වියදම් කෙරුවේ එහෙයිනි. එහෙත් දිනක් හදිසියේම මසුරන් අයත් බමුණා පැමිණියේය. පැමිණ "මගේ මසුරන් දහස දෙව"යි ඉල්ලුවේය. මසුරන් දහස තමා වියදම් කළ හෙයිනුත්, තමා දුප්පත් හෙයිනුත්, දෙන්නට තමා ළඟ මසුරන් නැති හෙයිනුත් ,

" තගේ මසුරන් දහස වියදම් කෙළෙමි. දිමට මා ළඟ මසුරන් නැතැ"යි මසුරන් තබාගත් බමුණා කීවේය.

"මා මසුරන් සොයාගත්තේ කොතරම් වෙහෙසකින්ද? තා එය වියදම් කළේ මන්ද? වහාම මට මසුරන් දෙවැ"යි මහළු බමුණා කෝපයෙන් පැවසුවේය.

"එසේනම් මසුරන් වෙනුවට මගේ දියණිය සරණපාවා ගනුව"යි මසුරන් තබාගත් බමුණා කීවේය. මෙසේ කියා මහළු බමුණාට සරණපාවාදෙන පිණිස, ගේ ඇතුළෙහි සිටි දියණිය තමාවෙත කැඳවූයේය.

එම බමුණාගේ දියණියද බොහෝ රූපත් ය. ඕතොමෝ දෙවඟනක වැනි තරුණියකි. ඇය දුටුවිට බමුණාටද මසුරන් පිළිබඳ සියළු ප්‍රවෘත්තිය අමතක වූයේය. මහත් ප්‍රීතියෙන් එම යෝජනාවට හේ එකඟවූයේය. ඇය සරණපාවාගෙන තමාගේ ගෙදරට පැමිණියේය.

ඒ තරුණ බැමිණි කාමයෙහි ලොල්වූවාය. එහෙයින් ඕ මහළු බමුණාගෙන් සතුටකට නොපැමිණියාය. රහසින් සොරසැමියකු සමග වසන්න[illegible]ටන්ගත්තාය. සොරසැමියා තරුණ බමුණෙක් වූවේය. ඔහු හා සිත් සේ විසීමට තම සැමියා ගෙදර සිටීම බාධාවක් වූයේය. කිසියම් උපායකින් තමාගේ සැමියා ගෙදරින් පිට කළ යුතු යයි ඕ සිතුවාය. මෙසේ සිතූ ඕ, දිනක් අසනීපයකින් මෙන් කෙඳිරිගාමින් ඇඳෙහි වැතිර සිටියාය. මහළු බමුණාද ඇය දුටුවේය. ඇයගේ සැටි දැක, හේ මහත්සේ බියවූයේය. බියවී ඇය වෙත ගොස්,

"සොඳුරිය තිට කවර නම් අසනීපයක් දැ"යි ඇසුවේය.

"බමුණ, මට නිතර කැමිබිම් සැදීමෙනුත්, මෙහෙවර කිරීමෙනුත් වෙහෙසට පැමිණියෙමි. එහෙයින් අසනීපවූයෙමි. ඉදින් තෝ මට ආදරයක් ඇත්තෙහි නම්, වහා මට මෙහෙවර පිණිස කෙල්ලක ගෙනෙවැ"යි කීවාය.

"සොඳුරිය, තී වෙනුවෙන් ඕනෑම දෙයක් කිරීමට මම කැමැත්තෙමි. එහෙත් මෙහෙවරට කෙල්ලක ගෙනඒම සඳහා මා ළඟ මුදල් නැත. එසේ හෙයින් කෙසේ නම්, කෙල්ලක ගෙන එම්දැ"යි මහළු බමුණා කීවේය.

"මෙරට සිඟා ඇවිද මුදල් සොයාගනුව"යි බැමිණිය කෝපයෙන් මෙන් පැවසුවාය. බැමිණිය මෙසේ කියනවිට හේ බියවූයේය. ඔහුට ඊට එකඟවීමට සිදුවූයේය.

"එසේ නම් මට ගමනට උවමනාකරන කෑම සකස්කොට දෙවැ"යි හේ බැමිණියට

පැවසුවේය. [illegible] අග්ගලා [illegible] [illegible] [illegible] දවා බැඳ, එම අග්ගලා කවුනට දී [illegible] පිටත්කළාය.

VOCABULARY

අගය කරනවා	evaluate, consider as valuable
අග්ගලාව	N2 a sweetball made of flour and jaggery; pl. අග්ගලා
අනුරාධපුරය	N2 Anuradhapura (place name)
අනුශාසනා කරනවා	admonish, advise
අමතකවී යනවා	get forgotten (gradually)
ආදර්ශය	N2 moral, model, example; pl. ආදර්ශ
ආපසු	back
ඇඳ	N2 bed, cot; pl. ඇඳන් ; stem ඇඳ
ඉගෙන	past participle of උගන්නවා
ඉදින්	if, now if
උගත්	learned
උවමනා කරනවා	want, require, be necessary
ඔබ	you. See grammar 6.
කථාව්‍යවහාරය	N2 speech, speaking; pl. කථාව්‍යවහාර
කරා	to. See grammar 17.
කාමය	N2 sensual enjoyment, sense pleasures; no pl.;stem කාම
කාරණාව	N2 fact; pl. කාරණා
කුමක්	what. See grammar 11.
කුරුණෑගල	N3 Kuruneyala (place name)
කුරුණෑගල යුගය	N2 Kurunegala-period
කුලය	N2 caste; pl. කුල
කෙටිකථාව	N2 short story; pl. කෙටිකථා
කෙඳිරි ගානවා	whine, cry in pain
කෙල්ල	N5 girl, lass; pl. කෙල්ලෝ ; stem කෙලි
කොතරම්	how much, how. See grammar 11.

ක්‍රි: ව: or ක්‍රි. ව.	abbreviation for ක්‍රිස්තු වර්ෂ (A.D.)
ගණන	N2 number, amount; pl. ගණන්
ගෞතම බෝධිසත්වයෝ	N5 Bodhisatva Gautama
ග්‍රන්ථය	N2 book, text; pl. ග්‍රන්ථ
චරිත කථාව	N2 life-story; pl. චරිත කථා
ජාතක පොත	N2 Jataka text, Jataka book
ඥානවන්තයා	N5 intelligent person; pl. ඥානවන්තයෝ
තරුණි	N5 maiden, young woman; pl. තරුණියෝ ; stem තරුණ
තෝරාගන්නවා	select, choose
දහස	(one) thousand; stem දහස්
දෙවඟන	N5 goddess, fairy; pl. දෙවඟනෝ
නමැති	named. See grammar 19.
නමින්	by name. See grammar 19.
නම් තබනවා	give a name to
නූගත්	not learned, uneducated
නූතන	modern
පසුව	later
පැහැදෙනවා	become convinced, enlighten, become clear
පරිදි	as, like. See grammar 10.
පරිවර්තනය	N2 translation; pl. පරිවර්තන
පිට කරනවා	send out
පිටත් කරනවා	send away
පිණිස	for. See grammar 13.
ප්‍රඥාව	N2 wisdom; no pl.; stem ප්‍රඥා
බඳු	like, similar to. See grammar 10.
බමුණා	N5 Brahmin; pl. බමුණෝ ; stem බමුණු
බලාපොරොත්තුවෙනවා	expect, hope

බැමිණි	N5 Brahmin woman; pl. බැමිණියෝ ; stem බැමිණි
බුද්ධඝෝෂ	Buddhaghoša (one of the greatest Pāli commentators)
බෝධිසත්වයෝ	N5 Bodhisatva, i.e. an aspirant to Buddhahood; pl. only; stem බෝධිසත්ව
භාෂාව	N2 language; pl. භාෂා
මදක් or මඳක්	a little
මන්ද	why. See grammar 11.
මල්ල	N2 bag; pl. මලු
මසුරන්	a gold coin (usually in the plural)
මෙන්	like. See grammar 10.
මෙහෙවර	N2 service, attendance; no pl.
යුගය	N2 period, time, era; pl. යුග
යෝජනාව	N2 proposal; pl. යෝජනා
රාජ්‍යය කරනවා	reign, rule
ලියනවා	write
වනාහි	specifying particle. See grammar 8.
වැතිර සිටිනවා	remain lying
විචාරකයා	N5 critic; pl. විචාරකයෝ ; stem විචාරක
වියදම් කරනවා	spend, expend
වියදම් වෙනවා	get spent, be spent
විසීම	N2 living, residing in; pl. විසීම්
වූකලී	specifying particle. See grammar 8.
වෙත	to. See grammar 17.
වෙහෙස	N2 exertion, effort, hard work, trouble, fatigue; no pl.; stem වෙහෙස
ශතවර්ෂය	N2 century; pl. ශතවර්ෂ
ශාස්ත්‍රය	N2 science; pl. ශාස්ත්‍ර
ශිල්පය	N2 art or technical science; pl. ශිල්ප

Lesson Nine

සකස් කරනවා	arrange, prepare, make
සමය	N2 time, period, era; no pl.; එසමයෙහි at that time
සැටිය	N2 manner, nature; pl. සැටි
සිඟා ඇවිදිනවා	go begging
සිත් සේ	at will, at one's pleasure
සොඳුරි	N5 dear one (feminine), darling (feminine); pl. සොඳුරියෝ ; stem සොඳුරු
සොර සැමියා	N5 paramour; pl. සොර සැමියෝ ; stem සොර සැමි
සොරා	N5 thief, robber, rogue; pl. සොරු ; stem සොර
ස්ත්‍රී	N5 woman; pl. ස්ත්‍රියෝ or ස්ත්‍රීහු ; stem ස්ත්‍රී
ස්වාමින්වහන්සේ	N5 Buddhist monk; pl. ස්වාමින්වහන්සේලා
හරියේදි	around, about

GRAMMAR

1. PAST TENSE OF ලබනවා 'GET, RECEIVE'

1.1 The verb ලබනවා , in addition to the expected regular past tense stem ලැබුවි- , has an irregular past tense stem ලද්- . Past tense forms are made from this stem in two alternate ways:

Alternant 1. The person-number endings are added to ලද්- as follows:

	Singular	Plural
1st Person	ලදිමි	ලදිමු
2nd Person	ලදිහි	ලදහු
3rd Person	ලදී	ලදහ

Alternant 2. The final -ද් of the stem is doubled, and person-number endings are added in the same way as for other past tense verbs (6,1):

		Singular	Plural
1st Person		ලද්දෙමි	ලද්දෙමු
2nd Person		ලද්දෙහි	ලද්දහු (ලද්දහු)
3rd Person	Masc	ලද්දේය	ලද්දෝය
	Fem	ලද්දාය , ලද්දීය	

The regular form and alternants 1 and 2 are used interchangeably.

අපි තෑගි ලැබුවෙමු.
අපි තෑගි ලදිමු. } We received gifts.
අපි තෑගි ලද්දෙමු.

1.2 The emphatic past tense of ලබනවා is either ලැබුවේ or ලද්දේ:

අප ලැබුවේ තෑගිය.
අප ලද්දේ තෑගිය. } It was gifts that we received.

1.3 The past tense verbal adjective nad the regular forms ලැබුව (general) and ලැබූ (pre-nominal). It also nas the irregular form ලද which acts as both a pre-nominal and a general form:

අප ලැබූ දේවල් අප ලද දේවල්	things that we received
අප එම දේවල් ලැබුවහොත් අප එම දේවල් ලදහොත්	if we were to receive those things

2. PAST PASSIVE

The present passive is formed with the passive participle plus either ලබනවා or ලැබෙනවා (4,7). The past passive may be formed by using the regular past tense form of ලබනවා :

Present Passive:	මා විසින් මෙම පොත් කියවනු ලැබෙයි. (ලැබේ.) These books are read by me.
Past Passive:	මා විසින් මෙම පොත් කියවනු ලැබුවේය. These books were read by me.

However, in forming the past passive, it is more customary to use one of the ලද්- alternants of ලබනවා . When one of the ලද්- forms is used the passive participle is replaced by the present tense verbal adjective:

මා විසින් මෙම පොත කියවන ලදි. මා විසින් මෙම පොත කියවන ලද්දේය.	This book has been read by me.

The past tense verbal adjective and emphatic forms from the ලද්- stem are used in passive construction in the expected ways:

අප විසින් කරන ලද්දේ පොත් කියවීමය.
What has been done by us is reading books.

අප විසින් කියවන ලද පොත්
The books that we have read

3. IRREGULAR VERB FORMS

In addition to those irregular verb forms that have been encountered so far, the following irregular alternants for වෙනවා 'be', කරනවා 'do' කියනවා 'say' and ලැබෙනවා 'get, receive' should be noted:

3.1 වෙනවා 'Be'

In addition to the past tense forms with the stem forms වුය්- and වුව්- given in 6.2, there are alternate past tense forms with a stem වුන්- as follows. Note that this form resembles the colloquial form more than the others:

	Singular	Plural
1st Person	වුනෙමි	වුනෙමු
2nd Person	වුනෙහි	වුනාහු
3rd Person Masc	වුනේය	වුනෝය
Fem	වුනාය	

3.2 කරනවා 'Do'

Along with past tense forms with stems කෙරුවි- and කළ- , there are alternate forms with the stem කෙළ-. This stem generally occurs only before endings which begin with -එ or -ඒ . Thus:

කෙළෙමි	I did
කෙළෙමු	we did
කෙළෙහි	you (singular) did
කෙළේය	he did

In the third person plural there is another alternant කොළ-. Thus:

කොළෝය	they did

3.3 කියනවා 'Say'

In addition to the past tense stem කිව්වි- there is an alternant past tense stem කිවි- . Thus:

කිවෙමි	I said
කිවෙහි	you said
කිවේය	he said

The corresponding verbal adjective is කී . Thus:

ඔහු කිවු දේ or ඔහු කී දේ the things he said

3.4 ලැබෙනවා 'Get, Receive'

ලැබෙනවා has, in addition to its regular past participle ලැබී , the alternate form ලැබ . Thus:

ළමයි තැගි ලැබී ප්‍රීති වුනෝය.

or ළමයි තැගි ලැබ ප්‍රීති වුනෝය.

Receiving gifts, the children became happy.

4. QUASI-VERBS ඇති, නැති, හැකි, යුතු

4.1 ඇති, නැති, හැකි and යුතු and their various forms are Quasi-verbs in that each of them has some forms which resemble verb forms in appearance and use, without having all of the forms characteristic of a verb. (නැති is actually නො plus ඇති , and they thus behave alike in virtually all respects.)

The major forms of Quasi-verbs, with their associated uses, are as follows:

1. The Adjectival Form:

Each of the Quasi-verbs has a form which may occur before nouns (like the prenominal verbal adjective forms of verbs) to form the equivalent of an English relative clause. The forms thus used are ඇති, නැති, හැකි and යුතු :

කමලසිරි පුස්තකාලයෙහි ඇති සෑම පොතක්ම කියවයි.
Kamalasiri reads every book that is in the library.

එම කඩයෙහි නැති එළවළු ජාතියක් නැත.
There is no kind of vegetable that is not found in that shop.

ගුණපාල තමාට හැකි සෑම වැඩක්ම සතුටින් කරයි.
Gunapala does cheerfully every kind of work that he can do.

පරීක්ෂණය සඳහා කියවිය යුතු පාඩම් මේ සතියේදී කියවමු.
During this week, we read the lessons that are required (must be read) for the examination.

2. The Simple Form:

The equivalent of a simple form of a verb may be made in two ways:

(a). The adjectival form may be used followed by the predication marker.

(b). A simple form is made by replacing the final vowel of the adjectival forms by -අ , giving ඇත, නැත, හැක, යුත . The assertion marker is not used with these forms.

For ඇති, නැති, හැකි alternative (b) is more commonly used, though (a) is permissable. For යුතු , alternative (a) is almost always used, and the form යුත is archaic and restricted to poetry:

අනුරාධපුරයෙහි පුරාණ සිද්ධස්ථාන ඇත (or ඇති ය.)
There are old shrines (holy-places) in Anuradhapura.

මෙම මලෙහි කිසිම සුවඳක් නැත (or නැති ය. .)
There is no fragrance in this flower.

මේ බස් එකෙන් නුවරට ගිය හැක (or හැකි ය. .)
One can go to Kandy by this bus.

"සිල් රැකිය යුතුය, බණ ඇසිය යුතුය"යි ඇතැමෙක් පවසති.
Some say that "one must observe sil: one must listen to the sermons."

The simple forms given above may be used with animate or inanimate nouns, singular or plural and in any person. However, one may occasionally encounter forms showing agreement for number and person. They are given below so that the student might recognize them if he should meet them. Since they resemble the corresponding verb forms, they generally cause no difficulty. As with verbs, the third person masculine singular forms are used with neuter subjects, either singular or plural.

	Singular	Plural
1st Person	ඇත්තෙමි	ඇත්තෙමු
	නැත්තෙමි	නැත්තෙමු
	හැක්කෙමි	හැක්කෙමු
	යුත්තෙමි	යුත්තෙමු
2nd Person	ඇත්තෙහි	ඇත්තාහු (ඇත්තෙහු)
	නැත්තෙහි	නැත්තාහු (නැත්තෙහු)
	හැක්කෙහි	හැක්කාහු (හැක්කෙහු)
	යුත්තෙහි	යුත්තාහු (යුත්තෙහු)

3rd Person	Masc.	Fem.	
	ඇත්තේය	ඇත්තාය, ඇත්තිය	ඇත්තෝය
	නැත්තේය	නැත්තාය, නැත්තිය	නැත්තෝය
	හැක්කේය	හැක්කාය	හැක්කෝය
	යුත්තේය	යුත්තාය, යුත්තිය	යුත්තෝය

3. Emphatic Form:

Emphatic forms for the Quasi-verbs are made by dropping the final vowel, doubling the resultant final consonant and adding -ඒ giving the forms: ඇත්තේ, නැත්තේ, හැක්කේ and යුත්තේ. These are used like the emphatic forms of verbs:

> මා ළඟ ඇත්තේ නවකථා පමණය.
> It is only novels that I have.
>
> මෙම සෙල්ලිපියෙහි නැත්තේ රජතුමාගේ නමය.
> It is the name of the king that is lacking in this inscription.
>
> විනෝද විය හැක්කේ නටන විටය.
> It is while dancing that one can enjoy himself.

ඔබ කියවිය යුත්තේ මෙම පොත් නොවේ.
It is not these books that you must read.

4. Participial forms: The participial forms ඇතිව and නැතිව have been given in Lesson 8, 5.2. හැකි has a parallel form හැකිව , used in a similar way.

අසනීපවූ හෙයින් වැඩ කළ නොහැකිව බණ්ඩා ගෙදර ගියේය.
Banda, unable to work because he was ill, went home.

The form යුතුව exists, but it is restricted almost entirely to a special construction to be given later.

4.2 Summary: The forms of the Quasi-verbs given above (except for the forms showing number agreement) are summarized in the following table:

Adjectival	ඇති	නැති	හැකි	යුතු
Simple	ඇත, ඇතිය	නැත, නැතිය	හැක, හැකිය	(යුත), යුතුය
Emphatic	ඇත්තේ	නැත්තේ	හැක්කේ	යුත්තේ
Participial	ඇතිව	නැතිව	හැකිව	(යුතුව)

4.3 ආදරයක් ඇති

The phrase ආදරයක් ඇති 'to have love/affection for' can take a subject in the nominative case, with which it agrees. The object of the affection is in the dative case. ඇති takes its usual endings:

"මම තිට ආදරයක් ඇත්තෙමි" යි බමුණා කීවේය.
'I have affection for you,' the brahmin said.

5. කැමති

5.1 As in Colloquial Sinhala, කැමති 'like', takes the equivalent of the English object in the dative case, but with verbs, it may take the passive participle in Literary Sinhala. The form කැමති (or, rarely කැමැති), with the predication marker, forms simple sentences:

මම එම සිංහල පොත්වලට කැමතිය.
I like those Sinhala books.

හේ වඩුවැඩ කරනු කැමතිය.
He likes to do carpentry.

කැමති also serves as an adjectival form:

ඔහු කැමති පොත් මම ද කියවමි.
I also read the books he likes.

5.2 In Literary Sinhala, කැමති also has many of the forms of a Quasi-verb like ඇති, such as the following set showing person-number agreement (note the change of vowels in the stem).

	Singular	Plural
1st person	කැමැත්තෙමි	කැමැත්තෙමු
2nd person	කැමැත්තෙහි	කැමැත්තෙහු කැමැත්තහු කැමැත්තාහු
3rd person masc	කැමැත්තේය	කැමැත්තෝය, කැමැත්තාහ
fem	කැමැත්තිය	

මම මෙම වැඩ කරනු කැමත්තෙමි.
I like to do this work.

ඕතොමෝ සිංහල පොත් කියවනු කැමැත්තිය.
She likes to read Sinhala books.

5.3 There is an emphatic form කැමැත්තේ, but in modern writing, simple කැමැති is usually used. Thus:

ඔහු කරනු කැමැත්තේ වඩුවැඩය.

or, more commonly,

ඔහු කරනු කැමති වඩුවැඩය.
It is carpentry he likes to do.

5.4 There is also an adverbial form කැමතිව,

එම යෝජනාවට කැමතිව බමුණා මිනිසාට මසුරන් දුන්නේ ය.
Liking that scheme, the brahman gave the money to the man.

6. SECOND PERSON PRONOUN ඔබ

The second person pronoun ඔබ is both polite and relatively noncommittal with regard to the relative status of the addressee, and is thus the pronoun most commonly employed in letters, whether business or personal, in modern Sinhala. Its case forms are as follows (Note that there is no distinction between the Nominative and Accusative, and that there are alternate genitive and instrumental case forms):

Nominative	ඔබ
Accusative	
Dative	ඔබට
Genitive	ඔබගේ, ඔබේ
Instrumental	ඔබගෙන්, ඔබෙන්

ඔබ may be either singular or plural in meaning without change in form, although a plural in -ලා is sometimes met with. ඔබ, whether it is singular or plural in meaning, is commonly treated like a third person plural with regard to agreement, taking the appropriate form of the verb:

> ඔබ වැඩ කරති.
> You (singular or plural) work.
>
> ඔබ ගිය සතියේ සීගිරිය බැලීම සඳහා ගියෝය.
> You (singular or plural) went to see Sigiriya last week.

However, some modern authors use ඔබ with second person agreement, either singular or plural depending on meaning:

> ඔබ ජාතකකථා කියවති.
> You (singular) read Jataka stories.
>
> ඔබ නටමින් විනෝද වෙහු.
> You (plural) enjoy dancing.
>
> ඔබ ගිය අවුරුද්දේ වෙසක් සැරසිලි බැලීමට ගියෙහි.
> Last year you (singular) went to see the Vesak decorations.

In an imperative sentence with ඔබ, the familiar imperative form of the verb (8,2.3) either singular or plural may be used. But it is more polite to express imperatives indirectly by using යුතු :

> ඔබ විසින් මේ පාඩම කියවිය යුතුය.
> You must read this lesson.

7. යනු

යනු like යන (2,10) and යනුවෙන් (3,7) is used in naming and specifying. As noted earlier, යන is adjectival, whereas යනුවෙන් is adverbial and is used with verbs. යනු is nominal and is most commonly used following the subject of an equational sentence, in which the predicate attribute is a definition, an explanation, or an interrogative requiring a definition or explanation.

'සංවර්ධනය' යනු දියුණුකිරීමයි.
'Samvardhanaya' means development.

'බුද්ධාගම' යනු බෞද්ධයන් විසින් අදහනු ලබනු ආගමයි.
'Buddhāgama' is the religion practiced by Buddhists.

'සාහිත්‍යය' යනු කුමක්ද?
What is 'Sāhityaya'?

8. SPECIFYING EMPHATICS වූකලී AND වනාහි

වූකලී and වනාහි are used in equational sentences which define or specify, following the thing specified and serving to emphasize it. Roughly, they have the meaning 'to be sure', but generally do not show up in English translation:

ජාතක පොත වූකලී වැදගත් බෞද්ධ ග්‍රන්ථයකි.
The Jataka text is an important Buddhist text.

ලංකාව වනාහි කුඩා දිවයිනකි.
Sri Lanka is a small island.

One Colloquial equivalent for වූකලී and වනාහි is නම් 'of course', (C.S. 18,9.2) and this is also met with in Literary Sinhala:

ලංකාව නම් කුඩා දිවයිනකි.
Sri Lanka is a small island.

9. උවමනා 'NECESSARY'

The adjective උවමනා 'necessary' is a formal equivalent of Colloquial ඕන and like it is used with the equivalent of the English subject in the dative case in the sense 'want, need'. In simple sentences it takes the predication marker in Literary Sinhala.

මට එම මසුරන් උවමනාය.
I need those gold coins.

ඔබට කෑම උවමනාද?
Do you need food?

උවමනා කරන, like its Colloquial equivalent ඕන කරන (C.S. 25), is used adjectivally with the sense '(become) necessary'.

ගමනට උවමනා කරන කෑම දෙව.
Give me the food necessary for the journey.

10. LIKE, AS

In Literary Sinhala, the equivalent of English comparisons with 'like' or 'as' are usually expressed with the postpositions වැනි and මෙන් , but these differ in their use, and each has alternates in specific constructions.

10.1 In adjectival constructions such as 'as a man like a king', වැනි is used and takes an object in the accusative:

දෙවඟනක වැනි කුමරියක දැක....
Seeing a goddess-like princess...

යක්ෂයකු වැනි මිනිසෙක්...
A man like a devil...

මුහුදු වැනි විශාල වැව්...
Big tanks like seas...

In this usage, බඳු may substitute for වැනි :

දෙවඟනක බඳු කුමරියක දැක...
Seeing a goddess-like princess...

යක්ෂයකු බඳු මිනිසෙක්...
A man like a devil...

මුහුදු බඳු විශාල වැව්...
Big tanks like seas...

10.2 In the equivalent of English adverbial prepositional phrases with 'like', such as 'he speaks like a villager,' 'she is beautiful like a goddess', මෙන් , may be used but not වැනි . The object of මෙන් will be in the accusative case.

හෙතෙම ගැමියකු මෙන් කථා කරයි.
He speaks like a villager.

එම රටෙහි උගත්තු කුමාරයින් මෙන් ජීවත් වෙති.
In that country, scholars live like princes.

ඕ තොමෝ දෙවඟනක මෙන් රූපත් ය.
She is beautiful like a goddess.

ග්‍රීෂ්මකාලයේදී අව්ව ගින්දර මෙන් සැරය.
In summer the sun is hot like fire.

In this usage, සේ or ලෙස may substitute for මෙන් :

හෙතෙම ගැමියකු සේ (or ලෙස) කථා කරයි.
He talks like a villager.

ඕතොමෝ දෙවඟනක සේ (or ලෙස) රූපත්ය.
She is beautiful like a goddess.

10.3 මෙන් may also be used to express a direct comparison like that indicated by English '(as)...as'. The two items being compared will normally be in the same case as required by the construction. However, where the thing being compared is in the nominative, the object of මෙන් will be in the accusative, since postpositions never take the nominative case:

ගුණපාල සිරිපාල මෙන් උගත් නැත.
Gunapala is not (as) educated as Siripala.

ඉගැනීම නිදාගැනීම මෙන් පහසු නැත.
Learning is not (as) easy as sleeping.

In this construction also, සේ or ලෙස may substitute for මෙන් if the object of මෙන් is in the accusative:

ගුණපාල සිරිපාල සේ (or ලෙස) උගත් නැත.
Gunapala is not (as) educated as Siripala.

ඉගැනීම නිදාගැනීම සේ (or ලෙස) පහසු නැත.
Learning is not (as) easy as sleeping.

10.4 The equivalent of English 'X as well as Y' may be expressed by X මෙන්(ම) Y ද (or ත්). The emphatic ම virtually always follows මෙන් in this construction. Both forms will be in the case required by the construction, except that the object of මෙන් will again be in the accusative where some other oblique case is not required. Note that the order of items compared is the reverse of that in English:

නූගත් ගැමියාට මෙන්ම උගත් විචාරකයාට ද ජාතකකථාවලින් රසයක් විඳිය හැක.
The educated critic as well as the uneducated villager can experience joy by reading Jataka stories.

පොහොසත් මිනිසුන් මෙන්ම දුප්පත් මිනිස්සුද එම ගමෙහි ජීවත් වෙති.
In that village live poor people as well as rich.

10.5 In the equivalent of English 'as if' plus a prepositional phrase, such as 'as if in sickness, as if from fear,' Literary Sinhala uses මෙන් with a noun in the appropriate case.

ඕ අසනීපයකින් මෙන් කෙඳිරි ගෑවාය.
She moaned as if in sickness.

හේ බියෙන් මෙන් මෙසේ පිළිතුරු දුන්නේය.
He replied thus as if in fear.

10.6 For all of the comparisons in 10.1 through 10.5 above Colloquial Sinhala has වගේ .

ඔබ එහි ගියේ මන්ද?
or ඔබ එහි ගියේ කවර හෙයින්ද?
Why did you go there?

Like ඇයි , මන් virtually always occurs immediately followed by the question marker ද after an emphatic verb. කවර හෙයින් , however, is sometimes found separated from ද . Thus one may find:

කවරහෙයින් ඔබ එහි ගියේද?
or ඔබ කවරහෙයින් එහි ගියේද?
or ඔබ එහි කවරහෙයින් ගියේද?
besides ඔබ එහි ගියේ කවර හෙයින්ද?

But only ඔබ එහි ගියේ මන්ද?
or ඔබ එහි ගියේ ඇයිද?
Why did you go there?

12. විට

12.1 The Literary Sinhala equivalent for the Colloquial කොට which forms the present temporal gerund (C.S. 8,6) is විට . Like කොට , විට follows the present tense verbal adjective.

බමුණා මෙසේ පවසන විට බැමිණි ඉවතට ගියාය.
When the Brahmin said this, the Brahmin woman went away.

12.2 Unlike Colloquial කොට , however, විට may be used with the past tense verbal adjective in either the prenominal or the general form. So used they form the equivalent of Colloquial past temporal gerunds(-ආම form: C.S. 21,16) and indicate action prior to that of the main verb:

කොළඹ ආවිට මම ඔබ දැකිමට එමි.
When I go to Colombo I will see you.

13. සඳහා AND පිණිස

පිණිස is an alternate for සඳහා 'for' (3,4.6). With nouns they generally have the sense 'for (the sake of)':

දෙමව්පියෝ දරුවන්ගේ දියුණුව සඳහා (or පිණිස) වැඩකරති.
The parents work for the welfare of their children.

They also appear with verbs in either a verbal noun or the passive participle form, and then generally have the sense 'in order to' or so that':

විජය කුමාරයාගේ පිරිසෙහි සියලුදෙනාම දිය ගෙන ඒම සඳහා (or පිණිස) ගියේය.
Every one of the retinue of Prince Vijaya went to fetch water.

ගොවියෝ සී සානු සඳහා (or පිණිස) කුඹුරට යති.
Farmers go to the field in order to plow.

පිණිස but not සඳහා , may appear with the verb in the present tense verbal adjective as an alternative to the preceding construction.

ගොවියෝ වැඩකරන පිණිස කුඹුරට යති.
The farmers go to the field to work.

14. SHORT FORMS OF එම AND මෙම

Previously එම and මෙම were given as the Literary equivalents of ඒ and මේ . In Literary Sinhala they may also appear in the short alternate form එ and මෙ when they modify nouns. Although the short forms may appear before any noun, they are most common before certain nouns particularly in frequent adverbial expressions such as එරට 'in that country' මෙරට 'in this country', එකල 'at that time', මෙකල 'at this time', etc.

එ and මෙ also occur before postpositions like වැනි , බඳු , ලෙස, සේ , පරිදි etc. to form adjectival or adverbial expressions with the functions and meanings that one would expect from the postpositions involved. Thus:

එ බඳු	මෙ බඳු
එ වැනි	මෙ වැනි
එ සේ	මෙ සේ
එ ලෙස	මෙ ලෙස
එ පරිදි	මෙ පරිදි

මෙබඳු වැඩ නොකරව.
Don't do work of this type.

එවැනි කෙනකු දැකීම අපහසු ය.
It is difficult to see such a person.

මම මෙසේ පවසමි.
I say thus (like this).

ගුරුවරුන්ට එසේ නොකියව.
Don't speak like that to (your) teachers.

The postposition මෙන්(ම) 'like' occurs only with එ giving එමෙන් and the special meaning 'similarly.'

එමෙන්ම, මෙම වැඩද වැදගත් ය.
Similarly, this work is also important.

මෙ and එ are used with විට (Section 10 above) to form මෙවිට 'now, at this time' and එවිට 'then, at that time'. The latter is a Literary equivalent for Colloquial එතකොට .

වැසි වසින්නට පටන්ගත්තේය. එවිට වැඩකරමින් සිටි ගොවියෝ ගෙවල්වලට ගියෝය.
It started raining. Then the farmers who were working in the fields went (to their) home(s).

මෙවිට කුමාරයා කුමරියට මෙසේ පැවසුවේය.
Now (at this point) the prince said thus to the princess.

They also occur with පමණ to form මෙපමණ 'this much' and එපමණ 'that much', equivalents of Colloquial මෙච්චර and එච්චර .

එම ගමෙහි එපමණ වී ගොවිතැන් නොකරති.
They do not do that much rice cultivation in that village.

15. WRITING SYSTEM

15.1 The symbol ඤ represents the palatal nasal ñ (5,9.1).

ඤාණවන්ත	ñānavanta	wise
රතිඤ්ඤා	ratiññā	firecrackers
පිපිඤ්ඤා	pipiññā	cucumber
පඤ්ච (or පංච)	pañca	five (Sanskrit)

15.2 The symbol ඥ stands for the consonant combination jñ. In reading this is usually pronounced as gñ or sometimes kñ.

අඥ	ajña	ignorant
ප්‍රඥාව	prajñāva	wisdom

15.3 When the symbol generally used for the half-nasal ɾ is added to ධ dh or ඨ ṭh, the resulting symbols ද්ධ and ට්ඨ stand for ddh and ṭṭh, respectively. Thus:

බෞද්ධ	or	බෞද්‍ධ	or	බෞද්ධ	bauddha	Buddhist
අට්ඨ	or	අට්‍ඨ	or	අට්ඨ	aṭṭha	meaning

15.4 The letters ක , ත , and න may be added in a slightly altered form directly to ව giving ක්‍ව kv, ත්‍ව tv and න්‍ව nv, which are thus alternants for ක්ව , ත්ව , and න්ව respectively.

පක්ව	or	පක්‍ව	pakva	ripe, cooked
සත්ව	or	සත්‍ව	satva	living being
අන්වය	or	අන්‍වය	anvaya	order

16. එ AND ඔ IN SANSKRIT BORROWINGS

Modern formal Sinhala contains many words taken directly from Sanskrit. These are generally transliterated directly into Sinhala without any change except for the addition of endings necessary to make them fit the Sinhala inflectional system. However, Sanskrit had no distinction between the long and short form of the vowels එ and ඔ. These vowels were written without length but were considered to be always long. When words containing them are borrowed into Sinhala they may be written either short or long and the student should thus be prepared to encounter variations in spelling such as the following:

දෙශීය	or	දේශීය	indigenous
ඝොෂාව	or	ඝෝෂාව	noise
බොධිසත්ව	or	බෝධිසත්ව	Bodhisatva

When reading such words aloud, an educated speaker who recognizes the words as Sanskrit borrowings will generally read the vowels concerned as long regardless of how they are written.

17. වෙත AND කරා

The postpositions වෙත and කරා have the sense 'to, towards' when used with verbs of motion. A dependent noun is in the accusative case.

ශිෂ්‍යයෝ ගුරුවරුන් වෙත යති.

ශිෂ්‍යයෝ ගුරුවරුන් කරා යති.
The students go to the teachers.

ගොවීයෝ කුඹුරු වෙත යති.

ගොවීයෝ කුඹුරු කරා යති.
The farmers go towards the fields.

In Colloquial Sinhala, motion to a person or persons must be expressed using ළඟට rather than a dative case noun (C. S. 10,10). වෙත and කරා serve as Literary equivalents for ළඟට. Thus they are most commonly used with animate nouns as in the first example above, and examples like the second are less frequent.

18. MANNER CLAUSES

Clauses or phrases of manner may be formed with පරිදි, ලෙස or සේ following a verbal adjective or an ordinary adjective.

පරිදි
ප්‍රයෝජනවත් ලෙස } වැඩ කළ යුතුය.
සේ
Work must be done in a useful manner.

පරිදි
අප දක්වන සේ } මෙය කියවිය යුතුය.
ලෙස
One must read this as we indicate.

The Colloquial equivalent of these clauses uses හැටියට or විදියට . Thus:

ප්‍රයෝජනවත් විදියට වැඩ කරන්න.
Work in a useful manner.

අප කියන හැටියට මේ වැඩ කරන්න.
Do this work as we say.

19. නමැති AND නමින් 'NAMED, CALLED'

නමැති (or නැමැති) and නමින් are used in naming expressions. නමැති (or නැමැති) is adjectival and used like යන (3,7) or නම් (6,4). නමින් is adverbial and used like යනුවෙන් (3,7).

විමල් නමැති
නැමැති } ශිෂ්‍යයා...

The student named Wimal...

ජාතකට්ඨ කථා නමැති
නැමැති } පොත ....

The book entitled Jātakatthakatha...

එම ශිෂ්‍යයා සිරිල් නමින් හැඳින්වෙයි.
That student is known as Siril.

20. එනම්

එනම් is used like English 'that is, i.e.', or 'specifically' to further specify something which has gone before, either in its own sentence or the one immediately preceding.

මෙම පොත සකස්කළේ අනුරාධපුර සමයෙහිදී ය. එනම් ක්‍රි. ව. පස්වැනි ශත වර්ෂය හරියේදී ය.
This book was done during the Anuradhapura period. That is, around the 5th century A.D.

සිංහල ජාතක පොත - එනම් පාලි ජාතක පොතෙහි සිංහල පරිවර්තනය -, කුරුණෑගල යුගයේදී - එනම් ක්‍රි.ව. දහහතරවැනි ශතවර්ෂයේදී සකස් කර ලදී.
The Sinhala Jataka book, *i.e.* the Sinhala translation of the Pali Jataka book, was done during the Kurunegala period, *i.e.* in the 14th century A.D.

Note that hyphens or a combination of hyphens and commas are frequently used to set off එනම් phrases as in the last example above.

21. වෙනුවට AND වෙනුවෙන්

The postposition වෙනුවෙන් has the sense 'for, on behalf of'. වෙනුවට means 'for, in place of, instead of' (C. S. 33,9):

ඔහු නවකතාවෙනුවට කෙටිකතා කියවයි.
He reads short stories instead of novels.

ඔහු වෙනුවෙන් මම එය කරමි.
I will do that on his behalf.

22. In Literary Sinhala, plural nouns may be used with singular meaning to show high respect. Such honorific plurals take a plural verb:

බොධිසත්වයෝ මෙසේ කිවෝය.
The Bodhisatva said thus.

SUPPLEMENTARY READINGS

මෙම අතිරේක කියවීම්වලින් දැක්වෙන්නේ උම්මග්ගජාතකය නමැති පොතෙන් තෝරාගත් කථා දෙකකි.

උම්මග්ගජාතකය වනාහි කුරුණෑගල යුගයේදී ලියනලද ග්‍රන්ථයකි. එහි ප්‍රධාන චරිතය වශයෙන් දැක්වෙන්නේ මහෞෂධ නම් පඬිවරයකුගේ චරිතයයි. මෙතුමා බොධිසත්ව කෙනකු වශයෙන් හැඳින්වෙයි. එතුමාගේ සියුම්නුවණ අනාවරණය කරන කථාරාශියක්ම උම්මග්ගජාතකයෙහි ඇත. එබඳු කථා දෙකක් පහත දක්වමු.

1. පුත්‍රප්‍රශ්නය

එක් ස්ත්‍රියක් පුතකු වඩාගෙන, මහෞෂධ පණ්ඩිතයන් සෑද වූ පොකුණට ගොස්, පළමුවෙන් තම පුතා නාවා, ඔහු පසෙක හිඳුවා, පසුව තොමෝ නාන පිණිස පොකුණට බැස්සාය. ඈ නානු සඳහා පොකුණට බැස්සවිටම, එක්තරා යකින්නියක් ඇයගේ දරුවා දැක, කෙසේ හෝ ඔහු පැහැරගෙන ගොස් කන්නට සිතා, ගැනු වෙසක් මවාගෙන, එම දරුවා සිටිතැනට අවුත්,

"මේ දරුවා ඉතාමත් සුරතල් ය. මොහු ඔබගේ පුතෙක්දැ"යි එම දරුවාගේ මවගෙන් ඇසුවාය.

"ඔව්, මේ මාගේ දරුවා යැ"යි මව පිළිතුරු දුන්නාය.

"මේ දරුවා මඳක් වඩාගෙන සුරතල් කරන්නට මට ඉඩදිය හැකිදැ"යි යකින්නි ඇසුවාය.

"හොඳයි. වඩාගනුවැ"යි දරුවාගේ මව කීවාය. එවිට, යකින්නිය එම දරුවා වඩාගෙන මඳක් සුරතල්කොට, ඇරගෙන පලාගියාය.

මෙය දුටු දරුවාගේ මව, ඇය පසුපසින් දිව්වාය. එසේ දිවගොස් යකින්නිය අල්වාගෙන,

"තී මගේ දරුවා කොහේ ගෙන යහිදැ"යි කෝපයෙන් ඇසුවාය.

"තිට කවර නම් දරුවෙක්ද? මේ මගේ පුතා යැ"යි යකින්නි බිය නැතිව කීවාය.

එම දරුවාගේ මව සහ යකින්නිය මෙසේ කලහකරමින් මහෞෂධ පණ්ඩිතයන්ගේ විනිශ්චයශාලාව අසලින් ගියෝය. ඔවුන්ගේ කලහශබ්දය ඇසුණු මහෞෂධ පණ්ඩිතයන්ගේ පිරිසෙහි අය ඒ බව පණ්ඩිතයන්ට සැළකළෝය. ඒ කුමක්දැ"යි බලන්නට පඬිතුමා පිරිසට කීවේය. පිරිසෙහි අය, කලහකරමින් යන ගැහැනුන් දෙදෙනා දැක, එම ප්‍රවෘත්තිය පඬිවරයාට දැන්වුවෝය.

ඔවුන් තමාවෙත කැඳවන්නට මහෞෂධ පඬිතුමා පිරිසෙහි අයට කීවේය. පඬිවරයා කීලෙස ඔවුහු කළෝය.

මහෞෂධ පඬිතුමා එම ගැහැණුන් දෙන්නාම තමා ළඟට ගෙන්වා,

"තොපගේ මේ කලහය කුමක්දැ"යි ඇසුවේය.

"පණ්ඩිතයෙනි, මේ ස්ත්‍රිය මගේ දරුවා පැහැරගත්තා යැ"යි යකින්නි කීවාය.

"නැත ස්වාමීනි, මේ මගේ දරුවා ය. මේ ස්ත්‍රිය දරුවා වඩාගන්නට යැයි ඉල්වාගෙන, ඔහු ඇරගෙන පලාගියා යැ"යි දරුවාගේ මව කීවාය.

පඬිවරයා එම ප්‍රවෘත්තිය වටහාගෙන,

'තෙපි මා කියන දේ කරහු දැ"යි ඇසුවේය.

"එසේ ය ස්වාමීනි"යි දෙදෙනාම කීවෝය.

එසේ ඔවුන් කී විට මහෞෂධ පඬිතුමා තම පිරිසෙන් කෙනකුට බිම ඉරක් අඳින්නට කියා, ඒ ඉර මැද දරුවා තබා,

"තී දරුවාගේ දෑත ගනුවැ"යි යකින්නියටද,

"තී දරුවාගේ දෙපය ගනුවැ"යි දරුවාගේ මවටද කීවේය. ඔවුන් දෙදෙනා එසේ ගත්විට,

"තොපි දෙදෙනා දරුවා දෙපසට අදිවු. දරුවා ඇදගත් ගැහැණියට දරුවා හිමිවේයැ"යි කීවේය.

දෙදෙනාම දරුවා ඇද්දෝය. මෙසේ අදිනවිට, දරුවාට වේදනා සිදුවන බව දැනගත් දරුවාගේ මව, ඔහු අතහැර හඬන්නට පටන්ගත්තාය.

ඒ කාරනයෙන්, "දරුවාගේ මව මේ ස්ත්‍රිය යැ"යි පඬිතුමා විනිශ්චය කොට, හඬමින් සිටි ස්ත්‍රියට දරුවා බාරදී,

"තී කවුදැ"යි යකින්නියගෙන් ඇසුවේය.

"යකින්නියක් වෙමි ස්වාමීනි"යි ඕ පිළිතුරු දුන්නාය.

එවිට මහෞෂධ පඬිතුමා, ඇගේ ක්‍රියාවෙහි දෝස් දක්වා ඇයට අවවාද කොට ඇය පිටත්කෙළේය.

2. කාලගෝළ ප්‍රශ්නය

"කාලගෝළ" යන නමින් හැඳින්වුන එක් මිනිසෙක් වුවේය. ඔහුට "දික්තල" නම් භාර්යාවක් වූවාය. ඕ බොහෝ රූපත් ස්ත්‍රියක් වූවාය.

දිනක් කාලගෝළ, දික්තල කැඳවා,

"සොඳුරිය, දෙමව්පියන් බැලීමට යාමට ආසා ඇත්තෙමි. ඒ සඳහා කැවුම්පෙවුම් ආදිය සකස් කරවැ"යි කීවේය.

"මවුපියන් බැලීමට යාමෙන් ඇති ප්‍රයෝජනය කුමක්දැ"යි කියා, ඕ තම සැමියාගේ ඉල්ලීම ප්‍රතික්ෂේපකළාය.

නැවතත් තිපවරක්ම ඇයට මෙසේ කියා, එම ගමන සඳහා හෙතෙම ඇගේ කැමැත්ත ලබාගත්තේය. ඇගේ කැමැත්ත ලැබ, කැවුම්පෙවුම් ආදියද සකස්කරවාගෙන, ගමනට අවශ්‍යවන දේද රැගෙන, කාලගෝළ තමාගේ බිරිඳ සමග මව්පියන් බැලීමට යාම සඳහා

පිටත්වුයේය. මෙසේ යන ඔව්හු අතරමඟදී දියපිරුණු ගඟක් දුටුවෝය. දියෙහි ගැඹුර නොදැන සිටි ඔවුහු ගඟට බැස එතරවී යාමට බියවුවෝය. එසේ හෙයින් එම ගඟින් එතෙරට යා නොහැකිව ගංතෙරට වී සිටියෝය.

එවේලෙහි, ගංතෙර ඇවිදිමින් සිටි "දික්පිටියා" නම් වු එක් මිනිසෙක් මොවුන් දැක්කේය. දැක, ඔවුන් දෙදෙනා සිටි තැනට පැමිනියේය. ඔවුන් වෙත පැමිනි දික්පිටියා දැක,

"මිත්‍රය , මේ ගඟ බොහෝ ගැඹුරුද නැද්දැ"යි ඔහුගෙන් කාලගෝළ ඇසුවේය.

ගඟට බැසීමට ඔවුන් බිය වු බව සිතාගත් දික්පිටියා ඔවුන් රවටන අදහසින්

"යහළුව, මේ ගඟ නම් ඉතා ගැඹුරු ය. කිඹුලුන්ගෙන්ද ගහන යැ"යි කීවේය.

එවිට, "එසේ නම් මිත්‍රය , ඔබ එතරවන්නේ කෙසේදැ"යි කාලගෝළ ඇසුවේය.

"මෙම ගඟෙහි දිනපතාම ගොස් මට පුරුදු ය. කිඹුලුන් ඇති නැති තැන් මම හොඳින් දනිමි. එහෙයින් ගඟින් යෑමට මගේ බියක් නැතැ"යි දික්පිටියා පිළිතුරු දුන්නේය.

එය ඇසූ කාලගෝළ "මිත්‍රය, එසේ නම් අප දෙදෙනාද මෙම ගඟින් එතර කළහැකිදැ"යි දික්පිටියාගෙන් ඇසුවේය.

"මිත්‍රය, එය ඉතා පහසු යැ"යි පිළිතුරු දුන් හෙතෙම, "තොප දෙදෙනාගෙන් කවරකු පළමුවෙන් ගෙනයායුතුදැ"යි තවදුරටත් ඇසුවේය.

"මේ මගේ අඹුව පළමුව ගෙනයව. පසුව මා ගෙනයවැ"යි කාලගෝළ කීවේය. දික්පිටියාද "යහපතැ"යි කියා, දික්තල කර හිඳුවාගෙන, කැවුම් ආදියත් අරගෙන, ගඟට බැස , මඳක් දුර ගොස්, එතැන් සිට දණ නවාගෙන දණින් ගියේය. ගංතෙර සිටි කාලගෝළ , "මේ ගඟ නම් ඉතා ගැඹුරු විය යුතුය. මෙතරම් උස මිනිසාටත් මේ දිය මෙතරම් ගැඹුරු නම්, මා වැනි කෙනෙකුට එය කෙතරම් ගැඹුරු විය යුතු දැ"යි සලකමින් තවතවත් බියවුයේය.

දික්පිටියා, දික්තල ගඟ මැදට ගෙණගොස්, "සොඳුරිය, මම ඔබ රැකබලාගනිමි. හැඳපැළඳ කැමති ලෙස සැරසී, සැපසේ මගේ ගෙහි වාසයකරව. ඔබට මේ අඟුටුමිට්ටියාගෙන් කවර නම් සැපතක්ද? මා කියන දේ පිළිගනුවැ"යි කීවේය.

එම බස් ඇසූ මොහොතෙහිම, තම සැමියා වු කාලගෝළ පිළිබඳ සෙනෙහය අත්හැර, දික්පිටියා පිළිබඳව ඇති වු ස්නේහ ඇතිව,

"ඉදින් මා අත්නොහරින බවට පොරොන්දුවක් දිය හැකි නම්, මම ඔබ කි දේ කරමි"යි දික්තල පිළිතුරු දුන්නාය. මෙසේ තිරණය කරගෙන දෙදෙනාම ගඟින් එතෙරට ගොස්, විශේෂයෙන්ම සතුටුව, කාලගෝළ අත්හැර දමා, ඔහුට පෙනෙමින් කැවුම් කමින් යන්නට පටන්ගත්තෝය.

කාලගෝළද ඔවුන් දෙදෙනාගේ ක්‍රියාව දැක, "මොවුහු මා මෙහි තනිකර දමා යති"යි සිතමින්, ගංතෙර ඇවිදිමින් සිට, මඳක් දියට බැස, භයින් නැවත ගොඩට අවුත්, ඔවුන් පිළිබඳ වු කෝපයෙන් නැවතත් ගඟට බැස්සේය. ගඟෙහි දිය අඩු බව දැනගෙන දික්පිටියා පිළිබඳව වඩාත් කෝපයට පැමිණ, ගඟින් එතරවී, දික්පිටියා කරා දිවගොස්,

"එම්බල සොර, තෝ මගේ අඹුව කොහේ ගෙනයහිදැ"යි ඇසුවේය. දික්පිටියාද, "එම්බල අඟුටුමිට්ටිය, තට කවර නම් අඹුවක්ද? මේ මගේ අඹුව යැ"යි කියා, කාලගෝළ බෙල්ලෙන් අල්ලා තල්ලුකර දැමුවේය. කාලගෝළද දික්තලගේ අත අල්ලාගෙන, "තී නොසිට කොහේ යහිදැ"යි කියමින්, දික්පිටියා සමඟ කලහකරමින් යන්නට පටන්ගත්තේය. මෙසේ යන ඔව්හු මහෞෂධ පණ්ඩිතයන්ගේ විනිශ්චය ශාලාව අසලට ළඟාවුවෝය. බොහෝදෙන

කලහශබ්දය අසා එතැනට රැස්වූවෝය.

මහෞෂධ පඬිතුමා "මේ කවර කලහයක් දැ"යි අසා, ඔවුන් තිදෙනාම ගෙන්වා, "තෙපි මා කියන නිසියෙහි සිටිනුදැ"යි දික්පිටියාගෙන් හා කාලගෝළගෙන් ඇසුවේය.

"එසේ ය ස්වාමීනි"යි ඔවුන් කී විට, පළමුව දික්පිටියා ශාලාව තුළට කැඳවාගෙන ගොස් තමාගේ පිරිස ඉදිරියෙහි, " තගේ නම කුමක්දැ"යි ඇසුවේය.

"දික්පිටියා නම් වෙමි ස්වාමීනි"යි හෙතෙම කීවේය.

"තගේ අඹුවගේ නම කුමක්දැ"යි පඬිතුමා ඇසුවේය. දික්පිටියා , දික්තලගේ නම දැනගන නොසිටි නිසා කටට ආ කිසියම් නමක් කීවේය.

"තගේ මවුපියන්ගේ නම් මොනවාදැ"යි පඬිතුමා ඇසුවිට,

"ඔවුන්ගේ නම් මේ මේ යැ"යි පැහැදිලිව කීවේය.

"තගේ අඹුවගේ මව්පියන්ගේ නම් මොනවාදැ"යි පඬිවරයා ඇසුවිට, එම නම් තමා දැනගන නොසිටි හෙයින් හේ කටට ආ නමක්ම කීවේය.

ඉන්පසු ඔහු යවා, කාලගෝළ ශාලාව තුළට ගෙන්වා පිරිස ඉදිරියෙහි, "තගේ නම කුමක්දැ"යි ඇසුවේය. "කාලගෝළ නම් වෙමි. ස්වාමීනි"යි හෙතෙම කීවේය.

"තගේ අඹුවගේ නම කුමක්දැ"යි පඬිතුමා ඇසුවේය. "ඇයගේ නම දික්තල යැ"යි කාලගෝළ පිළිතුරු දුන්නේය.

"තගේ මව්පියන්ගේ නම් මොනවාදැ"යි පඬිතුමා ඇසුවිට, "ඔවුන්ගේ නම් මේ මේ යැ"යි හෙතෙම කීවේය.

"තගේ අඹුවගේ මවුපියන්ගේ නම් මොනවාදැ"යි ඇසුවිට, තමා ඒ නම් හොඳින් දැනගන සිටි හෙයින්, "ඔවුන්ගේ නම් මේ මේ යැ"යි කාලගෝළ පිළිතුරු දුන්නේය.

ඉන්පසු, ඔහු ශාලාවෙන් පිටතට යවා, දික්තල ශාලාව තුළට කැඳවා, "තිගේ නම කුමක්දැ"යි ඇසුවේය.

"දික්තල නම් වෙමි. ස්වාමීනි"යි ඕතොමෝ කීවාය.

"තිගේ සැමියාගේ නම කුමක්දැ"යි පඬිවරයා ඇසුවිට, දික්පිටියාගේ නම දැනගන නොසිටි බැවින්, ඕ වෙන නමක් කීවාය.

"තිගේ මවුපියන්ගේ නම් මොනවාදැ"යි පඬිතුමා ඇසුවේය.

"ස්වාමීනි, ඔවුන්ගේ නම් මේ මේ යැ"යි ඕතොමෝ කීවාය.

"තිගේ සැමියාගේ මව්පියන්ගේ නම් මොනවාදැ"යි පඬිතුමා ඇසුවිට, දික්පිටියාගේ මව්පියන්ගේ නම් දැනගන නොසිටි හෙයින් ඕතොමෝ කටට ආ නමක්ම කීවාය.

අනතුරුව පඬිවරයා, කාලගෝළ සහ දික්පිටියාද ශාලාව තුළට කැඳවා, "මේ ගැහැනිය කිවූ නම්, කාලගෝළ කිවූ නම් සමග ගැළපේද? නැතහොත් දික්පිටියා කිවූ නම් සමග ගැළපේදැ"යි පිරිසෙහි අයගෙන් ඇසුවේය.

"කාලගෝළ කිවූ නම් සමගම ගැළපේ යැ"යි පිරිසෙහි අය කීවෝය. එවිට, "කාලගෝළ මැයගේ සැමියා යැ"යිද, "දික්පිටියා සොරසැමියා යැ"යිද කියා, මහෞෂධ පඬිතුමා එම ප්‍රශ්නය විසඳ, දික්තල කාලගෝළටම භාරදී, දික්පිටියාටද අවවාදකොට ඔවුන් පිටත්කර යැවුවේය.

VOCABULARY FOR SUPPLEMENTARY READINGS

READING 1

අතහරිනවා	give up, let go, abandon
අනාවරණය කරනවා	reveal, disclose
අඳිනවා	draw
අරගන්නවා	take (for oneself); past participle අරගෙන or ඇරගෙන
අල්ලාගන්නවා / අල්වාගන්නවා	catch, get hold of, capture
අවවාද කරනවා	advise
ඇදගන්නවා	pull (for oneself), pull out
ඉර	N2 line; pl. ඉරි
එසේය	yes (to superiors)
කලහ කරනවා	quarrel
කලහය	N2 quarrel; pl. කලහ
කාරණය	N2 fact, reason; pl. කාරණ or කාරණා
ක්‍රියා කරනවා	act
ගෙන්වනවා	cause to be brought
චරිතය	N2 character, life; pl. චරිත
තැනැත්ති	N5 person (feminine); pl. තැනැත්තියෝ
දෑත	N2 two hands
දෙපය	N2/3 two feet
දෙපස	two sides
දොස	N2 fault, error, wrong
දොස් දක්වනවා	point out errors
නාවනවා	bathe (someone else)
පණ්ඩිතයා	N5 pandit, scholar; pl. පණ්ඩිතයෝ ; stem පණ්ඩිත
පඬිවරයා	N5 scholar, pandit; pl. පඬිවරු ; stem පඬි
පස	N2 side; no pl.

Lesson Nine

පැහැරගෙනයනවා	snatch away, take away (by force)
පොකුණ	N2 pond; pl. පොකුණු
බාරදෙනවා	hand over, turn over to
මවාගන්නවා	create for oneself, assume
යකින්නි	N5 demon (female); pl. යකින්නියෝ
විනිශ්චය	N2 judgement, decision; no pl.
විනිශ්චය කරනවා	judge, decide
විනිශ්චය ශාලාව	N2 court (of law); pl. විනිශ්චය ශාලා
වෙස	N2 form, guise; pl. වෙස්
වේදනාව	N2 pain; pl. වේදනා
වේදනා සිදුවෙනවා	be afflicted with pain
ශාලාව	N2 hall; pl. ශාලා
සාදවනවා	cause to be made
සුරතල්	lovable (usually of a child)
සුරතලය	N2 baby's behavior or speech (affectionate); pl. සුරතල්
සුරතල් කරනවා	fondle (a baby)
ස්වාමියා	N5 lord, master; pl. ස්වාමියෝ ; stem ස්වාමි
ස්වාමීනි	vocative pl. of ස්වාමියා
හිමිවෙනවා	be owned, belong, become the possession of

READING 2

අකමැති වෙනවා	dislike, disagree
අඟුටුමිටියා	N5 dwarf; pl. අඟුටුමිටියෝ ; stem අඟුටුමිටි
අත්හරිනවා	give up, abandon
අනතුරුව	then, afterwards
අඹුව	N5 wife; pl. අඹුවෝ ; stem අඹු
ආසාව	N2 desire, wish; pl. ආසා

උස	tall, high
එතෙර වෙනවා	cross (a river, etc.)
එතැන් සිට	from that place or point
එම්බල	a term of address (derogatory)
කටට එනවා	come to one's mind
කර	N2/3 shoulder; pl. කරවල් ; stem කර
කැඳවාගෙන යනවා	take along with oneself (a person)
කැවුම	N2 oil-cake; pl. කැවුම්
කැවුම්පෙවුම්	oil-cakes, etc. (usually pl. only)
කිඹුලා	N5 crocodile; pl. කිඹුල්ලු ; stem කිඹුල්
ගංතෙර	N2/3 bank of a river; pl. ගංතෙරවල්
ගහන	be full of, be infested with
ගැඹුර	N2 depth; no pl.; stem ගැඹුර or ගැඹුරු
ගැඹුරු	deep
ගොඩ	N3 land, surface of the land; no pl.; stem ගොඩ
තනිකර දමනවා	isolate, desert
තවදුරටත්	furthermore, moreover
තිදෙනා	three persons
දණ	N2 knee, knees
දිනපතා	daily
දිව යනවා/ දුව යනවා	run, go running
නවාගන්නවා	bend
නීතිය	N2 justice, law, rule; pl. නීති
පළඳිනවා	wear ornaments
පළමුව	first(ly)
ප්‍රතික්ෂේප කරනවා	reject, refuse
භය	N2 fear; no pl.

භාර්යාව	N5 wire; pl. **භාර්යාවෝ**
භාරදෙනවා	hand over, turn over to
මාපියෝ	N5 parents; pl. only; stem මාපිය
මිනිහා	N5 man, human being; pl. **මිනිස්සු** ; stem **මිනිස්**
මොහොත	N2 moment, instant; no pl.
යහපත	1. fine (in predicate), proper; 2. N2 good, welfare; no pl.; stem **යහපත්**
විසඳනවා	solve, explain
විස්මය	N2 surprise, wonder; no pl.
සකස් කරනවා	cause one to prepare
සැප	N2 comfort; no pl.; stem **සැප**
සැපත	N2 comfort, pleasure; no pl.
සැරසෙනවා	be decorated, decked with
ස්නේහය	N2 love, affection; no pl.; stem **ස්නේහ**
හැඳ පැළඳ	having dressed and put on ornaments
හිඳුවාගන්නවා	make or cause one to sit

LESSON 10

සත්තුභස්ත ජාතකය 2.

මීට ඉහත ආ පාඩමෙන් සත්තුභස්ත ජාතකයෙහි මුල් කොටස දක්වා ඇත. මහලුබමුණා ගෙදරින් පිටවී යන පරිදි බැමිණිය උපායක් යෙදූ සැටි එම පාඩමෙහි සඳහන් වී ඇත. රටතොට සිගා ඇවිද මුදල් සොයාගනු පිණිස ගිය මහලුබමුණා අතරමගදී මියයනු ඇතැයි බැමිණිය කල්පනා කළාය. ඇය මෙම උපාය යෙදුවේ එහෙයිනි. එම කථාවෙහි ඉතිරි කොටස මෙම පාඩමෙන් දැක්වෙයි. ඒ මෙසේ ය.

බැමිණියගේ වචනයට එකඟ වූ බමුණාද මෙහෙවරට කෙල්ලක සෙවීම සඳහා ගෙදරින් පිටත්වී ගියේය. තම තරුණ බිරිඳගෙන් එක දිනකට හෝ වෙන්ව යෑම ඔහුට මහත් දුකක් සේ දැනුනේය. එහෙත් තම බිරිඳගේ ඉල්ලීම ඉටු කළ යුතු බව දන්නා බමුණා, රටතොට සිගා ඇවිද මුදල් සොයනු සඳහා ගෙදරින් පිටත්වී ගියේය. හේ රටතොට ඇවිද, මසුරන් හත්සියයක් පමණ සිගාගෙණ, මෙහෙවරට කෙල්ලක සෙවීමට බරණැස් නුවරට එන්නට වූයේය. මෙසේ එන අතරමගදී බඩගිනිවී, ගසක් මුලට ගොස් වාඩිවී, අග්ගලා මල්ල ලිහා අග්ගලා කිහිපයක් කෑවේය. ඉන්පසු, මල්ල නොබැඳම ගසමුල තබා වතුර බීම සඳහා ඒ අසළ වූ ගඟකට ගියේය. ගසෙහි එක් බෙනයක නයෙක් වූයේය. ලිහා තැබූ අග්ගලා මල්ලෙහි සුවඳ ගසෙහි සිටි නයාට දැනුනේය. බමුණා වතුර බොන්නට ගිය අතරේදී, නයා ගසින් බැස, අග්ගලා මල්ල ඇතුලට රිංගුවේය. බමුණාද වතුර බී ආපසු අවුත්, අග්ගලා මල්ල පරීක්ෂාකොට නොබලාම, එය බැඳ , කරේ තබාගෙන යන්නට ලැස්තිවුයේය . මෙසේ යන්නට ලැස්තිවු බමුණාට මෙබඳු ශබ්දයක් ඇසුනේය.

"බමුණ, තා ගෙදර ගියහොත් තගේ බිරිඳ වැනසෙයි. අතරමග රැඳුනහොත් තෝ වැනසෙහි."

බමුණා වටපිට බැලුවේය. හේ කිසිවකු දුටුවේ නැත. මෙයින් බියවී හේ හඬ හඬා යන්නට වූයේය.

මෙදින පසළොස්වක පෝය දිනයක් වූයේය. බරණැස් නුවර බොහෝදෙනා බණ ඇසීමට සේනක පඬිතුමා වෙතට යමින් සිටියෝය. ඔවුහු මෙසේ හඬ හඬා යන බමුණා දුටුවෝය. දැක අනුකම්පාවෙන්, "තොප හඬන්නේ මන්ද? තොපට කුමක් සිදුවුයේ දැ"යි ඇසුවෝය.

බමුණාද, තමාට සිදුවූ සියල්ල කීවේය. ඔව්හු බමුණා බෝධිසත්වයන්වහන්සේ කරා ගෙන ගියෝය. බමුණා සියලු ප්‍රවෘත්තිය බෝධිසත්වයන්වහන්සේට කීවේය. උන්වහන්සේද එය වටහාගත්සේක.

බමුණාගේ අග්ගලා මල්ල පරීක්ෂාකර බැලිය යුතුයැයි සිතූ උන්වහන්සේ බමුණාගෙන් මෙසේ ඇසූසේක:

"බමුණ , තාගේ මල්ලේ ඇත්තේ මොනවාද?"

"පණ්ඩිතයන්වහන්ස, එහි ඇත්තේ අග්ගලාය."

"තෝ එය හරිහැටි දනිහිද?"

"දනිමි ස්වාමීනි."

"දුර සිට එන තෝ අඟලා කෑමට අතරමග නොනැවතුනෙහිද?"

"ගසක් මුල නැවතුනෙමි ස්වාමීනි. නැවති අඟලා කා, අසළ වූ ගඟකට ගොස් වතුර බී, නැවතත් අඟලා මල්ල බැඳගෙන, කර තබාගෙන ආවෙමි ස්වාමීනි."

"තෝ වතුර බී ආපසු අවුත් අඟලා මල්ල පරීක්ෂාකර බැලුවෙහිද?"

"නැත පණ්ඩිතයෙනි. ක්ලාන්ත වූ හෙයින් එය අමතක වී ගියේය ස්වාමීනි."

සේනක පඬිතුමාද මිනිසකු ගෙන්වා, අඟලා මල්ල ලිහා එයට ලියකින් තට්ටුකරන ලෙස පැවසුවේය. ඔහු මල්ල ලිහා, තට්ටුකරන කල්හිම එහි සිටි නයා පිටවූයේය.

"තා අතරමගදී අඟලා කෑමට නැවති මල්ල ලිහුවහොත් නයා තා දෂ්ට කරනු ඇත. එයින් තා වැනසෙනු ඇත. ඉදින්, අතරමග නොනැවතී ගෙදර ගියහොත් බැමිණිය අඟලා මල්ල ලිහනු ඇත. එවිට නයා ඇ දෂ්ට කරනු ඇත. එයින් ඇය වැනසෙනු ඇත. තට ඇසුණු ගාථායේ තේරුම මෙය යැ"යි සේනක පඬිතුමා බමුණාට කීවේය. මෙයින් විශාල ප්‍රීතියට පත්වූ බමුණා තමා සිඟාගත් මසුරන් හත්සියය බෝධිසත්වයන්වහන්සේට පූජා කළේය.

"මට තාගේ මසුරන්වලින් ප්‍රයෝජනයක් නැතැ"යි කියා, සේනක පඬිතුමා එම මසුරන් හත්සියයට තව මසුරන් තුන්සියයක්ද එකතුකොට නැවත මහළු බමුණාටම දුන්නේය. එසේ දී "තා සිඟන්නට හේතුව කුමක්දැ"යි බමුණාගෙන් ඇසුවේය. බමුණාද සියළු ප්‍රවෘත්තිය කීවේය.

"තාගේ බිරිඳ මහළු ස්ත්‍රියක්ද, නැතහොත් තරුණ ස්ත්‍රියක්දැ"යි සේනක පඬිතුමා ඇසුවේය.

"පණ්ඩිතයෙනි, මගේ බිරිඳ තරුණ ස්ත්‍රියක් යැ"යි බමුණා කීවේය.

"එසේනම් මේ මසුරන් දහස ගෙදර ගෙන නොයව. මසුරන් ඉවතක සඟවා , ඒවා සැඟ වූ බව තෝ තාගේ බිරිඳට නොකියවැ"යි කියා පඬිතුමා බමුණා පිටත්කර යැව්වේය.

බමුණාද අතරමග ගසක් මුල මසුරන් සඟවා ගෙදර ගියේය. ගොස්,

"සොඳුරිය, දොර හරුව"යි කීවේය. ඒ වේලාවෙහි බැමිණියගේ සොරසැමියාද ගෙහි සිටියේය. බැමිණිද සොරසැමියාට සැඟවෙන පරිදි ඉඩ සලස්වා දොර හැරියාය. බමුණා මෙහෙවරට කෙල්ලක ගෙනාවේ නැත. කෝපයට පත්වූ බැමිණි, "මෙතෙක් දවස් සිඟා ඇවිද ගෙනා වස්තුව කොහිදැ"යි අසමින් බමුණාගේ අතෙහි වූ මල්ල ලිහා බැලුවාය.

මල්ලෙහි වූයේ ඉතුරු අඟලා කිහිපය පමණි.

"බමුණ , තා මෙතෙක් කල් සිඟා ගොස් ගෙනා වස්තුව මෙයදැ"යි කියමින්, බැමිණී බමුණාට බනින්නට වූවාය.

මෙයින් බියපත් වූ බමුණා, "කෝප නොවව සොඳුරිය. මම රටතොට සිඟා ඇවිද මසුරන් දහසක් ගෙනාවෙමි. එය අසවල් ගසමුල සඟවා ආවෙමි. සෙට උදේ ගොස් එය ගෙන එමි"යි කීවේය.

බැමිණිද එය සැඟවී සිටි සොරසැමියාට කීවාය. ඌද ගොස්, ගසමුල වූ මසුරන් දහස ගත්තේය.

බමුණා පසුදින උදේ ගසමුලට ගිය කල්හි තමාගේ මසුරන් දහස කිසිවකු විසින් සොරකම් කරගන්නා ලද බව දැනගත්තේය. ශේද කළහැකි කිසිවක් නැතිව, හඬ හඬා නැවත සේනක පඬිතුමා වෙත ගොස් එම ප්‍රවෘත්තිය කියන්නට වූයේය. එය ඇසූ පඬිතුමා,

"බමුණ, මසුරන් සැඟ වූ බව බැමිණියට කිවෙහිදැ"යි ඇසුවේය.

"කල්පනා අවු හෙයින් කිවෙමි ස්වාමින්වහන්සැ"යි බමුණා උත්තර දුන්නේය.

සේනක පඬිතුමාද, තමාගේ පිරිසෙන් කෙනකු යවා, බැමිණිය ගෙන්වා, පිරිස ඉදිරියෙහි දී බැමිණියගේ කටින්ම සියළු තොරතුරු හෙළිකරවූයේය. සොරසැමියාද ගෙන්වා ඌට දඬුවම් කළේය. බැමිණියටද අවවාදකොට, ඇය මහළු බමුණාටම පාවාදී, තමන්වහන්සේගේ විනිශ්චය ශාලාව අසල ගෙයක් සාදවා ඔවුන් එහි වාසය කරවූයේය.

VOCABULARY

අසවල්	such and such (specific, adjectival)
ඉටු කරනවා	fulfill
ඉඩ සලස්වනවා	make room (for)
ඉතිරි or ඉතුරු	remaining (adjectival)
ඉවත/ඉවතට	out, outside, elsewhere
ඉහත	earlier, prior to, above. See grammar 18.
උත්තරය	N2 answer: pl. උත්තර
ඌ	he, it. See grammar 14.
එකතු කරනවා	add, put together, gather (something)
තට්ටු කරනවා	tap, rap
තේරුම	N2 meaning, purpose; pl. තේරුම්
දඬුවම් කරනවා	punish
දැනෙනවා	feel
පරීක්ෂා කරනවා	examine, check, investigate
පසුදින	following day
පිට වෙනවා	go away, go out
පූජා කරනවා	offer (in worship)
බඩගිනි වෙනවා	be hungry
බඩගින්න	N2 hunger; no pl.; stem

බනිනවා	scold, blame, reprimand
බෙනය	N2 hollow (of a tree); pl. බෙන
මුල්	first, basic, earlier (adjective)
යලිත් or යළිත්	again
රැඳෙනවා	stop, stay, remain
රිංගනවා	creep into
ලැස්ති වෙනවා	prepare, get ready
ලීය	N2 stick; pl. ලී
වටපිට	around
වස්තුව	N2 wealth, treasure; pl. වස්තු
වාසය කරවනවා	make one live, settle someone
වැනසෙනවා	be ruined, be destroyed, perish
සඟවනවා	hide (something or someone)
සිඟනවා	beg
සිඟාගන්නවා	beg (for oneself)
සෙට	tomorrow
සොරකම් කරනවා	rob, steal
හරිනවා	open
හරිහැටි	rightly, correctly, certainly
හෙළිකරනවා	make one disclose
හේතුව	N2 cause, basis, reasons; pl. හේතු
හෝ	at least, even. See grammar 15.

GRAMMAR

1. PERFECT TENSE

In Colloquial Sinhala, the perfect tense is formed by using the past participle plus තියෙනවා (C. S. 21,5):

මම බත් කාලා තියෙනවා.
I have eaten rice.

In Literary Sinhala, a present perfect may be formed using the past participle followed by ඇති or තිබෙනවා , with the following restrictions:

1. The subject is always in the accusative case, even in a simple sentence in which it would be in the nominative in a different tense. Some modern writers do not observe this rule strictly.
2. The agreement is normally third person singular regardless of the number and person of the subject. This rule is generally followed by even those who do not observe rule 1.

විජය පිළිබඳ ප්‍රවෘත්තිය අප මීට ඉහත පාඩමක සඳහන් කර ඇත (or තිබේ).
We have mentioned the incident concerning Vijaya in a previous lesson.

එම පාසැලෙහි ශිෂ්‍යයන් පුස්කොළපොත් කියවා තිබේ (or ඇත).
The students of that school have read ola-leaf manuscripts.

Either ඇති or තිබෙනවා may occur in adjectival or emphatic forms in the appropriate types of clauses or sentences.

ඔබ කියවා ඇති පොත් මොනවා දැයි මම නොදනිමි.
I do not know what books you have read.

අප කියවා තිබෙන පොත් නවකථා පොත් නොවේ.
The books that we have read are not novels.

මා ගොස් ඇත්තේ පාසැලට පමණි.
It is only the school that I have gone to.

ඔවුන් කර තිබෙන්නේ ගැලපෙන දෙයක් නොවෙයි.
It is not a proper thing that they have done.

2. FUTURE WITH ඇති

In Literary Sinhala, a future form may be made using the passive participle plus ඇති . The same rules for agreement and the case of the subject apply as for the perfect (Section 1 above). This type of future generally has a 'might' sense like that associated with the Colloquial -වි form (C. S. 12,3):

මෙම බස්රිය කොළඹට යනු ඇත.
This bus will (might) go to Colombo.

හෙට ගොවියන් වැඩ කරනු ඇත.
The farmers will (might) work tomorrow.

As in the perfect, ඇති may occur in the emphatic form:

විශ්වවිද්‍යාලය පටන් ගනු ඇත්තේ ලබන සැප්තැම්බර් මාසයේය.
It will (might) be next September that the university reopens.

ඔවුන් යනු ඇත්තේ නැටුම් බැලීම පිණිසය.
What they will (might) be going for is to see dances.

3. නා VERBAL ADJECTIVE

In Literary Sinhala the present tense verbal adjective in -න has an alternant in -නා . Thus:

කරන	or	කරනා	doing
අදින	or	අදිනා	pulling
වැටෙන	or	වැටෙනා	falling

Verbs like කනවා 'eat', එනවා 'come', or යනවා 'go' with a monosyllabic stem that ends in a short vowel ($C\breve{V}$-) do not have the -නා alternate. However, monosyllabic stems with a long vowel and/or ending in a consonant ($C\bar{V}$-, $C\breve{V}C$-) like ගන්නවා 'take', සානවා 'plough' do take -නා :

සාන	or	සානා	ploughing
ගන්න	or	ගන්නා	taking
but only		යන	going
		කන	eating

With most verbs the -නා form is an optional variant not too frequently employed in current Literary Sinhala. However, with the verbs ඉන්නවා 'be', දන්නවා 'know', ගන්නවා 'take', the -නා form, i.e. ඉන්නා , දන්නා , and ගන්නා respectively, is the most commonly employed variant. In any case, the -න and -නා variants are used in the same way:

අප කරන වැඩ or අප කරනා වැඩ
The work that we do

දර අදින ළමයා or දර අදිනා ළමයා
The child who fetches firewood

ගසින් වැටෙන ගෙඩිය or ගසින් වැටෙනා ගෙඩිය
The fruit that falls from the tree

4. BEGIN TO

In Literary Sinhala the infinitive plus වෙනවා with a subject in the nominative case expresses 'begin to'. This constructon normally occurs in the past tense.

වැසි වසින්නට වූයේය.
It started raining.

යක්ෂයා දුටු මිනිස්සු දුවන්නට වූවෝය.
The people who saw the devil started to run.

5. WHILE, DURING

'During' or 'while' clauses can also be expressed by අතර with the present tense verbal adjective:

සොරා දුවන අතර බල්ලෙක් බිරුවේය.
A dog barked while the thief was running.

ගුරුවරයා උගන්වන අතර ශිෂ්‍යයෝ නවකතා කියවති.
The students read novels while the teacher teaches.

අතර may also be used with the past tense verbal adjective, and the suggestion is then that the action of the main clause takes place in a time span following the action of the verbal adjective. A common English equivalent is 'after':

සොරා දිවූ අතර බල්ලා බිරුවේය.
The dog barked after the thief ran away.

In either usage above, අතර may be put in the genitive and followed by දී :

බමුණා ගඟට යන අතරේ දී නයකු දුටුවේ ය.
The Brahmin saw a cobra, while going to the river.

බමුණා ගඟට ගිය අතරේ දී නයෙක් බමුණාගේ අග්ගලා මල්ලට රිංගුවේ ය.
After the brahmin went to the river, a cobra entered the Brahmin's bag containing sweet-meats.

6. REDUPLICATED FORM

In Literary Sinhala, as in Colloquial (C. S. 35,3), there is a reduplicated form of the verb.

6.1 For regular verbs, the Literary forms are made by reduplicating the past participle given in Lesson 5.1 as follows:

Classes 1 and 3: The past participle is doubled, but the final -ආ or -ඊ of the first occurrence is shortened to -අ and -ඉ respectively.

	Verb		Past Participle	Reduplicated Form
Cl 1	කපනවා	cut	කපා	කපකපා
	තෝරනවා	explain	තෝරා	තෝරතෝරා
Cl 3	තේරෙනවා	understand	තේරී	තේරිතේරී
	වැටෙනවා	fail	වැටී	වැටිවැටී

Class 2: The past participle is doubled without further change:

Verb		Past Participle	Reduplicated Form
අදිනවා	pull	ඇද	ඇදඇද
බඳිනවා	tie	බැඳ	බැඳබැඳ

6.2 Common irregular verbs have forms as follows:

Verb		Past Participle	Reduplicated Form
වෙනවා	become	වී	වෙවී
දෙනවා	give	දී	දිදී
බොනවා	drink	බී	බිබී
දනවා	burn	දූ	දුදූ
කනවා	eat	කා	කකා
ගානවා	rub, apply	ගා	ගගා

සානවා or සෑනවා	plow	සා or සෑ	සසා or සැසෑ

Note that once the past participle is known, all of the reduplicated forms above, except for වෙවී , can be regularly formed by the vowel-shortening rule given for Class 1 and 3.

Some verbs like එනවා 'come', යනවා 'go' and ගන්නවා 'take' do not have reduplicated forms.

6.3 Like the Colloquial reduplicated form, the Literary one is used to indicate action simultaneous with that of the main verb:

> මිනිස්සු නටනටා විනෝද වෙති.
> People enjoy dancing.
>
> බණ්ඩා වැට බැඳබැඳ කථා කරයි.
> Banda talks while building the fence.
>
> බබා වැටීවැටී ඇවිදින්නට පටන් ගනියි.
> The baby begins to walk (constantly) falling.

In Literary Sinhala, the reduplicated form is an alternant in meaning for the concurrent participle (5,2), so that for those verbs lacking a reduplicated form that participle may be used instead:

> ඇතැම් ශිෂ්‍යයෝ විභාගයට යමින් සටහන් කියවති.
> Some students read (their) notes on the way to the examination.
>
> වෙළෙන්දු ගොවියන්ගෙන් එළවලු සහ පලතුරු ගනිමින් ඔවුන්ට මෙසේ පවසයි.
> The merchant, while buying vegetables and fruits from the farmers, says thus.

7. QUESTIONS WITH ද

7.1 When ද is added to a sentence with the predication marker in any of its forms the latter is deleted (like the assertion marker in Colloquial Sinhala):

> මෙම මල් සුදු ය.
> These flowers are white.
>
> මෙම මල් සුදු ද?
> Are these flowers white?
>
> පුස්කොළ පොත් කියවීම අපහසුය.
> Reading ola-leaf manuscripts is difficult.
>
> පුස්කොළ පොත් කියවීම අපහසු ද?
> Is reading ola-leaf manuscripts difficult?

Note that this rule applies also to the predication marker that forms a part of the third person past tense, both singular and plural (6,1):

ගුරුවරයා ශිෂ්‍යයන්ට පාඩම් කියාදුන්නේය.
The teacher taught the lessons to the students.

ගුරුවරයා ශිෂ්‍යයන්ට පාඩම් කියාදුන්නේද?
Did the teacher teach the lessons to the students?

මිනිස්සු වෙසක් සැරසිලි බලා සතුටුවූවෝය.
The people enjoyed having seen the Vesak decorations.

මිනිස්සු වෙසක් සැරසිලි බලා සතුටුවූවෝද?
Did the people enjoy having seen the Vesak decorations?

7.2 In the present tense ද is added to any of the forms of the verb without change. However, for class 1 verbs there is an optional alternate form of the third person singular present tense that may be used before ද . It is made by dropping the -යි of the usual form and lengthening of -අ to -ආ . Thus either

හෙතෙම වැඩ කරයිද?
or හෙතෙම වැඩ කරාද?
Does he work?

මුරකාරයා බර උසුලයිද?
or මුරකාරයා බර උසුලාද?
Does the watchman bear a burden?

7.3 In sentences with the Quasi-verbs ඇති , නැති or හැකි , ද occurs after adjectival forms, rather than the simple form. Also, ඇති and නැති commonly shorten to ඇත් and නැත් before ද , and in turn these plus ද may be found written sometimes as ඇද්ද and නැද්ද respectively.

ඔබට ඉංග්‍රීසි කියවිය හැකිද?
Can you read English?

ඒ ගඟෙහි වතුර ඇතිද? (or ඇත්ද? or ඇද්ද?)
Is there water in that river?

මෙම ගසේ බෙනයෙහි නයෙක් නැතිද? (or නැත්ද? or නැද්ද?)
Isn't there a cobra in the hollow of this tree?

8. නම් 'IF'

All of the rules given for ද in Section 7 also apply to නම් 'if'. Thus:

එම මල් සුදු ය.
Those flowers are white.

එම මල් සුදු නම් ගෙන එනු මැනවි.
If those flowers are white, please bring them.

ගුරුවරයා පාඩම් කියා දුන්නේය.
The teacher taught the lessons.

ගුරුවරයා පාඩම් කියා දුන්නේ නම් ඔබ දැනගත යුතුය.
You must know if the teacher taught the lessons.

හෙතෙම වැඩ කරයි.
He works.

හෙතෙම වැඩ කරයි නම් (or කරා නම්)...
If he works...

ඔහුට ධනය ඇත.
He has wealth.

ඔහුට ධනය ඇත්නම්....
If he has wealth...

එහි මල් නැත.
There are no flowers there.

එහි මල් නැත්නම්....
If there are no flowers there...

9. THIRD PERSON HONORIFIC වහන්සේ

9.1 උන්වහන්සේ 'that person' and මුන්වහන්සේ 'this person' form a two member location set of third person pronouns. Like other forms with -වහන්සේ (5,4) they are highly respectful.

9.2 Forms with -වහන්සේ have a vocative case (8,8) in -වහන්ස , used in calling, or getting someone's attention.

පණ්ඩිතයන්වහන්ස	O Pandit
රජාණන්වහන්ස	O your majesty

Pronominal forms in -වහන්සේ such as ඔබවහන්සේ , තමන්වහන්සේ , උන්වහන්සේ , etc. are not generally used as vocatives, but it is customary instead to use one of the forms that includes a title as in the examples given above.

9.3 Note that වහන්සේ is commonly added to the accusative plural of nouns.

10. RESPECTFUL AGREEMENT ...සේක

Respectful forms in -වහන්සේ may occur with third person plural verb forms (c.f. 9,22):

බුදුරජාණන්වහන්සේ මෙසේ පවසති.
Buddha says thus.

පණ්ඩිතයන්වහන්සේ බමුණාට එම කාරණය පැහැදිලි කොළෝය.
The pandit explained that matter to the Brahmin.

As an alternant to this type of agreement, there are special respectful forms of the verb which occur with -වහන්සේ forms. These are made as follows:

1. Present Tense:
-සේක is added to the present tense verbal adjective to form an equivalent of the simple present:

බුදුරජාණන්වහන්සේ මෙසේ පවසන සේක.
Buddha says thus.

පණ්ඩිතයන්වහන්සේ බමුණාට අවවාද කරන සේක.
The pandit admonishes the Brahmin.

2. Past Tense:
-සේක is added to the past tense verbal adjective. While either the general or the prenominal form may be used, the latter is more frequent. The past -සේක form is an equivalent of the past tense simple form.

ස්වාමින්වහන්සේ බණ කිවු සේක.
The (reverend) monk preached (the) doctrine.

11. PURPOSE CLAUSES

Equivalents of English clauses of purpose or manner are formed by using ලෙස or සේ with the present tense verbal adjective. The forms පරිදි and මෙන් may substitute for ලෙස or සේ in some but not in all clauses, as follows:

11.1 Same Subject Purpose Clauses

The equivalent of English clauses with 'in order to' or 'for the purpose of' having the same subject as the main clause may be expressed with මෙන් as well as ලෙස and සේ, interchangeably:

සී සාන මෙන් ගොවියෝ කුඹුරට යති.
The farmers go to the field in order to plow.

ගුණපාල උඩරට නැටුම් බලන ලෙස ගියේය.
Gunapala went in order to see up-country dances.

හේ ගුරුවරයකු වන සේ උගනියි.
He learns in order to become a teacher.

The Colloquial equivalent of these purpose clauses employs the infinitive:

උඩරට නැටුම් බලන්න ගුණපාල ගියා.
Gunapala went to see up-country dances.

එයා ගුරුවරයෙක් වෙන්න ඉගෙනගන්නවා.
He learns in order to become a teacher.

11.2 Different Subject Purpose Clauses

The equivalent of English clauses with 'so that' having a different subject is expressed with පරිදි , as well as සේ or ලෙස :

ඕ හොර සැමියාට සැඟවෙන පරිදි (or සේ or ලෙස) සැලැස්වුවාය.
She made arrangements so that her lover might hide.

The Colloquial equivalent of these clauses also uses the infinitive.

ගුරුවරයා සිස්සයින්ට පොත් කියවන්න සැලැස්සුවා.
The teacher made arrangements for the students to read (the) books.

12. TELL TO, ASK TO

In Literary Sinhala, with verbs of asking, saying, ordering, etc., any of the forms සේ , ලෙස , මෙන් , පරිදි may be used with the present tense verbal adjective form of the verbs to indicate the action that is requested:

පොත් කියවන සේ(or ලෙස or මෙන් or පරිදි) ගුරුවරයා ශිෂ්‍යයන්ට පැවසුවේය
The teacher told the students to read the books.

In Colloquial Sinhala, as in English, the equivalent is the infinitive:

ගුරුවරයා සිස්සයින්ට පොත් කියවන්න කිව්වා.
The teacher told the students to read the books.

13. මාගේ , තාගේ

මාගේ and තාගේ are alternant forms for මගේ and තගේ , respectively.

14. THIRD PERSON PRONOUN ඌ

14.1 ඌ is a third person pronoun used both in Literary and Colloquial Sinhala to refer to animals or, derogatorily, to humans. For animals it may be either masculine or feminine, but for humans it is restricted to masculine. In the Literary language the nominative and accusative are distinguished in the plural, but the remaining forms are the same in both types of Sinhala.

	Spoken			Literary	
	Singular	Plural		Singular	Plural
Direct	ඌ	උන්	Nominative	ඌ	ඌලා
			Accusative	ඌ	උන්

	Spoken and Literary	
	Singular	Plural
Dative	ඌට	උන්ට
Genitive	උගේ	උන්ගේ
Instrumental	උගෙන්	උන්ගෙන්

14.2 ඌ is the (ඕ) member of a location set of which the other members are මූ 'this one (animal)', and අරූ 'that one (animal) over there'. The case forms of මූ and අරූ are like those of ඌ, except that අරූ does not shorten before -ගෙ and -ගෙන් of the singular. Thus:

	Spoken			Literary	
	Singular	Plural		Singular	Plural
Direct	මූ, අරූ	මුන්, අරූන්	Nominative	මූ, අරූ	මූලා, අරූලා
			Accusative	මූ, අරූ	මුන්, අරූන්

	Spoken and Literary	
	Singular	Plural
Dative	මූට, අරූට	මුන්ට, අරූන්ට
Genitive	මුගේ, අරූගේ	මුන්ගේ, අරූන්ගේ
Instrumental	මුගෙන්, අරූගෙන්	මුන්ගෙන්, අරූන්ගෙන්

15. හෝ

හෝ may be used in the sense 'at least, even'. As such it is a Literary equivalent of වත් (C. S. 18,14) and like වත් is used primarily in negative or interrogative sentences.

> ගුරුවරයා හෝ එම පාඩම නොදනියි.
> Even the teacher does not know that lesson.
>
> ඔබ හෝ මෙම වැඩ කළ යුතුය.
> At least you should do this work.

16. කොහි is a locational interrogative, the equivalent of Colloquial කොහෙ .

> තම්බපණ්ණි නම් නුවර කොහිද?
> Where is the city called Tambapaṇṇi?

17. කල්හි

කල්හි is an alternant for විට (9,12):

> බමුණා වතුර බොන්නට ගිය කල්හි ඔහුගේ මල්ලට නයෙක් රිංගුවේය.
> When the Brahmin went to drink water, a cobra crept into his bag.
>
> ඔවුහු වැඩකරන කල්හි කථා නොකරති.
> They do not talk when they work.

18. ඉහත 'BEFORE'

ඉහත is an alternate for පෙර 'before' (5,8.1), and like it takes a dative case noun or මේ and ඒ in the forms මීට and ඊට :

> එය මීට ඉහත දැක්වුවෙමු.
> We showed that before this.
>
> ඊට ඉහත ආ පාඩම.
> The lesson that came before that.

However, ඉහත is less common than පෙර in this usage.

SUPPLEMENTARY READINGS

මෙම අතිරේක කියවීම් සඳහාද තෝරාගෙන ඇත්තේ උම්මග්ග ජාතකයෙහි දැක්වෙන කථා දෙකකි.

ප්‍රශ්න මැනවින් විසඳීම පිළිබඳ මහෞෂධ පණ්ඩිතයන්ගේ දක්ෂතාව පිළිබිඹුවන කථා දෙකක් මීට ඉහතද දැක්වූයෙමු. මහෞෂධ පඬිතුමාගේ කීර්තිය අනුක්‍රමයෙන් රටෙහි පැතිරෙන්නට වූයේය. මහෞෂධ පණ්ඩිතයන් විසූ සමයෙහි ඉන්දියාවේ "මියුලු" නම් නුවරක් වූයේය. එහි "වේදේහ" නම් රජකෙනෙක් රාජ්‍යය කෙළේය. මහෞෂධ පණ්ඩිතයන්ගේ දක්ෂකම් පිළිබඳව වේදේහ රජතුමාටද ආරංචි වූයේය.

වේදේහ රජතුමාගේ රාජසභාවෙහි පඬිවරු හතරදෙනෙක් වූවෝය. එහෙත්, මහෞෂධ පඬිතුමාද තම රාජසභාවට ගෙන්වා ගතයුතු යැයි රජතුමා සිතුවේය. මෙසේ සිතා, ඒ බව තම පඬිවරුන් සතරදෙනාට දැන්වූයේය. මහෞෂධ පඬිතුමාගේ දක්ෂකම් ගැන හොඳින් අසා දැන සිටි පඬිවරු හතරදෙනා, රජතුමා මහෞෂධ පණ්ඩිතයන් රාජසභාවට ගෙන්වා ගතහොත් තමන්ගේ කීර්තියට බාධාවනු ඇතැයි සිතා, මහෞෂධ පඬිතුමා ගෙන්වා ගැනීම වැළැක්වීමට, හැකි සෑම ක්‍රමයකින්ම උපාය යෙදූවෝය. බොහෝවිට එම උපාය වශයෙන් ඔවුන් යෙදූවේ පහසුවෙන් විසඳිය නොහැකි යයි සිතූ ප්‍රශ්න සොය සොයා ඒවා විසඳා එවන මෙන් මහෞෂධ පඬිතුමා වෙත යැවීමය.තමා වෙත එවූ සෑම ප්‍රශ්නයක්ම මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ ඉතාමත් පහසුවෙන් විසඳා යැවූ සේක. මෙයින් මහත් සතුටට පත්වූ රජතුමා, මහෞෂධ පණ්ඩිතයන් තම රාජසභාවට ගෙන්වා ගත්තේය. පණ්ඩිතයන්වහන්සේද රජතුමාට අනුශාසනා කරමින් සිටි සේක.

පහත දක්වා ඇත්තේ මහෞෂධ පඬිතුමා වේදේහ රජතුමාට අනුශාසනා කරමින් සිටි කාලයේදී එතුමා විසඳූ ප්‍රශ්න දෙකක් පිළිබඳ කථාප්‍රවෘත්ති දෙකකි.

1. මැණික පිළිබඳ ප්‍රශ්නය

රජ්ජුරුවන්ගේ නුවර දකුණුවාසලට සමීපවූ ස්ථානයක පොකුණක් වූයේය. එම පොකුණු තෙර එක් තල් ගසක් වූයේය. එම තල් ගස උඩ වූ කවුඩු කැදැල්ලක එක් මැණිකක් තිබුණේය. මැණිකෙහි ඡායාව පොකුණෙහි පෙනෙන්නට වූයේය. මෙය දුටු නගරවැසියෝ "පොකුණෙහි මැණිකක් ඇතැ"යි රජ්ජුරුවන්ට සැළකොළෝය. එය ඇසූ රජ්ජුරුවෝ, පෙර සිට තම රාජසභාවෙහි වූ පඬිවරුන් හතරදෙනාගෙන් එක්කෙනකු වූ සේනක පණ්ඩිතයන් කැඳවා, එම මැණික පිළිබඳ ප්‍රවෘත්තිය දන්වා එය ගැනීමට උපායක් දන්වන ලෙස පැවසූවෝය. මැණික කෙසේ ගතයුතුදැයි දත නොහැකිව, සේනක පඬිවරයා එය පොකුණෙහි දිය ඉස්වා ගන්නා බව සුදුසු යැයි කීවේය. එසේ කී කල්හි, "එසේ නම් එලෙසම කරවැ"යි කියා රජතුමා එම කටයුත්ත සේනක

පඩිතුමාටම භාර කෙළේය. සේනකද බොහෝ මිනිසුන් රැස්කරවා, පොකුණෙහි දියත් ඉස්වා මඩත් අස්කරවා බිමත් සාරවා මැණික නොදුටුවේය. නැවත පොකුණෙහි දිය පිරුණු කල්හි මැණිකෙහි ඡායාව පොකුණෙහි පෙනෙන්නට වූයේය. නැවතත් සේනක දියත් ඉස්වා මඩත් අස්කරවා බිමත් සාරවා මැණික නොදුටුවේය.

මහෞෂධ පඩිතුමා විමසීමට මෙය හොඳ අවස්ථාවක් යැයි සිතූ රජතුමා, එතුමා කැඳවා, "පණ්ඩිතයෙනි, පොකුණෙහි මැණිකක් පෙනෙයි. සේනක පඩිතුමා, පොකුණෙහි දියත් ඉස්වා මඩත් අස්කරවා බිමත් සාරවා මැණික නොදුටුවේය. පොකුණෙහි දිය පිරුණු කල්හි නැවත මැණික පෙනෙයි. තොපට මෙය ගත හැකිදැ"යි ඇසුවේය. උන්වහන්සේ, "දේවයන්වහන්ස, ඒ බැරි නොවෙයි. මා සමග අව මැනව. මම ඔබවහන්සේට මැණික දක්වමි"යි කී සේක. රජතුමාද "මැණික දක්වමි"යි කී බසින්ම සතුටුව, "අද පණ්ඩිතයන්ගේ නුවණෙහි බලය දකිමු"යි බොහෝදෙනා පිරිවරා මහෞෂධ පඩිතුමා සමග පොකුණු තෙරට ගියේය.

එහි ගිය පඩිතුමා පොකුණ දෙස බලා, පොකුණෙහි පෙනෙන්නේ මැණිකෙහි ඡායාව පමණක් බව දැනගෙන, පොකුණු තෙර වූ තල් ගස උඩ බලා එහි වූ කවුඩු කැදැල්ල දැක, මැණික තිබිය යුත්තේ එහි යැයි සිතා, රජතුමා අමතා "දේවයන්වහන්ස, පොකුණෙහි මැණික නැතැ"යි පැවසුවේය. "එසේ නම් අර පෙනෙන්නේ කුමක්දැ"යි ඇසු කල්හි, වතුර භාජනයක් ගෙන්වා, "බැලුව මැනව දේවයන්වහන්ස, මැණික පෙනෙන්නේ පොකුණෙහි පමණක් නොවෙයි. භාජනයෙහිද පෙනේයැ"යි කිවේය. එවිට රජතුමා "මැණික කොහි විය යුතුදැ"යි ඇසු කල්හි, පඩිතුමා සිනහසී "පොකුණෙහිත් භාජනයෙහිත් පෙනෙන්නේ මැණික නොවෙයි. එහි ඡායාව පමණකි. මැණික ඇත්තේ මේ තල් ගස උඩ තිබෙන කවුඩු කැදැල්ලෙහි ය. මිනිසකු ගසට නංවා මැණික බාවාගත මැනවැ"යි කීවේය.

රජතුමා, පඩිවරයා කී ලෙසම මිනිසකු ගසට නංවා මැණික බැවුවේය. පණ්ඩිතයන්වහන්සේ ඒ මැණික අතට අරගෙන රජ්ජුරුවන්ගේ අතෙහි තැබූ සේක.

2. පිඟුත්තර කථාව

පෙර ඉන්දියාවේ "තක්සලා" නම් නුවරක් වූයේය. එහි "දිසාපාමොක්" නම් ආචාර්යවරයෙක් විසුවේය. ශිල්ප ශාස්ත්‍ර ඉගෙනීම සඳහා දරුවන් එතුමා වෙත යැවීම සිරිතක්ව පැවතුණේය. මියුලු නුවර "පිඟුත්තර" නම් දරුවෙක් ශිල්ප ශාස්ත්‍ර ඉගෙනීම සඳහා එතුමා වෙත ගියේය. හෙතෙම ඉගෙනීමෙහි දක්ෂයෙක් වූයේය. එහෙයින් හේ වැඩිකල් නොගොස්ම ශිල්ප ශාස්ත්‍ර මැනවින් හදාරා තම ඉගෙනීම අවසන් කෙළේය.

හෙතෙම ශිෂ්‍යයන් අතුරෙන් දක්ෂම ශිෂ්‍යයා වූයේය. දිසාපාමොක් ආචාර්යවරයාගේ පරම්පරාවෙහි වනාහි "ඉදින් වැඩිවිය පැමිණි දියණියක් ඇත්නම් ඇය දක්ෂම ශිෂ්‍යයාට පාවාදිය යුතු යැ"යි සිරිතක් වූයේය. දිසාපාමොක් ආචාර්යයන්ගේ විශිෂ්ට රූ ඇති එක් දියණියක් වූවාය. කුලසිරිත අනුව ඇය පිඟුත්තරට පාවාදෙන ලෙස දිසාපාමොක් ආචාර්යවරයා තීරණය කරගත්තේය. එසේ තීරණය කොට, පිඟුත්තර කැඳවා, "දරුව, තෝ මගේ ශිෂ්‍යයන් අතුරෙන් දක්ෂම ශිෂ්‍යයා වෙහි. ශිල්ප ශාස්ත්‍ර මැනවින් උගත්තෙහි. තොප තොපගේ නුවරට යැමට පෙර මා විසින් කළ යුතු

එක් දෙයක් ඇත. එනම් අපගේ කුල සිරිතට අනුව මගේ දියණිය තොපට සරණපාවා දීමයි." මෙසේ කියා, දියණියද ළඟට කැඳවා, පිඬගුත්තර අමතා, "දරුව, මේ මාගේ දියණිය තොපගේ භාර්යාව වශයෙන් භාරගත මැනවැ"යි පවසා, ඇය ඔහුට සරණපාවා දුන්නේය.

පිඬගුත්තරට කුමාරිකාව දැක ඇල්මක් ඇතිවූයේ නැත. ගුරුවරයාගේ වචනයට විරුද්ධ නොවිය හැකි බැවින් හේ ඇය භාරගත්තේය. හෙතෙම රාත්‍රියෙහි සකස්කොට අතුරන ලද ඇඳෙහි නිදාගත්තේය. කුමාරිකාවද අවුත් ඇඳට නැඟුණාය. එවිටම පිඬගුත්තර ඇඳෙන් බැස බිම වැතුරුණේය. කුමරියද එය දැක ඇඳෙන් බැස ඔහු සමීපයට ගියාය. හේ එතැනින් නැගිට නැවත ඇඳට නැංගේය. නැවත කුමාරිකාව ඇඳට නැංගාය. හේ නැවත ඇඳෙන් බැස බිම වැතුරුණේය. කුමාරිකාව ඇඳෙහිම නිදාගත්තාය.

ඔවුන් දෙදෙනා සඳහා සේවකයන් විසින් ගෙනෙන ලද රස ආහාර කුමරිය දෙස හෝ නොබලා කමින් බොමින් සතියක් පමණ හේ කල් ගතකෙළේය. කුමරියට ඔහු දැක්වූ ඇල්මක් නැත. ඇය හා කළ කතාබහක්ද නැත.

සතියක් පමණ මෙසේ කල් යවා කුමරියද කැටුව, ගුරුතුමා වෙත ගොස් වැඳ සමුගෙණ තම නුවරට යාම සඳහා හේ පිටත්වූයේය. නොකැමැතිවම දෙදෙනා මියුලු නුවරට පැමිණියෝය. නගරය සමීපයෙහි එක් අට්ටික්කා ගසක් වූයේය. ගමන් වෙහෙසින් සහ සාගින්නෙන් පෙළුනු පිඬගුත්තර ගසට නැඟ බඩ පිරෙන තුරු අට්ටික්කා කෑවේය. ගස මුල සිටි කුමරියද සාගිනි ඉවසාගත නොහැකිව, "ස්වාමීනි, මටත් අට්ටික්කා කඩා දුන මැනවැ"යි කිවාය. "ඇයි, තිට අත්පා නැද්ද? තිද නැග කඩාගනුවැ"යි පිඬගුත්තර කිවේය. සාදුකට වඩා දුකක් නැති හෙයින් කුමාරිකාව තොමෝම ගසට නැග අට්ටික්කා කඩාගෙන කන්නට වූවාය. පිඬගුත්තර ඇය ගසට නැංග බව දැනගෙන, වහවහා ගසින් බැස, ගස වට කටු ගසා, මහත් දුකකින් මිදුණ කෙනකු මෙන් සතුටුවෙමින් යන්නට ගියේය. කුමරියද ගසින් බසින්නට නොහැකිව ගස උඩම සිටියාය.

මියුලු නුවර රජතුමා, එදින දවල් කාලයෙහි උද්‍යානක්‍රීඩාකොට, සවස මාලිගයට යන අතර, අට්ටික්කා ගස උඩ වූ කුමාරිකාව දුටුවේය. දැක, දුටු විගසම පිළිබඳ සිත් ඇතිව, ඇයට ස්වාමියෙක් ඇද්ද නැද්ද යනු ඇසුවේය. කුමාරිකාවද "ස්වාමීනි, මාගේ දෙමව්පියන් විසින් මා පාවාදෙන ලද ස්වාමිකෙනෙක් ඇත. ඒ සැමියා මා මෙසේ තනිකර දමා ඉවත්ව ගියේයැ"යි කිවාය. රජතුමාද එය අසා, "හිමියන් නැති වස්තුව නම් අයත්වන්නේ රජ්ජුරුවන්ට නොවේදැ"යි කියා, කුමාරිකාව ගසින් බස්වා ඇතාගේ පිට උඩ හිඳුවාගෙන මාලිගාවට ගෙණ ගියේය. ගෙණගොස් ඇය අගමෙහෙසිය බවට පත්කරගත්තේය. ඇය හමුවූයේ අට්ටික්කා ගසක සිටිනවිටය. අට්ටික්කාවලට "උදුම්බරා" යන නමද වන හෙයින්, ඇයට "උදුම්බරා දෙවි යැ"යි නම් තැබුවේය.

පිඬගුත්තරද රාජසම්මතයෙන් රජමාලිගයෙහි සේවයට පත්වූයේය. දිනක් උදුම්බරා දේවි රජතුමා සමඟ රථයෙන් උද්‍යානයට යන අතරේදී, තවත් රාජසේවකයන් සමග සේවයෙහි යෙදී සිටි පිඬගුත්තර දැක, සිනාසුණාය. මෙය දුටු රජතුමා කිපී, "තී සිනාසුනේ මන්දැ"යි ඇසුවේය. "ස්වාමීනි, මාගේ මවුපියන් විසින් මා ප්‍රථමයෙන් පාවාදෙනලද මිනිසාය අර සේවයේ යෙදී සිටින්නේ. මා අට්ටික්කා ගසට නංවා ගසමුල කටුගසා ගියේ මේ මිනිසා ය. මොහු දැක මට සිනහ පහළවූයේයැ"යි ඕ කිවාය. එවිට රජතුමා "තා කියන්නේ බොරුය. තා සිනාසුනේ අනෙක් කිසියම් පුරුෂයකු දැක ඔහු හා අනුරාගයෙන් වියයුතුය. තා මරාදමමි"යි කියා කඩුව

ඇදගත්තේය. දේවී බියවී "ස්වාමීනි, පණ්ඩිතවරුන්ගෙන් මේ පිළිබඳව ඇසුව මැනවැ"යි බැගෑපත්ව කීවාය.

රජතුමා සේනක පඬිතුමා ගෙන්වා, "මැය කියන බස් පිළිගත හැකිදැ"යි ඇසුවේය. සේනකද "දේවයන් වහන්ස, ඇය කියන බස් පිළිගත නොහැක. මෙබඳු රූපත් කාන්තාවක අත්හැර දමා යන්නේ කවරෙක්දැ"යි කීවේය. සේනකගේ බස් අසා වඩාත් බිය වූ දේවිය, "ස්වාමීනි, මේ පිළිබඳව මහෞෂධ පණ්ඩිතයන්ගෙන්ද ඇසුව මැනවැ"යි රජතුමාගෙන් බැගෑපත් ලෙස ඉල්ලා සිටියාය.

රජතුමා මහෞෂධ පඬිතුමා ගෙන්වා මෙම ප්‍රශ්නය පිළිබඳව ඇසුවේය. මහෞෂධ පඬිතුමා "මෙබඳු රූපත් කාන්තාවක භාර්යාව වශයෙන් ලබාගැනීමට වාසනාවක් නැති පුරුෂයකු ඇය මෙසේ අත්හැර දමා යෑම පුදුමයක් නොවේ යයිද, දේවියගේ බස් පිළිගත හැකියැ"යිද පැහැදිලි කර දුන්නේය. රජතුමා, මහෞෂධ පණ්ඩිතයන් කරුණු පැහැදිලි කළ ආකාරයෙන් සන්සුන් සිත් ඇතිව, "පණ්ඩිතයෙනි, ඉදින් තොපි මෙහි නොසිටියහු නම්, අද මෙබඳු ස්ත්‍රීරත්නයක් අහිමිවී යනු ඇත. දැන් මා නැවත ලද්දේ තොප නිසා නොවේදැ"යි කියා සතුටුව මහෞෂධ පඬිතුමාට ස්තුති කෙළේය.

VOCABULARY FOR SUPPLEMENTARY READINGS

READING 1

අනුක්‍රමයෙන්	in order, gradually
අස් කරවනවා	cause to be removed, get one removed
ආරංචිවෙනවා	get news, get tidings
ආහාර පාන	food and drink
ඉසිනවා / ඉහිනවා	sprinkle, dash out, pump out
ඉස්වනවා	get one to sprinkle, dash out, or pump out
කවුඩා	N5 crow; pl. කවුඩෝ ; stem කවුඩු
කැදැල්ල	N2 nest; pl. කැදැලි / කැදලි
කිත්තිය / කීර්තිය	N2 fame, reputation; no pl.; stem කිත්ති / කීර්ති
ගෙන්වනවා	import
ඡායාව	N2 shadow, reflection; pl. ඡායා
තල්ගස	N2 palmyran palm; pl. තල්ගස්
දක්ෂකම/ දක්ෂතාව	N2 dexterity, skill, cleverness; pl. දක්ෂකම්/ දක්ෂතා
දේවයන්වහන්සේ	N5 king, majesty; pl. දේවයන්වහන්සේලා
නංවනවා	make one climb

පහසුවෙන්	easily
පැතිරෙනවා	spread
පිරිවරා	followed by, surrounded by
පිළිබිඹු වෙනවා	be reflected, be revealed
බාධාවෙනවා	be hindered, be obstructed
බාවනවා	make one lower something, or get down something
භාජනය	N2 vessel, container, pitcher; pl. භාජන
භාරකරනවා	entrust
මැණික	N2 gem, jewel; pl. මැණික්
රැස් කරවනවා	cause to gather
වාසල	N2 portal, gate; pl. වාසල්
වැළැක්වීම	N2 prevention; pl. වැළැක්වීම්
විමසීම	N2 investigation, testing; pl. විමසීම්
සභාව	N2 assembly, society; pl. සභා
සමීපවෙනවා	be close, get close to
සාරවනවා	cause to dig or plow

READING 2

අග	chief, main
අට්ටික්කා ගස	N2 fig tree; pl. අට්ටික්කා ගස්
අතුරනවා	spread
අත්පා	hands and feet
අනුරාගය	N2 love, affection; no pl.; stem අනුරාග
අයත්වෙනවා	belong, get ownership
අවසන් කරනවා	end, conclude, finish
අහිමිවෙනවා	lose ownership
ආචාර්යවරයා	N5 teacher, scholar; pl. ආචාර්යවරු ; stem ආචාර්ය
ඇල්ම	N2 affection, love, liking; no pl.; stem ඇල්ම

උද්‍යානය	N2 park, pleasure park; pl. උද්‍යාන
කටුගසනවා	put, place thorns
කටුව	N2 thorn; pl. කටු
කඩනවා	pick, break
කතාබහ	N2 talk, gossip; pl. කතාබහ්
කිපෙනවා	get angry, be enraged
කුමරි	N5 princess, girl, maiden
කුමාරිකාව	N5 princess, girl, maiden
කුල සිරිත	N2 family custom; pl. කුල සිරිත්
ක්‍රීඩාව	sport, game; pl. ක්‍රීඩා
දක්ෂයා	N5 clever person, smart fellow; pl. දක්ෂයෝ ; stem දක්ෂ
දේවි	N5 queen; pl. දේවියෝ
නගිනවා / නඟිනවා	climb (onto)
නැගෙනවා / නැඟෙනවා	get onto, climb onto
නිද්‍රගන්නවා	sleep
පාවාදෙනවා	give in marriage, hand over
පැහැදිළි කරනවා	clarify, explain clearly (to someone else)
පිළිබඳ සිත	N2 love, affection; no pl.; stem පිළිබඳ සිත්
පෙළෙනවා	suffer
ප්‍රථමයෙන්	(at) first
බස්වනවා	make one descend, make one get down
භාරගන්නවා	accept
මිදෙනවා	be relieved, be freed
මෙහෙසිය	N5 queen, consort; pl. මෙහෙසියෝ
රත්නය	N2 gem, jewel; pl. රත්න
රථය	N2 chariot; pl. රථ
රාජ සම්මතය	N2 royal consent, approval, order; no pl.; stem රාජ සම්මත

රාජ් සේවකයා	N5 royal official; pl. රාජ් සේවකයෝ ; stem රාජ් සේවක
රුව	N2 beauty, form, formal beauty; pl. රු
රූ ඇති	N2 beautiful, having beauty
වට	around
වහවහා	quickly
වාසනාව	N2 fortune, good luck, happiness; no pl.; stem වාසනා
වැඩිකල් නොගොස්	before long
වැඩිමලා	N5 the older one, eldest; pl. වැඩිමල්ලු ; stem වැඩිමල්
වැඩිවිය පැමිණෙනවා	attain puberty (of girls)
වැතිරෙනවා	lie, recline; past stem **වැතුරුණ්-**
විගස	at the moment, the moment
විශිෂ්ට	excellent, superb, distinguished
සන්සුන්	calmed, quieted
සමුගන්නවා	take leave, take permission (to leave)
සරණපාවා දෙනවා	give in marriage
සාගින්න	N2 hunger (lit. fire of hunger); no pl.; stem සාගිනි
සාදුක	N2 pain of hunger; pl. සාදුක්
සිනහපහළවෙනවා	laugh (involuntarily)
ස්තුති කරනවා	thank
හදුරනවා	study, train (in)

LESSON 11

වර්තමාන ලංකාව 1.

මීට ඉහත ආ "විජය පුවත" යන පාඩම් මාලාවේ තුන්වන කොටසින්, ලංකාව ආර්යජනපදයක් බවට පත්වූ අයුරු පෙන්වා දී ඇත. ආර්යජනපදයක් බවට පත්වීමෙන් පසු ලංකාව ස්වදේශිකයන් විසින් පාලනය කරන ලද රටක් විය. ලංකා ඉතිහාසයේ දැක්වෙන පරිදි , ලක්දිව පාලනය බොහෝදුරට සිංහල පාලකයන් අත රැඳී පැවතිනි. වරින්වර දකුණු ඉන්දියාවෙන් පැමිණි සතුරන්ගේ ආක්‍රමණවලට ලංකාව ගොදුරු වූ නමුත් සිංහල රජවරු ලංකාව එම උවදුරුවලින් බේරාගෙන, තම පාලන බලය තහවුරු කළහ. මෙසේ ලාංකික රජවරුන්ගේ පාලනය මත පැවතුණු දිවයින ක්‍රි.ව.16වන ශතවර්ෂයේ සිට නැවතත් විදේශිකයන්ගේ ආක්‍රමණවලට ගොදුරුවන්නට පටන්ගති. මෙවර ලක්දිව ආක්‍රමණය කරන්නට පටන්ගත් අය දකුණු ඉන්දියානු ජාතිකයෝ නොවූහ. ඔව්හු යුරෝපීය ජාතිකයෝ වූහ. ලක්දිව ආක්‍රමණය කළ ප්‍රථම යුරෝපීය ජාතිකයෝ පෘතුගීසීහු ය. ක්‍රි.ව.1505දී මොවුහු ලංකාව ආක්‍රමණය කොට, ලක්දිව මුහුදුබඩ පළාත් අත්පත් කරගත්හ. ඔව්හු අවුරුදු 150ක් පමණ කාලයක් ලංකාවේ මුහුදුබඩ පලාත් පාලනය කළහ. ඉන්පසු ලංකාවට පැමිණි අනෙක් යුරෝපීය ජාතිකයෝ ලන්දේසීහු ය. ඔවුන් පැමිණියේ ක්‍රි.ව. 1602දිය. ඔවුහු පෘතුගීසීන් ලංකාවෙන් නෙරපාදැමූහ. පෘතුගීසීන්ගෙන් ලංකාවේ මුහුදුබඩ පලාත්වල පාලන බලය අල්ලාගත් ලන්දේසීහු අවුරුදු 142ක් පමණ කාලයක් එම පලාත් පාලනය කෙරූහ. ලන්දේසීහු හෝ ලංකාවෙහි උඩරට රජය පරදවා, සම්පූර්ණ පාලනබලය අල්ලාගැනීමට පොහොසත් නොවූහ. ක්‍රි.ව. 1796දී ඉංග්‍රීසීහු ලංකාව ආක්‍රමණය කළහ. ඔවුහු ලන්දේසීන් නෙරපා දමා ලංකාවේ මුහුදුබඩ පළාත්වල බලය අල්ලාගත්හ. ක්‍රි.ව. 1815දී ඉංග්‍රීසීහු දිවයිනෙහි මුළු බලයම තමන් අතට ගත්හ. එතැන් සිට ක්‍රි.ව. 1948වන තුරු ලංකාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙහි යටත්විජිතයක් වශයෙන් පාලනය විය.

මෙම පාඩමෙන් ලංකාවට නිදහස ලැබීම පිළිබඳ කරුණු කිහිපයක් පමණක් ඉදිරිපත් කොට ඇත.

වර්තමාන ලංකාව යනුවෙන් මෙහි අදහස් කරනු ලබන්නේ නිදහසෙන් පසු ලංකාවයි. දෙවන ලෝක යුද්ධය අවසානවීගෙන එන අතරේදී, ඉංග්‍රීසි රජය ඇයගේ දකුණු ආසියාතික යටත්විජිතවලින් නැගිගෙන ආ ජාතික බලවේග සමථයකට පත්කිරීම සඳහා, එම විජිතවල ජනනායකයන් සමග, එම රටවල අනාගත පාලනයට අදාළවන කරුණු පිළිබඳව සාමකාමීව සාකච්ඡා කිරීමට තීරණය කළාය. යුද්ධ කාලයකදී ඉංග්‍රීසි රජය මෙම තීරණය ගත්තේ ඇයගේ දකුණු ආසියාතික යටත්විජිතවල පාලන ව්‍යවස්ථාවල ප්‍රශ්න විසඳීමටත්, එම විජිතවල ජනනායකයන්ගේ ඉල්ලීම්වලට කන්දීමටත් පමණක් නොව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යුද්ධ ප්‍රයත්නයද තහවුරු කරගැනීමේ අදහසිනි. මේ පරමාර්ථය සපුරාගනුවස් ඉංග්‍රීසි රජයේ නියෝජිතයන් ඉංදියාවේ

සහ ලංකාවේ ජනනායකයන් සමග සාකච්ඡා කළද, ඉංදියාව පිළිබඳව එම සාකච්ඡා එතරම් සාර්ථක නොවිය. ඊට ප්‍රධාන හේතුවක් වූයේ ඉන්දියාවේ පාලන ව්‍යවස්ථා පිළිබඳව ඉන්දිය ජනනායකයන්ගේ අදහස් සහ බ්‍රිතාන්‍ය පාලකයන්ගේ අදහස් අතර බොහෝ විෂමතා තිබීමය. එපමණක් නොව, එවක ඉන්දියාවේ "නැෂනල් කොන්ග්‍රස්" පක්ෂය (National Congress Party) සහ "මුස්ලිම් සංග" (Muslim League) පක්ෂය අතර වූ මතභේද ද එම තත්වය තවදුරටත් අවුල් කළේය. ඉංදියාවේ මෙන් නොව ලංකාවේ ජනනායකයන් සමග ඉංග්‍රීසි පාලකයන් පැවැත්වූ සාකච්ඡා බොහෝ දුරට සාර්ථක විය. එවක ලංකාවේ නායකයන්ගේ සාමූහික උත්සාහය සහ උනන්දුවද, ඔවුන්ගේ සාධාරණ ඉල්ලීම් සහ අදහස් උදහස්ද ඉංග්‍රීසි පාලකයන් සමග සාමකාමී සාකාච්ඡාවකට බෙහෙවින් ඇඩුටුන්නේය. සර් පොන්නම්බලම් රාමනාදන්, සර් ජේම්ස් පීරිස්, සර් ඩී. බී. ජයතිලක, එෆ්. ආර්. සේනානායක ආදි ප්‍රභූහු මෙම ජනනායකයන් අතරෙහි ප්‍රමුඛස්ථානයක් ගත්හ. ඉන්දිය ජනනායකයන්ගේ ඉල්ලීම් මෙන් නොව ලාංකික ජනනායකයින්ගේ ඉල්ලීම් බෙහෙවින් සාධාරණ ඒවා විය. එහෙයින් ලංකාවේ අනාගතය පිළිබඳව ලාංකික ජනනායකයන් ඉංග්‍රීසි පාලකයන් වෙත ඉදිරිපත් කළ යෝජනා සහ ඉල්ලීම් ඉංග්‍රීසි පාලකයන්ට පහසුවෙන් පිළිගත හැකිවිය. ලාංකික නායකයන් විසින් ඉංග්‍රීසි පාලකයන්ගේ මූලික අදහස්වලට විරුද්ධ නොවන අයුරු ව්‍යවස්ථාවක් සකස්කරන ලදි. ලංකාවේ අනාගත පාලනයට තුඩුදෙන පරිදි ලාංකික නායකයන් විසින් සකස් කරන ලද එම ව්‍යවස්ථාව සාකච්ඡා කොට, අවශ්‍ය ලෙස සංශෝධන ඉදිරිපත්කිරීම පිණිස, ලෝක යුද්ධය කෙරීගෙන යන අතරේදීම, ඉංග්‍රීසි ආණ්ඩුව විසින් කොමිසමක් (Commission) පත්කරන ලදි. මෙම කොමිසමෙහි සභාපතිවරයා වූයේ සෝල්බරි සාමිවරයා (Lord Soulbury) යි. මෙම කොමිසම සෝල්බරි කොමිසම (Soulbury Commission) යනුවෙන් හැඳින්වෙයි. මෙහි පරමාර්ථය වූයේ ලංකාවේ අනාගත ස්වතන්ත්‍ර පාලනයට ගැලපෙන අයුරු ව්‍යවස්ථාවක් ඉදිරිපත් කිරීමයි. ලංකාවෙහි ආභ්‍යන්තරික පාලනයට අයත් සෑම අංශයක් පිළිබඳවම ලංකාවට ස්වතන්ත්‍ර බලය පාවාදෙන පරිදිත්, විදේශීය කටයුතු සහ සංරක්ෂණය පිළිබඳව බලතල කිහිපයක් පමණක් ඉංග්‍රීසි ආණ්ඩුව මත රඳෙන පරිදිත්, සෝල්බරි කොමිෂන් සභාව ව්‍යවස්ථාවක් සකස් කළාය.

සෝල්බරි කොමිෂන් වාර්තාව සකස් කෙරීගෙන යන අතරේදී දෙවන ලෝක යුද්ධයද අවසාන විනි. බ්‍රිතාන්‍ය පාලනයෙහි බලයට පත් වූ ලේබර් පක්ෂය (Labour Party) තම යටත්විජිතවලට ස්වතන්ත්‍ර බලය පාවාදීමට තීරණය කරන ලදි. ලේබර් පක්ෂයට අයත් බ්‍රිතාන්‍ය පාලකයෝ මෙම තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන යෙදූහ. දකුණු ආසියාවේ විශාලම යටත්විජිතය වූ ඉන්දියාවට වහාම නිදහස් බලය ලබා දිය යුතු යැයි ඔව්හු තීරණය කළහ. යටත් විජිත යුගයේදී, පාලනය වශයෙන් ලංකාව බෙහෙවින් ඉන්දියාවට සම්බන්ධවූ හෙයිනුත්, දේශපාලනික වශයෙන් ලාංකිකයන් තුළ සෑහෙන අවබෝධයක් වූ හෙයිනුත්, එවක ලාංකික ජනනායකයන් ඉදිරිපත්කළ ඉල්ලීම් සහ යෝජනා ඉතාමත් සාධාරණ ඒවා වූ හෙයිනුත්, ඉන්දියාවට නිදහස දෙන අතරම ලංකාවටද නිදහස් බලය පාවාදිය යුතු යැයි ලේබර් පක්ෂයේ නායකයෝ වටහාගත්හ. ලංකාවට සම්පූර්ණ ස්වතන්ත්‍ර බලය දෙනු වස්, සෝල්බරි කොමිෂන් වාර්තාවෙන් වූ සුළු බාධක කිහිපයද ඉවත්කරගන්නා ලදි. අලුත් සංශෝධනද ඇතුළත්කොට ලංකාවට සම්පූර්ණ නිදහස දීම පිළිබඳ ආඥාපණත ක්‍රි. ව.1947දී ඉදිරිපත් කරන ලදි.

ලංකාවේ පාලන ව්‍යවස්ථාව බ්‍රිතාන්‍ය පාලන ව්‍යවස්ථාවට බොහෝදුරට සමාන වන සේ සකස් කරන ලදි. එමගින් ලංකාවට නියෝජිත පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් ඉදිරිපත් විය.

ලංකාවට ඉදිරිපත්කරන ලද ආණ්ඩුක්‍රමය බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයෙහි පිටපතක් සේ විය. එංගලන්තයේ රජු හෝ රැජින වෙනුවෙන් අග්‍රාණ්ඩුකාරවරයකු ලංකාවේ පාලන නායකයා වශයෙන් ලංකාවේ අගමැතිවරයාගේ අනුමැතිය අනුව පත්කරන ලද අතර, ලංකාවෙහි සියළුම පාලනබලය අගමැතිතුමා ඇතුළු නියෝජිත මන්ත්‍රීමණ්ඩලයට හිමිවිය. මෙබඳු පාලන ක්‍රමයක් මත ලංකාවට සම්පූර්ණ ස්වතන්ත්‍ර පාලන බලය ලැබුණේ ක්‍රි. ව.1948 පෙබරවාරි මස 4 වැනිදාය. එවිට ලංකාවෙහි පාලන පක්ෂයෙහි නායකයාව සිටි ඩී. ඇස්. සේනානායක මහතා නිදහස් ලංකාවේ ප්‍රථම අගමැතිවරයා බවට පත්විය. එවක ලාංකික නායකයන් සාමකාමී සාකච්ඡා මගින් ලංකාවට නිදහස ලබාගත් අයුරු ප්‍රශංසනීය ය. ලංකාවට නිදහස ලැබීමෙන් පසුව ද ලක්දිව පාලනයට අදාළවන සෑම කටයුත්තක්ම කරන ලද්දේ ඉංග්‍රීසි භාෂාවෙනි. රටේ පොදු මහජනතාවට නුපුරුදු සම්ප්‍රදායකිනි. නැඟී ආ හැකි සිංහල දෙමළ පිළිබඳ භාෂා ප්‍රශ්නයක් එමගින් තාවකාලිකව හෝ වැළැක්වුන නමුදු, පොදු මහජනතාවට තම රටෙහි පාලනය පිළිබඳ සෑහෙන අවබෝධයක් එමගින් ලැබුණේයයි කිව නොහැක. ලංකාවෙහි ප්‍රථම අමාත්‍යමණ්ඩලයෙහි සිංහල සහ දෙමළ අමාත්‍යවරුන් මෙන්ම සුළුජාතීන් නියෝජනය කරන අමාත්‍යවරුන්ද සිටිම, එවක සාමකාමී පාලනයකට බෙහෙවින් තුඩුදෙන්නක් විය. ලංකාව නිදහස ලැබූ කාලසීමාව තුළදීම නිදහස ලබාගත් ඉන්දියාව, බුරුමය ආදි රටවල් මෙන් නොව ආර්ථිකවශයෙන්ද හොඳ පදනමක් මත එවක ලංකාව පිහිටාතිබීම ලංකාවේ ඝාටක රහිත පාලනයට හේතුවුයේය. එසේවු නමුත්, විදේශීය භාෂාවකින් කෙරීගෙන ගිය එම පාලනයත්, දේශීය පදනමක් මත සකස් නොවූ දේශපාලන දශනයත් නිසා, එම පාලනක්‍රමය පොදුජනතාවට පහසුවෙන් සහභාගිවිය හැක්කක් වී යැයි පැවසීම උගහටය. පාලනබලය ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලැබූ අතළොස්සක් මතම පවතින්නක් බවට පත්විනි.

මෙතැන් සිට අද දක්වා ලංකාවේ දේශපාලන ඉතිහාසයට වැදගත්වන කරුණු කිහිපයක් අනතුරුව එන පාඩමකින් ඉදිරිපත්කරනු ඇත.

VOCABULARY

අගමැතිවරයා	N5 prime minister; pl. අගමැතිවරු ; stem අගමැති
අග්‍රාණ්ඩුකාරවරයා	N5 governor-general; pl. අග්‍රාණ්ඩුකාරවරු ; stem අග්‍රාණ්ඩුකාර
අත	in the hands of
අතළොස්ස	N5 a handful; no pl.
අදහස් උදහස්	ideas, etc.; pl. only
අදාළ වෙනවා	be relevant to
අනාගතය	N2 future; no pl.; stem අනාගත
අනුමැතිය	N2 approval; no pl.; stem අනුමැති

Lesson Eleven

අමාත්‍යමණ්ඩලය	N2 board of ministers, cabinet; pl. අමාත්‍යමණ්ඩල
අමාත්‍යවරයා	N5 minister; pl. අමාත්‍යවරු ; stem අමාත්‍ය
අයුරු	manner, as, so that. See grammar 18.
අවබෝධය	N2 understanding; no pl.; stem අවබෝධ
අවසාන වෙනවා	end, conclude
අවුල් කරනවා	disorganize, confuse, upset
ආක්‍රමණය	N2 invasion, attack; pl. ආක්‍රමණ
ආඥාපනත	N2 act (of parliament, etc.); pl. ආඥාපනත්
ආණ්ඩුක්‍රමය	N2 system of government; pl. ආණ්ඩුක්‍රම
ආභ්‍යන්තරික	internal, local
ආර්ථික	economic
ආසියාතික	Asian (adjective), Asiatic
ඇතුළත් කරනවා	include, admit, enter
ඇතුළු	including. See grammar 6.
ඉංග්‍රීසිහු	N5 the English people (pl.)
ඉදිරිපත් කරනවා	forward, present, put forward
ඉන්දියානු	Indian (adjective)
ඉන්දිය	Indian (adjective)
ඉවත් කරගන්නවා	take away, withdraw
උගහට	difficult
උත්සාහය	N2 effort; no pl.; stem උත්සාහ
එංගලන්තය	N2 England; no pl.
එමගින්	by that, through that
එවක	at that time
කන්දිම	N2 listening; pl. කන්දිම්
කෙරෙනවා	be done, get done
කොමිෂන් සභාව	N2 commission (committee); pl. කොමිෂන් සභා

කොමිසම	N2 commission; pl. කොමිසම්
ක්‍රියාත්මක කරනවා	implement, put into action
ගොදුරු වෙනවා	be subject to, fall prey to
ජනනායකයා	N5 public leader, national leader; pl. ජනනායකයෝ ; stem ජනනායක
-ජාතිකයා	N5 national, person of a nation or ethnic group (always occurs following the name of the country or group); pl. ජාතිකයෝ ; stem -ජාතික
තත්වය	N2 status, situation, condition; pl. තත්ව
තහවුරු කරනවා	confirm, establish
තාවකාලික	temporary
තාවකාලිකව	temporarily
තුඩුදෙනවා	be conducive to, be causal of
දර්ශනය	N2 sight, philosophy; pl. දර්ශන
දේශපාලන	political
දේශීය	native, indigenous, local, national
නමුදු	but. See grammar 2.
නැඟී එනවා	rise, spring up, arise
නැඟීගෙන එනවා	rise, spring up, arise (continuous - See grammar 21)
නියෝජනය කරනවා	represent
නියෝජිත පාර්ලිමේන්තුව	N2 representative parliament; pl. and stem නියෝජිත පාර්ලිමේන්තු
නියෝජිත මන්ත්‍රීමණ්ඩලය	N2 house of representatives; pl. නියෝජිත මන්ත්‍රීමණ්ඩල
නුපුරුදු	not used to, unaccustomed
නොව	unlike. See grammar 15.
පක්ෂය	N2 party, group; pl. පක්ෂ
පදනම	N2 basis, foundation; pl. පදනම්
පරදවනවා	defeat

Lesson Eleven

පරමාර්ථය	N2 aim, purpose, motive; pl. පරමාර්ථ
පාලකයා	N5 ruler, one who governs; pl. පාලකයෝ ; stem පාලක
පාලකබලය	N2 ruling power; no pl.; stem පාලකබල
පාර්ලිමේන්තුව	N2 parliament; pl. and stem පාර්ලිමේන්තු
පිටපත	N2 copy; pl. පිටපත්
පිහිටාතිබෙනවා	be established, be located, be situated
පෘතුගීසිහු	N5 the Portuguese people (pl.)
පොදු	common
පොහොසත්	rich, able
ප්‍රථම	first
ප්‍රභූවරයා	N5 distinguished person; pl. ප්‍රභූහු or ප්‍රභූවරු
ප්‍රමුඛ	chief, leading (adjective)
ප්‍රයත්නය	N2 effort; pl. ප්‍රයත්න
ප්‍රශංසනීය	praiseworthy
බලතල	power(s); pl. only
බලවේගය	N2 force, movement, uprising; pl. බලවේග
බාධකය	N2 obstacle, hindrance; pl. බාධක
බුරුමය	N2 Burma; no pl.; stem බුරුම
බොහෝදුරට	to a great extent
බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය	N2 British Empire
මත	on, based on. See grammar 19.
මතභේදය	N2 difference of opinion; pl. මතභේද
මහජනතාව	the public, people; no pl.; stem මහජනතා
මහතා	N5 gentleman, master, sir, Mr.; pl. මහත්වරු
මාලාව	N2 row, series, line, sequence; pl. මාලා
මුහුදුබඩ/මුදුබඩ	coastal, sea coast
යටත් විජිතය	N2 imperial colony; pl. යටත් විජිත

යුධය	N2 war; pl. යුධ
යුරෝපීය	European (adjective)
රජු	N5 king; pl. රජවරු
රදු පවතිනවා	remain, continue to stay
රහිත	without. See grammar 20.
රැජින	N5 queen; pl. රැජිනියෝ ; pl. stem රජ
ලන්දේසිහු	N5 the Dutch people (pl.)
ලෝක යුධය	N2 world-war
වරින්වර	from time to time, now and then
වර්තමාන	modern
වස්	so that. See grammar 7.
වාර්තාව	N2 report, minutes; pl. වාර්තා
වැළැක්වෙනවා	be prevented
විදේශිකයා	N5 foreigner; pl. විදේශිකයෝ ; stem විදේශික
විදේශීය	foreign
විදේශීය කටයුතු	N2 foreign affairs
විෂමතාව	N2 unevenness, discrepancy, difference; pl. විෂමතා ; stem විෂම
ව්‍යවස්ථාව	N2 constitution, statute; pl. ව්‍යවස්ථා
සංරක්ෂණය	N2 protection, security, defense; no pl.; stem සංරක්ෂණ
සංශෝධනය	N2 revision, amendment; pl. සංශෝධන
සපුරාගන්නවා	fulfill, achieve
සභාපතිවරයා	N5 chairman, president; pl. සභාපතිවරු ; stem සභාපති
සමථය	N2 settlement, state of calm, decision; no pl.
සමානවෙනවා	be similar
සම්පූර්ණ	full, complete
සම්ප්‍රදාය	N2 tradition; pl. සම්ප්‍රදා

Lesson Eleven

සම්බන්ධ වෙනවා	be connected
සර්	sir (titular prefix)
සාකච්ඡා කරනවා	discuss
සාධාරණ	just, justified, reasonable, common
සාමකාමී	peaceful
සාමකාමීව	peacefully
සාමිවරයා	N5 Lord (title); pl. සාමිවරු ; stem සාමි
සාමූහික	co-operative
සාර්ථක	successful
සීමාව	N2 limit, range; pl. සීමා
සුළු or සුලු	small, minor
සුළුජාතිහු	N5 (people of) minority communities (pl.)
ස්වතන්ත්‍ර	self-dependent, independent
ස්වදේශිකයා	N5 native, national, local person; pl. ස්වදේශිකයෝ ; stem ස්වදේශික
හේතු වෙනවා	be a cause

GRAMMAR

1. PAST CONCESSIVE

In Colloquial Sinhala, a past concessive form of the verb with the sense 'even if' is formed by adding -ත් to the past tense verbal adjective form (C.S. 34,3):

> ගුණපාල කතාකෙරුවත් සිරිපාල එන්නෙ නෑ.
> Even if Gunapala were to call (him) Siripala will not come.

The Literary equivalent is formed by adding any of the forms ත් , ද or more rarely දු , to the general form of the past tense verbal adjective. Like the Colloquial past concessive, the Literary one implies action prior to that of the main verb with the entire situation taking place at some future time:

> ගුණපාල කතාකෙරුවද (or කළද or කෙරුවත්) සිරිපාල එන්නේ නැත.
> Even if Gunapala were to call (him) Siripala will not come.

> ඔබ ගියත් (or ගියද or ගියදු) මම නො එමි.
> Even if you were to go, I will not come.

2. නමුත්

In both Colloquial and Literary Sinhala නමුත් 'but, however', can be used to introduce a sentence:

> දෙව්ලොවක් ඇතැයි ඇතැමෙක් පවසති. නමුත් එය කිසිවෙක් නොදකිති.
> Some say that there is a heaven. But no one sees it.

In Literary Sinhala නමුත් is also used together with the present or past (general or prenominal) verbal adjective to form 'although' clauses. In this construction, the difference in tense generally implies a difference of time with relation to the time of writing or speaking, rather than to the action or the main verb. Literary නමුත් also has a variant නමුදු . Thus:

> මගේ පුතා පැසැලට යන නමුත් කිසිවක් ඉගෙන නොගනියි.
> Although my son goes to school he does not learn anything.

> ගුරුවරයා පැවසුව නමුත් (or පැවසූ නමුත්) ශිෂ්‍යයෝ එම වැඩ නොකෙරුවෝය.
> Although the teacher told (them) the students did not do that work.

3. ACCUSATIVE POSSESSIVES

In Literary Sinhala, as in Colloquial, possessive relationships are generally expressed by the genitive case. However, in Literary they are sometimes expressed by using either the accusative or the stem form of the possessor. Where the possessor is plural, the accusative plural is used. Where the possessor is singular, the stem form is most common but nouns that have a distinct definite accusative (like those in 3,1) generally use that form. Thus:

ගුරුන් උපදෙස්	or	ගුරු උපදෙස්	teacher's advice

4. ORDINAL NUMERALS

In Literary Sinhala -වන may also be used instead of -වැනි or -වෙනි to form ordinal numerals:

දෙවන	or	දෙවැනි	or	දෙවෙනි	second
පස් වන	or	පස්වැනි	or	පස්වෙනි	fifth

5. WRITING NUMERALS

In writing numerals, the appropriate case and definiteness affixes are written with them according to the following conventions.

5.1 For Inanimate Numerals

5.11 Definite

a. In the direct case only the numeral is written:

6 = හය

8 = අට

b. The dative affix ට is written immediately after the numeral:

6ට = හයට

8ට = අටට

c. The genitive ඒ is written together with the last consonant symbol of the number in its written form:

6යේ = හයේ

8ටේ = අටේ

d. The instrumental -එන් is written together with the last consonant symbol of the number, or simply as -න් :

6 යෙන් or 6 න් = හයෙන්

8 ටෙන් or 8 න් = අටෙන්

5.12 Indefinite

The appropriate case affix is written along with the ක් of the indefinite:

8 ක් = අටක්

8 කට = අටකට

8 ක = අටක

8 කින් = අටකින්

5.13 In writing dates, the genitive case marker is often omitted.

1796 යේදී or 1796 දී = එක්දාස් හත්සිය අනූහයේදී
in 1796

1815 යේ ජනවාරි මාසයේදී or 1815 ජනවාරි මාසයේදී
in January 1815

5.2 For Animate Numerals

-කෙනා , -දෙනා , -නම are written out with the appropriate case and definiteness affixes.

1 කෙනෙක් = එක්කෙනෙක්

2 දෙනෙකුට = දෙදෙනෙකුට

3 නමකගෙන් = තුන්නමකගෙන්

5.3 For Ordinals

The numeral is written followed by one of the forms -වැනි , -වෙනි , or -වන .

1 වැනි = පළවැනි

2 වෙනි = දෙවෙනි

3 වන = තුන්වන

6. ඇතුළු 'INCLUDING'

ඇතුළු is an adjectival form meaning 'including'. That which is included precedes ඇතුළු :

විජය කුමාරයා ඇතුළු පිරිස
The retinue, including prince Vijaya

7. වස්

වස් is used with the passive participle form of verbs, as an alternant for සඳහා or පිණිස in the sense of 'for, so that' (9,12):

වැඩ කරනුවස් ගොවියෝ කුඹුරට යති.
The farmers go to the field for work.

Unlike සඳහා and පිණිස , වස් is not used as a postposition with verbal nouns or other nouns. Its use is also less frequent than that of සඳහා or පිණිස .

8. PASSIVE VOICE

Occasionally, in passive sentences the විසින් following the actor is omitted, but the noun or pronoun expressing the actor remains in the oblique. This optional omission of විසින් is found primarily in dependent clauses:

ශිෂ්‍යයන් කියවන ලද පොත් besides ශිෂ්‍යයන් විසින් කියවන ලද පොත්
The books that were read by the students

අප කියවනු ලබන පොත් besides අප විසින් කියවනු ලබන පොත්
The books that are being read by us

9. FEMININE AGREEMENT

In Literary Sinhala some inanimate nouns appear with verbs showing feminine agreement. Although the nouns so occurring cannot be specified by any general rule, they tend to be nouns referring to organizations or vehicles. In all such instances, this feminine agreement is optional.

රජය අළුත් පියවරක් ගැනීමට තීරණය කෙරැවාය (or කෙරැවේය)
The government decided to take a new step.

10. AGENT VERBAL NOUNS

The verbal nouns in -ීම or -ිල්ල in either Colloquial or Literary Sinhala, like Colloquial verbal nouns in -එක , refer to the action of the verb.

Sinhala also has verbal nouns referring to the actor or object of the verb. There are both animate and inanimate forms of such nouns made as follows.

a. Animate:

Animate verbal nouns are formed by adding -න්නා for the masculine and -න්නී for the feminine form of the nouns. Thus:

Verb Stem	Verbal Noun Masculine		Feminine	
ය - go	යන්නා	he who goes	යන්නී	she who goes
අදි - pull	අදින්නා	he who pulls	අදින්නී	she who pulls

These animate verbal nouns generally refer to the subject of the verb which may be either actor or object of the action depending on the meaning of the verb. Thus: අදින්නා 'the puller (masculine)' from අදිනවා 'to pull', but ඇදෙන්නා 'the one who is pulled (masculine)' from ඇදෙනවා 'be pulled'. They take the same affixes as other class 5 nouns with forms as follows:

	Definite	Indefinite	Plural
Masculine	අදින්නා	අදින්නෙක්	අදින්නෝ
Feminine	අදින්නී	අදින්නියක්	අදින්නියෝ

b. Inanimate:

The Inanimate verbal nouns (these are however very rare) are formed by adding -න්න to the stem of the verb and they thus resemble the Colloquial Infinitive in form:

Verb Stem	Verbal Noun
ඇදෙ- be pulled	ඇදෙන්න that which is being pulled

These inanimate nouns occur only in the singular and have the forms of a Class 2 noun as follows:

	Singular	
	Definite	Indefinite
Direct	ඇදෙන්න	ඇදෙන්නක්
Dative	ඇදෙන්නට	ඇදෙන්නකට
Genitive	ඇදෙන්නෙහි	ඇදෙන්නක
Instrumental	ඇදෙන්නෙන්	ඇදෙන්නකින්

This type of inanimate verbal noun is common only for certain verbs, unlike the animate ones above which are quite freely formed. They most commonly refer to the object of the verb, but for some verbs refer to the subject or to the action. They thus cannot be freely coined and their meanings cannot be predicted by any general rule and so must be learned as they occur. A few examples follow:

> ගස් කපන්නා ගසට නගියි.
> The tree-cutter climbs the tree.
>
> කපු කටින්නී කුමාරියකි.
> She who is spinning cotton is a princess.
>
> මම බිම ඇදෙන්න දැක්කෙමි.
> I saw that which was being dragged on the ground.

11. QUASI VERBAL NOUNS

The quasi-verbs ඇති , නැති , හැකි and යුතු have noun forms parallel to the verbal nouns given in sections above as follows:

Verb Stem	Verbal Noun		
	Masculine	Feminine	Neuter
ඇති	ඇත්තා	ඇත්ති	ඇත්ත
නැති	නැත්තා	නැත්ති	නැත්ත
හැකි	හැක්කා	හැක්කි	හැක්ක
යුතු	යුත්තා	යුත්ති	යුත්ත

12. THIRD PERSON PLURAL AFFIX -හ

There is an alternant form of the third person plural past tense which has -හ rather than the predication marker. With -හ the final stem vowel is -ආ rather than එ . But some modern writers use -ඇ instead of -ආ.

Third Person Plural Past Tense	Alternate Form
බැලුවෝය	බැලුවාහ or බැලුවහ
ඇද්දෝය	ඇද්දාහ or ඇද්දහ
වැටුණෝය	වැටුණාහ or වැටුණහ
කළෝය	කළාහ or කළහ
ආවෝය	ආවාහ or ආවහ
ගියෝය	ගියාහ or ගියහ

13. PAST TENSE SHORT FORM

The Literary Sinhala past tense simple forms (6,1) have alternate short forms made as follows:

For Regular Verbs of all Classes:

1. For all forms except the second and third person plural, a past stem is formed by replacing the stem-final vowel of the present tense by -ී- and changing the remaining stem vowels in the usual manner for the past tense. There is no doubling of consonants for Class 2. Thus:

	Present Stem		Past Stem
Class 1	බල-	see	බැලී-
Class 2	අදි-	pull	ඇදී-
Class 3	වැටෙ-	fall	වැටී-

2. For the second and third person plural, the stem-final vowel is replaced by -ූ- and the vowels are changed as usual. Thus:

	Present Stem	Past Stem
Class 1	බල-	බැලූ-
Class 2	අදි-	ඇදූ
Class 3	වැටෙ-	වැටූ

3. For monosyllabic verbs (CV-) ending in අ- or ආ-, the vowel is changed to ඇ- (always long):

Present Stem		Past Stem
ද-	burn	දැ-
සා-	plough	සැ-
ගා-	apply	ගැ-

4. To the stems formed as above, the usual person-number affixes are added, but in the third person plural only the හ alternant (section 12 above) is used with the short form. Thus:

		Singular	Plural
Class 1	1.	බැලීමි	බැලීමු
	2.	බැලීහි	බැලූහු
	3.	බැලීය	බැලූහ
Class 2	1.	ඇදීමි	ඇදීමු
	2.	ඇදීහි	ඇදූහු
	3.	ඇදීය	ඇදූහ
Class 3	1.	වැටීමි	වැටීමු
	2.	වැටීහි	වැටූහු
	3.	වැටීය	වැටූහ

For Irregular Verbs:

වෙනවා , ගන්නවා and දෙනවා have the following forms:

		Singular	Plural
වෙනවා	1.	වීමි	වීමු
	2.	වීහි	වූහු
	3.	විය, වීය	වූහ
ගන්නවා	1.	ගතිමි	ගතිමු
	2.	ගතිහි, ගත්හි	ගත්හු
	3.	ගති	ගත්හ

දෙනවා	1.	දිමි, දුනිමි	දිමු, දුනිමු
	2.	දිහි, දුනිහි, දුන්හි	දුන්හු
	3.	දී , දුනි	දුන්හ

Note that some of the short form alternants of දෙනවා have already appeared in 8,1.5.

යනවා does not have a short form. බොනවා has the same stem for all persons, as follows:

Present Stem	Past Stem
බො-	බී

The short forms of the past tense are used in the same way as the long form given earlier, but the frequency of their use differs from verb to verb. In general the short form is quite commonly used for the irregular verbs.

එම නුවරෙහි දුප්පත් බමුණෙක් විය.
There was a poor brahmin in that city.

ගුරුවරයා ශිෂ්‍යයන්ට පොත් කියවන ලෙස පැවසීය.
The teacher asked the students to read the books.

14. PAST TENSE OF CLASS 3 VERBS, දෙනවා AND වෙනවා

14.1 There is an alternate form of the third person singular of Class 3 verbs, formed by adding -ඉ rather than -ඒය to the past tense stem. Thus:

Past Tense	Past Tense Alternate Form
වැටුණේය	වැටුණි
කෙරුණේය	කෙරුණි

This has an additional variant form by which -උණ් of the past tense stem is changed to -ඉණ් when the -ඉ is added. Thus:

Alternate 1	Alternate 2
වැටුණි	වැටිණි
කෙරුණි	කෙරිණි

14.2 දෙනවා 'give' and වෙනවා 'be, become' also have variants of this kind as follows:

	Alternate 1	Alternate 2
දෙනවා	දුනි	දිනි
වෙනවා	වුනි	විනි or විණි

15. නොව

15.1 නොව is used to form the equivalent of English 'not...but' constructions, as in the following examples. නොව does not generally follow verbs.

> මෙය නවකථාවක් නොව කෙටි කථාවකි.
> This is not a novel but a short-story.
>
> කමලසිරි ඉගෙනගන්නේ මහාවිද්‍යාලයයෙහි නොව විශ්වවිද්‍යාලයයෙහිය.
> It is not at the high school that Kamalasiri learns but at the university.

15.2 X පමණක් නොව Y ද forms the equivalent of English 'not only X but (also) Y':

> කමලසිරි කෙටිකථා පමණක් නොව නවකථාද කියවයි.
> Kamalasiri reads not only short-stories but also novels.
>
> ඉගැන්වීමට පමණක් නොව ගොවිතැන් කිරීමටද හෙතෙම කැමතිය.
> He likes not only teaching but also farming.

The Colloquial equivalent is විතරක් $\left\langle\begin{matrix}\text{නෙවි}\\\text{නෙමෙයි}\end{matrix}\right\rangle$ .. ත් (C. S. 26,5):

> කමලසිරි කෙටිකතා විතරක් නෙමෙයි (or නෙවි) නවකතත් කියවනවා.

16. හු PLURALS

16.1 Many Sinhala animate nouns with a direct singular in ආ have a plural in උ . The last consonant before the උ is doubled unless the consonant is ර් , ය් , ව් , ණ් , ළ් . (ස් as usual, doubles as ස්ස් ,) These nouns are familiar both from Colloquial and Literary Sinhala.

Singular	Plural
පුතා	පුත්තු
මිනිහා , මිනිසා	මිනිස්සු
සොරා	සොරු

In Literary Sinhala, nouns of this type have an alternate plural by which හු is added to the noun stem. In general, for nouns of this kind the stem will be as follows:

a. The nominative singular without -ආ if the last consonant is ත්, ද්, ඩ්, න්, ම්, ස්, ල්.

b. Otherwise the nominative singular with -ආ shortened to -අ.

Thus:

Nominative Singular	Stem	Plural
පුතා	පුත්	පුත්හු
මිනිසා	මිනිස්	මිනිස්හු
සොරා	සොර	සොරහු

This හු plural alternate occurs only in the nominative case, and the other case forms are the same as for the ු plural, i.e. with -ුන් and no consonant doubling (3,1.122).

16.2 Nouns which refer to nations, nationalities and groups with stems ending in -ි or -ු usually take the හු plural. The -ි and -ු are lengthened to -ී and -ූ before හු. Such nouns usually occur in the plural and the stem is commonly used as an adjective. Thus:

Stem (and adjective)	Nominative Plural
ඉංග්‍රීසි	ඉංග්‍රීසීහු
හින්දු	හින්දූහු

The oblique stem is formed by replacing -හු by -න් :

Stem	Nominative Plural	Oblique Stem
ඉංග්‍රීසි	ඉංග්‍රීසීහු	ඉංග්‍රීසීන්
හින්දු	හින්දූහු	හින්දූන්

17. ANIMATE NOUNS IN -ු

Some nouns with -හු plural alternates given in Section 16 above have an alternate singular form in -ු rather than -ආ. Thus:

පුතා or පුතු

සොරා or සොරු

Only certain nouns have these alternants and the student must learn to recognize them as they occur. Other case affixes are added to the direct case as usual.

	Singular	Plural
Nominative	පුතු	පුත්තු
Accusative	පුතු	පුතුන්
Dative	පුතුට	පුතුන්ට
Genitive	පුතුගේ	පුතුන්ගේ
Instrumental	පුතුගෙන්	පුතුන්ගෙන්
Vocative	(පුත	පුතුනි)

18. අයුරු

18.1 අයුරු can be used as an alternate for පිරිදි , ලෙස , and සේ (9,17) in forming manner clauses with an ordinary or verbal adjective.

> සුදුසු අයුරු වැඩ කළ යුතුය.
> One must work properly.
>
> අප දක්වන අයුරු මෙය කියවිය යුතුය.
> One must read this as we indicate.
>
> ගුරුවරයා පැවසූ අයුරු ශිෂ්‍යයා වැඩ කළේය.
> The student worked as the teacher said.

18.2 අයුරු is also an alternate for පිරිදි , ලෙස and සේ in forming different subject purpose clauses (10,11.2).

> රට දියුණුවන අයුරු පාලකයෝ වෙහෙසෙති.
> The rulers { exert themselves / make effort } so that the country prospers.

18.3 අයුරු manner clauses may be used as the object of a verb of perception or the subject of an adjectival form.

> ගුණපාල වැඩකරන අයුරු මම දනිමි.
> I know the way Gunapala works.
>
> ඔවුන් නිදහස ලබාගත් අයුරු ප්‍රශංසනීයය.
> The manner in which they secured freedom is praiseworthy.

The Colloquial equivalent of these clauses employs හැටි or විදිය .

> ගුණපාල වැඩකරන හැටි මම දන්නවා.
> I know the way Gunapala works.

ගුණපාල වැඩකරන හැටි හොඳයි.
The manner in which Gunapala works is good.

19. මත 'ON THE BASIS OF'

The postposition මත has the sense 'on (the basis of), based on':

අධ්‍යාපනය දේශීය පදනමක් මත සකස්විය යුතුය.
Education must be organized on a national basis.

ඉංග්‍රීසි පාලනය මත පැවතුණු දිවයින...
The island that was under English rule...
(Literally '...that was being conducted on (the basis of) English rule')

20. රහිත AND සහිත

20.1 රහිත 'without' is the opposite of සහිත (5,8.2) and is used in the same sort of constructions:

කරදර රහිත ජීවිතයක්
A life without troubles.

20.2 ව may be added to රහිත or සහිත to form adverbial phrases:

කරදර සහිතව ජීවත් විය.
He lived with trouble.

කරදර රහිතව ජීවත් විය.
He lived without trouble.

21. CONTINUED ACTION

ගෙනයනවා added to the past participle of Class 3 verbs adds the sense of continued action. **ගෙන එනවා** (sometimes **ගන එනවා**) in the same usage has the sense of action which begins and then continues.

යුධය කෙරීගෙන යන අතර...
When the war was being continued...

ඒ ශතවර්ෂයෙහි යුධය කෙරීගෙන ආවේය.
In that century the war started (and went on).

22. WRITING SYSTEM - f

The sound f occurs in Sinhala only in foreign words, usually English. It is represented in modern Sinhala in two ways:

1. f plus ဖ : The f is written before, after or within the ဖ :

ေfဖာေတာ်
ေဖfါေတာ် } foto photographs
ေဖာေတာ်

2. ო :ო Is a recently introduced symbol for representing f:

ေოာေတာ်	foto	photographs
ေოာ် ဧဆစ်	fō ēsəs	Four Aces (brand of cigarettes)

SUPPLEMENTARY READINGS

1. ලක්දිව ගොවිතැන

යම් කිසි රටක වාසය කරන්නන්ගේ ජීවනමාර්ග සහ ජාතික ධනය උපදවන ක්‍රම අනුව එම රටෙහි ආර්ථික පදනම පිළිබිඹුවේ යැයි සඳහන් කළ හැකිය. මූලික වශයෙන් මෙම කරුණුවලට අනුව ලංකාව පිළිබඳ විමසා බලන කල්හි විදේශික පාලනයට යටත්වීමට පෙරත් විදේශික පාලනය යටතේත්, විදේශිකයන්ගෙන් නිදහස ලබාගැනීමෙන් පසුත් ලංකාවේ ආර්ථික මුහුණුවර කෙබඳු වී දැයි සැලකිය යුතුවෙයි. ලංකාව ශතවර්ෂ කිහිපයක්ම විදේශික පාලනයට යටත් වී තිබුනි. එම කාල සීමාව තුලදී, ලංකාවේ ජාතික ධනය, එම විදේශික පාලකයන් විසින් යොදවන ලද්දේ සම්පූර්ණයෙන්ම වාගේ ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහාය. රටෙහි ධනය උපදවන ක්‍රමද, ඔවුන්ගේ වෙළඳ සැලැස්මට ගැළපෙන පරිදි ඔවුහු මූලික වශයෙන් වෙනස් කළහ. ලාංකික ජනතාවගේ අවශ්‍යතා සපුරාලන අයුරු සකස්වී තිබුණු ගොවිතැන් ක්‍රම සහ අනෙත් ව්‍යාපාරද මෙම විදේශික පාලනය නිසා වෙනස් විය.

විදේශිකයන් ලක්දිව අත්පත්කරගැනීමට පෙර දිවයිනෙහි ප්‍රධාන වගාව වශයෙන් පැවතුණේ වී ගොවිතැනයි. ලක්වැසියන්ගේ ප්‍රධාන ආහාරය බත් ය. එහෙයිනි ලක්දිව ගොවිතැන් අතුරින් වී ගොවිතැනට මූලික ස්ථානයක් ලැබුණේ. මෙම වී වගාවෙහි දියුණුව සඳහා ඉතාමත් සාර්ථක වූ වාරිමාර්ග ක්‍රමයක් පැරණි ලංකාවෙහි විය. එය වැව් කර්මාන්තය යනුවෙන් හැඳින්වෙයි.

විදේශික පාලනයට ලක්දිව යටත්වීමෙන් පසු, පෙර ප්‍රධාන වගාවක් වී තිබුණු වී ගොවිතැනෙහි දියුණුව නැවතුනේය. වී ගොවිතැනට වූ මෙම බාධාවට තුඩුදුන් කරුණු කිහිපයක් වූයේය. ස්වදේශිකයන්ට වඩා විදේශිකයන්ගේ ලාභ ප්‍රයෝජන සඳහා වූ වෙනත් බෝගවර්ගවල දියුණුව සඳහා දෙන ලද අවධානයත්, ලංකාවේ උඩරට පෙදෙස්වල තිබුණු විශාල බිම් කොටස් වැවිලි ව්‍යාපාරයට යෙදවීම සඳහා විදේශික වැවිලි කරුවන්ට විකිණීමත්, පිටරටින් සහල් ගෙන්වා අඩුමිලකට ඒවා ලාංකිකයින්ට දීමට විධිවිධාන යෙදීමත් යන කරුණු එයින් සමහරක් සේ දැක්විය හැකිය. බුරුමය, ඉන්දියාව ආදී රටවලින් හාල් මිලයට ගැනීමේ පුරුද්ද ඇතිවීමෙන් ලංකාවේ වී ගොවිතැනෙහි දියුණුවද බොහෝදුරට අඩුවිය. එසේ වූ නමුත්, මෙරට ගොවියා වී ගොවිතැනෙහිම යෙදුනේය.

ලක්වැසියන්ගේ රැකිරක්ෂා ගැන විමසා බලන කල්හි, ගොවිතැනට ප්‍රධාන තැනක් හිමිවන බව පැහැදිළි වෙයි. ලංකාවේ ප්‍රධාන වගා වී ඇත්තේ වී, පොල්, රබර් සහ තේ වගාය. මෙයින් පොල්, රබර් සහ තේ ලංකාවේ ප්‍රධාන වෙළඳ වගා තුන වෙයි. ලංකාවට පිටරටින් ගෙන්වනු ලබන හාල්, සීනි, රෙදි, කාර්මික උපකරණ ආදී සෑම ද්‍රව්‍යකටම පාහේ ලංකාවේ රජය විසින් ගෙවනුලබන මුදල්වලින් වැඩිකොටසක් මෙම බෝගවර්ග තුනෙන් ලබාගන්නා මුදල් වෙයි. වී ගොවිතැන ලක්වැසියාගේ ප්‍රධාන රැකියාවක් වන නමුත් ලංකාවට අවශ්‍යවන

සහල් ප්‍රමාණයෙන් සැහෙන කොටසක් තවම පිටරටින් ගෙන්වනු ලැබෙයි. මේ සඳහා විශාල වියදමක් දැරීමට ලංකාවේ රජයට සිදුවී ඇත. ලංකාවට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය වන මිරිස් ලූනු සහ අලවර්ගවලින් සැහෙන කොටසක් දැන් ලංකාවේම වවනු ලැබෙයි. ලංකාවේ වගාකොට දියුණු කළ හැකි තවත් බෝගවර්ග රාශියකි. උක්, දුම්කොළ, රටකජු සහ කපු ඉන් සමහරකි.

2. පැරණි ලක්දිව ගොවිතැන් ආදිය.

ලංකාව ආර්ය ජනපදයක් බවට පත්කරන ලද අයුරු මෙහි මුල් පාඩමක දක්වා ඇත. ලක්දිවට ආර්යයින් පැමිණෙනවිට ලක්දිව විසූ විවිධ ගෝත්‍රිකයන් භාවිතාකරන ලද්දේ දියුණු වූ කෘෂිකාර්මික ක්‍රම නොවෙයි. කෘෂිකාර්මික කටයුතු සඳහා, මුල්වරටම ආර්යයෝ යකඩ නගුල සහ විවිධ ලෝහ උපකරණ භාවිතය ලංකාවට ඉදිරිපත් කළහ. "මෙම අලුත් උපකරණ එවක ලක්දිව විසූ ගෝත්‍රික ජනයාද භාවිතයට ගත්හ"යි සැලකිය යුතුය. ලංකාවට මුල් යුගවලදී පැමිණි ආර්යයන්ගේ සංඛ්‍යාව එතරම් වැඩි නොවූ හෙයින්, ඔවුහු ලාංකික ගෝත්‍රිකයන් මෙම අළුත් උපකරණ භාවිතයෙහි උනන්දුකරවූහයි ද සැලකිය හැක.

ලංකාවට මුලින්ම පැමිණි මෙම ආර්යයෝ "සිංහල" යනුවෙන් හඳුන්වන ලදහ. වංශකථාවල සඳහන්වන පරිදි මුල් ම සිංහලයෝ මූලික වශයෙන් ලක්දිව වියලි කලාපයෙහි ජනපද පිහිටවූහ. වියලි කලාපයෙහි, තෙත් කලාපයෙහි මෙන් ඝන කැලෑ නොවිය. ඒවා ගොවිතැන් කිරීම සඳහා පහසුවෙන් එළිකර ගතහැකි විය. මුල්ම ආර්යයන් වියලි කලාපයෙහි ජනාවාස පිහිටුවීමට වැඩිකැමැත්තක් දැක්වූයේ මේ නිසාද විය හැක. ලක්දිව එවක විසූ ගෝත්‍රිකයන් මෙන් මොවුහුද ගොවිතැනින් ජීවත්වන්නෝ වූහ. ගොවිතැන් කිරීමේ පහසුව අනුව ඔවුහු තම ජනපද පිහිටුවා ගත්හ. වියලි කලාපයෙහි බිම්ද තැනි බිම් විය. තෙත් කලාපයෙහි බෙහෙවින් කඳුකර පෙදෙස් විය. මෙහි පැමිණි ආර්යයන්ගේ මූලික ආහාරය වූයේ බත් ය. වී ගොවිතැන සඳහා වඩා පහසු පෙදෙස් වශයෙන් එහෙයින් ඔවුහු වියලි කලාපය තෝරා ගත්හ.

වී ගොවිතැන් කිරීමේ ක්‍රම 2ක් එවක වී යැයි සැලකිය හැක. කැලෑ කපා දමා එම බිම් කොටස්, වැස්සෙන් ජලය ලබා වී ගොවිතැන් කිරීම සඳහා යෙදීම එක් ක්‍රමයක් වූ අතර නියම ලෙස සකස්කරන ලද කුඹුරුවල, වැසිජලය මෙන්ම වාරිමාර්ග ක්‍රමවලින් යොදනුලබන ජලයද ලබා වී ගොවිතැන් කිරීම අනෙක් ක්‍රමය විය. වී ගොවිතැන් කරනුවස්, මෙයින් පළමුවැනි ක්‍රමය එතරම් සාර්ථක ක්‍රමයක් නොවිය. මේ කරුණු ඔවුහු වටහාගත්හ. වී ගොවිතැන් කිරීමට මෙන්ම තද නියංකාලවලදී බීම සඳහා ජලය ගැනීමටද අවශ්‍ය පරිදි ජලය රැස්කර තැබීමේ මාර්ගයක් වශයෙන් ඔවුහු පැරණි ලංකාවෙහි මුල්වරටම වැව් කර්මාන්තය ආරම්භ කළහ. සෑම ප්‍රධාන ගම්කම පාහේ මෙබඳු වැවක් ඔවුහු තැනූහ.

වැසිජලය පමණක් ලබා ගොවිතැන් කරන ලද බිම්වල ඔවුන් වගා කළේ වී පමණක් නොවේ. දිනපතා ආහාරය සඳහා ප්‍රයෝජනයට ගන්නා ලද නොයෙක් ධාන්‍ය වර්ගද ඔවුහු වැවූහ. අමු, කුරහන් ආදියද, ආහාරවර්ග සකස් කිරීම සඳහා මෙන්ම නොයෙක්

බෙහෙත් වර්ග සඳහාද පාවිච්චි කරනු ලබන තෙල් සපයා දෙන තල ආදි ධාන්‍යවර්ගද මෙබඳු බිම්වල ඔවුන් වවන ලදි. උක් වගාවද සෑහෙන ප්‍රමාණයකට කෙරිනි. උක්පැණි සහ සකුරු ආහාර සඳහා පාවිච්චි කරනලදි. මීට අමතරව නොයෙක් පලතුරු වර්ගද වවන ලදි.

පැරණි සිංහලයෝ, රෙදිවිවීම පිළිබඳව සෑහෙන අවබෝධයක් ඇත්තෝ වූහ. රෙදි විවීම සඳහා උවමනාවන නූල් ඔවුන් විසින් වවන ලද කපුවලින් සපයා ගන්නා ලදි. එවක පොල්වතු වූ බවද පැරණි සෙල්ලිපි ආදියෙහි සඳහන් වී ඇත.

කෘෂිකර්මයට අමතරව, ගවයන් ඇතිකිරීමද කරන ලදි. එළකිරි මෙන්ම කිරිවලින් සාදාගන්නා ලද දීකිරි, මෝරු, වෙඬරු, ගිතෙල් ආදියද වැදගත් ආහාර පාන වර්ග විය. බත් සමග ගිතෙල් කෑමේ සිරිතක්ද, එවක පැවතුණු බව සඳහන් වෙයි. ගිතෙල් වැදගත් බෙහෙතක්ද වෙයි. වර්තමාන සිංහලයෝ බත් සමග ගිතෙල් නොකති. ඔවුන් ගිතෙල් පාවිච්චියට ගන්නේ බෙහෙතක් වශයෙන් පමණි. දැනට ලංකාවේ වාසයකරන ජනයා අතුරින් පුරුද්දක් වශයෙන් බත් සමග ගිතෙල් කන්නෝ දෙමළ හින්දු ජනයාය. ඉන්දියාවෙහි සෑම පලාතකම පාහේ මිනිස්සු බත් සමග ගිතෙල් කති.

එකල කළුතර පලාත්වල වවනලද, ආහාර සඳහා යෙදෙන විවිධ බෝගවර්ග විය. ඉඟුරු, කහ, ගම්මිරිස් ආදි කුළුබඩු වර්ග මේවායින් සමහරකි.

එවක සිංහලයෝ ධාන්‍ය සහ එළවළු වර්ගවලින් පමණක් යැපෙන්නෝ නොවූහ. අද මෙන්ම එදාද සිංහලයන්ගේ ආහාරයේ වැදගත් කොටසක් වූයේ මාළු යි. මුහුදුබඩ පලාත්වල මසුන් මරන්නන්ගේ ගම් පිහිටා තිබුනි. මසුන්මරන්නෝ ගම්වැසියන්ට මාලු සැපයූහ. ගම්වැසියන්ට වැද්දෝ මස් සැපයූහ.කැලෑවලින් සොයාගන්නා ලද මීපැණි ආහාරයක් පමණක් නොව වැදගත් බෙහෙතක්ද විය.

ගොවිතැනට සම්බන්ධවන්නකි වාරිමාර්ග ක්‍රමය. ලංකාවට පැමිණි ආර්යයෝ වි ගොවිතැන සහ වාරිමාර්ගක්‍රම පිළිබඳ හොඳ අවබෝධයක් ඇත්තෝ වූහ. මොවුන්ගේ මෙම මූලික දැනුම, පැරණි ලාංකික වාරිමාර්ග ක්‍රමයෙහි දියුණුවට හේතුවක් විය. පසුකාලීනව ලංකාවේ ඇති වූ සංකීර්ණ වාරිමාර්ග ක්‍රමය මොවුන්ගේ මෙම දැනුමෙහි විකාශනයට සාක්ෂි දරයි.

VOCABULARY FOR SUPPLEMENTARY READINGS

READING 1

අවධානය	N2 attention; no pl.
අවශ්‍යතාව	N2 need, necessity; pl. අවශ්‍යතා
ඇතිවීම	N2 arising, happening, taking place, becoming; pl. ඇතිවීම්
උක්	sugar cane; pl. only
උපකරණය	N2 implement, tool; pl. උපකරණ
කපු	cotton; pl. only

කර්මාන්තය	N2 industry, craft; pl. කර්මාන්ත
කාර්මික	industrial, technical
ජීවනමාර්ගය	N2 mode or means of living; pl. ජීවනමාර්ග
දුම්කොළ	tobacco; pl. only
ධනය	N2 wealth; no pl.; stem ධන
පැහැදිලි වෙනවා	become clear
බෝගවර්ගය	N2 a kind of seed or grain for planting; pl. බෝගවර්ග
මිල	N2 price; no pl.
මුහුණුවර	N2 character, features, countenance; no pl.
යටත්වෙනවා	be subject to, surrender
යම් කිසි	any, whatsoever
යොදවනවා	engage someone; cause to use, use
රටකජු	peanuts; pl. only
ලක්වැසියා	N5 Ceylonese; pl. ලක්වැසියෝ ; stem ලක්වැසි
ලූනු	onions; pl. only
වාගේ	like, as if, so to say (Coll. වගේ)
වාරිමාර්ග ක්‍රමය	N2 irrigation system; pl. වාරිමාර්ග ක්‍රම
වැවිලි කරුවා	N5 planter; pl. වැවිලි කරුවෝ; stem වැවිලි කරු
වැවිලි ව්‍යාපාරය	N2 plantation (scheme); pl. වැවිලි ව්‍යාපාර
වැව් කර්මාන්තය	N2 system of tanks (reservoirs); pl. වැව් කර්මාන්ත
වෙළඳ	commercial
ව්‍යාපාරය	N2 activity, scheme, undertaking, business; pl. ව්‍යාපාර
සපුරාලනවා	supply (for oneself), procure
සම්පූර්ණයෙන්	fully, completely
සැලැස්ම	N2 plan, scheme; pl. සැලැස්මවල්

READING 2

අමතරව	in addition to

අමු	a kind of grain; pl. only
ආරම්භ කරනවා	begin, start, commence
ඇතිකරනවා	grow, tend, rear (of animals, etc.)
ඉඟුරු	ginger; pl. only
උනන්දු කරනවා	make one interested in, encourage
එළකිරි	cow-milk; pl. only
එළි කරගන්නවා	get cleared (for oneself)
කඳුකර	hilly
කහ	saffron, turmeric; pl. only
කුරහන්	a kind of millet; pl. only
කුළුබඩු	spices; pl. only
කෘෂිකාර්මික	agricultural
ගම්මිරිස්	black pepper; pl. only
ගවයා	N5 cow (cattle); pl. ගවයෝ ; stem ගව
ගිතෙල්	N5 ghee; pl. only
ගෝත්‍රිකයා	N5 member of a tribe; pl. ගෝත්‍රිකයෝ ; stem ගෝත්‍රික
ඝන	thick, dense
ජනාවාසය	N2 settlement; pl. ජනාවාස
ජලය	N2 water; no pl.; stem ජල
තද	hard, tough, strict, severe, strong
තනනවා	build
තල	sesame (seed or plant); pl. only
තැනිබිම	N2 lowland; pl. තැනිබිම්
දැනුම	N2 knowledge, know-how; pl. දැනුම්
දිකිරි	curd, yoghurt; pl. only
ධාන්‍ය	grain; pl. only
නියඟ	N2 drought; pl. නියං

Lesson Eleven

නියමලෙස	properly, well
පසුකාලීනව	later, at a later period
පැණි or පැනි	syrup, treacle; pl. only
පිහිටවනවා	fix, establish
බහුල වශයෙන්	greatly, for the most part
බෙහෙත	N2 medicine, drug; pl. බෙහෙත්
භාවිතය/භාවිතාව	N2 use, usage; no pl.
මඩ කරනවා	make wet, make muddy
මසුන්මරන්නා	N5 fisherman; pl. මසුන්මරන්නෝ ; stem මසුන්මරන
මාලුවා or මාළුවා	N5 fish; pl. මාලු or මාළු
මී පැණි	honey; pl. only
මෙබඳු	like this, such
මෝරු	whey, buttermilk; pl. only
යැපෙනවා	suffice, be enough
යොමු වෙනවා	direct, focus, draw the attention
රැස්කර තබනවා	keep stored
ලෝහය	N2 metal; pl. ලෝහ
විකාශනය	N2 development, expansion; pl. විකාශන ; stems විකාශන (plus nouns), විකාශනය (plus verbs)
විවිධ	manifold, various
විවීම	N2 verbal noun of වියනවා 'weave'
වෙඬරු	butter; pl. only
සංකීර්ණ	complex
සංඛ්‍යාව	N2 number, numeral; pl. සංඛ්‍යා
සකුරු	jaggery; pl. only
සපයනවා	supply, provide with
සාක්ෂි දරනවා	bear witness

LESSON 12

වර්තමාන ලංකාව 2.

පසුගිය පාඩමින්, ලංකාවට නිදහස ලැබුණු අයුරු කෙටියෙන් දක්වා ඇත. එතැන් සිට අද දක්වා, ලංකාවේ දේශපාලන ඉතිහාසයට අදාළවන කරුණු ස්වල්පයක් මෙම පාඩමින් ඉතා ලුහුඬින් වුවද දැක්වීමට අදහස් කරමු.

ලංකාව නිදහස ලැබීමට පෙර, එවක ලාංකික ජනනායකයන් බෙහෙවින් උනන්දුවූයේ නිදහස ලබාගැනීම පිණිස ය. ඔව්හු ඉංග්‍රීසි පාලකයන් සමග සාධාරණ පදනමක් මත සාකච්ඡාවකට ඉදිරිපත්වුවෝ, ලංකාවට නිදහස ලබාගැනීමෙහිලා පොහොසත් වූහ. මෙම පරමාර්ථය ඉටුකරගැනීම සඳහා එවක සිටි ජනනායකයෝ ජාති, භාෂා සහ ආගම් භේදවලින් තොරව සාමූහිකව ක්‍රියා කළහ. එසේවුවද, නිදහස ලබාගත් පසු, කල් යත් යත් මෙම ප්‍රශ්නද පැනනගින්නට නොවූයේ යැයි කිව නොහැක. දෙමළ ඇමතිවරුන් කිහිප දෙනෙකු අමාත්‍ය මණ්ඩලයෙහි සිටියද, ලංකාවෙහි මූලික පාලනබලය රඳාපැවතුනේ සිංහල ඇමතිවරුන් අතෙහි ය. එපමණක් නොව, එවක දේශපාලනඥයන් අනුගමනය කළා වූ දේශපාලන ක්‍රමය ස්වදේශීය මුහුණුවරකින් තොරවූ නිසා, එය පොදු ජනතාව හට පහසුවෙන් සහභාගිවිය හැක්කක්ද නොවිය. එවක දේශපාලනඥයෝ ඉංග්‍රීසි රටාවට ගැළපෙන පරිදි ලංකාවේ පාලනක්‍රමය සකස් කළහ. ලංකාවේ ජනයාගෙන් වැඩි කොටසවන පොදු මහජනතාවට එයට පහසුවෙන් සහභාගිවිය හැකි දැයි ඔවුහු සලකා නොබැලූහ. මේ ආදි හේතු නිසා, එකල පාලනක්‍රමය තේරුම් ගතහැකි වූයේත්, එයට සහභාගි විය හැකි වූයේත් ඉංග්‍රීසි මාධ්‍යයට පුරුදු වූ අතළොස්සකට පමණි. කෙසේ හෝ වේවා, එවක ලංකාවේ ආර්ථික පදනම සතුටුදායක වූ හෙයින්, රටේ අභ්‍යන්තරික වශයෙන් එතරම් ප්‍රශ්න පැනනැගීමට අවස්ථාවක් ඇති වූයේ නැත.

පොදු ජනයාගේ අවබෝධයෙන් ඈත් වූ මෙම දේශපාලනක්‍රමය අනාගතයේදී බැරෑරුම් ප්‍රශ්නවලට ලක්විය හැකිවන්නේ යැයි, එකල දේශපාලනඥයන් නොසිතුවා විය හැක. විදේශීය කටයුතුවලදී මෙන්ම ඇතැම් අභ්‍යන්තරික පාලන කටයුතුවලදී ද, එවක පාලකයෝ බ්‍රිතාන්‍ය පාලන ක්‍රමයෙන්ම උපදෙස් ගත්හ. ලංකාවේ ආර්ථික තත්වය පිළිබඳවද බ්‍රිතාන්‍යයෙහි සිතැඟිපාකම් බොහෝදුරට බලපාන්නට විය. වැවිලි කර්මාන්තයෙන් වැඩි කොටසක් බ්‍රිතාන්‍ය කොම්පැනිවලට අයත් වූ අතර, දිවයිනෙහි වෙළඳාම් සහ කර්මාන්තවලින්ද වැඩිහරියක් ඉංග්‍රීසි ජාතිකයින් අතේ පවතින්නට විය. එවක ලාංකික පාලකයන් ඉංග්‍රීසි රජය සමග කළාවූ සංරක්ෂණ ගිවිසුම යටතේ, බ්‍රිතාන්‍ය හමුදා ලංකාවේ නැවැත්වීමට ඉඩලැබුණි. මේ හේතු නිසා, කටුනායක ගුවන් තොටුපලත්, ත්‍රිකුණාමලයේ වරායත් බ්‍රිතාන්‍ය පාලනය යටතේ පවතින්නට විය. මෙම කරුණු ලංකාවේ දේශපාලන අනාගතයට කෙතෙක්දුරට බලපාන්නේ දැයි එවක පාලකයන් ඇතැම්විට නොසිතුවා වියහැක.

Lesson Twelve

නිදහස ලැබීමෙන් පසු, ස්වතන්ත්‍ර දේශපාලන ක්‍රමයක් ලංකාවේ ක්‍රමයෙන් තහවුරු වන්නට වෙද්දී, ලංකාවේ පාලනබලය දිනාගන්නට මහන්සි දරන්නාවූ අනෙක් දේශපාලන පක්ෂද ඇතිවන්නට විය. ජාතිවාදී අදහස් දැරූ ඇතැම් දේශපාලනඥයෝ, බ්‍රිතාන්‍ය බලකඳවුරු ලක්දිව පිහිටුවා තිබීම, තම දේශපාලන පරමාර්ථ ඉටුකරගැනීම සඳහා හොඳ ආයුධයක් කර ගත්හ. ඉංග්‍රීසි හමුදා ලංකාවේ නවත්වා තිබීම දිවයිනෙහි නිදහසට බාධාවක් බව ඔවුහු පෙන්වාදුන්හ. එහෙත්, ජාතිවාදී දේශපාලනඥයන් දැක්වූ මෙම අදහස,මුලදී පොදුජනයා තුළ එතරම්දුරට බල නොපෑවේය.

ලංකාවට අලුතෙන් ඉදිරිපත් කරන ලද්දාවූ ආණ්ඩුක්‍රමය සාර්ථක ලෙස කරගෙනයෑමට , හොඳින් සංවිධානය වූ පක්ෂක්‍රමයක් අවශ්‍ය විය. ප්‍රබල පක්ෂයක් වශයෙන් එක්සත් ජාතික පක්ෂය (United National Party) සංවිධානයවීම, ලංකාවේ ස්වතන්ත්‍ර පාලනයේ මුල් අවස්ථාවේදී සිදුවූ වැදගත් දෙයකි. එක්සත් ජාතික පක්ෂය හෙවත් යු. ඇන්. පී. පක්ෂය හැරුණුවිට තවත් පක්ෂ කිහිපයක් විය. මෙම පක්ෂ අතුරින් 3ක් මාක්ස්වාදී (Marxist) පක්ෂ වූයේය. එනම් ලංකා සමසමාජ පක්ෂය (Lanka Samasamaja Party), බෝල්ෂේවික්-ලෙනින් පක්ෂය (Bolshevik-Lenin Party) සහ කොමියුනිස්ට් පක්ෂය (Communist Party)යි. මේ හැර ඉතිරි පක්ෂ ජාතිවාදී පක්ෂ දෙකක් වූ ද්‍රවිඩ සංගමය (Tamil Congress) සහ ලංකා ඉන්දියානු සංගමය (Ceylon-Tamil Congress)යි. මෙම ජාතිවාදී පක්ෂ දෙකෙහි පරමාර්ථය වූයේ සුළුජාතීන්ගේ අයිතිවාසිකම් රැකගැනීමයි. නිදහස ලැබෙනවාත් සමඟම, ලක්දිව පාලන බලය භාරගතහැකි ප්‍රබල පක්ෂයක් තිබීම වැදගත් කරුණක් විය. එහෙත්, නියෝජිත පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් සාර්ථක ලෙස ගෙනයාම සඳහා අවශ්‍යවන හොඳින් සංවිධානය වූ විරුද්ධ පක්ෂයක් එවක නොතිබීම මහත් පාඩුවක් විය. විරුද්ධ පක්ෂ වශයෙන් පෙනීසිටි මාක්ස්වාදී පක්ෂ නොහොත් ජාතිවාදී පක්ෂ ජාතික වශයෙන් වැදගත්වන පරමාර්ථයක ක්‍රියා කළේ නැත. මාක්ස්වාදී පක්ෂ නායකයන් නොයෙක් ක්‍රමවල විප්ලවකාරී වැඩවල යෙදී සිටි අතර ජාතිවාදී පක්ෂ නායකයෝ සුළුජාතීන්ගේ අයිතිවාසිකම් රැකගැනීම විනා ජාතික වශයෙන් ලංකාවේ දියුණුවට අදාළවන වැඩපිළිවෙළක් ගැන නොසිතූහ. කම්කරුවන්ගේ සිත් දිනාගැනීම මාක්ස්වාදීන්ගේ මූලික පරමාර්ථය විය. කම්කරුවන් එකතුකොට, වෘත්තීය සංගම් සංවිධානය කිරීමෙහිලා මාක්ස්වාදීහු සමර්ථවූහ. මෙම වෘත්තීය සංගම් සංවිධානය, රටේ ආර්ථික තත්වයට කෙළින්ම බලපෑවේය.

වර්ෂ 1947දී පවත්වන ලද ඡන්දයෙන් ඩී. ඇස්. සේනානායක මහතාගේ නායකත්වයෙන් සංවිධානය වූ යු. ඇන්. පී. පක්ෂය වැඩි ආසන ගණනක් දිනාගත්තේය ස්වාධීන (Independent) නියෝජිතයන් 21 දෙනකුගේ සහ ආණ්ඩුකාරතුමා විසින් සුළුජාතීන් වෙනුවෙන් පත්කරනුලබන මන්ත්‍රීවරුන් 6දෙනාගේද සහයෝගය ඇතිව, පාලන පක්ෂයක් වශයෙන් යු. ඇන්. පී. පක්ෂය බලයට පත්විය. දෙමළ ජනතාවගේද, අනෙක් සුළුජාතීන්ගේද සිත්දිනාගෙන, රටේ පාලනය ගෙනයාමට ඩී. ඇස්. සේනානායක මහතා සමත්වූයේය. වර්ෂ 1952ගේ මාර්තු මාසයේදී එතුමා හදිසියේ මිය ගියෙන් යු. ඇන්. පී. පක්ෂයේ පාලන බලය දුර්වල විය.

පාලන පක්ෂය එකමුතුකොට, එහි නායකත්වය සාර්ථකලෙස ගෙනයාම සඳහා සුදුස්සකු සෙවීම පහසු නොවිය. ඩී. ඇස්. සේනානායක මහතාගේ මරණයෙන් පසු, සුළු කලක්

පාලන පක්ෂයෙහි නායකත්වය දරන ලද්දේ එතුමාගේම පුත්‍රයා වූ ඩඩ්ලි සේනානායක මහතා විසිනි. වර්ෂ 1953ගේ ඔක්තෝබර් මාසයේ සිට සර්. ජෝන් කොතලාවල මහතා අගමැතිවරයා බවටත් , එක්සත් ජාතික පක්ෂයේ නායකයා බවටත් පත්වූයෙන්, එතැන් සිට අවුරුදු 3ක් පමණ කාලයක් ලක්දිව පාලනය යූ. ඇන්. පී. පක්ෂය මතම රඳාපැවතුනි.

ඩී. ඇස්. සේනානායක මහතා ජීවත්ව සිටින කල්හිද, ක්‍රමයෙන් එක්සත් ජාතික පක්ෂය තුල නොයෙක් ප්‍රශ්න පැන නගිමින් තිබුනි. මෙයින් වැදගත් සිද්ධියක් වූයේ පාලන පක්ෂයෙහි ප්‍රබල සාමාජිකයකු වූ ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා දේශපාලනික මතභේද මත එම පක්ෂයෙන් අස්වී විරුද්ධ පක්ෂයට එකතුවීමයි. ශ්‍රීලංකා නිදහස් පක්ෂය (Sri Lanka Freedom Party) යනුවෙන් අළුත් දේශපාලන පක්ෂයක්ද බණ්ඩාරනායක මහතා විසින් පිහිටුවන ලදි. විරුද්ධ පක්ෂයේ සාමූහිකත්වයක් ඇතිකිරීමට බණ්ඩාරනායක මහතා සමත්වූයෙන්, එතුමා විරුද්ධ පක්ෂයේ නායකයා ලෙස වර්ෂ 1956වන තුරු ක්‍රියා කළේය.

මේ වනවිට, ලංකාවේ ආර්ථික තත්වයද ක්‍රමයෙන් අසතුටුදායක තත්වයකට පත්වෙමින් තිබුනි. කාර්මික වශයෙන් ලංකාව දියුණුකිරීම පිළිබඳ එතරම් වැදගත් පියවරක් මුල් අවධියේදි යූ. ඇන්. පී. ආණ්ඩුව විසින් නොගන්නා ලදි . ආදායම් උපදින්නාවූ සෑම ව්‍යාපාරයක්ම පැවතුනේ ස්වදේශීය හෝ වේවා විදේශීය හෝ වේවා පුද්ගලික ව්‍යාපාරිකයන් අතේය. මේ හැරුණු විට, මුල් යුගයේ යූ. ඇන්. පී. පාලකයන්ගේ දේශපාලන ක්‍රමය පොදුජනයා හට එතරම් හුරුපුරුදු වූ එකක් නොවිය. ලංකාවට නිදහස ලැබීමත් සමගම, රටේ ආර්ථික තත්වය සතුටුදායකව තිබුණු හෙයින් මෙම ප්‍රශ්න පොදුජනයාගේ අවධානයට ලක් නොවිනි. එහෙත් රටේ ආර්ථික තත්වය නරක අතට හැරී යත් යත් මෙම ප්‍රශ්න පොදුජනයාගේ ජීවිතයට කෙළින්ම බලපාන්නට විය.

ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ නායකයා වූ බණ්ඩාරනායක මහතා, මෙබඳු අවධියකදි, තම දේශපාලන සැලැස්ම සකස් කළේ විශේෂයෙන්ම පොදු සිංහල මහජනතාවගේ සිත් දිනා ගැනීමට හැකිවන අයුරු ය. එතුමාගේ අරමුණ වූයේ විශේෂයෙන්ම සිංහල බෞද්ධයන්ගේ සිත් දිනා ගැනීමයි. දිවයිනෙහි වැඩිජනතාව බෞද්ධයන් වූ නමුත් යටත්පිරිසෙයින් ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් හෝ එතෙක් කල් පැවතුණු ආණ්ඩු ක්‍රම යටතේ ලැබී නොතිබුණු බව එතුමා පෙන්වා දුන්නේය. පොදු ලාංකික ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවන පරිදි ක්‍රමික වැඩපිළිවෙලක් ඉදිරිපත්කළ යුතු බව පෙන්වාදුන් බණ්ඩාරනායක මහතා සිංහල භාෂාවටත්, බුද්ධාගමටත් මුල් තැනක් හිමිවන අයුරු තම පක්ෂයේ ප්‍රතිපත්ති සකස් කළේය. රටේ ආර්ථික තත්වය දියුණුකිරීම සඳහා බණ්ඩාරනායක මහතා සමාජවාදී වැඩපිළිවෙළක් ඉදිරිපත් කෙළේය. පොදු ජනතාවට පහසුවෙන් සහභාගි විය හැකි පරිදි රටේ පාලනක්‍රමය සකස් කළ යුතු බව එතුමාගේ අදහස වූයේය.

වර්ෂ 1956දි පවත්වන ලද ඡන්දයෙන් වැඩි ආසන ගණනක් දිනාගැනීමට බණ්ඩාරනායක මහතා හට හැකි විය. මෙසේ, අවුරුදු දහයක් පමණ කාලයක් ලංකාවේ පාලනබලය ගෙනගියාවූ යූ. ඇන්. පී. පක්ෂය පරදවා එතුමා ලංකාවේ අගමැතිවරයා බවට පත්වූයේය.

ඡන්දය දිනාගැනීම සඳහා බණ්ඩාරනායක මහතා ඉදිරිපත් කළ ඇතැම් යෝජනා , රටේ දේශපාලන සාමීතියට එතරම් තුඩුදෙන ඒවා නොවිය. ස්වභාෂා පනත මීට එක් නිදසුනකි. ඉංග්‍රීසි වෙනුවට සිංහලෙන් පමණක් රටෙහි පාලනය ගෙන යෑම පිළිබඳව යෝජනාවක්

Lesson Twelve

බණ්ඩාරනායක රජය මඟින් වර්ෂ 1956 ජුනි මාසයේදී ඉදිරිපත් කරන ලදී. මෙම යෝජනාව ඉදිරිපත් කිරීමත් සමගම රටෙහි නොයෙක් ජාතිභේද ආරාවුල් පැන නගින්නට විය. මෙම ආරාවුල් නිසා රටෙහි පාලනය දුර්වල වූයේය. නැගී ආ මෙබඳු ජාතික ආරාවුල් නිසා, යෝජිත භාෂා පනත ක්‍රියාත්මක කිරීමට ඉඩක් නොලැබුණි. බණ්ඩාරනායක රජය බලයට පත්කිරීමට මූලික වශයෙන් උපකාරී වූ අය භික්ෂූන් වහන්සේලාත්, සිංහල ගුරුවරුත්, ආයුර්වේද වෛද්‍යවරුත් පොදු කම්කරු ජනයාත් ය. භාෂා පනත ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කළහොත් තමන්ගේ බලාපොරොත්තු ඉටු නොවන්නේ යැයි දැනගත් මොවුහු කල් යත් යත් බණ්ඩාරනායක රජය පිළිබඳව කලකිරෙන්නට වූහ. මේ හැරුණු විට බණ්ඩාරනායක මහතාගේ අමාත්‍ය මණ්ඩලයේද නොයෙක් මතභේද ක්‍රමයෙන් නැගඑන්නට විය.

ලංකාවේ ආර්ථික දියුණුවට වැදගත් පියවර කීපයක්ම බණ්ඩාරනායක රජය විසින් ගන්නා ලදී. එසේ වුවද, ජාතිභේද ආරාවුල් මැද පාලන බලය පවත්වාගෙන යාම දුෂ්කර කාර්යයක් විය. රටේ ආර්ථික තත්වයද දිනෙන් දිනම අසතුටුදායක තත්වයකට හැරෙන්නට විය බණ්ඩාරනායක රජය ගැන පොදුජනයා තුල තිබුණු පැහැදීමද, මේ ආදී නොයෙක් හේතු නිසා ක්‍රමයෙන් අඩුවන්නට විය. මේ අතර, මාක්ස්වාදීන් විසින් සංවිධානය කරන ලද වැඩවර්ජන ව්‍යාපාර නිසා රටේ සාමයත්, ආර්ථික තත්වයත්, මුළුමනින්ම අවුල් තත්වයකට හැරුණේය. අවුරුදු පහක සම්පූර්ණ පාර්ලිමේන්තු වාරය ගෙනයාමට බණ්ඩාරනායක රජයට ඉඩ නොලැබුණි. වර්ෂ 1959යේ සැප්තැම්බර් 25 වෙනිදා බණ්ඩාරනායක මහතා සාහසිකයකුගේ වෙඩිපහරකට ලක්වූයෙන් පසුදින මියගියේය.

ඉන්පසු, බණ්ඩාරනායක රජයෙහි අමාත්‍යධුරයක් ඉසිලූ ඩබ්ලිව්.දහනායක මහතා අගමැතිධුරයට පත්විය. එහෙත් එම රජය ගෙන යා හැකි වූයේ මාස කිහිපයක් පමණි. වර්ෂ 1960 මාර්තු මස ඡන්දයක් පවත්වන ලදින් නැවතත් යු. ඇන්. පී. පක්ෂය වැඩි ආසන ගණනක් දිනා ගත්තේය. ඩඩ්ලි සේනානායක මහතාගේ නායකත්වයෙන්, යළිත් යු. ඇන්. පී. ආණ්ඩුවක් පිහිටුවන ලදද, සාර්ථක ලෙස රජය පවත්වා ගෙන යාමට තරම් අවශ්‍ය ආසන ගණනක් ඔවුන් සතුව තිබුණේ නැත. එහෙයින් නැවත වර්ෂ 1960 ජුලි මස ඡන්දයක් පවත්වන ලදී. මෙම ඡන්දයෙන් ශ්‍රීලංකා නිදහස් පක්ෂය බලයට පත්විය. පක්ෂය මෙහෙයවන ලද්දේ මියගිය බණ්ඩාරනායක මහතාගේ භාර්යාව වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විසිනි. එතුමිය අගමැතිනිය වශයෙන් පත්වූවාය. එහෙත් මෙම රජයටද, පාර්ලිමේන්තු වාරය වන පස් අවුරුද්ද සම්පූර්ණ කිරීමට නොහැකි විය. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ අමාත්‍ය මණ්ඩලය ඇතුලතත්, ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් අතරේත් වූ මත භේද නිසා 1965දී සී. පී. ද සිල්වා මහතා ප්‍රමුඛ ශ්‍රීලංකා නිදහස් පාක්ෂික මන්ත්‍රීවරු කිහිපදෙනෙක් විරුද්ධ පක්ෂයට එකතු වූහ. මෙයින් ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ ආසන සංඛ්‍යාව අඩුවූයෙන්, පාලන බලය ගෙනයාම කරදර සහිත තත්වයකට භාජන විය. එම වර්ෂයේම විරුද්ධ පක්ෂය විසින් ඉදිරිපත්කරන ලද විශ්වාසභංග යෝජනාවකින් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රජය පරාජයට පත්විය. එම වර්ෂයේම ඡන්දයක් පවත්වන ලදී. එයින් යු. ඇන්. පී. පක්ෂය වැඩි ආසන ගණනක් දිනාගැනීමට සමත්වූයෙන්, එම පක්ෂයේ නායකයා වූ ඩඩ්ලි. සේනානායක මහතාගේ ප්‍රමුඛත්වයෙන් නැවතත් යු. ඇන්. පී. ආණ්ඩුවක් පිහිටුවන ලදී.

මෙම පාඩම ලියන ලද්දේ වර්ෂ 1969 දිය. ඉන්පසු ලංකාවේ ආණ්ඩුක්‍රමය බෙහෙවින් වෙනස් වී ඇත. ඒ පිළිබඳ කෙටි විස්තරයක් සඳහා 242 වෙනි පිටුව (page 242) බලන්න.

VOCABULARY

අගමැතිනිය	N5 woman prime minister
අත	N2 hand; pl. අත්
අත	N2 state, condition, nature; no pl.
අතෙහි or අතේ	in the hands of
අයිතිවාසිකම	N2 (political) right; pl. අයිතිවාසිකම්
අරමුණ	N2 target, aim; pl. අරමුණු
අවධිය	N2 time, period, stage; pl. අවධි
අවස්ථාව	N2 occasion, moment, period, stage; pl. අවස්ථා
අවුල	N2 confusion, disorder; pl. අවුල්
අසතුටුදායක	unsatisfactory, unhappy
අස් වෙනවා	leave, resign
ආණ්ඩුකාරතුමා	N5 governor-general; pl. ආණ්ඩුකාරවරු
ආයුර්වේද වෛද්‍යවරයා	N5 Ayurvedic physician; pl. ආයුර්වේද වෛද්‍යවරු
ආරාවුල	N2 trouble, confusion, disorder; pl. ආරාවුල්
ආසනය	N2 seat; pl. ආසන
ඇතුලත or ඇතුළත	inside, within
ඇත් වෙනවා	be away from, get away from
ඉටුකරගන්නවා	achieve, fulfill (for oneself)
ඉටු වෙනවා	be fulfilled
උනන්දු වෙනවා	be interested in, make efforts, be eager for, apply oneself
උපකාරී වෙනවා	help, be helpful
උපදිනවා	bring forth, be born
උසුලනවා	bear, hold
එකමුතු කරනවා	put together, unite
එක්සත් ජාතික පක්ෂය	N2 United National Party; no pl.

Lesson Twelve

එතුමිය	she (honorific)
ඕනෑ එපාකම්	interests; pl. only
කටුනායක	N3 Katunayake; no pl.
කම්කරුවා	N5 laborer, worker; pl. කම්කරුවෝ ; stem කම්කරු
කලකිරෙනවා	be dejected, be disappointed
කාර්යය	N2 work, duty, activity; pl. කාර්ය
කෙටියෙන්	in short, in brief
කෙතෙක් දුරට	how far
කෙලින්ම or කෙළින්ම	directly
කෙසේ හෝ වේවා	howsoever it may be, be that as it may
කොමියුනිස්ට් පක්ෂය	N2 Communist Party
ක්‍රමික	systematic, ordered
ගිවිසුම	N2 agreement, pact; pl. ගිවිසුම්
ගුවන් තොටුපල	N2 airport; pl. ගුවන් තොටුපලවල්
ගෙනයාම or ගෙනයෑම	N2 carrying out, continuing; no pl.
ඡන්දය	N2 vote, election; pl. ඡන්ද
ජාතිවාදී	nationalistic, communalistic
ජීවනය	N2 living, existence; no pl.; stem ජීවන
තොරව	without. See grammar 19.
තොර වෙනවා	be without, get rid of. See grammar 19.
ත්‍රිකුණාමලය	N2 Trincomalee; no pl.
දුර්වල වෙනවා	become weak, become feeble
දුෂ්කර	difficult, hard
දේශපාලනඥයා	N5 politician; pl. දේශපාලනඥයෝ
දේශපාලනික	political
ද්‍රවිඩ සංගමය	N2 Tamil Congress; no pl.
ධුරය	N2 post, position, office; pl. ධුර

නඟාසිටුවනවා or නගාසිටුවනවා	raise, uplift
නරක	bad
නායකත්වය	N2 leadership; pl. නායකත්ව
නිදසුන	N2 example, illustration; pl. නිදසුන්
නොහොත්	or, if not. See grammar 8.
පරාජය	N2 defeat; no pl.
පවත්වාගෙනයනවා	continue, carry out
පසුගිය	last, previous, earlier
පහළ වෙනවා	become manifest, come into being
පාක්ෂික	belonging to a party
පාඩුව	N2 loss; pl. පාඩු
පැනනගිනවා or පැනනඟිනවා	arise, spring up
පියවර	N2 step; pl. පියවර or පියවරවල්
පුද්ගලික	private, personal
ප්‍රතිපත්තිය	N2 principle; pl. ප්‍රතිපත්ති
ප්‍රබල	strong, powerful
ප්‍රමාද කරනවා	delay
ප්‍රමුඛ	chief, headed by. See grammar 16.
ප්‍රමුඛත්වය	N2 leadership, priority; pl. ප්‍රමුඛත්ව
බලකඳවුර	N2 (military) base, force; pl. බලකඳවුරු
බලපානවා	influence, affect
බැරෑරුම්	serious, grave, difficult
බෝල්ෂෙවික් ලෙනින් පක්ෂය	N2 Bolshevik Lenin party
භාජන වෙනවා	be subject to
භාෂා පනත	N2 language-act (of parliament); no pl.
භික්ෂූන්වහන්සේ	N5 Buddhist monk; pl. භික්ෂූන්වහන්සේලා ;stem භික්ෂු
භේදය	N2 difference, conflict; pl. භේද

Lesson Twelve

මාක්ස්වාදියා	N5 Marxist; pl. මාක්ස්වාදියෝ or ...වාදීහු ; stem මාක්ස්වාදී
මාධ්‍යය	N2 medium, means; pl. මාධ්‍ය
මැතිනිය	N5 madam, lady (honorific); pl. මැතිනියෝ
මැද	in the midst of
මුළුමනින්	totally, completely
මෙහෙයවනවා	lead, conduct
මේවනවිට	by this time
යෝජිත	proposed
රටාව	N2 pattern; pl. රටා
රැක ගැනීම	N2 protection, safeguarding; pl. රැක ගැනීම්
ලංකා ඉන්දියානු සංගමය	N2 Ceylon - Indian Congress; no pl.
ලංකා සමසමාජ පක්ෂය	N2 Lanka Sama Samaja Party (i.e. the Trotskyite party in Sri Lanka)
ලුහුඬින්	in brief, in short
වරාය	N2 harbor; pl. වරායවල්
වාරය	N2 turn, term; pl. වාර
වැඩපිළිවෙළ	N2 scheme of work; pl. වැඩපිළිවෙළවල්
වැඩවර්ජනය	N2 strike; pl. වැඩවර්ජන
විනා	without. See grammar 13.
විප්ලවකාරී	revolutionary
විරුද්ධ පක්ෂය	N2 opposition party; pl. විරුද්ධ පක්ෂ
විශ්වාසභංග යෝජනාව	N2 no-confidence-motion; pl. විශ්වාසභංග යෝජනා
වුවද	even if. See grammar 5.
වෘත්තිය සංගමය	N2 trade union; pl. වෘත්තිය සංගම්
වෙඩි පහර	N2 gunshot; pl. වෙඩි පහරවල්
ව්‍යාපාරිකයා	N5 businessman, entrepreneur; pl. ව්‍යාපාරිකයෝ ; stem ව්‍යාපාරික
ශ්‍රී	illustrious, glorious

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය	N2 Sri Lanka Freedom Party (SLFP); no pl.
සංරක්ෂණ-ගිවිසුම	N2 defence agreement
සංවිධානය වෙනවා	be organized
සතුටුදායක	satisfactory, happy
සතුව	belonging. See grammar 17.
සමත්වෙනවා	succeed, be able
සමර්ථ වෙනවා	succeed, be able
සමාජවාදී	socialist(ic)
සලකාබලනවා	consider, take under advisement
සහයෝගය	N2 co-operation, support; no pl.
සාමය	N2 peace; no pl.; stem සාම
සාමාජිකයා	N5 member (of an organization, etc.); pl. සාමාජිකයෝ ; stem සාමාජික
සාමූහිකත්වය	N2 unity; no pl.
සාහසිකයා	N5 thug, villain, assassin; pl. සාහසිකයෝ ; stem සාහසික
සිද්ධිය	N2 incident; pl. සිද්ධි
සුදුස්සා	N5 suitable person; pl. සුදුස්සෝ ; stem සුදුසු
ස්ථිතිය	N2 stability; no pl.
ස්වදේශීය	indigenous, native, local
ස්වභාෂා-පනත	N2 Official Language Act; no pl.
ස්වභාෂාව	N2 mother tongue, vernacular; stem ස්වභාෂා
ස්වල්පය	N2 a little; no pl.; stem ස්වල්ප
ස්වාධීන	independent
හමුදාව	N2 army; pl. හමුදා
හැර	without. See grammar 13.
හැරෙනවා	turn, change to
හැරුණුකොට	except for, apart from. See grammar 13.

Lesson Twelve

හුරුපුරුදු	used to, accustomed to
නොවත්	or. See grammar 8.

ඩඩ්ලි සේනානායක මහතාගේ ප්‍රමුඛත්වයෙන් පිහිටුවන ලද යූ. ඇන්. පී. පාලනය වර්ෂ 1970 දක්වා පැවතිණි. එම වර්ෂයේ මාර්තු මස (month) පවත්වන ලද මහජන ඡන්දයෙන් (general election) නැවතත් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විශාල ජයක් අත්පත්කර ගත්තාය. එතුමියගේ නායකත්වය යටතේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ මාක්ස්වාදී පක්ෂය වූ ලංකා සමසමාජ පක්ෂයත්, කොමියුනිස්ට් පක්ෂයත් එකමුතුව 'සමගි රජයක්' (coalition government) පිහිටුවන ලදී. මෙතුමියගේ පාලනය යටතේ සිදු වූ වැදගත්ම සිද්ධිය වර්ෂ 1972 මැයි මස 22 වෙනි දින ලංකාව ජනරජයක් (republic) බවට පත්කිරීමයි. ශ්‍රී ලංකාවේ පූර්ණ පාලන බලය (full ruling power) එමගින් ලාංකිකයන් අතට පැවරිණි (entrusted, vested with).

GRAMMAR

1. PROGRESSIVE PARTICIPLES

1.1 Literary Sinhala has both present and past progressive participles. These show agreement in gender and number, and are formed as follows:

1.11 Present Progressive Participle

a. The masculine and neuter singular are the same as the present tense emphatic form of the verb.

b. The feminine singular replaces the -ඒ of the emphatic form by either ඊ or ආ .

c. The masculine and feminine plural replace the -ඒ of the emphatic form by ඕ (or occasionally -අහු).

d. The neuter plural, as usual for Literary verb forms, is the same as the neuter singular.

Thus: for යනවා 'go'

	Singular	Plural
Neuter	යන්නේ	යන්නේ
Masculine		යන්නෝ, (යන්නහු)
Feminine	යන්නී, යන්නා	

1.12 Past Progressive Participle

The past progressive participle is formed as follows:

a. For all forms but the feminine singular, the past progressive participle is made from the past emphatic form in the same way as the present progressive participle is made from the present emphatic form.

b. The feminine singular form may be made, for all verbs, by replacing the ඒ of the past emphatic form by ආ .

Thus:

	Singular	Plural
Neuter	ගියේ	ගියේ
Masculine		ගියෝ (ගියහු)
Feminine	ගියා	

Note that the past progressive participle is the same as the third person past tense without the assertion marker (6,1.1).

Irregular verbs which have a past emphatic form with a double consonant have an alternate feminine singular form in ඊ . Thus:

ගත්තා	or	ගත්තී	from	ගන්නවා	take
දුන්නා	or	දුන්නී	from	දෙනවා	give
උන්නා	or	උන්නී	from	ඉන්නවා	be

1.2 Use of the forms

1.21 The present progressive participle always has the same subject as the main verb and indicates action contemporaneous with it.

හේ වලට යන්නේ මුවකු දුටුවේය.
Going to the jungle, he saw a deer.

1.22 The past progressive participle also has the same subject as the main verb and indicates prior action.

හේ තම රටට පැමිණියේ දියුණු විය.
Having come to his own country, he became prosperous.

කුවේණි විජය දුටුවා බිය වුවාය.
Kuveni saw Vijaya and became frightened.

2. FUTURE TENSE

2.1 Literary Sinhala has a tense usually referred to as the future in traditional grammars. It is formed by replacing the -ඒ of the present emphatic form by the following person-number suffixes:

	Singular	Plural
1st Person	-එමි	-එමු
2nd Person	-එහි	-එහු or -අහු or -ආහු
3rd Person		
Masc and Neut	-ඒය	-ඕය or -ආහ
Fem	-ආය, ඊය	

Thus the first person singular forms of verbs of different classes will be as follows:

	Verb Class		First Person Singular
Class 1	බල-	see	බලන්නෙමි
Class 2	ඇදි-	pull	ඇදින්නෙමි
Class 3	වැටෙ-	fall	වැටෙන්නෙමි
Irregular	දෙ-	give	දෙන්නෙමි

වෙනවා appears as either වෙන්නෙමි or වන්නෙමි.

The full set of future forms is illustrated below with යනවා :

	Singular	Plural
1st Person	යන්නෙමි	යන්නෙමු
2nd Person	යන්නෙහි	යන්නෙහු යන්නහු යන්නාහු
3rd Person		
Masc and Neut	යන්නේය	යන්නෝය, යන්නාහ
Feminine	යන්නාය, යන්නීය	

Note that, despite the number of alternates, the first and second person forms generally have person-number affixes like the past tense, and that the third person forms are mostly like the progressive participle plus ය . Thus in reading, future forms are generally easily recognizable because of the combination of stem plus න්න,න්න් with familiar person-number endings.

2.2 Future tense forms may, as the name implies, refer to future action, particularly with adverbs of future time, but they are by no means restricted to such a meaning, and are often used to refer to continuous, habitual action in the present, and particularly to action or states that are timeless or always so:

> මම හෙට එම නගරයට යන්නෙමි.
> I am going to that city tomorrow.
>
> අනාගතයේදී කිසි වෙනසක් සිදුනොවන්නේය.
> No change will occur in the future.
>
> දක්ෂ පාලකයෝ රටවැසියන්ගේ දියුණුව පදහා උත්සාහ කරන්නෝය.
> Capable rulers will take effort for the benefit of the inhabitants of the country.

3. OPTATIVE

3.1 There is an optative form of the verb in Literary Sinhala. It is made for all clauses by adding the following endings to the present tense stem:

First Person Singular	- මිවා
Second Person Singular	- හිවා
Third Person Singular	- වා (with lengthening of the preceding vowel)
First Person Plural	- මෝවා (මුවා)
Second Person Plural	- හුවා
Third Person Plural	- ත්වා

Thus for කරනවා 'do' and අරිනවා 'open':

	Singular	Plural
1st Person	කරමිවා	කරමෝවා, කරමුවා
2nd Person	කරහිවා	කරහුවා
3rd Person	කරාවා	කරත්වා

	Singular	Plural
1st Person	අරිමිවා	අරිමෝවා, අරිමුවා
2nd Person	අරිහිවා	අරිහුවා
3rd Person	අරීවා	අරිත්වා

Note that the endings resemble the present tense endings plus -වා , though with some changes in form.

3.2 The optative usually implies that the speaker hopes that the action of the verb will take place i.e. 'let it happen, may it happen':

> දරුවෙක් උපදීවා.
> May a child be born!
>
> දෙවියෝ මේ පින් ගනිත්වා.
> May the gods partake of this merit!

The optative is relatively rare in contemporary Literary Sinhala except in some common formulae, often with වේවා , such as:

සැපවේවා	may (you) be happy, healthy
නිදුක්වේවා	may (you) be happy, healthy
දුකින් මිදෙත්වා	may they (all beings) be freed from suffering
නිරෝගීවේවා	may (you) be healthy
සුවපත්වේවා	may (you) be healthy
සැරදේවා	may (you) be blessed
දිනේවා	may (you) be victorious, prosperous, glorious
ජයවේවා	may (you) be victorious, prosperous, glorious

4. ABSOLUTE PARTICIPLE

4.1 The absolute participle is made by adding -ත් to the present tense stem of the verb:

	Verb	Present Tense Stem	Absolute Participle
Class 1	බලනවා	බල-	බලත්
Class 2	අදිනවා	අදි-	අදිත්
Class 3	වැටෙනවා	වැටෙ-	වැටෙත්

The verb වෙනවා has the alternant වත් besides වෙත්.

4.2 The absolute participle may be used to form clauses which indicate action contemporaneous with the main verb but having a different subject.

> පඬිවරයා මෙසේ පවසත් පිරිසෙහි අය සතුටු වූහ.
> As the Pandit was thus saying, those in his retinue became happy.

4.3 If the emphatic particle ම is added to the absolute participle, it adds the sense 'as soon as'.

> මුවා උගුලෙහි වැටෙත්ම නරියා පලා ගියේය.
> As soon as the deer fell in the trap, the jackal ran away.

4.4 The absolute participle may be doubled, and the sense is then like English 'the more ... the more' or ' as X continued, so did Y'. In this construction, the subject may be the same or different from that of the main verb:

කල් යත්යත් රට දියුණු විය.
As time went on, the country prospered.

වැඩ කරත්කරත් හේ පොහොසත් විය.
The more he worked, the richer he became.

The Colloquial equivalent of this construction is a doubled infinitive:

කල් යන්න යන්න රට දියුණු උනා.
වැඩ කරන්න කරන්න එයා පොහොසත් උනා.

5. 'EVEN (IF)' වුවද

The past tense concessive form of වෙනවා , has a special use, as the equivalent of English 'even (if), although'. In this usage it may occur after nouns, adjectives and adverbs.

ලුහුඬින් වුවද	even (if) in brief
මේ මල් සුදු වුවද	although these flowers are white
මේ මල් වුවද නොගැලපෙයි.	Even these flowers are not suitable.
ගුරුවරයාට වුවද මෙම පාඩම නොතේරෙයි.	Even the teacher doesn't understand this lesson.

The Colloquial equivalent of වුවද is උනත් .

6. RELATIVE CLAUSES WITH වෙනවා

As mentioned earlier a verbal adjective form of වෙනවා may be used in forming relative clauses of location (7,3.23) Both the present and past verbal adjective forms of වෙනවා are also used in forming equational relative clauses, (i.e. the one who is (or was) X):

එම විද්‍යාලයෙහි ආචාර්යවරයකු වන සිරිසේන මහතා....
Mr. Sirisena, who is a teacher in that college, ...

එම විද්‍යාලයෙහි ආචාර්යවරයකු වූ සිරිසේන මහතා....
Mr. Sirisena, who was a teacher in that college, ...

7. VERBAL ADJECTIVE WITH වූ

Literary Sinhala has alternate forms of the present and past tense verbal adjective formed with වූ as follows:

The present tense form is made by adding වූ to a form of the verb identical to the masculine singular agent verbal noun (11,10). Thus:

Verb Stem		Verbal Adjective
කර-	to do	කරන්නාවූ
අදි-	to pull	අදින්නාවූ
වැටෙ-	to fall	වැටෙන්නාවූ
වෙ-	to be	වෙන්නාවූ or වන්නාවූ

The past tense form is made by adding වූ to a form identical with the Colloquial past tense simple form of the verb.

Verb Stem	Verbal Adjective	
	Past Tense Verb	Verbal adjective
කර-	කෙරුවා	කෙරුවාවූ
අදි-	ඇද්දා	ඇද්දාවූ
වැටෙ-	වැටුණා	වැටුණාවූ

The present and past tense verbal adjectives with වූ are used in the same way as the usual verbal adjectives: but there may be slight differences in meaning which are difficult to describe in general terms except to say that the present tense verbal adjective with වූ may add a bit more emphasis to the entire construction and the past tense verbal adjective with වූ may place more emphasis on the action of the verb having being completed than is the case with the ordinary verbal adjectives. This construction may also be used in the passive.

The verb ලබනවා 'get, obtain', whether in the passive or not, appears in the past tense as either ලැබුවා or ලද්දා before වූ.

මා කියවන පොත්
මා කියවන්නාවූ පොත් } the books I read

මා කියවූ පොත්
මා කියෙවුවාවූ පොත් } the books I read

මා විසින් කියවන ලද පොත්
මා විසින් කියවන ලද්දාවූ පොත් } the books that have been read by me

තෑගි ලැබුවා වූ ශිෂ්‍යයෝ
or තෑගි ලද්දා වූ ශිෂ්‍යයෝ
The students who got presents

8. හෙවත් AND නොහොත්

හෙවත් and නොහොත් both occur between nouns or noun phrases and may have 'or' as an English equivalent, but they usually imply different meanings. හෙවත් generally suggests 'or' in the sense of 'that is to say' and thus the forms that it links refer to the same thing.

සිරිල් හෙවත් විමල්ගේ අයියා....
Siril, that is, Wimal's elder brother...

නොහොත් generally links alternatives, i.e. 'if not one then the other', or 'either'.

සිරිල් නොහොත් සුනිල්.....
(either) Siril or Sunil...

Some modern authors do not adhere strictly to the distinction stated above but use හෙවත් and නොහොත් as alternants.

9. 'AFTER' CLAUSES

පසු 'after' may be used with the past tense verbal adjectives to form 'after' clauses. This construction is an alternative for the instrumental of the verbal noun plus පසු . Thus:

මම ගෙදර ගිය පසු }
or මම ගෙදර යැමෙන් පසු } එම පොත් කියවමි.
I shall read those books after I go home.

10. විය හැකි 'MAYBE'

විය හැකි 'maybe' is used with verb forms that are identical in shape with the Colloquial present and past simple form, and the sense is present or past accordingly. The same rules of agreement and the case of the subject apply as for the perfect (10,1). Note that the negative 'maybe not' can be formed by prefixing නො- to either විය or the simple verb form, but the latter is more common.

Positive: ඔවුන් එය කරනවා විය හැක.
Maybe they are doing it.

Negative: ඔවුන් එය කරනවා නොවිය හැක.
or ඔවුන් එය නොකරනවා විය හැක.
Maybe they are not doing it.

11. -ත් සමගම 'AS SOON AS, WITH'

Either the -ඊම verbal noun or the equivalent of the present simple Colloquial form (as for විය හැකි in the preceding section) may be used with -ත් සමගම to form 'as soon as' clauses:

මහලු බමුණා ගෙට එනවාත් සමගම තරුණ බැමිණිය සොරසැමියා පිටත් කළාය.
As soon as the old brahmin entered the house, the young Brahmin woman sent the paramour away.

නිදහස ලැබීමත් සමගම පාලනය වෙනස් විය.
As soon as independence was granted, the administration changed.

Note that English 'with' (the usual sense of සමග) is sometimes used in a similar way, as in:

නිදහස දෙනවාත් සමගම ලංකාවේ පාලනය වෙනස් මුහුණුවරක් ගත්තේය.
With the granting of independence, the politics of Sri Lanka took on a new character.

12. GENITIVE OF RELATION AND ලා

With -ඊම verbal nouns the genitive case may be used to indicate 'with regard to, in relation to, or concerning'. In formal writing a form ලා may be added to the noun in the genitive to add further emphasis. (This ලා will generally not appear in an English translation.)

ඉගෙනීමෙහිලා කමලසිරි දක්‍ෂයෙකි.
Kamalasiri is clever in studies.

13. EXCEPT (FOR)

Literary Sinhala can use any of the forms හැරුණුවිට , හැර or විනා as postpositions meaning 'except (for), apart from, leaving out'. The Colloquial equivalent is ඇර, ඇරෙන්න (C.S. 33,7).

වී ගොවිතැන හැරුණුවිට පළතුරු වගාවද මෙම ප්‍රදේශයෙහි සාර්ථකලෙස කළ හැක.
Apart from paddy cultivation, one can also do fruit cultivation successfully in this area.

පොත් ලිවීම හැර වෙන කිසිවක ගේ නොකරයි.
He does nothing else except write books.

ඉතිහාසය විනා වෙන කිසිවත් ගේ නොදනී.
He does not know anything except history.

14. INSTRUMENTAL PROGRESSIVE PARTICIPLE

The neuter past progressive participle can be used with the instrumental case ending -එන් and the sense 'as a result of, since, because':

ඉගෙනීම අවසන් වූයෙන් හෙතෙම තම නුවරට පැමිණියේය.
Since his studies had been completed, he returned to his city.

In this construction either ලද්දෙන් or ලදින් can be used in the passive. Thus:

එම වර්ෂයේම මහජන ඡන්දයක් පවත්වන ලද්දෙන් 〉 ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බලයට පත්විය.
or එම වර්ෂයේම මහජන ඡන්දයක් පවත්වන ලදින් 〉
A general election being held in that very year, the Sri Lanka Freedom Party came into power.

15. ධුරය 'POSITION, STATUS'

ධුරය follows a noun in the stem form, commonly a title, to form a compound referring to the position connected with that title. Thus අගමැතිධුරය 'premiership', ඇමතිධුරය 'ministership', etc.

16. ප්‍රමුඛ 'HEADED BY'

X ප්‍රමුඛ Y means 'the Y (usually an organization or a group) headed by X (usually a name or a title)'. X is in the direct case.

අගමැතිතුමා ප්‍රමුඛ අමාත්‍යමණ්ඩලය
The cabinet headed by the Prime Minister.

17. සතු AND සතුව 'BELONGING TO'

සතු and සතුව both follow nouns in the oblique case to form postpositional phrases indicating possession or control. Phrases with සතු are adjectival and immediately precede the thing possessed, whereas phrases with සතුව are adverbial and are used in construction with verbs.

ඔහු සතු සියළුම ධනය සොරු ගත්හ.
Thieves took away all the wealth he had.

එම රටෙහි සියළුම වෙළඳ-ව්‍යාපාර රජය සතුව පවතී.
All the trade projects (concerns) in that country are state-controlled.

18. DATIVE -හට

There is an alternate dative form in -හට instead of -ට, used only with animate nouns. Unlike -ට, -හට is sometimes written separated from the preceding word. Thus:

ළමයාහට or ළමයා හට instead of ළමයාට 'to the child'

ජනතාවහට or ජනතාව හට instead of ජනතාවට 'to the people'

19. තොර AND තොර වෙනවා

19.1 තොර 'without' takes a preceding noun in the instrumental case, and the entire phrase may be used adjectivally.

අවබෝධයෙන් තොර ජීවිතයක්
A life without understanding

19.2 තොරව is the adverbial form of තොර :

රටේ ප්‍රශ්න පිළිබඳ අවබෝධයකින් තොරව පාලනය කළ නොහැක.
One cannot rule without an understanding of the country's problems.

19.3 වෙනවා is added to තොර to make a verbal form 'be without':

ඔවුහු හොඳ ගතිවලින් තොර වෙති.
They are without good qualities.

අවබෝධයෙන් තොරවීම
being without understanding

අවබෝධයෙන් තොර වූ ජීවිතයක්
a life without understanding

Note that the adjectival form තොර වූ is an alternate for තොර alone (compare the last example with the one in 19.1).

20. 'IF, WHETHER' CLAUSES WITH ද AND යි

In Literary Sinhala, as in Colloquial (C. S. 15,4), the question marker ද may be used as 'if, whether' clauses with verbs of thinking, considering, knowing, etc. In Literary Sinhala the quotation marker යි commonly follows ද in this usage:

දරුවාට එය කළ හැකි දැයි පියා නොසිතුවේය.
The father did not consider whether the child could do it.

ඔබට මෙය කළ හැකි දැයි නොදනිමි.
I do not know whether you can do this.

In Colloquial Sinhala, the quotation marker (-ය) කියලා also appears optionally in such constructions:

ළමයාට ඒක කරන්න පුළුවන්ද දන්නෙ නෑ.
or ළමයාට ඒක කරන්න පුළුවන්ද කියලා දන්නෙ නෑ
I don't know whether the child can do it.

21. යටත්පිරිසෙයින්......හෝ

Sometimes හෝ is used as an alternant for වත් with යටත්පිරිසෙයින් 'at least, even' (2,15):

යටත්පිරිසෙයින් ඔබ හෝ එය කළ යුතුය.
At least you should do that.

SUPPLEMENTARY READINGS

1. ලංකාවේ දේශපාලන පක්ෂ

මෙම අතිරේක කියවීමෙන් බලාපොරොත්තුවන්නේ ලංකාවේ දේශපාලන පක්ෂවල ඉතිහාසය කෙටියෙන් දැක්වීමයි. නිදහස ලැබීමෙන් පසු, ලංකාවේ දේශපාලන ඉතිහාසය දොළොස්වන පාඩමින් දැක්වුවෙමු. එහිද දේශපාලන පක්ෂ පිළිබඳව තරමක සඳහන් කිරීමක් කෙරිනි. එක් එක් පක්ෂයේ ආරම්භය සහ සකස්වීම වශයෙන් ඒවායේ ඉතිහාසයට අදාළවන කරුණු එම පාඩමෙහි එතෙක් දුරට නොදැක්විනි. ඒ පිළිබඳ තරමක විස්තරයක් මෙහි දැක්වෙයි.

රටේ මහජනයාගේ සහභාගිත්වය ඇති දේශපාලන පක්ෂ ක්‍රමයක් ඇතිවිය හැක්කේ, රටේ පාලනය පිළිබඳ සැලකිය යුතු අවබෝධයක් මහජනයා තුළ ඇති වූ විට පමණි. මෙබඳු අවබෝධයකට තුඩුදෙන දේශපාලනික පරිසරයක් ඉංග්‍රීසි පාලනයෙහි මුල් අවධිවලදී ලංකාවෙහි නොවීය. එම වකවානු තුල ලාංකේය දේශපාලන පක්ෂ ක්‍රමයක් ඇතිවිය නොහැකිවූයේ එහෙයිනි.

ලංකා පාලනය පිළිබඳව ලාංකිකයන් හට සැලකිය යුතු වගකීමේ බලයක් නොවූ බව දැනගත් ලාංකික උගත්හු මේ පිළිබඳව ප්‍රශ්න නගන්නට වූහ. සර් රාමනාදන්, සර් ජේම්ස් පීරිස්, සර් ඩී. බී. ජයතිලක, එෆ් . ආර්. සේනානායක යන ප්‍රභූහු මොවුන් අතරෙහි ප්‍රමුඛස්ථානයක් ගත් අය වූහ. ජාති, ආගම් භේදවලින් තොරව ඔවුහු ලංකා දේශපාලන ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයෙහි පුරෝගාමී වූහ. සමකාලීනව පැවති ඉංග්‍රීසි පාලනක්‍රමයට විරුද්ධව, ලාංකික උගතුන් විසින් කරන ලද උද්ඝෝෂණවල ප්‍රතිඵලයක් වශයෙන්, ලංකාවේ අභ්‍යන්තරික දේශපාලන තත්ත්වය ගැන පරීක්ෂා කොට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස, බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව විසින් ලංකාවට 1927දී කොමිෂන් සභාවක් එවන ලදී. මෙම කොමිෂන් සභාව ඩොනමෝර් සාමිවරයා (Lord Donoughmore) ප්‍රමුඛ තවත් දෙදෙනෙකුගෙන් යුක්ත විය. මොවුන් ලංකාවට අවුත් එවක ලංකාවේ විසූ උගත් ප්‍රභූන්ගේද අදහස් විමසා, ලංකාවේ දේශපාලන තත්ත්වය පිළිබඳ කරන ලද පරීක්ෂණයකින් පසු තම වාර්තාව බ්‍රිතාන්‍ය රජයට ඉදිරිපත් කරන ලදී.

බ්‍රිතාන්‍ය රජය එම වාර්තාව පිළිගත්තාය. බ්‍රිතාන්‍ය රජය විසින් පිළිගන්නා ලද එම වාර්තාව අනුව වර්ෂ 1931දී ලංකාවේ පිහිටුවන ලද ආණ්ඩු ක්‍රමය ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යනුවෙන් හඳුන්වන ලදී.

ලංකාවේ දේශපාලන ඉතිහාසයෙහිලා, ඩොනමෝර් වාර්තාවෙන් ඉදිරිපත් වූ වැදගත්ම යෝජනාවකි ලාංකිකයින්ට සර්වජනඡන්දබලය ලබාදීම - එනම් වයස 21න් වැඩි සෑම දෙනාටම ඡන්දයදීමේ බලය ලබාදීම. ලාංකික දේශපාලන පක්ෂවල උදාවට මෙය බෙහෙවින් හේතු වියැයි සැලකිය හැක. ඩොනමෝර් පාලනක්‍රමය ඉදිරිපත්වීමට පෙර, ලංකාවේ දේශපාලන ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයෙහි මුලිකව ක්‍රියාකළ "ලංකා ජාතික සංගමය" (Ceylon National Congress) යනුවෙන් හැඳින්වෙන සංවිධානයක් විය. ලංකාවට දේශපාලන නිදහස

ලබාගනුවස්, ජාති සහ ආගම් භේදවලින් තොරව, උගත් ලාංකික ප්‍රභූහු, "ලංකා ජාතික සංගමය" නම් අදහස් ඉදිරිපත් කිරීමට හොඳම මාධ්‍යයක් බවට පමුණුවාගත්හ. එහෙත්, ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ දෙනලද සර්වජනඡන්දබලය නිසා, වැඩි ජාතිය වූ සිංහලයන්ගේ නියෝජනයද වැඩිවිය. දෙමළ ජනතාව වෙනුවෙන් විශේෂ ආසන වෙන්කරවාගැනීම සඳහා මුලදීම දැරූ ප්‍රයත්නද අසාර්ථක වූයෙන්, දෙමළ සාමාජිකයෝ "ලංකා ජාතික සංගමයෙන්" ක්‍රමයෙන් ඈත් වූහ.

මෙය ජාතිවාදී අදහස් දරන එක්තරා දේශපාලන පක්ෂයක් ලංකාවේ බිහිවීමට තුඩුදුන් කරුණක් විය. බිහි වූ එම පක්ෂය දෙමළ සංගමය (Tamil Congress) යනුවෙන් හඳුන්වන ලදි. මෙය ජී. ජී. පොන්නම්බලම් මහතාගේ නායකත්වය යටතේ පිහිටුවා ගන්නා ලද්දකි. මෙම පක්ෂයෙහි බලාපොරොත්තුව වූයේ දෙමළ බලය තහවුරු කරගන්නා අතරම සිංහල බලය වැඩිවීම හැකි පමණ වැළැක්වීමයි.

වර්ෂ 1947දී පවත්වන ලද මැතිවරණයේදී දෙමළ සංගමයේ අපේක්ෂකයන් හට ලංකාවේ උතුරු පළාත්වල ආසන සියල්ලම පාහේ දිනාගැනීමට හැකි විය. මොවුහු පාර්ලිමේන්තුවේ විරුද්ධපක්ෂයේ මන්ත්‍රීවරුන් ලෙස පෙනීසිටියහ. ඩී. එස්. සේනානායක මහතාගේ නායකත්වය යටතේ පැවති එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයට, දෙමළ සංගමයේ නායකයා වූ පොන්නම්බලම් මහතා වර්ෂ 1948දී බැඳුනේය. මේ හේතුව නිසා "දෙමළ සංගමය" කොටස් දෙකකට කැඩිනි. එයින් එක් කොටසකට අයත් වූ අය පොන්නම්බලම් මහතා අනුගමනය කළ අතර, අනෙක් කොටසට අයත් වූ අය වෙනම පක්ෂයක් පිහිටුවා ගත්හ. ඔවුන් විසින් පිහිටුවන ලද පක්ෂය "ෆෙඩරල් පක්ෂය" (Federal Party) යනුවෙන් හැඳින්වෙයි. දෙමළ ජනතාව සඳහා ෆෙඩරල් ආණ්ඩුක්‍රමයක් අවශ්‍ය බව මෙම පාක්ෂිකයෝ පෙන්වා දුන්හ. මෙම පක්ෂය පිහිටුවන ලද්දේ එස්. ජේ. වී. චෙල්වනායගම් මහතාගේ නායකත්වය යටතේ ය. දෙමළ සංගමයෙහි මෙන් මෙම පක්ෂයෙහිද සාමාජිකයන් වූ අය මූලිකවශයෙන් දෙමළ අය වූහ. දෙමළ ජනතාවගේ ප්‍රශ්න නියෝජනය කිරීම සඳහා තිබෙන ප්‍රබලම පක්ෂය මෙය වෙයි.

ලංකාවේ වැඩිජනතාව වූ සිංහලයන්ගේ සාධාරණ අයිතිවාසිකම් රැකගැනීම සඳහා වර්ෂ 1936දී "සිංහල මහාසභාව" නමින් පක්ෂයක් පිහිටුවන ලදි. මෙම පක්ෂය ඇතිකිරීමෙහිලා පුරෝගාමී වූයේ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා ය. එහෙයින් එය එතුමාගේ නායකත්වය යටතේ පිහිටුවන ලදි. සිංහල ජනතාවගේ දේශපාලන අයිතිවාසිකම් රැකගන්නා අතර රටේ ආර්ථිකය නගාසිටුවීම සහ දේශීය සංස්කෘතියෙහි උන්නතියක් ඇතිකිරීම සිංහල මහාසභාවේ මූලික පරමාර්ථය විය.

මෙම පක්ෂ සියල්ලම, එනම් - දෙමළ සංගමය, ෆෙඩරල් පක්ෂය සහ සිංහල මහාසභාව -, බෙහෙවින් ජාතිවාදී ප්‍රතිපත්තීන් ගත් ඒවා විය. දෙමළ සංගමය සහ ෆෙඩරල් පක්ෂය, දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් රැකගැනීමට ප්‍රයත්න දැරූ අතර, සිංහල මහාසභාව සිංහල ජනයාගේ අයිතිවාසිකම් සහ දේශපාලන බලතල රැකගැනීමට ප්‍රයත්න දැරීය. වෙනසකට තිබුනේ රටේ ආර්ථිකය සහ සංස්කෘතිය නගාසිටුවීම ගැනද සිංහල මහාසභාවේ අවධානය යොමුවීමයි. මෙම දේශපාලන පක්ෂවල දක්නට ලැබුණු තවත් සමානකමක් නම්, ඒ සියල්ලම දේශපාලන දර්ශනය වශයෙන් බොහෝදුරට දේශීය ධාරාවක් ගැනීමයි.

මෙයින් වෙනස් වූ දේශපාලන දර්ශනයක් මත පදනම් වූ පක්ෂයක් 1934දී ලංකාවේ

පිහිටුවන ලදී. පිලිප් ගුණවර්ධන, දොස්තර ඇස්. ඒ. වික්‍රමසිංහ සහ ඇන්. ඇම්. පෙරේරා යන මහතුන්ගේ ප්‍රධානත්වයෙන් පිහිටුවනු ලද මෙම පක්ෂය "ලංකා සමසමාජ පක්ෂය" යනුවෙන් හැඳින්විනි. මෙම පක්ෂය පිහිටුවීමත් සමඟම ලංකාවේ මුල්වරට මාක්ස්වාදය බිහිවීමත් සිදුවිය. ආරම්භයේදී මේ පක්ෂය තුළ මාක්ස්වාදයට අයත් විවිධ මත දැරූ අය වූහ. ඇතැමෙක් සමාජවාදය තහවුරු කළහ. ඇතැමෙක් කොමියුනිස්ට් වාදය තහවුරු කළහ. පසුව දොස්තර ඇස්. ඒ. වික්‍රමසිංහ මහතා ප්‍රමුඛ කණ්ඩායම විසින් "කොමියුනිස්ට් පක්ෂය" යන නමින් වෙනම දේශපාලන පක්ෂයක් පිහිටුවා ගන්නා ලදී. ජාතිවාදයෙන් තොරව ලක්වැසියන්ගේ පොදු ප්‍රශ්න විසඳීමත්, රටේ ආර්ථිකය නගාසිටුවීමත්, විශේෂයෙන්ම කම්කරුජනතාවගේ ප්‍රශ්න නියෝජනය කිරීමත් මෙම මාක්ස්වාදී පක්ෂවල පරමාර්ථ විය.

කම්කරුවන්ගේ ප්‍රශ්න ඉදිරිපත්කිරීම සඳහා සංවිධානය වී තිබුණු තවත් පක්ෂයක් විය. එය කම්කරු පක්ෂය (Labor Party) යි. මෙහි නායකයා වූයේ ඒ. ඊ. ගුණසිංහ මහතා යි. මුලදී මෙම පක්ෂය ප්‍රබලව පැවතිනි. එහෙත් මාක්ස්වාදී පක්ෂ ඇතිවීමෙන් පසු එහි බලය ක්‍රමයෙන් අඩුවී ගියේය.

මේ හැරුණු විට, මෙම මුල්භාගයේදී පැවති තවත් සුළුපක්ෂ කිහිපයක් විය. ඒවා නම්වශයෙන් "මුස්ලිම් සංගමය" (Muslim League) , 'ලංකා යෝනක සංගමය" (Ceylon Muslim League) , සහ "ලංකා-ඉන්දියානු සංගමය" (Ceylon-Indian Congress) ද වෙයි.

වර්ෂ 1946දී, ලංකා පාලන ඉතිහාසයෙහි වැදගත් පියවරක් ගන්නා ලදී. එනම්, පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව සකස් කරන ලද සෝල්බරි ආණ්ඩුක්‍රමය පිළිගැනීමයි. මෙම පාලන ක්‍රමය පිළිගැනීමත් සමගම මනාවින් සංවිධානය වූ දේශපාලන පක්ෂවල අවශ්‍යතාවද හොඳින් ප්‍රකට විය. ජාතිවාදී අදහස්වලින් තොරව, රටේ පොදු යහපත සඳහා ස්ථිර දේශපාලන පක්ෂයක් පිහිටුවීමේ අගය, එවක නායකයන්ට වැටහී ගියේය. මෙම අරමුණ ඉටුකරගැනීම සඳහා එවක පැවති දේශපාලන පක්ෂ කිහිපයක නායකයෝ සාකච්ඡා පැවැත්වූහ. එම සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන්, ඔවුන් විසින් 1946දී "එක්සත් ජාතික පක්ෂය" (United National Party) නමින් දේශපාලන පක්ෂයක් පිහිටුවන ලදී. මෙම පක්ෂය ගොඩනගන ලද්දේ , ලංකා ජාතික සංගමය, සිංහල මහා සභාව, මුස්ලිම් සංගමය, ලංකා යෝනක සංගමය ආදී දේශපාලන පක්ෂ එකමුතු කිරීමෙනි. මෙම පක්ෂය ගොඩනැගීම සඳහා දිවයිනෙහි විවිධ ජාතීහු සහභාගි වූහ. එසේ පිහිටුවන ලද මෙම පක්ෂයෙහි නායකයා වශයෙන් ඩී. ඇස්. සේනානායක මහතා තෝරාගනු ලැබුවේය. එවක රාජ්‍ය මන්ත්‍රණ සභාවේ නායකධුරය දැරුවේද එතුමා ය. වර්ෂ 1952 දක්වා ලංකා පාර්ලිමේන්තුවෙහි අගමැතිධුරය දරන ලද්දේ ද ඒ මහතා විසිනි.

කල් යත්යත් එක්සත් ජාතික පක්ෂය තුළ නොයෙක් මතභේද ඇතිවන්නට විය. මෙයින් ඉතාමත් වැදගත් සිද්ධියක් වූයේ, ප්‍රබල දේශපාලනඥයකු වූ ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා, එක්සත් ජාතික පක්ෂයෙන් ඉල්ලා අස්වී විරුද්ධ පක්ෂයට එකතුවීමයි. මෙම සිද්ධිය වූයේ 1951දීය. එතුමා ප්‍රමුඛ මන්ත්‍රීවරු කිපදෙනෙක්ම එක්සත් ජාතික පක්ෂයෙන් අස්වූහ. ඉතාමත් ප්‍රබල දේශපාලන පක්ෂයක් බිහිවීම මෙහි ප්‍රතිඵලය විය. බණ්ඩාරනායක මහතාණන් විසින් පිහිටුවන ලද නව දේශපාලන පක්ෂය "ශ්‍රීලංකා නිදහස් පක්ෂය" (Sri Lanka Freedom Party) යනුවෙන් හැඳින්වෙයි.

2. ලංකාවේ නිදහස් අධ්‍යාපන ක්‍රමය

ලංකාවේ අධ්‍යාපනය පිළිබඳ තොරතුරු කිහිපයක් මීට ඉහත, තුන්වන පාඩමෙන් දක්වා ඇත. එහි මූලිකවශයෙන් දක්වා ඇත්තේ දැනට ලංකාවේ පවතින අධ්‍යාපන ආයතන ආදිය පිළිබඳ විස්තරයක් වෙයි. මෙම අතිරේක කියවීමෙන්, ලංකාවේ නිදහස් අධ්‍යාපන ක්‍රමය ඇතිවීම පිළිබඳ තොරතුරු කිහිපයක් ලුහුඬින් දක්වමු.

මෙහිලා නිදහස් අධ්‍යාපනය යනුවෙන් අදහස් කෙරෙන්නේ පාසැල් ගාස්තු නොගෙවා ලබන අධ්‍යාපනය යි. බටහිර විදේශ ආධිපත්‍යයට ලංකාව යටත්වීමට පෙර ලංකාවේ පැවතුණු ප්‍රධාන අධ්‍යාපන ආයතන පිරිවෙන් ය. විෂය කිහිපයක් පිළිබඳ පුහුණුවක් ලබාදුන්නා වූ පළල් අධ්‍යාපන ක්‍රමයක් ලෙස පැරණි පිරිවෙන් අධ්‍යාපනය සැලකිය හැක. මේ බවට වැදගත් සාක්ෂි පැරණි සිංහල සාහිත්‍යයෙන් අපට ලබාගත හැක. එම පිරිවෙන් අධ්‍යාපනයද නිදහස් අධ්‍යාපන ක්‍රමයක් විය. එහෙත් මෙහිදී අපේ අවධානය යොමුවී ඇත්තේ, බටහිර විදේශ ආධිපත්‍යයට ලංකාව මුළුමනින්ම යටත්වීමෙන් පසු, ඉංග්‍රීසීන් විසින් ලංකාවේ ඇතිකරන ලද අධ්‍යාපන ක්‍රමය අනුක්‍රමයෙන් වෙනස්කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ අධ්‍යාපන ක්‍රමය ගැන ය.

ලක්දිව යටත්විජිතයක් කරගැනීමෙන් පසු ඉංග්‍රීසි පාලකයන්ට අවශ්‍ය වූයේ, ඔවුන්ගේ පාලනබලයෙහි පැවැත්ම සහ ඔවුන්ගේ වෙළඳ ව්‍යාපාරවල දියුණුව සඳහා ලංකාවේ සේවයෙහි යෙදිය හැකි ලාංකික අනුගාමිකයන් පිරිසකි. එබඳු සේවයකට අවශ්‍යවන දැනුම සහ දැකුම ලබාදීමේ මාධ්‍ය ලෙස ඉංග්‍රීසි අධ්‍යාපනයත්, ක්‍රිස්තුලබ්ධිය පැතිරවීමත් ඔවුහු සැලකූහ. මෙයින් ක්‍රිස්තුලබ්ධිය පැතිරවීමේ කාර්‍යය, අනෙක් යටත්විජිතවල මෙන් ලංකාවේද බොහෝදුරට ක්‍රිස්තියානි මිෂනාරිවරුන් (Christian missionaries) විසින් කරන ලදී. මිෂනාරිවරුන් විසින් තම ආගම පැතිරවීමේ පරමාර්ථයෙන් අධ්‍යාපන ආයතනද පිහිටුවන ලදී. පොදු මහජනයා ක්‍රිස්තියානි ආගමට හරවාගැනීම සඳහා හොඳම මාධ්‍යය ඔවුන්ගේ මව්භාෂාව බව මිෂනාරීහු වටහාගත්හ. මේ නිසා පොදු මහජනයා හට ඔවුන්ගේ මව්භාෂාවෙන්ම අධ්‍යාපනය ලබාදීමට මිෂනාරීහු අවශ්‍ය පියවර ගත්හ. ලාංකේය සමාජයේ උසස් පවුල්වලට අයත් වූ අයගේ දරුවන්ට පමණක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබාදීම තමන්ගේ වාසිය සඳහා වන බව ඔවුහු දැන සිටියහ. මිෂනාරීන්ගේ මෙම අධ්‍යාපන ව්‍යාපාරය සඳහා එවක රජයෙන් ආධාර ලැබුණි. මේ හේතුව නිසා සාම්ප්‍රදායික වූ බෞද්ධ හින්දු සහ මුස්ලිම් පාසැල්වලට ආණ්ඩුවෙන් ලැබුණේ ඉතාමත් අඩු සැලකිල්ලකි.

පසුව රෝමානු-කතෝලික පාසැල් පිහිටුවීමත් සමගම, ප්‍රොටෙස්ටන්ට්-මිෂනාරීන්ගේ (Protestant missionaries) පැසැල්වලට රජයෙන් දෙනලද ආධාර බෙහෙවින් අඩුවිය. මේ සමගම වාගේ පිහිටුවන ලද, සාම්ප්‍රදායික නොවූ, බෞද්ධ සහ හින්දු පාසැල් නිසාද අධ්‍යාපන ආයතන අතරේ තරඟකාරී බව වැඩිවිය. මේ සියළුම පාසැල් ආණ්ඩුවේ ආධාරලබන

ඒවා විය. මේ හැරුණු විට අධ්‍යාපනයෙහි ව්‍යාප්තිය සඳහා රජය මගින් පිහිටුවන ලද පාසැල්ද විශාල සංඛ්‍යාවක් වූයේය. මේ හේතුව නිසා පාලනය වශයෙන් අධ්‍යාපන ආයතන, කොටස් දෙකකට බෙදිනි. රජයේ - ආධාරලබන පාසැල් සහ රජයේ පාසැල් යනුවෙනි. අධ්‍යාපන මාධ්‍යයද දෙ-ආකාර විය. ඉංග්‍රීසි මාධ්‍යයෙන් වූ අධ්‍යාපනය සහ සිංහල හෝ දෙමළ යන ස්වභාෂාවලින් වූ අධ්‍යාපනය යනුවෙනි. මේ අතුරින් ඉංග්‍රීසියෙන් අධ්‍යාපනය ලැබූ අය වරප්‍රසාද ලැබූ අය වූහ. එම අධ්‍යාපනය ලබාගත හැකි වූයේද උසස් සමාජ තරාතිරම්වලට අයත් වූ අයගේ දරුවන්ට පමණි. රජයෙන් පාසැල්වලට ලැබෙන ආධාර ප්‍රමාණයද, අධ්‍යාපන මාධ්‍යය සහ අධ්‍යාපන ආයතනවල පාලනය මත තීරණය විනි. ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගැන්වීම කෙරුණු පාසැල්වලටත්, රෝමානු-කතෝලික සහ ප්‍රොටෙස්ටන්ට් සමාගම් මගින් පාලනයවුණු පාසැල්වලටත් අනෙක් පාසැල්වලට වඩා වැඩි ආධාර ප්‍රමාණයක් රජයෙන් ලැබුනි. ආගම් වශයෙන් බැලූකල, ලංකාවේ ජනගහනයෙන් වැඩිම කොටස බෞද්ධයෝ වූහ. එසේ වුවද, බෞද්ධ පාසැල්වලට රජයෙන් ලැබුණු ආධාර ප්‍රමාණය ඉතාමත් සුළු එකක් විය. බෞද්ධයන් ලඟට ලාංකික ජනගහනයෙන් වැඩිකොටස හින්දු අය වූහ. හින්දු පාසැල් සඳහා රජයෙන් දෙන ලද්දේ ද ඉතාමත් සුළු ආධාර ප්‍රමාණයකි. බෞද්ධ සහ හින්දු යන පාසැල්වලට ලැබුණු ආධාර ප්‍රමාණයට වඩා බෙහෙවින් වැඩි වූ ආධාර ප්‍රමාණයක් රෝමානු-කතෝලික සහ ප්‍රොටෙස්ටන්ට් පාසැල්වලට රජයෙන් ලබාදෙන ලදි. රජයටම අයත් පාසැල්වලටද රජයෙන් ලැබුනේ ඉතාමත් අඩු සැලකිල්ලකි. රජයෙන් ලැබෙන ආධාර ප්‍රමාණවල මෙම අසමත්වය නිසා නොයෙක් මතභේද පැන නගින්නට විය. දශක කිහිපයක සිට ඇති වූ මෙම මතභේද කල් යත්යත් උග්‍රවන්නට විය. ක්‍රි. ව. 1939න් ආරම්භවූ දශක කිහිපය තුළ මේ පිළිබඳ ප්‍රශ්න වඩාත් ඉස්මතු වී පැන නැංගේ යයි කිව හැක.

කතෝලික සහ ප්‍රොටෙස්ටන්ට් සමාගම්වලට අයත් පාසැල්වල එම ආගම්වලට අයත් නොවන ශිෂ්‍යයන් සැලකිය යුතු ප්‍රමාණයක් සිටියද, ඔවුන්ට තමන්ගේ ආගම ඉගෙනීමට එම පාසැල්වල කිසිම පහසුකමක් නොතිබීමද, මහජනයාගේ අවධානයට ලක් වූ තවත් ප්‍රශ්නයක් විය. මේ ආදී හේතු නිසා වැඩි කල් නොගොස් අධ්‍යාපන ක්‍රමයේ ප්‍රතිසංවිධානයක් අවශ්‍යවන ලකුණු පහළ විය.

අධ්‍යාපන මාධ්‍යය වශයෙන් පාසැල්, කොටස් 3කට බෙදිනි. ඉංග්‍රීසි පාසැල්, ද්විභාෂා පාසැල් සහ ස්වභාෂා පාසැල් යනුවෙනි. ස්වභාෂා පාසැල් සිංහල සහ දෙමළ යනුවෙන් කොටස් 2ක් විය. මේවා අතුරින්, විෂයක් වශයෙන් ඉංග්‍රීසි උගන්වන ලද්දේ පාසැල් කිහිපයක පමණි. එහෙත් ඒ සඳහා විශේෂ ගාස්තුවක් අයකරන ලදි. ඒවායෙහි ස්වභාෂා අධ්‍යාපනය සඳහා පාසැල් ගාස්තුවක් අය නොකරන ලදි.

ද්විභාෂා පාසැල් දෙවර්ගයකි. ඇතැම් ද්විභාෂා පාසැල් ඉංග්‍රීසි-සිංහල වූ අතර අනෙක් ඒවා ඉංග්‍රීසි-දෙමළ විය. සාමාන්‍ය මිනිසා මෙම පාසැල් හැඳින් වූයේ "බයිලිංගුවල් ඉස්කෝල" යනුවෙනි. පාසැලේ පළමුවැනි අවුරුදු 4 හෝ 5 ඇතුළතදී, මේවායෙහි අධ්‍යාපනය මූලිකව ස්වභාෂාවකින්- එනම් සිංහලෙන් හෝ දෙමළෙන්- , දුන් අතර එතැන් සිට අධ්‍යාපන මාධ්‍යය වශයෙන් ක්‍රමයෙන් ඉංග්‍රීසි යොදාගන්නා ලදි. මේවායේ අධ්‍යාපනය සඳහා පාසැල් ගාස්තු ගෙවිය යුතු විය. ද්විභාෂා පාසැල් සංඛ්‍යාව ඉතාමත් අඩුවූ අතර, ඒවා අනුක්‍රමයෙන් නැතිවී යන්නට විය.

ඉංග්‍රීසි පාසැල්වල ඉගෙනීම සඳහා පාසැල්ගාස්තු අයකරන ලදින් ඒවායේ අධ්‍යාපනය ලබාගැනීම ධනපතිපංතියට අයත් වූ අයට මූලික වශයෙන් සීමා වූයේය. උසස්

රැකියාවක් ලබාගැනීම සඳහා අවශ්‍යවන අධ්‍යාපනය ලැබුණේ ඉංග්‍රීසි පාසැල්වල ඉගෙනීම ලැබූ අයට පමණ ය. මේ හේතු නිසා ලක්දිව ජනතාවට සමාන-පහසුකම් ඇති අධ්‍යාපන ක්‍රමයක් නොවිණි.

ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ දක්නට ලැබුණු මෙබඳු දුර්වලකම් වරින්වර බ්‍රිතාන්‍යනිරීක්ෂකයන් විසින්ද පෙන්වා දෙන ලදී. ලංකාවේ ආණ්ඩු ක්‍රමය පිළිබඳව පරීක්ෂා කොට වාර්තාවක් ඉදිරිපත්කිරීම සඳහා පත්කරන ලද ඩොනමෝර් කොමිසම (Donoughmore Commission - 1927) විසින් ලංකාවේ අධ්‍යාපනය ගැන කරන ලද වෙනස, එය අධ්‍යාපනය පිළිබඳ කමිටුවකට භාරදීමයි. මෙය සිදුවුයේ 1931 දිය. මෙම කමිටුවේ සභාපතිවරයා අධ්‍යාපන ඇමතිවරයා යනුවෙන් හැඳින්විණි. මෙම තනතුර සඳහා ප්‍රථමයෙන් පත්වුයේ සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාය. එවක අධ්‍යාපන ක්‍රමය පොදු ජනතාවට ප්‍රයෝජනවත්වන ලෙස සකස් වී නොතිබුණු බව කන්නන්ගර කමිටුව විසින් පෙන්වා දෙන ලදී. රජයේත් අනෙක් අංශවලත් උසස් රැකියා සඳහා සුදුස්සන්වීමේ වරප්‍රසාදය ඉංග්‍රීසි අධ්‍යාපනය ලබන අයට පමණක් සීමාවී තිබීම එවක අධ්‍යාපන ක්‍රමයේ විශාල දුර්වලකමක් බව කන්නන්ගර කමිටුව විසින් පෙන්වා දෙන ලදී. අධ්‍යාපනය ලැබීම වශයෙන්, උසස් පංතිය සහ සාමාන්‍ය ජනතාව අතර තිබුණු පරතරය නැතිකර දැමීම සඳහා වැදගත් පියවරක් මෙම කමිටුව විසින් ගන්නා ලදී. එනම් නිදහස්-අධ්‍යාපන පනත ඉදිරිපත් කිරීමයි. 'මෙම පනත ඉදිරිපත්කරන ලද්දේ 1944දිය. එම පනත අනුව ඉදිරිපත් කරන ලද එක් යෝජනාවකි බාලාංශයේ සිට විශ්වවිද්‍යාලය තෙක් නිදහස් අධ්‍යාපනය ලබාදිය යුතු බව. මෙම යෝජනාවලට විරුද්ධවූ අය බොහෝය. එහෙත් මහත් බාධක මැද්දේ, රාජ්‍ය මන්ත්‍රණ සභාවේදී මෙම යෝජනා වලී 1945දී සම්මත කරගන්නා ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පුණි අධ්‍යාපනයක් ලබාගැනීමේ වරප්‍රසාදය පොදුජනතාවටද හිමිවිය.

VOCABULARY FOR SUPPLEMENTARY READINGS

READING 1

අඩුවී යනවා	grow less, decrease
අපේක්ෂකයා	N5 candidate; pl. අපේක්ෂකයෝ ; stem අපේක්ෂක
අලුතෙන් or අළුතෙන්	anew, newly
ආරම්භය	N2 beginning; no pl.; stem ආරම්භ
ආර්ථිකය	N2 economy; stem ආර්ථික
ඉල්ලා අස්වෙනවා	resign
උගතා	N5 scholar, learned one; pl. උගත්තු or උගත්තූ ; stem උගත්
උදාව	N2 rise, origin; stem උදා
උද්ඝෝෂණය	N2 uproar, demand (etc.); pl. උද්ඝෝෂණ ; stems උද්ඝෝෂණ / උද්ඝෝෂණය
උන්නතිය	N2 development, uplift, eminence; no pl.

ආරුව	N2 character, touch, shape; no pl.
එතෙක්දුරට	that much, so far
කම්කරු පක්ෂය	N2 Labor Party; no pl.
කැඩෙනවා	break, be broken
කැබිනට් මණ්ඩලය	N2 the cabinet (of ministers); pl. කැබිනට් මණ්ඩල
කොමියුනිස්ට්වාදය	N2 Communism; no pl.
ගොඩනගනවා or ගොඩනඟනවා	build up
ජාතිවාදය	N2 communalism, nationalism; pl. ජාතිවාද
තහවුරු කරනවා	support
දෙමළ සංගමය	N2 Tamil Congress; no pl.
නව	new
නියෝජනය	N2 representation; pl. නියෝජන ; stems නියෝජන/නියෝජනය
පමුණුවා ගන්නවා	turn into
පරිසරය	N2 atmosphere, environment; pl. පරිසර
පරීක්ෂණය	N2 investigation, examination; pl. පරීක්ෂණ
පුරෝගාමීත්වය	N2 leadership; no pl.
පුරෝගාමී වෙනවා	be in the forefront
ප්‍රකට	evident, clear, well-known
ප්‍රතිඵලය	N2 result; pl. ප්‍රතිඵල
ප්‍රතිසංස්කරණය	N2 revision, re-construction, re-organization; pl. ප්‍රතිසංස්කරණ ; stems ප්‍රතිසංස්කරණ / ප්‍රතිසංස්කරණය
ප්‍රයත්න දරනවා	make efforts, attempt
ප්‍රශ්න නගනවා or ප්‍රශ්න නඟනවා	raise questions, question
බැඳෙනවා	be tied to, join
බිහිවීම	N2 coming into being, birth; pl. බිහිවීම්
භාගය	N2 part, portion, half; pl. භාග
මහතුන්	gentlemen - acc. pl. of මහතා
මාක්ස්වාදය	N2 Marxism; no pl.

මැතිවරණය	N2 election; pl. මැතිවරණ
මුලදීම	at first
මුස්ලිම්-සංගමය	N2 Muslim League; no pl.
රාජ්‍යමන්ත්‍රණ සභාව	N2 State Council; no pl.
ලංකා ජාතික සංගමය	N2 Ceylon National Council; no pl.
ලංකා යෝනක සංගමය	N2 Ceylon Muslim League; no pl.
ලාංකේය	Ceylonese, of Ceylon
වකවානුව	N2 period, time(-limit); pl. වකවානු
වගකීම	N2 responsibility, sense of responsibility
විස්තරය	N2 description; pl. විස්තර
වෙන්කරවනවා	get something set aside, separated, or reserved
සංස්කෘතිය	N2 culture; pl. සංස්කෘති
සකස්වීම	N2 getting arranged, getting organized, formation; pl. සකස්වීම්
සඳහන් කිරීම	N2 mentioning, mention; pl. සඳහන් කිරීම්
සමකාලීන	contemporary
සමාජවාදය	N2 socialism; no pl.
සමානකම	N2 similarity; pl. සමානකම්
සම්ප්‍රදාය	N2 tradition, pattern; pl. සම්ප්‍රදා
සර්වජනඡන්දබලය	N2 universal franchise; no pl.
සහභාගිත්වය	N2 participation; no pl.
සැලකියයුතු	reasonable, worthy of consideration
සිංහල මහා සභාව	N2 the Sinhala Maha Sabha (literally Sinhalese great council)
ස්ථිර	firm, permanent, strong
හැකිපමණ	as much as possible, as far as possible

READING 2

අදහස් කෙරෙනවා	signify a notion, mean
අනුගාමිකයා	N5 follower; pl. අනුගාමිකයෝ ; stem අනුගාමික

අයකරනවා	charge (fees, etc.)
අසමතාව	N2 inequality, disparity, dissimilarity; no pl.
ආධිපත්‍යය	N2 rule, sovereignty, power, domination; pl. ආධිපත්‍ය
උග්‍ර වෙනවා	be acute, be serious
උසස්	high, higher, upper, respectable
කමිටුව	N2 committee; pl. කමිටු
ක්‍රිස්තු-ලබ්ධිය	N2 Christian faith; no pl.
ගාස්තුව	N2 fee, fare; pl. ගාස්තු
තනතුර	N2 position, post; pl. තනතුරු
තරඟකාරීත්වය	N2 competition; no pl; stem තරඟකාරී
තරාතිරම	N2 status, position; pl. තරාතිරම්
තීරණය වෙනවා	be decided, be determined
දක්නට ලැබෙනවා	be seen, be found
දශකය	N2 decade; pl. දශක
දැකුම	N2 sight, philosophy; pl. දැකුම්
දුර්වලකම	N2 weakness, feebleness; pl. දුර්වලකම්
දෙ-ආකාර	two-fold
ද්විභාෂා	bilingual
ධනපති පංතිය	N2 rich class, capitalist class; pl. ධනපති පංති
නැතිකර දමනවා	destroy, put an end to
නැතිවී යනවා	become non-existent, disappear
නිදහස් අධ්‍යාපන පනත	N2 Free Education Act; no pl.
නිරීක්ෂකයා	N5 investigator, observer; pl. නිරීක්ෂක
පරතරය	N2 gap; no pl.
පලමුවැනි or පළමුවැනි	first
පලල් or පළල්	broad, wide
පහසුකම	N2 facility, ease, convenience; pl. පහසුකම්
පැතිරවීම	N2 spreading, expansion; pl. පැතිරවීම්

යකෙක් වගේ මිනිහෙක්.
A man like a devil.

උගත් අයට රජවරුන්ට වගේ ජීවත් වෙන්න පුලුවං.
Learned people can live like kings.

එයා ගමේ කෙනෙක් වගේ කතා කරනවා.
He talks like a villager.

ඉගනගන්න එක බුදියගන්න එක වගේ ලේසි නෑ.
Learning is not as easy as sleeping.

නූගත් අයට වගේම උගත් අයටත් පුලුවං මේ කතා කියවලා රස විඳින්න.
The learned as well as the unlearned can experience joy reading these stories.

11. INTERROGATIVES කුමක්, කෝ, කෙබඳු, කෙවැනි AND මන්ද

11.1 කුමක් is an inanimate singular interrogative, the equivalent of Colloquial මොකක් :

මෙය කුමක්ද?
What is this?

11.2 කො- is an interrogative prefix usually used with quantifiers පමණ or තරම් . Thus කොපමණ or කොතරම් 'how much':

ඔබට කොපමණ මුදල් උවමනාද?
or ඔබට කොතරම් මුදල් උවමනාද?
How much money do you need.

කොතරම් sometimes appears as කෙතරම් .

11.3 කෙබඳු and කෙවැනි are interrogatives formed with බඳු and වැනි . They thus have the sense 'what kind of, like what':

හෙතෙම කෙවැනි කෙනෙක්ද?

හෙතෙම කෙබඳු කෙනෙක්ද?
What kind of person is he?

ඔහු කෙබඳුද?
What is he like?

The Colloquial equivalent of this form is කොයි වගේ .

එයා කොයි වගේ මිනිහෙක්ද?
What type of man is he?

11.4 මන්ද 'why' is an alternate for කවර හෙයින්ද (7,12.3) or ඇයිද (8,14):

Lesson Twelve

පැවැත්ම	N2 continuity, existence, stability; no pl.
පූර්ණ	full, complete
ප්‍රතිසංවිධානය	N2 re-organization; pl. ප්‍රතිසංවිධාන
ප්‍රොටෙස්ටන්ට	protestant
බටහිර	N3 west, western
බයිලිංගුවල්	bilingual
බෙදෙනවා	be divided
මව්භාෂාව	N2 mother-tongue; pl. මව්භාෂා
මැද්දේ	in the midst of, amidst
මිෂනාරියා	N5 missionary; pl. මිෂනාරිහු ; stem මිෂනාරි
මිෂනාරිවරයා	N5 missionary; pl. මිෂනාරිවරු ; stem මිෂනාරි
මෙහිදී	here
රැකියාව	N2 job, occupation; pl. රැකියා or රැකියාවල්
රෝමානු කතෝලික	Roman Catholic
ළඟට	next to
වරප්‍රසාදය	N2 privilege; pl. වරප්‍රසාද
වාසිය	N2 profit, gain, benefit; pl. වාසි
විදේශ	foreign
ව්‍යාප්තිය	N2 expansion, extension; no pl.; stem ව්‍යාප්ති
සමාගම	N2 society, company, organization; pl. සමාගම්
සමාජය	N2 society; pl. සමාජ
සම්මත කරගන්නවා	get approved, get passed (as a bill) (for oneself)
සාක්ෂිය	N2 evidence, witness; pl. සාක්ෂි
සාම්ප්‍රදායික	traditional
සැලකිල්ල	N2 regard, respect, attention; pl. සැලකිලි
සීමාවෙනවා	be limited to, be restricted to
හරවාගන්නවා	get someone changed to (for oneself), convert

LESSON 13

'ශාන්ති'
599, නාවල පාර,
රාජගිරිය
6. 1. 69.

සැරදේවා!

ප්‍රිය කමලසිරි,

කලකින් ඔබට ලිපියක් එවීමට නොහැකිවීම ගැන කණගාටුවෙමි. මේ දිනවල මා පිට පැවරී ඇත්තේ වැඩ රාශියකි. ලිපි පමාවනුයේ එහෙයිනි. ඒ ගැන ක්ෂමාවනු මැනවි.

ඔබ පිළිබඳව ශුභ ආරංචි දෙකක්ම දැනගතිමි. එකක් ඔබ මෙවර විශ්වවිද්‍යාලය ප්‍රවේශ විභාගයෙන් ඉතාමත් උසස් ලෙස සමත්වී තිබීමයි. මා මෙය දැනගත්තේ පසුගිය සඳුදා 'දිනමිණ' පුවත්පතිනි. අනෙක ඔබ සියල්ල ළඟදීම නව නිවෙසක පදිංචිවීමට යාම පිළිබඳවයි. මෙය දැනගත්තේ ඔබ පියාණන් විසින් අප පියාණන්ට එවන්නට යෙදුණු ආරාධනා පත්‍රයකිනි.

ඔබ විශ්වවිද්‍යාලය ප්‍රවේශයෙන් උසස් ලෙස සමත්වීම ගැන අප සියල්ලගේම ඉමහත් ප්‍රීතිය මෙයින් දන්වා සිටිමු. විශ්වවිද්‍යාලයට ඇතුල් වූ පසු ඔබ කරන්නට බලාපොරොත්තුවන විෂයයන් මොනවා දැයි දැනගනු කැමැත්තෙමි. එය මට දන්වා එවනු මැන. පළමුවන වසරේදී ඇතුළුවූවිට ඔබට අර්ථශාස්ත්‍රය, සිංහල භාෂාව සහ මූලික ගණිතය යන විෂයයන් කරන හැකි. ඔබ විශ්වවිද්‍යාලය ප්‍රවේශ විභාගයට කළ අනෙක් විෂය වන සංස්කෘත භාෂාවට ඔබ ආශාවක්

දක්වයක් ඒ වෙනුවට අර්ථශාස්ත්‍රය කිරීම වඩා නුවණට හුරු යැයි මට වැටහෙයි. සංස්කෘත වැනි භාෂාවක් හැදෑරීමෙන් ප්‍රායෝගික වශයෙන් කිසියම් අගයක් ඇද්ද යනු සැක සහිතයි. ඉදින් ඔබට විවේක ඇතහොත් ඔබේ දැනුම දියුණුවීම සඳහා සංස්කෘත කියවන්න. අර්ථශාස්ත්‍රය වැනි විෂයයක් වර්තමාන ලෝකයට වඩා අවශ්‍ය බව පෙනී යයි.

පළමුවැනි වර්ෂයේ විභාගයෙන් පසු ඔබ විශේෂ උපාධියක් කිරීමට බලාපොරොත්තුවන්නෙහි නම් ඒ සඳහා මූලික විෂයයක් තෝරාගැනීම ඇතැම්විට දුෂ්කර කාර්යයක් වනු ඇත. ගණිතයෙහි පමණක් නොව සිංහල භාෂාව විෂයෙහිද ඔබ ඉතා දක්ෂයකු වන සෙයකි. විශේෂ උපාධියක් කිරීම සඳහා කුමන විෂයක් තෝරාගත යුතුද යන්න තීරණය කරන හැක්කේ General Arts Qualifying විභාගයේ ප්‍රතිඵල මත වුවද, දැන්මතියා එක් විෂයක් පිළිබඳව විශේෂ උනන්දුවක් දැක්වීම නුවණට හුරු යැයි මට හැඟෙයි. පසුව ඔබට ඒ විෂය පිළිබඳව විශේෂ උපාධියක් සාර්ථකලෙස කළ හැකි වන සෙයකි. මෙම විෂයෙහිලා මගේ කල්පනාව මූලික ගණිතය වඩා වැදගත් බවයි. වර්තමාන ලෝකයේ විවිධ විෂයයන් පිළිබඳ පර්යේෂණයන්හි යෙදී සිටින උගතුන්, ඔවුනොවුන් අතරේ අදහස් හුවමාරු කරගැනීම සඳහා උපයෝගී කරගන්නා වූ මූලික මාධ්‍යය මූලික ගණිත යැයි මට හැඟෙයි. මෙම විෂය පිළිබඳව සහජ දක්ෂකම් දක්වන ඔබ, විශේෂ උපාධියක් සඳහා හැදෑරිය යුත්තේ එම විෂය යි. එහෙයින් ඔබේ විශේෂ අවධානය මෙම විෂය විෂයෙහි යොමුකරන අතර අනෙක් විෂයයන්ද උනන්දුවී හදාරන්න. මෙම විෂයයන් සඳහා අවශ්‍ය මූලික පොත්පත් කියවීම පිණිස සෑහෙන කාල සීමාවක් ඔබට මෙම නිවාඩු කාලයෙන් ලැබේ යැයි සිතමි.

ඔබට නේවාසික ශිෂ්‍යයකු වශයෙන් විශ්ව විද්‍යාලයෙහි ඉගෙනීමට අවස්ථාවක් ලැබීමද ඉතාම වැදගත්. ඔබ තෝරාගෙන ඇත්තේ කවර ශිෂ්‍ය නිවාසයට දැයි දැනගනු රිසිවෙමි. ඔබ හැදෑරීමට බලාපොරොත්තුවන විෂයයන් හදාරන්නා වූ ශිෂ්‍යයන් රාශියක් ඔබට එහිදී හමුවේවි. ඔවුන් සමග ඔබ හදාරන විෂයන් පිළිබඳව සාකච්ඡා කිරීමට වැදගත් අවස්ථාවක් ඔබට ලැබේවි. මා විශ්ව විද්‍යාලය තුළ සිටියා වූ කාලය තුළදී මිතුරන් සමග සහභාගිවූ මෙබඳු සාකච්ඡාවලින්

ලබාගත් දැනුම මම ඉතා අගය කොට සලකමි. පොතපත හැදෑරීමෙහිලා පමණක් නොව ක්‍රීඩාභ්‍යාස විෂයෙහිලා ද නේවාසික ශිෂ්‍යයකුට ලැබෙනුයේ හොඳ අවස්ථාවකි. එයින් ඔබ හැකි පමණ ප්‍රයෝජන ගතයුතුයි.

විශ්ව විද්‍යාලයීය ශිෂ්‍යයකු වශයෙන් ඔබ වෙත පැවරී ඇත්තේද වැදගත් වගකීම් රාශියකි. ඒ සියල්ලම ඔබ අතින් ඉටුවනු දකිනු කැමැත්තෙමු.

ඔබට මගෙන් යම් කිසි පොතක් අවශ්‍ය වෙතොත් දන්වා එවනු මැන. නොවරදවාම එය එවන්නෙමි.

ලබන මාසයේ පැවැත්වෙන ඔබ සියල්ලගේ ගෙට ගෙවදීමේ උත්සවයට තාත්තා සහ මම එන්නෙමු. ඔබ ආවිට අපට තව තොරතුරු කථාකරගත හැකිවේවි, නේද?

ඔබට ඉඩක් ඇත්නම් පිළිතුරක් එවන්න. මා පියත් ඇතුළු ඔබ සියල්ල ඉතාමත් ආදරයෙන් සමරමි.

සැපවේවා,
මීට,
හිතවත්,
රංජිත්.

පිළිතුර

'අමානි'
කුරුණෑගල පාර,
මිනුවන්ගොඩ.
13. 1. 69.

ආසිරි !

ආදරණීය සොහොයුර,

ඔබ එවූ ලිපිය ලදිමි. ඊට ඉතාමත් සතුටියි. කාලෙකින් ලිපියක් නොලැබුණේ ඔබට වැඩ වැඩි නිසා යයි මමද සිතිමි.

මගේ සමත්වීම ගැන ඔබ එවා තිබුණු සතුටු පණිවුඩය ගැන ඉතාමත් කෘතඥවෙමි. මගේ අනාගත

දියුණුව ගැන ඔබ දක්වන උනන්දුව ඉතා අගයකොට සලකමි.

ඔබ ලිපියේ දක්වා තිබුණු වැදගත් අවවාද සියල්ලටම ස්තුතියි. එයින් මගේ සිතේ වඩාත්ම කාවැදීගියේ මූලික ගණිතය පිළිබඳව ඔබ දක්වා තිබුණු අදහස් රාශියයි. විශේෂ උපාධියක් කිරීමේ ආසාව මා සිත තුළද වෙයි. ඒ සඳහා කිනම් විෂයක් තෝරාගත යුතු දැයි සිත සිතා සිටිමි. මූලික ගණිතය පිළිබඳව විශේෂ උපාධියක් කිරීමේ ආසාව ඔබ දක්වූවා වූ අදහස්වලින් මා සිත තුළ තහවුරු විණි. ඔබ කෙසේ වෙතත් මූලික ගණිතය විෂයෙහිලා මා තුළ එතරම් දක්ෂකමක් ඇද්ද යන්න මට නම් සැකයකි. මෙම නිවාඩු කාලයෙන් පොතපත කියවීමෙහිලා හැකිතරම් ප්‍රයෝජන ගැනීමට මහන්සිවෙමි. කියවන හැකි සෑම පොතක්ම කියවමි. කෙතරම් පොත්පත් කියවනත්, ඒවායේ සඳහන්වන කරුණු වටහාගැනීම සඳහා අවධානය යොමුකිරීම දැන් මට ගැටළුවක් වී ඇත.

මෙම නිවාඩුකාලය තුළ මට, පුද්ගලික ආයතනයක් වන 'ශ්‍රී සුමන' විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ පංතිවල ශිෂ්‍යයින්ට මූලික ගණිතයත්, විශ්ව විද්‍යාලය ප්‍රවේශ පංතියේ ශිෂ්‍යයන්ට අර්ථශාස්ත්‍රයත් ඉගැන්වීමට අවස්ථාවක් ලැබුණි. මෙයින් මට සෑහෙන මුදලක් ලැබුණාද, ඒ සඳහා බොහෝ කාලය කැපකරන්නට වෙයි. මා මෙම තාවකාලික තනතුර භාරගත්තේ දැනට මට මුදල් අවශ්‍ය වී ඇති හෙයිනි.

මා තෝරාගෙන ඇත්තේ 'ජයතිලක' ශිෂ්‍ය නිවාසයටයි. අපේ විද්‍යාලයෙන් පසුගිය වසරේ ඇතුළත් වූවා වූ ශිෂ්‍යයන් නැවති සිටින්නේද එම නිවාසයේ වන හෙයින් විශ්ව විද්‍යාලයට ගිය පසු මගේ නේවාසික ජීවිතය සතුටින් ගතකරන හැකිවේ යැයි සිතමි. ඔබ නැවතී සිටියේත් එම ශිෂ්‍ය නිවාසයේම නේද ? ඉතින් ඔබ හමුවූ විටක ඒ ගැන තොරතුරු රාශියක්ම දැනගත හැකි වේවි නේ ?

සිංහල සහ අර්ථශාස්ත්‍රය පිළිබඳව ඔබ විශ්ව විද්‍යාලයේදී භාවිතා කළ පොත් ඇත්නම් ඒවා ලබාගනු කැමැත්තෙමි. ඒවා තැපැල් මගින් එවීමට මහන්සි නොගන්න. මට දිනක ඔබේ ගෙදරට ආ හැකි. එවිට ඒ පොත් ගන්නාම ඇති.

මා විශ්ව විද්‍යාලයට යෑමට නියමිතව ඇත්තේ තව මාස 2 කින් පසුවයි. ඉන් පෙර කෙසේ හෝ

ඔබ හමුවීමට බලාපොරොත්තුවෙමි.

අපේ ගෙට ගෙවදීමේ උත්සවයට ඔබ එන බව අසා ඉතාමත් සතුටුවූයෙමි. අම්මාද ඔබ ගැන නිතර තොරතුරු අසයි. නොවරදවාම එනු මැනව.

ඔබ සඳහන් කළ අයුරු විශ්වවිද්‍යාලීය ශිෂ්‍යයකු වශයෙන් මගෙන් ඉටුවිය යුතු වගකීම් සියල්ලම හැකි පරිදි ඉටුකිරීමට මහන්සි දරන්නෙමි.

මෙහි සියලුදෙනාම සුවසේය. මාපියන් ඇතුළු ඔබ සියලුදෙනාම ඉතාමත් ආදරයෙන් සමරමි.

සැපවේවා,
මීට
හිතාදර
කමලසිරි.

VOCABULARY

අතින්	by. See grammar 16.
අර්ථශාස්ත්‍රය	N2 economics; no pl.
ආදරණීය	dear, beloved
ආරාධනා පත්‍රය	N2 invitation-card; pl. **ආරාධනා පත්‍ර**
ආශාව	desire, liking, fondness; pl. **ආශාවල්** or **ආශා**
ආසිරි	blessings, greetings. See grammar 1.2.
ඉටුකිරීම	N2 fulfilling; pl. **ඉටුකිරීම්**
ඉමහත්	great
උපයෝගී කරනවා	use, make use of
ඔවුනොවුන්	them, those different people
ඔහි	there (Coll. **ඔහේ**)
කණගාටුවෙනවා	be sorry
කථා කරගන්නවා	talk (reflexive)

Lesson Thirteen

කමා වෙනවා	pardon, excuse
කලකින් or කලෙකින්	after some time, for some time
කාවැදී යනවා	get into (as an idea), impress one
කැපකරනවා	devote, dedicate, keep apart
කිනම්	what, which. See grammar 19.
කුමන	what, which. See grammar 19.
කෘතඥවෙනවා	be grateful
ක්‍රීඩාභ්‍යාසය	N2 practice in sports; pl. ක්‍රීඩාභ්‍යාස
ගැටළුව	N2 problem; pl. ගැටළු
තහවුරු වෙනවා	be confirmed, be established
තැපැල්	N mail; pl. only
දැන්ම තියා	from now on
දිනමිණ	N2 Dinamina (name of a newspaper); no pl.
නාවල	N3 Nawala (place name); no pl.
නියමිතව	fixed, decided (adverb)
නිවාසය	N2 house, hall of residence; pl. නිවාස
නේවාසික	of a dwelling place, residential
නොවරදවා	without fail
පණිවුඩය	N2 message; pl. පණිවුඩ
පමා වෙනවා	be delayed, be late
පර්යේෂණය	N2 research; pl. පර්යේෂණ
පලමුවන or පළමුවන	first
පැටවෙනවා	be loaded
පැවරෙනවා	be entrusted with
පිට	on (top of)
පුවත්පත	N2 newspaper; pl. පුවත්පත්
ප්‍රායෝගික	practical

ප්‍රිය	dear. See grammar 1.3.
මහන්සි ගන්නවා	take effort, try
මැන	good, please. See grammar 10.
මිනුවන්ගොඩ	N3 Minuwangoda (place name)
මූලික ගණිතය	N2 mathematics; no pl.
යන්න	the fact that. See grammar 15.
රාජගිරිය	N2 Rajagiriya (place name)
රිසි	liked, desirable
ලඟදී or ළඟදී	soon
ලිපිය	N2 letter; pl. ලිපි
ලිවීම	N2 writing; pl. ලිවීම්
වටහාගැනීම	N2 understanding; pl. වටහාගැනීම්
වැනි	like, such as.
විශ්වවිද්‍යාලයීය / විශ්වවිද්‍යාලීය	of a university
ශිෂ්‍ය නිවාසය	N2 student dormitory, hostel; pl. ශිෂ්‍ය නිවාස
ශුභ	good, happy, auspicious
සතුටු පණිවුඩය	N2 message of satisfaction, congratulatory message; pl. සතුටු පණිවුඩ
සමත්වීම	N2 success, passing (of an exam); pl. සමත්වීම්
සමරනවා	remember
සහජ	innate
සැකසහිත	doubtful
සැපවේවා	may (you) be happy! See grammar 1.2.
සැරදේවා	may (you) be blessed, may (you) live long. See grammar 1.2.
සුවසේ	well, fine, happily
සොහොයුරා	N5 brother; pl. සොහොයුරෝ ; stem සොහොයුරු
ස්තුතියි	thanks, thank you

Lesson Thirteen

හැදෑරීම	N2 education, training, studies; pl. හැදෑරීම්
හිතවත්	well-wishing
හිතාදර	affectionate, affectionately
හුවමාරු කරගන්නවා	exchange (mutually)

GRAMMAR

1. LETTER FORM

The readings for this lesson are two relatively formal personal letters. Since personal typewriters are relatively uncommon in Sri Lanka, letters are very commonly in handwritten form, as they appear here. While there is a basic similarity in form between Sinhala and English letters the following differences should be noted.

1.1 Return Address and Date

In the two letters in this lesson the first element in the return address is the house-name. This reflects a rather common Ceylonese custom of giving a name to one's house. In the return address the name of the house is commonly written in single or double quotes.

In Sri Lanka, dates are abbreviated in the British rather than the American order; that is: day-month-year. This order is followed whether the month is indicated by number or name. Thus 6. 1. 69 or 6. ජනවාරි 69. Some people use an older Sinhala system in which the order is year-month-day. Thus 1969 ජනවාරි 6වැනි දා. As in English, there is some variation in the punctuation of addresses; the one used in these letters is typical.

1.2 The Greeting

There may be (optionally) a greeting at the top of the letter. This could be one of numerous auspicious phrases, commonly a blessing. Some of these are connected with a particular religion, some are not. Some common ones unconnected with any religion are:

a.

සැරදේවා සෙත්වේවා සෙත් සැරද	May you be blessed
සැපවේවා	May you be happy
ආසිරි	Blessings.

b. The following are Buddhist:

තිසරණ සරණයි තුනුරුවන් සරණයි තුනුරුවන්ගේ පිහිටයි	Blessings (protection) of the Triple Gem

නමවුරුවන්ඩියා	Salutation to the Triple Gem

c. The following are Christian:

දෙවි සරණයි දෙවි පිහිටයි	Blessings (protection) of God.

1.3 The Salutation (dear so-and-so) is also optional in Sinhala, although both letters here include it. A common equivalent for English 'dear' is ප්‍රිය , but there is really no form that is as neutral as the English 'dear'. Thus almost every form used in this way is likely to imply some quality of relationship such as relative status, formality of relationship, affection, etc. ආදරණීය used in the second letter is less neutral than ප්‍රිය , and always implies some sort of affection. The term සොහොයුරා literally means 'brother', but is used between close friends whether or not there is any kinship connection. Note that titles used in the salutation will be in the vocative case.

Since the salutation is optional one may omit it if he is not sure of the proper term of address for the addressee.

1.4 The Complimentary Close

This has a maximum of three parts, all optional, as follows:

1. The blessing
2. මීට or මෙයට
3. Characterization of the writers relationship to the addressee.

1.41 The blessing is usually one of the same set of forms used as the greeting at the top of the letters (1.2 above).

1.42 මීට or මෙයට simply connects the writer to the letter, if only one part of the complimentary close is retained it is usually this.

1.43 For the characterization of the writer's relationship to the addressee, as for the salutation, there are no forms as neutral and automatic as English 'sincerely' or 'yours truly'. Some common ones are:

හිතවත් හිතෛෂී	well-wishing
හිතාදර ආදර ආදරණීය දයාබර	affectionate

1.5 Style

Whenever one writes a letter in Sinhala there is a tendency to use at least some of the conventions of Literary Sinhala. The general rule is that the more formal a letter the more it will tend to approximate Literary rather than Colloquial usage. The clearest single indication of the relative formality of a letter is in the verb forms employed. Formal letters will employ Literary main verbs whereas an informal letter between good friends might use Colloquial verb forms. Between these two extremes there are various mixtures of style and content. Note for example that the two personal letters here are friendly in tone but relatively formal in grammar and that, while they generally adhere to Literary Sinhala grammar, they also include a few Colloquial usages such as ලැබේවි and හමුවේවි rather than ලැබෙනු ඇත and හමුවනු ඇත , and the imperative එවන්න rather than the strictly formal එවනු මැනවි .

2. INFINITIVE PLUS යෙදුණ

An Infinitive plus යෙදුණ , past tense verbal adjective of යෙදෙනවා 'to be engaged in', forms a verbal adjective construction with a past passive sense. It may equate with an English perfect or pluperfect passive (i.e has been done or had been done) depending on the main verb of the sentence. The subject of the Infinitive is in the Oblique case optionally followed by විසින් .

ළමයා විසින් කියවන්නට යෙදුණ පොත මම කියවමි.
I am reading the book that has been read by the boy.

පුතා එවන්නට යෙදුණ ලිපිය පියා කියවූයේය.
The father read the letter that had been sent by the son.

3. යෙදුණා වූ

Alternate verbal adjectives with වූ were described in 12,7. The construction with යෙදුණ , given in Section 2 above, has an alternate of this kind, in which යෙදුණ becomes යෙදුණා before වූ :

ඔබ විසින් එවන්නට යෙදුණා වූ ලිපිය ලදිමි.
I received the letter that you had sent.

4. PRESENT PARTICIPLE

There is a Literary Sinhala present participle formed simply by adding -ත to the present tense stem of the verb. Thus:

Class 1	කියන
Class 2	අදින
Class 3	වැටෙන
Irregular	වෙන

5. PRESENT PARTICIPLE WITH හැකි

The present participle may be used in place of the potential participle with හැකි . The constructions are otherwise the same.

මෙම වැඩ ළමයාට කෙරිය හැකිය.

මෙම වැඩ ළමයාට කරන හැකිය.
The child can do this work.

6. PRESENT CONDITIONAL

6.1 A present conditional form of the verb may be made regularly in Literary Sinhala in one of the following ways.

1. The form හොත් may be added to the present participle. Thus:

කියන හොත්

අදින හොත්

2. The form තොත් may be added to the present tense stem of the verb. This form is now more common than the previous one. Thus:

කිය තොත්

අදි තොත්

6.2 The quasi-verbs ඇති and නැති have the conditional forms ඇතොත් and නැතොත් respectively in addition to ඇතහොත් and නැතහොත් forms given earlier (9,4).

6.3 The present conditional, like the past, is used to form the conditional 'if' clauses, but it generally implies action concurrent with rather than prior to the main verb.

ඔහු නුවර යනහොත් මමද යමි.
If he goes to Kandy I will go too.

ඔබ ළඟ එම පොත් ඇතොත් දන්වනු මැනවි.
If you have those books please inform me.

පියා ගෙදර වෙතොත් පුතාද ගෙදර විය යුතුය.
If the father is home the son too must be home.

6.4 The -තොත් form is also used in Colloquial Sinhala too, but it is not as common as නම් with the present verb in the same sense (C.S. 12,5).

7. PRESENT CONCESSIVE

The present concessive form of the verb may be formed by adding -ත් to the present participle.

Verb		Present Participle	Present Concessive
කියව-	read	කියවත	කියවතත
ඇදි-	pull	ඇදිත	ඇදිතත්
වැටෙ-	fall	වැටෙත	වැටෙතත්
වෙ-	be	වෙත	වෙතත්

The quasi-verbs ඇති and නැති have ඇතත් and නැතත් respectively.

7.1 There are also formal variants of the present concessive which add -ද or -දු rather than -ත් . Sometimes -ත of the verb is changed to -තු before -දු .

-ත් Form	Variants
කියවතත්	කියවතද, කියවතදු, කියවතුදු
ඇදිතත්	ඇදිතද, ඇදිතදු , ඇදිතුදු
වැටෙතත්	වැටෙතද, වැටෙතදු, වැටෙතුදු
වෙතත්	වෙතද, වෙතදු, වෙතුදු

7.2 The present concessive, like the past concessive (11,1) is used to form 'even if' clauses but generally implies action contemporaneous with rather than prior to that of the main verb.

> පොත් කියවතත් එහි ඇති කරුණු මට නොතේරෙයි.
> Although I read books I do not understand what is in them.
>
> මෙම දිනවල පුතා ලිපි එවතත් වැඩි තොරතුරු නොදන්වයි.
> Although the son sends letters these days he does not give us much news.

8. PRESENT EMPHATIC FORM

There is an alternate present emphatic form of the verb in Literary Sinhala which adds -නුයේ rather than -න්නේ to the verb-stem.

Verb Stem		Present Emphatic Form		
කර-	do	කරන්නේ	or	කරනුයේ
අදි-	pull	අදින්නේ	or	අදිනුයේ
වැටෙ-	fall	වැටෙන්නේ	or	වැටෙනුයේ

9. CONTINUOUS ACTION

In Literary Sinhala යනවා may be used following the perfect participle of a Class 3 verb in order to indicate continuous action.

පෙනී යයි	is seen
දැනී යයි	is felt

Compare the similar use of ගෙන යනවා in 11,21.

10. HONORIFIC IMPERATIVE

The form මැනව or මැනවි (8,2.4) used in forming the honorific imperative, has an alternate form මැන .

මෙම පොත කියෙවුව මැන (or මැනව or මැනවි).
Please read this book.

මෙම වැඩ කෙරුව මැන (or මැනව or මැනවි)
Please do this work.

11. PASSIVE PARTICIPLE

Three new uses of the passive participle -නු (4,6) are exemplified in this lesson:

1. Clauses with a verb in the passive participle form are used as objects of verbs of perception. The usual English equivalent is a verb in -ing.

පියා පොත කියවනු පුතා දකියි.
The son sees the father reading the book.

ළමයා නටනු මම දිටිමි.
I saw the child dancing.

The Colloquial Sinhala equivalent is the simple form of the verb.

මම ළමයා නටනවා දැක්කා.
I saw the son dancing.

2. The passive participle may be used as an alternative to the infinitive dependent on කැමති or its more formal equivalent රිසි :

හේ නටනු රිසිය.
හේ නටනු කැමතිය.
හේ නටන්නට කැමතිය
He likes to dance.

Since the construction with -නු is more formal than that with the infinitive, it is the usual one with රිසි .

3. The passive participle may be used as an alternant for the general form of the past tense verbal adjective in forming an honorific imperative with මැනව , මැනවි or මැන . Thus:

එය මට දන්වා එවුව මැනවි (or මැනව or මැන).
එය මට දන්වා එවනු මැනවි (or මැනව or මැන).
Please inform me of that.

12. CONSIDER AS

12.1 One Literary Sinhala equivalent for English 'consider X as Y' is 'X Y කොට සලකනවා '. For the most part this construction is restricted to instances where both X and Y are nouns, and both are then in the accusative case:

ලාංකිකයෝ කතරගම දෙවියන් වැදගත් දෙවිකෙනෙකු කොට සලකති.
Ceylonese consider the God of Kataragama as an important God.

12.2 Only a few adjectives occur as Y in this construction. They are usually adjectives of value like අගය- 'valuable', වැඩි 'more,' etc. In this construction also X will be in the accusative case.

එම පොත් මම ඉතා අගය කොට සලකමි.
I consider those books as very valuable.

13. WITH REGARD TO

'With regard to' may be expressed with the posposition විෂයෙහි . The form ලා is sometimes added to විෂයෙහි , adding slight emphasis.

ගණිතය විෂයෙහි(ලා) මෙම පොතින් දැක්වෙන කරුණු පැහැදිලි නැත.
The facts given in this book with regard to arithmetic are not clear.

විෂයෙහි is actually the -එහි genitive form of the noun විෂය 'range, subject' and sometimes just an -එහි genitive without විෂය indicates 'with regard to'. This use of the genitive is restricted to inanimate nouns, particularly verbal nouns in -ඊම , and again ලා is optional.

මෙම ශිෂ්‍යයා පොත් ලිවීමෙහි(ලා) දක්ෂයෙකි.
This student is skilled with regard to writing books.

14. CLAUSES FORMED WITH INTERROGATIVES

In English there are sentences containing clauses which are not interrogative but are formed with interrogative words such as 'who, when, where, how,' i.e. sentences such as:

'He said where John is going.'
'I know what it is.'
'It is clear what it is.'

The Literary Sinhala equivalent of such clauses may be formed by using the appropriate interrogative sentence followed by the quotation marker -යි .

මේ මල කුමක් දැයි දනිමි.
I know what this flower is.

පුතා යන්නේ කොහි දැයි පියා නොදනියි.
The father does not know where the son is going.

Note that this is similar to the way in which 'if' or 'whether' clauses are formed using -යි (12,20).

එයින් ප්‍රයෝජනයක් වේ දැයි සැක සහිතයි.
It is doubtful whether it will be of use.

15. යනු AND යන්න

Sentences such as those discussed in Section 14, may also be formed using one of the forms යනු or යන්න, either following -යි or replacing it.

මේ මල කුමක් දැයි යනු (යන්න) දනිමි.

මේ මල කුමක්ද යනු (යන්න) දනිමි.
I know what this flower is.

පුතා යන්නේ කොහි දැයි යනු (යන්න) පියා නොදනියි.

පුතා යන්නේ කොහිද යනු (යන්න) පියා නොදනියි.
The father does not know where the son is going.

එයින් ප්‍රයෝජනයක් වේ දැයි යනු (යන්න) සැක සහිතයි.

එයින් ප්‍රයෝජනයක් වේද යනු (යන්න) සැක සහිතයි.
It is doubtful whether it will be of use.

16. අතින් AND විසින් WITH CLASS 3 VERBS

In both Colloquial and Literary Sinhala many Class 3 verbs and verbs formed with වෙනවා have a passive sense somewhat like that of English 'get' plus past participle: කෙරෙනවා 'get done', ඇදෙනවා 'get pulled', බිඳෙනවා 'get broken', etc. The equivalent of the English agent (i.e. 'by John' in 'It got done by John') is usually left unexpressed in Sinhala, but if it is expressed, Colloquial Sinhala uses the postposition අතින් as the equivalent of 'by' (C.S. 36).

> ළමයා අතින් කෙරෙන වැඩ.
> The work done by the child.

In Literary Sinhala, either අතින් or විසින් may be found in such constructions:

> මේ ශිෂ්‍යයන් අතින් කෙරෙන වැඩ.
>
> මේ ශිෂ්‍යයන් විසින් කෙරෙන වැඩ.
> The work being done by these students.

In Literary Sinhala, there may be a difference in implication between අතින් and විසින්, in that the latter may place more emphasis on the actor and his conscious or volitional participation.

17. වෙත

වෙත 'with' or 'to' is an equivalent for colloquial ළඟ (C.S. 2,6) and ළඟට (C.S. 10,10) in either possessive constructions or with verbs of motion.

Colloquial: අපි ළඟ නවකතා පොත් නෑ.

Literary: අප වෙත නවකථා පොත් නැත.
We do not have novels with us.

Colloquial: පුතා තාත්තා ළඟට යනවා.

Literary: පුතා පියා වෙත (or වෙතට) යයි.
The son goes to the father.

Where Colloquial Sinhala has ළඟට, Literary Sinhala may have වෙතට as an alternate for වෙත.

18. ANIMATE PLURALS OF INANIMATE NOUNS

In Literary Sinhala some inanimate nouns may be found optionally inflected like animate nouns in the plural with no implication of animateness. Thus විෂය 'subject' may have plural forms as follows:

Nominative	විෂයයෝ
Accusative	විෂයයන්
Dative	විෂයයන්ට
Instrumental	විෂයයන්ගෙන්

However, there is still a difference from animate plural inflection in that animate nouns have only a single genitive in -ගේ whereas these inanimate nouns may add -ගේ in the possessive sense but -හි in the locative sense. Thus:

විෂයයන්ගේ	of the subjects
විෂයයන්හි	in the subjects

19. කුමන AND කිනම්

Both කුමන and කිනම් are Literary Sinhala interrogative adjectival forms meaning 'which, what'. කුමන is generally used with inanimate nouns whereas කිනම් can be used with both inanimate and animate nouns:

කුමන හේතුවක් or කිනම් හේතුවක්....
what (or which) purpose...

කිනම් කෙනෙක්.....
what (or which) person...

20. LOCATION SETS

එහි 'there', මෙහි 'here' and ඔහි 'there (by you)' are strictly literary equivalents of colloquial and literary එහේ, මෙහේ, and ඔහේ respectively. කොහි 'where', the equivalent of කොහේ was given earlier (10,16).

SUPPLEMENTARY READINGS

1.

නො: 59,
මීගමු පාර,
ජාඇල.
10. 3. 69.

සැරදේවා !

ප්‍රිය සොයුර,

බොහෝ කලකින් ඔබ ගැන කිසිම තොරතුරක් දැනගන්නට නොලැබුණු හෙයින් මෙය ලියන්නට අදහස් කරමි. දින කීපයකට පෙර ඔබේ ගෙදර ලිපිනයට ලියුමක් එවුවෙමි. ඊට පිළිතුරු වශයෙන් ඔබේ වැඩිමල් සොහොයුරාණන් විසින් එවන්නට යෙදුණ හැපැල්පතෙහි සඳහන් වී තිබුණා ඔබ දැනට මාස 2 කට පමණ පෙර ඉන්දියාවට ගිය බව. වාසනාවකට මෙන් ඔබේ ලිපිනයද එහි සඳහන් කර තිබුණි. අප කිසිකෙනෙකුට නොදන්වා පිටරටකට යාම ගැන කනගාටුවෙමු. කෙසේ වෙතත් ඔබේ අනාගත දියුණුව සඳහා ගිය ගමනක් හෙයින් අපි බෙහෙවින් ප්‍රීතිවෙමු.

ඉතින් කොහොමද තොරතුරු? ඔබට මෙහෙ වාගේම සැපපහසුකම් ඔහේ ඇද්දැයි දැනගනු කැමැත්තෙමි. ඔය විශ්ව විද්‍යාලයවල අධ්‍යාපන කටයුතු කෙසේද? ඔබ ඔහිදී හදාරන විෂයයන් මොනවාද? ඔබ ඉතාමත් කැමති භාෂාවක් වූ හින්දි භාෂාවද ඔහිදී හොඳින් ඉගෙනගත හැකි වේයැයි සලකමි.

ඔබ ඉන්නා පළාතේ කථාකරන

භාෂාව කුමක්ද? හින්දි චිත්‍රපටි ආදිය බලන්නට ඔබට හොඳ ඉඩකඩ ඇතිනේද? ඔබ නැවතී ඉන්නේ විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය නිවාසයකද? නැතහොත් පුද්ගලික ස්ථානයකද? දැනටම ඔබට මිත්‍රයින් විශාල පිරිසක් ඇතැයි සිතමි. එසේ වෙතොත් එය ඔබේ යහපතටයි. ඔවුන්ගෙන් භාෂාව ගැනත් රටතොට ගැනත් සමාජය සහ සංස්කෘතිය ගැනත් බොහෝ දේ ඉගෙනගත හැකි වන බැවිනි.

නිවාඩුකාලය කොයි දිනවල ලැබේවිදැයි ඔබ දන්නෙහිද? එම කාලය තුලදී කරන්නට බලාපොරොත්තුවන්නේ කුමක්ද? ලංකාවට ඇවිත් යන්න අදහස්කර සිටින්නෙහිද? නැතහොත් ඔහිම නැවතී සිටීමටද කල්පනාව? ඔහිම නැවතී සිටියහොත් රටතොට බලන හැකි නේද? එවිට, ඔබ ලංකාවට ආ පසු අපට ඉන්දියාව ගැන හුඟක් තොරතුරු කියා දිය හැකි නේද? ඔබ බෞද්ධයකු වන අතරම පුරාවිද්‍යාව ගැනත් ආසාවක් දක්වන ශිෂ්‍යයකුවන නිසා, විශේෂයෙන්ම ඉන්දියාවේ බෞද්ධ සිද්ධස්ථාන ආදිය බැලීමට අදහස් කරනු ඇතැයි සිතමි. ඔබ සතුව හොඳ කැමරාවක්ද ඇති හෙයින් ඔබට පින්තූර රාශියක්ද ගත හැකි වෙයි. එම සිද්ධස්ථානවල පිංතූර කිහිපයක් ගැනීමට නම් අමතක කරන්න එපා. විශේෂයෙන්ම බුද්ධගයා, සාංචි, අජන්තා යන ස්ථානවලට යෑමට අමතක නොකරන්න. එම ස්ථාන අපි විශේෂයෙන්ම අගය කරමු. එහෙයින් ඒවායේ පිංතූර කිහිපයක් නොවරදවාම ඔබ එනවිට රැගෙන එන්න.

ඔහි දේශගුණය, කෑම්බීම් ආදිය කෙසේද? ඒවායින් ඔබට කිසිම කරදරයක් නැතැයි සිතමි.

අප ගැන හෝ රට ගැන හෝ විශේෂයෙන් කිවයුත්තක් නොමැත. ඔබේ සියළුම අධ්‍යාපන කටයුතු සාර්ථකවේවායි පතමි.

මිට
හිතාදර,
විමල්.

2.

ශිෂ්‍ය නිවාසය,
පූනා විශ්ව විද්‍යාලය,
12 . 12 . 69 .

ප්‍රිය සොයුර,

ඔබ විසින් එවන්නට යෙදුණු ලිපිය ලදිමි. ඒ ගැන ඉතාමත් සතුතියි. ඔබ [illegible] නොදන්වා මා ඉන්දියාවට පැමිණීම ගැන මට සමාවන්න. ඉන්දියාවට යාම සඳහා තීරණය කිරීමෙන් පසු ඔබ හමුවීමට ඒමටයි සිතාසිතා සිටියේ. එසේ වුවත්, ඉන්දියාවට යාම සඳහා අවශ්‍ය නොයෙක් වැඩ කටයුතු කිරීමට සිදුවූයෙන්, ඔබ හමුවීමට එන්නට ඉඩක් ලැබුනේ නැහැ. එහෙත් ඔබට, මෙහි පැමිණි වහාම ලිපියකින් හෝ දන්වන්නට සිතා සිටියෙමි. කෙසේ හෝ එයද අතපසු විණි. මෙහි මා බලාපොරොත්තු වූ තරමට වඩා වැඩකටයුතු වැඩිවීම ඊට එක් හේතුවකි. මෙහි ආවාට පසු ගෙදරට වුවද තවම මා යවා ඇත්තේ එක ලිපියක් පමණකි.

මෙහි පැමිණි දිනම මට ශිෂ්‍ය නිවාසයක කාමරයක් ලබාගත හැකිවීම නිසා මගේ වැඩ කටයුතුවලට විශාල පහසුවක් සිදුවිණි. මා නැවතී සිටින ශිෂ්‍ය නිවාසයේ සිට පංතිවලට යෑමට විනිත්තු 2ක් වත් ගතනොවෙයි. එය නම් මට විශාල පහසුවක්. උදේ 8වේ සිට 10ය වන තෙක් දිනපතාම - එනම් සඳුද සිට සිකුරාදා දක්වා, පංති පැවැත්වෙයි. දවසේ ඉතිරි තරිය පොත්පත් බලාගැනීමට යෙදීමට සිදුවෙයි. පංතිවලට අමතරව බොහෝ පොත්පත් බැලීමට සිදුවේ. ලංකාවේ

මෙන් එතරම් විනෝදයෙන් කල් ගත කිරීමට මෙහි ඉඩක් නොලැබෙයි. මෙහි අනෙක් ශිෂ්‍යයින්ද බොහෝ මහන්සි වී වැඩකරනු පෙනෙයි. ඒ දකින විට පොතපත කියවීමට මටද සිතෙයි. ලංකාවේ විශ්වවිද්‍යාලවල මෙන් නොව මෙහි වාරයක් ඇතුළතද පරීක්ෂණ කිහිපයක පවත්වනු ලැබෙයි. යටත් පිරිසෙයින් වාරයක් ඇතුළත පරීක්ෂණ 2ක් හෝ පැවැත්වෙයි. මේ නිසා සෑම ශිෂ්‍යයකුටම පාහේ සෑහෙන කාල ප්‍රමාණයක් පොතපත කියවීම සඳහා කැපකිරීමට සිදුවෙයි.

ඉන්දියා ඉතිහාසය හැදෑරීම සඳහා මා මෙහි පැමිණි නමුත්, මෙහිදී ඒ වෙනුවට පුරාවිද්‍යාව තෝරාගතිමි. එය මා විශේෂයෙන්ම ප්‍රියකරන විෂයක් වන බැවිනි. හින්දි, මරාඨි වැනි භාෂා ඉගෙනීමටද මට ලැබී ඇත්තේ හොඳ අවස්ථාවකි. එයින් සම්පූර්ණ ප්‍රයෝජන ගැනීමට මම මහන්සි දරන්නෙමි.

මගේ පංතියේ සිටිනුයේ තවත් ශිෂ්‍යයින් 3 දෙනෙකු පමණි. එයින් එක්කෙනෙකු ඉන්දියානු ජාතිකයෙකු වන අතර අනෙක් දෙදෙනා ජපන් ජාතිකයෝය.

අපට නිවාඩුකාලය ලැබෙනුයේ නව සතියකින් පමණය. මේ නිවාඩුව මාසයක් පමණ කල් වෙයි. එම කාලයේ දී මගේ මිත්‍රයකු සමග රටතොට බැලීමට යාමට අදහස් කර සිටින්නෙමි. විශේෂයෙන්ම ඔබ සඳහන් කළ ස්ථානවලට යන්ට මහන්සි ගන්නෙමි. එම ස්ථානවල පින්තූර කිහිපයක් ඔබට තැපැල්කර එවන්නෙමි.

මේ දිනවල මෙහි සීතකාලයයි. ලංකාවට වඩා බොහෝ තදින් සීත ගතිය ඇඟට දැනෙයි. කෑමබීමවලින් කිසිම කරදරයක් නැත. ඉතාමත් සතුටින් කල්ගෙවමි.

ලංකාව ගැන වරින්වර මෙහි ප්‍රවෘත්ති පත්‍රවලින් තොරතුරු දැනගනිමි. එහෙත් ඒවායේ එතරම් තොරතුරු දක්නා නොලැබෙයි. වැදගත් දෙයක් ඇතොත් දන්වා එවන්න.

ඔබ පවුලේ සියලුදෙනාම ආදරයෙන් මතක් කළ බව කියන්න.

මීට,

උපාලි.

VOCABULARY FOR SUPPLEMENTARY READINGS

READING 1

අජන්ටා	Ajanta (place name)
අදහස් කර සිටිනවා	be thinking, be intending
අමතක කරනවා	forget (intentionally or preventably)
ඉඩකඩ	N2 room, space, opportunity; pl. ඉඩකඩවල්
කථා කරනවා	talk, speak
චිත්‍රපටිය	N2 film, movie; pl. චිත්‍රපටි
ජාඇල	N3 Jaela (place name)
තැපැල් පත	N2 post-card; pl. තැපැල් පත්
දැනට	(for) now
දේශගුණය	N2 climate; no pl.
නො.	abbreviation for නොම්මරය 'number'
නොමැත	is not, are not
පතනවා	wish
පිංතූරය / පින්තූරය	N2 picture; pl. පිංතූර / පින්තූර
පුරාවිද්‍යාව	N2 archaeology; no pl.; stem පුරාවිද්‍යා
බුද්ධගයා	Buddhagaya (place name)
මීගමුව	N2 Negombo (place name); stem මීගමු
ලිපිනය	N2 address; pl. ලිපින
වාසනාවකටමෙන්	fortunately
සාංචි	Sanchi (place name)
සැපපහසුකම	N2 comfort, facility; pl. සැපපහසුකම්
සොයුරා	N5 brother; pl. සොයුරෝ ; stem සොයුරු

READING 2

අතපසු වෙනවා	get delayed, get forgotten

ඉන්දියා	Indian
කාමරය	N2 room; pl. කාමර
ජපන්ජාතිකයා	N5 Japanese person; pl. ජපන්ජාතිකයෝ ; stem ජපන්ජාතික
තදින්	severely, strongly
තැපැල් කරනවා	mail, post
දක්න ලැබෙනවා	be seen, be found
දන්වා එවනවා	inform (by sending a message)
නැහැ	= Coll. නෑ
පහසුව	N2 ease, comfort, facility; no pl.; stem පහසු
පුනා	Poona (place name)
ප්‍රවෘත්ති පත්‍රය	N2 newspaper; pl. ප්‍රවෘත්ති පත්‍ර
මරාඨි	Marathi (language name); no pl.
විනෝදය	N2 pleasure, joy, fun; pl. විනෝද
සමා වෙනවා	pardon, excuse
සිතසිතා සිටිනවා	be thinking
සීතකාලය	N2 cold season; pl. සීතකාල
සීතගතිය	N2 cold(ness); pl. and stem සීතගති

LESSON 14

බුදුරජාණන්වහන්සේ

බුදුරජාණන්වහන්සේ උපත ලැබුයේ ක්‍රි. පූ. 563දී පමණ, පැරණි ඉන්දියාවේ "කපිලවස්තු" නගරයේය. උන්වහන්සේගේ පියා "ශුද්ධෝදන" නම් රජකෙනෙක් විය. මව "මහාමායා" දේවිය. ගිහිගෙයි සිටියදී උන්වහන්සේ හැඳින්වුණේ "සිද්ධාර්ථ" යන නමිනි.

සිද්ධාර්ථ කුමාරයා බොහෝ සැප විඳිමින් රජමාලිගයෙහි වැඩුනේය. එතුමාගේ පියා වූ ශුද්ධෝදන රජතුමාද සිය පුතුට හැකිපමණ සැපසම්පත් ලබාදෙමින්, ඔහු ගිහිගෙයි රැඳෙන පරිදි අවශ්‍ය විධිවිධාන සැලැස්වුයේය. තම පුත්‍රයා ගිහිගෙයි රැඳෙනු දකිනුරිසි වූ ශුද්ධෝදන රජතුමාට ඒ සඳහා කටයුතු කිරීමෙහිලා බෙහෙවින් වෙහෙසෙන්නට විය. මෙසේ ඔහුට වෙහෙසෙන්නට වූයේ, සිද්ධාර්ථ කුමාරයා රජකෙනෙකු වී මුළු ඉන්දියාවේම ආධිපත්‍යය පිහිටුවනු දැකීම ඔහුගේ බලාපොරොත්තුව වූ හෙයිනි.

තරුණ වයසට පත් සිද්ධාර්ථ කුමාරයාට "යශෝධරා" නම් රූපත් කුමරියක විවාහ කර දුන්නේය.

තරුණ සිද්ධාර්ථ කුමාරයා උද්‍යානක්‍රීඩාවෙහි ප්‍රිය විය. දිනක්, හෙතෙම උයනට යන අතරමගදී, සැරයටියක වාරුවෙන්, අමාරුවෙන් ගමන් කරන, දත්වැටුණු, කෙස් පැසුණු, ඇඟරැළි ගැසුණු, කුදු ගැසුණු, දකින කල පිළිකුල් උපදවන සුළු මහළු මිනිසකු දුටුවේය. ඊට පෙර මහළු මිනිසකු නොදුටු විරූ ඔහු, " ඒ තැනැත්තා කවරෙක්දැ"යි ස්වකීය රථාචාර්යයාගෙන් ඇසූ කල, ඒ මහළු මිනිසකු බවත්, උපන් යමෙකු ඇත්නම් ඒ සියල්ලටම මහළු බව සාධාරණ බවත්, රියැදුරා පැවසීය. එය ඇසූ සිද්ධාර්ථ කුමාරයා තමාද දිනක මහළුබවට පත්වන බව දැන, කලකිරුණු සිත් ඇතිව, උද්‍යානක්‍රීඩාවෙහි පවා ආසාව අත්හැර ආපසු රජමාලිගය කරා ගියේය. ආපසු රජමාලිගයට ගිය හෙතෙම, ජීවිතයෙහි යථාතත්වය පිළිබඳ මෙනෙහි කරමින්, කලකිරුණු සිතින් කල්යැවීය.

නැවත, දිනක් උයනට යන අතරමගදී රෝගී තැනැත්තකු දැක, " ඒ කවරේදැ"යි රියැදුරාගෙන් අසා දැන, පෙර සේම කලකිරී පෙරළා රජමාලිගයට පැමිණියේය. තමා ලත් ගිහි සැප සම්පත් කෙරෙහි සිද්ධාර්ථ කුමාරයාගේ සිත අනුක්‍රමයෙන් කලකිරෙන්නට විය. නැවතත් දිනක, උයනට යනු රිසි වූ කුමරු ඒ බව රියැදුරාට දැන්විය. රියැදුරා සමග අස්රියෙන් උයනට යන කල්හි අතරමගදී, සිව්දෙනකු විසින් ඔසවාගෙන යනු ලබන මළ සිරුරක් දක්නට ලැබිණ. දැක "ඒ කුමක්දැ"යි රියැදුරාගෙන් ඇසීය. ඒ මළ සිරුරක් බවත්, මරණය උපන් කාටත් සාධාරණ බවත්, ඒ නිසා මෙන්ම, දිනක, රිය පදවන තමාත්, රියෙහි ගමන්කරන කුමරුත් මරණයට පත්වන බවත් රියැදුරා සිද්ධාර්ථ කුමාරයා හට පහදාදුන්නේය. රියැදුරා එසේ පහදාදුන් පසු ජීවිතය පිළිබඳ නිසරුබව වටහාගත් කුමරු උද්‍යානක්‍රීඩාව පිළිබඳ ආසාව අත හැර ආපසු

රජමාලිගයට ගියේය. මෙසේ ටික දිනක් ගත වූ පසු, නැවතත් සිද්ධාර්ථ කුමාරයා උයනට යනු රිසි විය. එදින උද්‍යානක්‍රීඩා සඳහා යන්නේ හෙතෙම අතරමගදී සන්සුන් ලෙස ගමන්කරන ශ්‍රමණ කෙනකු දුටුවේය. කුමාරයා ශ්‍රමණයන් දැක්මෙන්ම පැහැදුනු සිත් ඇතිව, " ඒ කවරෙක්දැ"යි රියැදුරාගෙන් අසා දැන, සතුටුව, තමාද එම ශ්‍රමණවරයා මෙන් පැවිදි විය යුතු යැයි තීරණය කරගත්තේය. එදින උද්‍යානක්‍රීඩාවෙහි ආසා ඇති වූ කුමරු මුළු දිනයම උයනෙහි ගතකෙළේය.

එදිනම සිය දේවිය වූ යශෝධරාවට පුත්‍රයකු ලැබුණු බව, තම පිය රජතුමා විසින් තමා වෙත එවන ලද පණිවුඩකරුවකුගෙන් සිද්ධාර්ථ කුමාරයා දැනගත්තේය. තම පුත්‍රයාට "රාහුල" යන නම දෙන ලදී. මුළු දිනයම උයනෙහි ගතකළ කුමරු ආපසු මාලිගයට පැමිණියේ, එදිනම ගිහිගෙන් නික්මයන අදහසිනි. ගිහිගෙයි තුබූ සියළුම සැපසම්පත් කෙරෙන් ඔහුගේ සිත මිදුනේය. ඔහු යම් සැපතක් බලාපොරොත්තුවූයේ නම් ඒ පැවිදි සැපතය.

එදිනම මැදියම් රැයෙහි, සිය බිරිඳත්, බිළිඳු දරුවාත්, රජ සැපත් අත්හැර දමා එතුමා ගිහිගෙන් නික්ම ගියේය. තම පුතා ගිහිගෙන් නික්ම ගිය බව දැනගත් ශුද්ධෝදන රජතුමා බොහෝ දුකට පත්වූයේය. සියළු රජසැප අත්හැර සිය සැමියා ගිහිගෙන් නික්ම ගිය බව දත් යශෝධරා දේවියද බෙහෙවින් දුක්වූවාය. ගිහිගෙන් නික්ම යනවිට එතුමාගේ වයස අවුරුදු 29ක් පමණ විය. සංසාරයෙහි යථාතත්වය අවබෝධකරගැනීමෙහි මෙහෙයුණු සිතැති එතුමා ශ්‍රමණවරයකු ලෙස පැවිදි විය. තමා ගිහිගෙයි සිටියදී ලත් සැප එතුමා පැවිදිව, නිසරුකොට සැලකීය. නොයෙක් සමකාලීන ආචාර්යවරුන් වෙතට ගොස් ඔවුන් වෙතින් සංසාරවිමුක්තිය පිළිබඳ නොයෙක් කරුණු උගත් නමුදු එයින් සෑහීමකට පත්නොවී, සවකීය චින්තනයෙන් සංසාර විමුක්තිය පිළිබඳ මාර්ගයක් සෙවීමට උත්සුක විය. එතුමා අවබෝධ කරගත් ධර්මය "චතුරාර්ය සත්‍ය ධර්මය" නමින් හැඳින්වෙයි. එතුමා මෙම ධර්මය අවබෝධකරගත්තේ තම 35වැනි වියේදිය. එතැන් සිට තමාගේ සෙසු ජීවිත කාලය තමා අවබෝධකරගත් ධර්මය ජනතාව හට අවබෝධකරදීම සඳහා එතුමා යෙදිය. නගරයක් නගරයක් පාසා යමින් එතුමා තම ධර්මය දේශනා කළේය. චතුරාර්ය සත්‍යධර්මය අවබෝධකරගත් දින සිටම එතුමා හැඳින්වීම සඳහා "බුද්ධ"- එනම් "බුදුරජාණන්වහන්සේ", යන නම භාවිතයට පත්විය.

බුදුරජාණන්වහන්සේ දේශනාකළ ධර්මය "බුද්ධ ධර්මය" යනුවෙන් හැඳින්වෙයි. එය ක්‍රමයෙන් ආචාරමාර්ගයක් වශයෙන් බොහෝ දෙනා විසින් අනුගමනයකරනු ලබන්නක් බවට පත් විණි. එය බුදුසමය හෙවත් බුද්ධාගම යනුවෙන් හැඳින්වෙයි.

VOCABULARY

අවබෝධ කරගන්නවා	realize, gain comprehension
අවබෝධකර දෙනවා	make someone else realize, explain
අශ්වරිය	N2 chariot, horse-drawn vehicle; pl. අශ්වරියවල්

ආචාර මාර්ගය	N2 system of ethics or conduct; pl. ආචාර මාර්ග
ඇඟරැලි ගැසෙනවා	wrinkle, wrinkles (of the body) appear
උත්සුක වෙනවා	be intent on, strive for
උපත	N2 birth; pl. උපත්
උපන්	born. See grammar 4.
උයන	N2 park; pl. උයන්
එසවාගෙන යනවා	carry (while lifting)
කවරේ	who, what. See grammar 14.
කුදු ගැසෙනවා	be hunch-backed (due to age)
කුමරු	N5 prince; pl. කුමරහු
කෙරෙන්	from. See grammar 5.
කෙරෙහි	in, with regard to. See grammar 5.
කෙස්	N2 hair (of head) (plural collective)
ක්‍රි. පූ.	abbreviation for ක්‍රිස්තු පූර්ව B.C.
ගමන් කරනවා	move, walk, journey
ගිහිගේ	N4 household (status); no pl.; genitive ගිහිගෙයි
චතුරාර්ය සත්‍යය	N2 the four noble truths (collective singular)
චින්තනය	N2 thinking, thought; pl. චින්තන
තුබූ	(that which) was. See grammar 4.
දත	N2 tooth: pl. දත්
නික්ම යනවා	set out, leave, depart
නිසරු	non-substantial, useless
පණිවුඩ කරුවා	N5 messenger; pl. පණිවුඩ කරුවෝ ; stem පණිවුඩ කරු
පත්	arrived at (a state of being). See grammar 4.
පදවනවා	drive
පවා	even. See grammar 17.
පහදා දෙනවා	explain

Lesson Fourteen

පාසා	every. See grammar 18.
පැසෙනවා / පැහෙනවා	mature, ripen, turn grey (of hair)
පැවිදි වෙනවා	be ordained (as a monk or nun), become an ascetic
පිළිකුල	N2 dejection; no pl.; stem පිළිකුල්
පෙරළා	back. See grammar 15.
බුදුසමය	N2 Buddhism; no pl.
බුද්ධ ධර්මය	N2 Buddhist doctrine; no pl.
මළ සිරුර	N2 dead body; pl. මළ සිරුරු
මෙනෙහි කරනවා	reflect, ponder, meditate upon
මෙහෙයෙනවා	be directed (towards), be led (to)
යම්	whatever. See grammar 2.
යමෙක්	anyone, he (who). See grammar 2.
රථාචාර්යයා	N5 charioteer; pl. රථාචාර්යයෝ
රිය	N2 cart, chariot, car, vehicle; pl. රිය / රියවල්
රියැදුරා	N5 charioteer, driver; pl. රියැදුරෝ ; stem රියැදුරු
රෝගියා	N5 sick person; pl. රෝගියෝ ; stem රෝගී
ලත්	received. See grammar 4.
වාරුව	N2 help, strength, support; no pl.
විමුක්තිය	N2 freedom, liberation; no pl.; stem විමුක්ති
විරූ	earlier. See grammar 6.
වෙතින්	from. See grammar 5.
ශ්‍රමණවරයා	N5 recluse; pl. ශ්‍රමණවරු ; stem ශ්‍රමණ
සංසාරය	N2 cycle of rebirth, mundane existence, the world; pl. සංසාර
සම්පත	N2 wealth, fortune, luxury; pl. සම්පත්
සැරයටිය	N2 walking stick; pl. සැරයටි
සැහීම	N2 satisfaction; no pl.

සිය	one's own. See grammar 16.
සිව්දෙනෙක්	four people
සුළු or සුලු	characterized by. See grammar 13.
සුවය	N2 comfort, happiness, pleasure; no pl.; stem සුව
ස්වකීය	one's own. See grammar 16.

GRAMMAR

1. -දී 'WHILE'

1.1 The form දී (C.S. 14,7) may be added to the -ත් form of the verb, i.e. the absolute participle (12,4) to form the equivalent of English 'while' clauses.

> හෙතෙම උයනට යත් දී මහලු මිනිසකු දුටුවේය.
> He saw an old man while going to the park.
>
> පංතියෙහි සිටිත් දී ශිෂ්‍යයෝ කෑනොගසති.
> The students do not shout while in the class.

However there are some verbs that optionally use the -ඉය potential participle form (4,2) before -දී . The verbs සිටිනවා and තිබෙනවා both meaning 'be, exist' are two such verbs. Thus:

> සිටිත් දී or සිටිය දී
>
> තිබෙත් දී or තිබිය දී
>
> පාසැලෙහි සිටිය දී හෙතෙම දක්ෂයෙක් විය.
> He was clever while at school.

1.2 The -ත් of the absolute participle may change to -ද් before -දී giving යද්දී , සිටිද්දී , etc. In Literary Sinhala, these forms are alternants for -ත්දී , but they are the forms that regularly occur in Colloquial Sinhala, where දී is pronounced as දි :

> එයා නටද්දි වැටුනා.
> He fell down while dancing.

2. යම් , යමක් , යමෙක් AND CORRELATIVE CONSTRUCTIONS

2.1 The form යම්- occurs before nouns with an indefinite sense such as English 'whatever, whichever' or 'some...or other'. යමක් and යමෙක් are pronominal forms based on යම් . යමක් is inanimate with a sense 'whatever, whichever' or 'something or other', and යමෙක් is animate (masculine) with a sense 'whoever' or 'someone or other'. The case forms of යමක් and යමෙක් are as follows:

	Animate			Inanimate
Nominative		යමෙක්		යමක්
Accusative	යමකු	or	යමෙකු	
Dative	යමකුට	or	යමෙකුට	යමකට
Genitive	යමකුගේ	or	යමෙකුගේ	යමක
Instrumental	යමකුගෙන්	or	යමෙකුගෙන්	යමකින්

2.2 යම් , යමක් and යමෙක් are commonly used in correlative sentences having two clauses and the following characteristics:

1. යම්- plus a noun, or යමක් or යමෙක්, occurs in the first clause which is usually a ද or නම් clause.
2. The second clause has a corresponding pronoun referring back to the -යම් form. This pronoun will be the ඒ member of a pronominal location set. Thus:

යමෙක් එහි ගියේ නම්
යමෙක් එහි ගියේ ද } හේ ආපසු නොපැමිණියේය.
Whoever went there did not return.

මෙහි යමක් ඇත්නම්
මෙහි යමක් ඇත්ද } ඒ මාගේ නොවෙයි.
Whatever is here is not mine.

යම් ධනයක් ඔහුට අයිති වී නම්
යම් ධනයක් ඔහුට අයිති වී ද } ඒ සියල්ල නැතිවිය.
Whatever wealth he had was lost.

යම් කුමරියක් ඔහු දුටුවා නම්
යම් කුමරියක් ඔහු දුටුවා ද } ඕ ඔහු කෙරෙහි පිළිබඳ සිත් ඇතිකර ගත්තාය.
Whatever princess saw him fell in love with him.

3. ALTERNATE PAST TENSE OF CLASS 3 VERBS

There is another alternant to the third person singular of Class 3 verbs, formed by replacing the final -ඉ of alternant 2 (11,14) by -අ .

Past Tense	Alternate 1	Alternate 2	Alternate 3
වැටුණේය	වැටුණි	වැටිණි	වැටිණ
කෙරුණේය	කෙරුණි	කෙරිණි	කෙරිණ
වුණේය	වුණි	විණි	විණ

4. VERBAL ADJECTIVES තිබූ, තුබූ, ගත්, දුන්, දත්, පත්, ලද් AND උපන්

Some irregular verbs have short forms of their past tense verbal adjectives (7,3) as follows:

Verb		Past Tense Verbal Adjective
තිබෙනවා	be, have	තිබූ , තුබූ
ගන්නවා	get, take	ගත්
දෙනවා	give	දුන්
දන්නවා	know	දත්
පැමිණෙනවා	reach, arrive	පත්
ලබනවා	get, receive	ලද්
උපදිනවා	be born	උපන්

Note that පත් is generally used in the sense of 'to arrive at a state', with the state in the dative. Thus:

> මහළු වයසට පත් කුමරු .....
> The prince who became old...

5. වෙත AND කරා

5.1 වෙත and කරා (9,17) are post-positions which themselves inflect for case. The case-forms are as follows:

Direct	වෙත	කරා
Dative	වෙතට	(no form)
Genitive	වෙතැ	කෙරේ, කෙරෙහි
Instrumental	වෙතින්	කෙරෙන්

5.2 In the direct, වෙත and කරා both have the sense of 'towards'. වෙත , in the dative case, has the same sense, but with a bit more emphasis.

> ප්‍රසිද්ධ ගුරුවරයකු වෙත or වෙතට or කරා ගොස් ශිල්ප ඉගෙනගත්තේය.
> He went to a reputed teacher and learned the arts.

5.3 In addition, වෙත is used in the sense of 'in, on, with, with reference to' or 'in regard to'.

> ඔහු වෙත යහපත් ගුණ ඇත.
> He has good qualities (in him).

ඔහු වෙත මුදල් තබා.....
Having kept the money with him...

Note that in many, but not all, of the uses described here and in 5.2, වෙත and වෙතට are equivalents for Colloquial ළඟ and ළඟට, as stated in (9,17). This is generally so where proximity or possession are involved.

5.4 The genitive form of වෙත, i.e. වෙතැ, has the same uses as the direct. Thus:

ප්‍රසිද්ධ ගුරුවරයකු වෙතැ ගොස්.....
Having gone to a reputed teacher...

ඔහු වෙතැ යහපත් ගුණ ඇත.
He has good qualities in him.

5.5 The genitive case-forms of කරා, i.e. කෙරේ and කෙරෙහි, are used in the sense of 'with (reference to)' or 'in regard to'.

ගුරුවරයා ශිෂ්‍යයා කෙරේ (or කෙරෙහි) පැහැදුණේය.
The teacher was pleased with the student.

5.6 In the instrumental both postpositions have the sense 'from':

ගුරුන් වෙතින් ශිල්ප උගෙන.....
Having learned the arts from the teachers...

ගිහි සැප කෙරෙන් වෙන්ව....
Being detached from the comforts of household life...

There may be a slight difference in meaning such that වෙතින් relates more to the personal and internal, and කෙරෙන් to the physical and external, as the examples show, but some current writers do not observe this distinction between වෙතින් and කෙරෙන් and use them interchangeably.

6. විරූ

When විරූ is added to the negative past verbal adjective, usually of a verb of experience, it adds the sense that the experience is new, unique or surprising much like English phrases such as 'hitherto unseen' or 'such as has never been heard before'.

නොඇසූ විරූ දෙයක් ඇසීමු.
We heard something not heard before.

(විරූ may also be added to the positive past verbal adjective. The sense is then that the experience is a familiar or not uncommon one, but this usage is far less common than that with the negative past verbal adjective.)

7. HONORIFIC PLURAL

Commonly in Literary Sinhala the plural may be used to refer to a single person to indicate great respect. Thus:

සේනක පණ්ඩිතයෝ මෙසේ කීහ.
Pandit Senaka said thus.

එකුමරු ශ්‍රමණයන් දැක සතුටුවිය.
That prince became happy on seeing the recluse.

Note that this explains why even Colloquial forms like හාමුදුරුවො 'Buddhist monk' take plural case forms.

8. සිතැති

There are many adjective phrases of the shape noun plus ඇති, indicating that the following noun has the characteristic referred to by the noun before ඇති. Thus:

සිත ඇති	having the intention/desire
ගුණ ඇති	having virtues, i.e. virtuous
නුවණ ඇති	having intelligence

Very commonly if the noun preceding ඇති ends in a short vowel that vowel is dropped and the two words are combined. Thus:

සිත ඇති ---> සිතැති

ගුණ ඇති ---> ගුණැති

නුවණ ඇති ---> නුවණැති etc.

නුවණැති අය මෙබඳු වැඩ නොකරති.
Intelligent people do not do work of this type.

The particular phrase සිතැති in addition to its literal sense 'with a mind' also has the idiomatic sense 'well disposed to, having someone's interest at heart' like that of Colloquial හිතවත් (C.S. 25,12).

ශිෂ්‍යයන්ට සිතැති ගුරුවරයෙක්....
A teacher well disposed towards students

9. ද 'FURTHERMORE'

ද 'also' instead of connecting two or more things (1,10), is sometimes used simply as an indication that the discourse is being continued, roughly like English 'furthermore' or 'moreover'.

රජතුමාද කුමරුට සියළු සැප සම්පත් ලබාදුන්නේය.
Furthermore, the king provided the prince with all the comforts and luxuries.

10. කල 'WHEN'

කල like විට (9,12) and කල්හි (10,17) may be used either with the past or present verbal adjectives to form 'when' clauses.

නයා දුටු කල බමුණා බිය විය.
The Brahmin got scared when he saw the cobra.

බණ අසන කල උපාසක අය කථා නොකරති.
The devotees do not talk (i.e. gossip) when listening to sermons.

11. දැන

In Colloquial Sinhala දැන, the perfect participle of දන්නවා usually does not occur alone, but only in the form දැනගෙන. In Literary Sinhala, however, දැන is used alone just like any other past participle.

තම පුතා ගිහිගෙන් නික්ම ගිය බව දැන රජතුමා දුක් වුයේය.
The king, knowing that his son had renounced the household life, became sad.

12. HAVE TO, HAPPEN TO

As in Colloquial Sinhala (C.S. 29,4) the infinitive form of the verb plus වෙනවා, with the subject in the dative case, can be used in the sense of 'have to, happen to'. This usage of වෙනවා is a less frequent alternant for the similar use of සිදුවෙනවා (7,11). It can be in any tense according to the context.

In the past the shortened forms of වෙනවා, that is විය or විනි (විණි), are more common than the වුවි-/ වුය්-(වුන්-) forms in this construction.

ඔහුට එය කරන්නට වෙයි.
He has to (or will have to) do that.

ඔහුට එය කරන්නට විය.
He had to do that.

විජය විසින් කුවේණිය පළවා හරින ලදින් ඇයට තම නෑයන් වෙතට යන්නට විනි.
As Kuveni was abandoned by Vijaya, she had to go to her relatives.

13. සුළු

When සුළු (or සුලු) follows a present tense verbal adjective, it adds the sense 'characterized by' or 'of the nature of'. That is, the noun that follows is of such a nature that it does what the verb indicates.

> හෙතෙම සිත් කලකිරවන සුළු දෙයක් දුටුවේය.
> He saw something that depressed the mind (i.e. a mind-depressing thing).

14. කවරේ AND කවරෙක්

කවරෙක් is the indefinite animate form of the interrogative කවරේ (7,12).

කවරෙක් is an equivalent of Colloquial කවු or කවුරු (C.S. 27,3) AND refers only to humans.

කවරේ can refer either to inanimates or humans and is thus an equivalent of either කවුරු or මොකක් / මොනවා.

> මේ පොත් කවරේ ද?
> What are these books?

> කුමරු උයනට යන අතර මහලු මිනිසකු දැක 'ඒ කවරේ දැ'යි රියැදුරාගෙන් ඇසීය.
> The prince, on the way to the park, saw an old man and asked the charioteer who that was.

15. පෙරළා AND ආපසු

Both පෙරළා and ආපසු are used with verbs of motion such as යනවා , එනවා or පැමිණෙනවා , to express the sense of returning to a place. The place is in the dative and is commonly inserted between පෙරළා or ආපසු and the verb of motion.

> රජතුමා පෙරළා (or ආපසු) මාලිගයට පැමිණියේය.
> The king returned to the palace.

> ඇමතිවරයා පෙරළා (or ආපසු) තම රටට පැමිණියේය.
> The minister returned to his (own) country.

16. සිය AND ස්වකීය

The adjectival forms සිය or ස්වකීය like තම (6,8) express the sense of 'one's own'.

> කුමාරයා සිය (or ස්වකීය) රථාචාර්යයාගෙන් මෙසේ ඇසීය.
> The prince asked his (own) charioteer thus.

17. පවා 'EVEN'

පවා , 'even', may follow a noun in any case-form as required by the syntax:

> සුනිල් ක්‍රීඩාකිරීමට පවා අකමැතිය.
> Sunil does not even like to play.
>
> අද සුනිල් පවා ක්‍රීඩා කරයි.
> Even Sunil plays today.

18. පාසා

පාසා follows an inanimate noun in the direct indefinite to form phrases with distributional senses such as 'from (one) to the (other)' or 'in every (one), to every (one), from every (one)', etc. The noun preceding පාසා may be doubled to emphasize the distributional sense:

> ගමක් පාසා යමින් or ගමක් ගමක් පාසා යමින්
> going from village to village
>
> මලක් පාසා or මලක් මලක් පාසා
> in every flower, from flower to flower, etc.

The Colloquial equivalent of පාසා is ගානෙ (C.S. 25,10).

SUPPLEMENTARY READINGS

1. මහාත්මාගාන්ධිතුමා

වයඹදිග ඉන්දියාවෙහි, පෝර්බන්දර් නම් පෙදෙසෙහි, වර්ෂ 1869යේ ඔක්තෝබර් මස 2වැනි දින ගාන්ධිතුමා උපත ලැබිය. එවක පෝර්බන්දර් ප්‍රාදේශීය රාජ්‍යයක් වූයේය. එහි අගමැතිධුරය දැරූ කරම්චන්ද් ගාන්ධිතුමා මොහුගේ පියා විය. පුට්ලිබායි මොහුගේ මව වූවාය. මොහුට සහෝදරියක්ද, සහෝදරයෝ දෙදෙනෙක්ද වූහ. ගාන්ධි, පවුලේ බාලයා විය. ඔහුට මෝහන්දාස් කරම්චන්ද් ගාන්ධි යන නම දෙන ලදි.

ගාන්ධිගේ මව සිය ආගම වූ හින්දු ආගම කෙරෙහි තද භක්තියක් දැක්වූවාය. දේවාලයට යනවිට කුඩා ගාන්ධිද කැටුව යෑමට ඕ තොමෝ කිසි දිනක අමතක නොකළාය. දිනපතා යාච්ඤා කිරීමටත් සෑම ආගමික ව්‍රතයක්ම මැනවින් රැකීමටත් ඕ තොමෝ පුරුදුව සිටියාය. ඇත්ත කීමෙහිත්, තමා භාරගත් කටයුතු නිසිලෙස ඉටුකිරීමෙහිත් ඇති අගය ඕ තොමෝ කුඩාවියේදීම ගාන්ධිට කියාදුන්නාය. තම මවගේ මෙම ආදර්ශමත් ගතිපැවතුම් කුඩාවියේ සිටි ගාන්ධි කෙරෙහි බෙහෙවින් බලපෑවේය.

මොහු සිය මූලික අධ්‍යාපනය ලැබුවේ පෝර්බන්දර්හි වූ පාසැලේදීය. පසුව හේ රාජ්කෝට්හි ප්‍රාථමිකපාසැලට ඇතුළු වී සිය ඉගෙනීම කරගෙන ගියේය. ඉන් පසුව රාජ්කෝට්හි උසස් විද්‍යාපීඨයටද ඇතුළත්ව අධ්‍යාපනය ලැබුවේය. ශිෂ්‍යයකු වශයෙන් කුඩා ගාන්ධි එතරම් දක්ෂයෙක් නොවිය. රේඛාගණිතය සහ ඉංග්‍රීසි භාෂාව කෙරෙහි හේ තරමක ඇල්මක් දැක්විය.

එවක හින්දුන් අතර පැවති සිරිතකි ළදරු-විවාහය. මෙම සිරිතට අනුව අටහැවිරිදි වූ ගාන්ධිත් පෝර්බඳර්හි වෙළඳ ව්‍යාපාරියකුගේ දියණියක වූ කස්තූර්බායි දැරියත් අතර විවාහ ගිවිස්වාගන්නා ලදි. මේ අනුව, දහතුන් හැවිරිදි වූ විට ගාන්ධිට විවාහ ජීවිතයට ඇතුළත්වීමට සිදුවිය. විවාහය නිසා ඔහුගේ ඉගෙනීමට බාධා පැමිණුනද, විවාහයෙන් අවුරුද්දකට පසු ගාන්ධිට සිහිති පුතකුගේ පියකුවීමේ වාසනාව ලැබිණ. දහනව හැවිරිදි වියේදී ගාන්ධි දරුවන් පස් දෙනකුගේ පියෙක් විය.

ගාන්ධි බාලවියේ සිටියදීම ඔහුගේ පියා මියගියේය. කුඩාකලදී ලද මෙවැනි අත්දැකීම්වලින් හේ බොහෝ දේ ඉගෙනගත්තේය. හේ යම් දැනුමක් පොතපතින් ලබාගත්තේද ඊට වඩා වැඩි දැනුමක් සමාජය ඇසුරින් ලැබුවේය. ගාන්ධි පවුලට බෙහෙවින් හිතවත් වූ මුස්ලිම්, පාර්සි, ජෛන ආදි විවිධ පුද්ගලයෝ වූහ. නිතර දෙවේලේ ආගිය මොවුන්ගෙන් ජීවිතය හා සමාජය පිළිබඳව බොහෝ දේ ගාන්ධි ඉගෙනගත්තේය.

ගාන්ධිගේ බාල වියේදීම ඔහුගේ පියා මියයෑම නිසා, ගාන්ධිගේ අනාගතය පිළිබඳ කටයුතු සැලැස්වීමට ඔහුගේ නෑයන්ට සිදුවිය. ගාන්ධි අනාගතයේදී පෝර්බන්දර්හි අගමැතිවරයා වනු දැකීමට ඔවුහු කැමති වූහ. මේ සඳහා ඔහු නීතිය හැදෑරිය යුතු යැයි ඔවුහු

තීරණය කළහ. පුද්ගලික වශයෙන් ගාන්ධි වෛද්‍යවරයකුවීමට සිතැතිවුවද, ඔහුගේ නෑදෑයින්ගේ තීරණය අනුව නීතිය හැදෑරීමට හේ එකඟ විය. නීතිය හැදෑරීම සඳහා ඔහුට එංගලන්තයට යන්නට විය. නීතිය හදාරමින් හෙතෙම එංගලන්තයෙහි වර්ෂ 2½ක් ගතකෙළේය. මෙම කාලය ඔහුගේ ජීවිතයෙහි වැදගත් අවස්ථාවක් වූයේය. සමාජය සහ සංස්කෘතිය ආදී වශයෙන් අලුත්ම පරිසරයක සිටි මෙම කාලයතුලදී ගාන්ධිගේ චින්තනය අළුත් මුහුණුවරක් ගත්තේය. ඉංග්‍රීසි සමාජය ඇසුරෙන් ලද නව අත්දැකීම් නිසා ඔහුට තම මව්බිම වන භාරතය අළුත් දෘෂ්ටිකෝණයකින් බැලිය හැකි විය. සංස්කෘත භාෂාවද හෙතෙම හැකිපමණ ඉගෙනගන්නට වූයේය. සංස්කෘත පොත්පත් කියවත් කියවත්, පැරණි භාරතයෙහි වූ ශ්‍රීවිභූතියත්, එවකවන විට විදේශ ආධිපත්‍යය නිසා ඉන්දියාව ඛේදජනක තත්වයකට පත් වී තිබූ ආකාරයත් මැනවින් ඔහුට වැටහෙන්නට විය. විදේශ ආධිපත්‍යයෙන් ඉන්දියාව මුදාගැනීමේ චේතනාව ඔහු තුල මෝරන්නට වූයේය. 1891දී නීතිඥ විභාගයෙන්ද සමත් වී මොහු පෙරළා ඉන්දියාවට පැමිණියේය.

සියරටට පැමිණි ඔහුට ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකුවශයෙන් සේවය කිරීමට බොම්බායට යන්නට සිදුවිය. වැඩිකල් නොගොස් දක්ෂ නීතිඥයකු ලෙස හෙතෙම ප්‍රසිද්ධ වූයේය. අවුරුදු දෙකක් පමණ කාලයක් ඇතුළත හෙතෙම එම උසාවියෙහි ඉතාමත් දක්ෂ නීතිඥයා විය.

නීති සමාගමක් මගින් කරන ලද ආරාධනයක් අනුව, 1893නේ අප්‍රියෙල් මාසයේදී මොහුට දකුණු අප්‍රිකාවට යන්නට සිදුවිය. ඔහුට දකුණු අප්‍රිකාවට ආරාධනා කරන ලද්දේ ඉන්දියානු ජාතික වෙළඳ ව්‍යාපාරිකයකුගේ නඩුවකට පෙනීසිටීම සඳහා ය. දකුණු අප්‍රිකාවෙහි ඔහු ගතකළ කාලය ඉතාමත් වැදගත් එකක් වූයේය. දකුණු අප්‍රිකාවෙහි වූ ඉන්දියානු ජාතිකයින්ට එහි වූ සුදු ජාතිකයන්ගෙන් ලැබුණු තාඩනපීඩන හේ එහිදී සියැසින් දුටුවේය. සුදුජාතිකයින්ගේ මෙම තාඩනපීඩනවලට ලක් වූ අය ඉන්දියානු ජාතිකයෝ පමණක් නොවූහ. කළුජාතිකයෝ සියල්ලම පාහේ මෙම කරදරවලට ලක්වූහ. ඉන්දියානු ජාතිකයකු වූ ගාන්ධිටද එහිදී නොයෙක් වර මෙබඳු කරදරවලට මුහුණපෑමට සිදුවිය. සුදුජාතිකයින්ට විශේෂ වරප්‍රසාද ලබාදීමද, කළුජාතිකයින්ට යටත්පිරිසෙයින් ඔවුන්ගේ මානව අයිතිවාසිකම් හෝ ලබා නොදීමද ගාන්ධිගේ සිත බෙහෙවින් කලකිරවන්නක් විය. වර්ණභේදය මත මිනිසා, මිනිසාට කරන මෙබඳු කෲරකම් හේ ප්‍රසිද්ධියේම හෙළා දැක්කේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝවිට හෙතෙම සුදුජාතිකයන්ගේ තර්ජනවලට පමණක් නොව ගුටිබැටවලටද ලක්විය. නොයෙක් වර ඔහුට සිරදඬුවම් විඳීමට සිදුවිය. එහෙත් ඒවායින් හෙතෙම කම්පා නොවිය. අයුක්තිය දුටු කල්හි ඒ ගැන ප්‍රශ්න කිරීමෙන් මොහු වැළැක්වීමට කිසිවකුට හැකි නොවිය.

දකුණු අප්‍රිකාවේදී මිනිසුන් වශයෙන් බලයක් හෝ අයිතිවාසිකමක් නොතිබූ ඉන්දියානු ජාතිකයන් වෙනුවෙන් 1894දී සටන් ඇරඹූ ගාන්ධි, වැඩිකල් නොගොස්, එහි වූ ඉන්දියානු ජාතිකයන්ගේ නායකයා බවට පත්විය. මෙලෙස මහජන සේවය ඇරඹූ මෙතුමා සිය නීතිඥ වෘත්තියද අත්හැරියේය. නිදහස පිළිබඳව තම අදහස් මෙතුමා ප්‍රසිද්ධ දේශනවලින් හැරුණුවිට පුවත්පතින් සහ තමා ලිවූ පොතපතින්ද ප්‍රකාශයට පත්කෙළේය. ඉන්දියානු ජාතිකයන්ගේ අයිතිවාසිකම් ඉල්ලීම සඳහා මෙතුමා විසින් ආරම්භ කරන ලද "ඉන්දියානුමතය" (Indian Opinion) නම් පුවත්පත මෙහිලා සඳහන් කළ හැක. මෙම පුවත්පත ඉංග්‍රීසියෙන් හැරුණුවිට හින්දි, ගුජරාති, සහ දෙමළ යන ඉන්දීය භාෂාතුනෙන්ද මුද්‍රණය කරන ලදී. ඉන්දීය ජනතාවගේ සිත් නිදහස කෙරෙහි යොමුකරවමින්, මෙතුමා විසින් ලියන ලද 'හින්ද් ස්වරාජ්' (Indian Home Rule)

යන නුවා පොතද විශේෂයෙන් සැලකිය යුතුය. අවිහිංසා ධර්මය හා ස්වරාජ්‍යය ගැන කරන ලද විවරණයක් එහි වෙයි. නිදහස ලබාගැනීම සඳහා ක්‍රියාත්මක කළ යුත්තේ ආයුධ-සටනක් නොව අවිහිංසා සටනක් බව එතුමා ඉන්දියානු ජාතිකයින්ට ඒත්තුගැන්වූයේය.

ඉන්දියානු ජාතිකයින්ගේ අයිතිවාසිකම් ලබාගැනීම සඳහා එතුමා අනුගමනය කළේ අවිහිංසාවත්, සහයෝගතාවර්ජනයත් සත්‍යග්‍රහයත් ය. එය එතුමාගේ දේශපාලන ධර්මය විය. මෙම ව්‍යාපාරය 1904රේ සිට එතුමා ක්‍රියාත්මක කෙළේය.

වර්ෂ 1906දී බ්‍රිතාන්‍යරජය අප්‍රිකාවේ විසූ ආසියාතික ජාතිකයින්ට ඉතා කරදර ඇතිවන අයුරු නීතිසංග්‍රහයක් සකස් කළාය. මෙම නීතිසංග්‍රහය හෙළාදැකීමට "ජොහැන්නස්බර්ග්" (Johannesberg) නුවරදී ගාන්ධිතුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පවත්වන ලදී. මෙම රැස්වීමට සහයෝගය දැක්වීම පිණිස අප්‍රිකාවේ විසූ ඉන්දියානුජාතිකයන් පමණක් නොව චීන ආදී අනෙක් ආසියානු ජාතිකයෝද රැස්වූහ. රැස්වීම අවසානයේදී ගාන්ධිතුමා ඇතුළු ආසියානුජාතිකයින් විශාල සංඛ්‍යාවක් බන්ධනාගාර ගතකරන ලද ද, ගාන්ධිතුමා විසින් කරන ලද මෙබඳු උද්ඝෝෂණවල ප්‍රතිඵලයක් වශයෙන් 1909දී එම නීති සංග්‍රහය අහෝසිකරන ලදී. මෙය ගාන්ධිතුමා ලත් ප්‍රථම දේශපාලන ජයග්‍රහණය ලෙස සඳහන් කළ හැක.

බ්‍රිතාන්‍ය ආණ්ඩුව කරදරවලට මුහුණ පැවහොත් එවැනි අවස්ථාවලදී තමාගේ වර්ජනව්‍යාපාර නවත්වන සිරිතද, ආණ්ඩුවට උපකාරකිරීමේ පුරුද්ද ද එතුමා වෙත රැඳී තිබුනි. 1906දී දකුණු අප්‍රිකාවේ නේටල්හි (Natal) වැසියන් රජයට විරුද්ධව කැරලි ගැසූ විට මෙතුමා තමන්ගේ ඉන්දියන් ගිලන්රථ කණ්ඩායම රජයේ සහාය පිණිස යෙදිය. ඔවුන්ගේ එම උපකාරය ලැබූ බ්‍රිතාන්‍ය රජය ප්‍රසිද්ධියේම ගාන්ධිතුමාට ප්‍රශංසා කළාය. සතුරාගේ දුර්වල අවස්ථාව බලා ඔහුට පහරදී සිය අරමුණු ඉටුකරගැනීමේ ගතියක් එතුමා වෙත නොතිබුනි.

දකුණු අප්‍රිකාවේදී මෙතුමා නැවත නැවත සිරදඬුවම් විඳිමින්, 1914 වනතෙක්ම ඉන්දීය ජාතිකයන්ගේ සාධාරණ අයිතිවාසිකම් ලබාදීමේ සටනක යෙදී සිටියේය. දකුණු අප්‍රිකාවේ පුරා අවුරුදු 21ක් වාසයකරමින් ගෙනගිය සටනේ ප්‍රතිඵලයක් වශයෙන් 1914 වනවිට දකුණු අප්‍රිකාවේ විසූ ඉන්දියානු ජාතිකයන්ට, සෙසු ජාතිකයන්ට සමාන නිදහසක් ලබාදීමට මෙතුමා සමත්වූයේය.

ගාන්ධිතුමාගේ "හින්ද්-ස්වරාජ්" (Indian Home Rule) නම් පොත ලියවීමෙන් පසු ඉන්දියාවේ මහත් ජාතික ප්‍රබෝධයක් ඇතිවිය. "ඉන්දියාවට පැමිණ ඉංග්‍රීසීන්ට විරුද්ධව අවිහිංසා සටන් ආරම්භ කළ මැනවැ"යි ඉන්දියාවෙහි නායකයෝ එතුමාගෙන් ඉල්ලා සිටියහ. දකුණු අප්‍රිකාවෙහි කළ වැඩකටයුතු අවසන්කර මෙතුමා 1915දී සියරටට පැමිණියේ ඉන්දියාව විදේශ ආධිපත්‍යයෙන් මුදාගැනීමේ ස්ථිර අදහස ඇතිවය.

ගාන්ධිතුමා සියරටට පැමිණීමෙන් පසු. එවක දුර්වලව පැවති කොන්ග්‍රෙස් පක්ෂයට (Congress Party) තම සහයෝගය ලබාදී එය ප්‍රබල පක්ෂයක් බවට පත්කෙළේය. ක්‍රමයෙන් එතුමා භාරතයේ විමුක්ති සටනේ පුරෝගාමියා විය. සිය රටේ නිදහස ලබාගැනීම සඳහාද එතුමා ගෙනගිය සටන, සහයෝගතාවර්ජනය, අවිහිංසා-ධර්මය සහ සත්‍යග්‍රහව්‍යාපාරය මත පදනම් විය.

මානව-යුක්තිය සඳහා මෙතුමා ගෙනගිය සටන් නිසාත්, ජනසමාජයට මෙතුමාගෙන් සිදුවූ උදාර සේවය නිසාත් මෙතුමා "මහාත්මා ගාන්ධි" යනුවෙන් හැඳින්වෙන්නට විය.

ඉන්දීය ජනතාවගේ එක්සත් බවට බාධකව පැවති කුලභේදය සහ හින්දු-මුස්ලිම්

භේදය නැතිකර දැමීමට එතුමා හැකි සෑම පියවරක්ම ගත්තේය. ඉන්දියාවට සම්පූර්ණ ස්වතන්ත්‍රභාවය ලැබෙනතුරු, බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් වරින්වර ඉදිරිපත්කරන ලද සෑම ආණ්ඩුක්‍රම පනතකටම එතුමා විරෝධය ප්‍රකාශ කෙළේය. බ්‍රිතාන්‍ය ආණ්ඩුවට විරුද්ධව එතුමා ගෙනගිය ව්‍යාපාර නිසා නොයෙක් වර එතුමාට සිරදඬුවම් විඳින්නට සිදුවූයේය. එහෙත් එතුමාගේ සටන නැවතුනේ නැත. මෙතුමා බ්‍රිතාන්‍ය ආණ්ඩුවට විරුද්ධව ගෙනගිය ව්‍යාපාරවල ප්‍රතිඵලයක් වශයෙන්, සෑහෙන කාලසීමාවකින් පසුව වුවද ඉන්දියාවට ස්වතන්ත්‍රභාවය දීමට බ්‍රිතාන්‍ය ආණ්ඩුවට සිදුවිය. 1947ගේ අගෝස්තු මස 14වෙනි දින නීතිගතකරන ලද ඉන්දියා - ස්වාධීනතා පනත (Indian Independence Act) අනුව, ඉන්දියාව නිදහස් රටක් බවට පත්විය.

එහෙත් මහාත්මාගාන්ධිතුමා බලාපොරොත්තු වූ පරිදි එක්සත් - ඉන්දියාවක් ඇතිවූයේ නැත. ඊට හේතුව ඉන්දියාව සහ පකිස්තානය යනුවෙන් රාජ්‍ය දෙකක් බිහිවීමයි. හින්දු-මුස්ලිම් භේදය උග්‍රවීමට මෙය තුඩුදෙන්නක් විය. රටෙහි නොයෙක් ප්‍රදේශවල හින්දු-මුස්ලිම් ගැටුම් ඇතිවූයේය. මේවා මැඩපැවැත්වීමට මහාත්මාගාන්ධිතුමා හැකිපමණ ඉදිරිපත්වූයේය. ඉන්දියාව සහ පකිස්තානය යනුවෙන් රාජ්‍ය දෙකකට කැඩීමට පෙර ලැබී තිබුණු ආධාර මුදල්වලින් (assets) පකිස්තාන් රාජ්‍යයට දියයුතු කොටස වූ රුපියල් දශලක්ෂ 550ක මුදලක් ඉන්දියානු ආණ්ඩුව රඳවාගෙන තිබිණි. මෙම මුදල පකිස්තාන් රජයට දියයුතු යැයි මහාත්මාගාන්ධිතුමා පැවසීය. එතුමාගේ ඉල්ලීම අනුව එම මුදල පකිස්තාන් රජයට භාරදෙන ලදි. මහාත්මා ගාන්ධිතුමාගේ මෙම සාධාරණ ප්‍රතිපත්ති වටහාගැනීමට නොහැකි වූ ඇතැම් අන්තවාදීහු එතුමාට විරුද්ධව කුමන්ත්‍රණය කළහ. මහාත්මාගාන්ධිතුමා මුස්ලිම්-පාක්ෂිකයකු යැයි ඔවුහු සිතූහ. මිනිසා විසින් මිනිසාට කරනුලබන කෲරකම් වළක්වා මානව-විමුක්තිය ලබාදීම සඳහා තම ජීවිතයේ සෑම මොහොතක්ම කැපකළ මෙතුමා, 1948 ජනවාරි 30වැනිදා අන්තවාදියකුගේ වෙඩිපහරින් මිය ගියේය.

එහෙත් එතුමා සාමකාමී ලෝකයාගේ හදවත් තුළ සදාකල්හි ජීවත් වනු ඇත.

2. අනගාරික ධර්මපාලතුමා

ලක්දිව බුද්ධාගම පුනරුත්ථාපනය කොට එය ඉන්දියාව ආදි ලෝකයේ අනෙක් රටවල ප්‍රචාරය කිරීමටත්, සිංහලජාතිය නගා සිටුවීමටත් විශේෂ පරිශ්‍රමයක් දැරූ උතුමකු වශයෙන් අනගාරික ධර්මපාලතුමා හැදින්විය හැක.

මෙතුමා උපන්නේ ක්‍රි.ව. 1864රේ සැප්තැම්බර් මස 17වැනිදාය. මේ කාලය වන විට ලංකාව විදේශ ආධිපත්‍යයට යටත්ව තිබුණි. ජාතික, ආගමික, ආර්ථික ආදි වශයෙන් සිංහලයෝ බෙහෙවින් පිරිහී සිටියහ. මෙතුමා මුලදී "දොන් ඩේවිඩ් හේවාවිතාරණ" යන නමින් හැඳින්විණි. බෞද්ධ පාසැල් නොතිබුණු එවැනි සමයක, ක්‍රිස්තියානි පාසැල් කිපයක අධ්‍යාපනය ලැබීමට මෙතුමාට සිදුවිය. එයින් පසු කොළඹ විද්‍යෝදය පිරිවෙණෙහි අධිපති වූ හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගල ස්වාමීන්වහන්සේ වෙතින් එතුමා බුද්ධධර්මය, පාලි සහ සිංහල හැදෑරිය.

මේ අවධියේදී ඇමරිකානු ජාතික කර්නල් එච්. එස්. ඕල්කට් තුමා ලංකාවට පැමිණීම, හේවාවිතාරණ තරුණයාගේ ජීවිතයේ පෙරළියක් ඇතිකිරීමට පොහොසත් වූ බව පෙනේ. බුද්ධාගම පිළිබඳ වැදගත් පොත්පත්කියවීමෙන් පසු බෞද්ධයකු වූ ඕල්කට්තුමා ලංකාවට පැමිණියේ ලංකාවෙහි බුද්ධාගම නගාසිටුවීමේ පරමාර්ථයෙනි. එතුමා මෙහි පැමිණ, එවක ලංකාවේ සිටි බෞද්ධනායකයන්ගේද සහාය ඇතිව 1891දී ලංකාවේ නොයෙක් ස්ථානවල බෞද්ධ සමිතිසමාගම් සහ පාසැල් ආදිය පිහිටුවිය. මෙතුමා විසින් පිහිටුවන ලද, කොළඹ පරමවිඥානාර්ථ බෞද්ධ සමාගම (Buddhist Theosophical Society) මෙහිලා විශේෂයෙන් සැලකිය යුතුය. අමතක වී ගිය බෞද්ධ **සංස්කෘතියත්**, සභ්‍යත්වයත් ජනතාවට මතක්කරදීමෙහි නිරතවෙමින්, මෙතුමා බෞද්ධ පුනරුත්ථානයට පදනම දැමුවේය. මෙම අවධියේ හේවාවිතාරණ තරුණයාගේ අවධානය ඕල්කට් තුමාගේ සමාජ, ආගමික කටයුතු කෙරෙහි යොමුවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහුට පරමවිඥානාර්ථ සමාගමේ කාරකසභාවට ඇතුළත්වීමට ඉඩ ලැබුණි. මෙහි කටයුතුකරමින් සිටියදීම හෙතෙම ලිපිකරුවකු වශයෙන් රජයේ සේවයට බැඳුණ නමුත්, ඉතා සුළුකලකින් ඉන් අස් විය. ඉන්පසු හෙතෙම ජාතියත්, ආගමත් නගා සිටුවීම සඳහා ආත්මපරිත්‍යාගයෙන් කටයුතු කිරීමෙහි නිරත විය. ඕල්කට්තුමා බුද්ධාගම පිළිබඳව ඉංග්‍රීසියෙන් දේශන පවත්වමින් දිවයිනෙහි පළාතක් පළාතක් පාසා යද්දී, එම ඉංග්‍රීසි කථා සිංහලට පරිවර්තනය කරමින් දේශනා කළේ තරුණ හේවාවිතාරණ මහතා ය. ඒ අතර තමන් විසින්ද බුද්ධධර්මය පිළිබඳ දේශනාකිරීමට හෙතෙම අමතක නොකළේය.

වර්ෂ 1884දී ප්‍රථමවරට විදේශරටකට යෑමේ අවස්ථාව මෙතුමාට ලැබුණේය. එතුමා ගියේ ඉන්දියාවට ය. එම ගමනෙනුත්, එහිදී අසන්නට, දකින්නට සහ කියවන්නට ලැබුණු නොයෙක් තොරතුරුවලිනුත්, මොහුගේ සිත අධ්‍යාත්මය කෙරෙහි යොමුවිය. ගිහිජීවිතයෙන් ඈත්ව,

බ්‍රහ්මචාරිවරයකු වශයෙන් තම ජීවිත කාලය මුළුමනින්ම සමාජසේවය සඳහා යොදවන්නට අවසර දෙන මෙන් ඉල්ලා මාපියන් වෙත මෙතුමා ලිපියක් යැවිය. අවසරයද, ආශීර්වාදයද එකවිට ලැබිණ. ගිහියකු වශයෙන් සැප විඳින්නට ඉඩ තිබියදී, බුද්ධශාසනය සහ සිංහල ජාතිය නගාසිටුවීම වෙනුවෙන් ඒ සියළුසැපසම්පත් අත්හැර මෙතෙමේ 1885දී බ්‍රහ්මචාරී-ජීවිතයට ඇතුළත් විය. එතැන් පටන් එතුමා තමා හැඳින්වීමට "දේවාවිතාරණ" යන නාමය අත්හැර "ධම්මපාල" යන නම භාවිතා කෙළේය. ගිහිජීවිතයෙන් ඈත්වී ජාතිය සහ ශාසනය වෙනුවෙන් සේවය කිරීමට එතුමා කැප වූ නිසා "අනගාරික ධම්මපාල" යනුවෙන් මහජනයා විසින් එතුමා හඳුන්වන ලද්දේය.

ජාතිය දියුණු නොවූ කල ආගම දියුණු කළ නොහැකිබව වටහාගත් එතුමා ස්වකීය ජනතාව නගාසිටුවීමේ කටයුතු ආරම්භ කළේය. දේශීය ඇඳුම් පැළඳුම්, සිරිත්විරිත් ආදියෙහි අගය එතුමා තහවුරු කෙළේය. විදේශීය නම්, ආගම්, ඇඳුම් පැළඳුම් සහ සිරිත්විරිත්වලට වහල් වූ සිංහලයෝ එතුමාගේ විවේචනයට සහ උපහාසයට ලක්වූහ. ලක්වැසියන්ගේ මෙවැනි දුර්වලකම් විවේචනයට ලක්කරමින්, ජාතිය නිදහස් කරගැනීමේ අවශ්‍යතාව එතුමා පෙන්වා දුන්නේය.

මෙම ව්‍යාපාර සඳහා එතුමා යොදාගත්තේ සිය දේශන, ධර්මපත්‍රිකා සහ සඟරාය. දිවයිනෙහි පළාතක් පාසා යමින් එතුමා තම ධර්මප්‍රචාරක කටයුතු වැඩිදියුණු කෙළේය. බුද්ධධර්මීය පිළිබඳව, සිංහලෙන් මෙන්ම ඉංග්‍රීසියෙන්ද මෙතුමා පත්‍රිකා සහ පොත් සකස් කෙළේය. බෞද්ධ අධ්‍යාපනයෙහි දියුණුව දකිනුරිසි වූ එතුමා දිවයිනෙහි පිටිසර පළාත්වල පවා බෞද්ධ පාසැල් පිහිටුවීමෙහි වෙහෙසුනේය.

තම රටේ පමණක් ධර්මප්‍රචාරය කිරීමෙන් සෑහීමකට පත්නොවූ එතුමා බුද්ධධර්මය පිටරටද ප්‍රචාරය කිරීමට බෙහෙවින් වෙහෙසුනේය. ඉන්දියාව, සියම, බුරුමය, ඇමෙරිකාව, එංගලන්තය, ජපානය, ප්‍රංශය, ඉතාලිය, ජර්මනිය ආදී රටවල් ගණනකටම ධර්මප්‍රචාරක කටයුතු සඳහා මෙතුමා ගියේය. විදේශීය රටවල් අතුරින්, විශේෂයෙන්ම එතුමා ඉන්දියාවෙහි ධර්මප්‍රචාරය සඳහා මහත් වෙහෙසක් ගත් බව පෙනේ.

විදේශවලට එතුමා ගියේ ධර්මප්‍රචාරක කටයුතු සඳහා වුවද, ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා එම රටවලින් ගතහැකි උපදෙස් ගැනීමට එතුමා අමතක නොකෙළේය. ජාතීන් අතර සබඳතාවයක් සහ සාමකාමී සහජීවනයක් ඇතිකිරීමෙහිලාද මෙතුමා බෙහෙවින් වෙහෙසුණු කෙනෙකි.

තම ජීවිතයේ අවසාන කාලය පැවිදිව ගතකිරීමට තීරණයකරගත් මෙතුමාණෝ 1931 ජුලි මස 31වැනිදින, "සිරිදෙවමිත්ත ධම්මපාල" නමින් පැවිදිජීවිතයට ඇතුළත් වූහ. පැවිදිව වයස්ගතව සිටියදී පවා මෙතුමාණෝ තම මුළු ශ්‍රමයම බෞද්ධ කටයුතු සඳහා යෙදූහ. මෙතුමාණන් පැවිදිවූයේද, පැවිදි වූ පසු විසුයේද ඉන්දියාවෙහිය. පැවිදි වී වර්ෂ 3කට පමණ පසු මෙතුමාණෝ ඉන්දියාවේ බරණැස් නුවරදී අපවත් වූහ. එතුමාණන් අපවත් වූයේ වර්ෂ 1933 අප්‍රියෙල් 29 වැනි දිනය.

බුද්ධාගමෙහි උන්නතියටත්, විශේෂයෙන්ම ලංකා ජනතාව නගාසිටුවීමටත් මෙතුමාණන්ගෙන් සිදුවූ සේවය අප්‍රමාණය.

VOCABULARY FOR SUPPLEMENTARY READINGS

READING 1

අත්දැකීම	N2 experience; pl. අත්දැකීම්
අන්තවාදියා	N5 extremist, fanatic; pl. අන්තවාදියෝ ; stem අන්තවාදි
අප්‍රිකාව	N2 Africa; no pl.; stem අප්‍රිකා
අමුතු	new, strange
අයුක්තිය	N2 injustice; pl. අයුක්ති
අරඹනවා	start, begin
අවිහිංසාව	N2 non-violence, harmlessness; no pl.; stem අවිහිංසා
අහෝසි කරනවා	abolish, nullify, invalidate
ආගිය	visited (literally come and gone)
ආදර්ශමත්	exemplary
ආරාධනය	N2 invitation; pl. ආරාධන
ආරාධනා කරනවා	invite
ආසියානු	Asian (adjective)
ඇරඹෙනවා	start, begin
ඇසුර	N2 company, association with; no pl.; stem ඇසුරු
ඉදිරිපත් වෙනවා	come forward
ඉන්දියන්	Indian (adjective)
ඉන්දියා-ස්වාධීනතා පනත	N2 Indian Independence Act; no pl.
උදාර	exalted, noble, distinguished
උපකාර කරනවා	help, assist
උපකාරය	N2 help, assistance; pl. උපකාර
උසාවිය	N2 court of law; pl. උසාවි
එක්සත්	united
ඒත්තු ගන්වනවා	make one understand, make one believe, convince
කම්පා වෙනවා	be shaken, be taken aback

කලකිරවනවා	make one dejected, make one disappointed
කළු ජාතිකයා	N5 dark-skinned person; pl. කළු ජාතිකයෝ ; stem කළු ජාතික
කැප වෙනවා	be dedicated
කැරලි ගසනවා	revolt
කැරැල්ල	N2 revolt; pl. කැරලි
කුමන්ත්‍රණය කරනවා	conspire
කුල භේදය	N2 caste division, caste disparity, casteism; pl. කුල භේද
කෲරකම	N2 cruelty; pl. කෲරකම් ; stem කෲර
ඛේදජනක	miserable, pitiable, distressing
ගතිපැවතුම්	behavior, manners, etc.; pl. only
ගතිය	N2 nature (of a person); pl. ගති
ගැටුම	N2 clash, collision; pl. ගැටුම්
ගිලන් රථය	N2 ambulance; pl. ගිලන් රථ
ගිලන්රථ කණ්ඩායම	N2 ambulance corps, ambulance group; pl. ගිලන්රථ කණ්ඩායම්
ගිවිස්වා ගන්නවා	decide, get agreed upon
ගුජරාති	Gujarati (language name)
ගුටිබැට	blows, etc.; pl. only
චීන	Chinese
චේතනාව	N2 idea, intention, thought; pl. චේතනා
ජයග්‍රහණය	N2 victory; pl. ජයග්‍රහණ ; stem ජයග්‍රහණ
ජෛන	Jain (adjective)
තාඩනපීඩන	N oppressions; pl. only
දශ ලක්ෂය	N2 ten lakhs (one million); pl. දශ ලක්ෂ
දැරිය	N5 girl; pl. දැරියෝ
දුර්වල	weak, feeble
දෘෂ්ටිකෝණය	N2 perspective, point of view, vision; pl. දෘෂ්ටිකෝණ

Lesson Fourteen

දේශනය	N2 lecture; pl. දේශන
නඩුව	N2 legal case, lawsuit; pl. නඩු
නිතර දෙවේලේ	frequently
නිසි	proper
නීති ගතකරනවා	make law (legal)
නීතිඥයා	N5 lawyer; pl. නීතිඥයෝ ; stem නීතිඥ
නීති සංග්‍රහය	N2 code of law; pl. නීති සංග්‍රහ
නීති-සමාගම	N2 law-company, law-society; pl. නීති-සමාගම්
පකිස්තානය	N2 Pakistan; no pl.; stem පකිස්තාන්
පදනම් වෙනවා	be based on
පාක්ෂිකයා	N5 one who belongs to a party, a partisan; pl. පාක්ෂිකයෝ ; stem පාක්ෂික
පාර්සි	Parsee (adjective)
පුද්ගලයා	N5 person, individual; pl. පුද්ගලයෝ ; stem පුද්ගල
පුරා	full, complete
පුරෝගාමියා	N5 leader, one in the forefront; pl. පුරෝගාමියෝ ; stem පුරෝගාමී
පෝර්බන්දර්	N2 Porbandar (place name)
ප්‍රකාශ කරනවා	make public, publish, express
ප්‍රකාශයට පත් කරනවා	bring to light, express
ප්‍රධානත්වය	N2 leadership; pl. ප්‍රධානත්ව
ප්‍රබෝධය	N2 enlightenment; no pl.
ප්‍රශංසා කරනවා	praise
ප්‍රසිද්ධියේ	publicly
ප්‍රාදේශීය	provincial
බන්ධනාගාර ගතකරනවා	imprison
බාධක වෙනවා	be an obstacle, hinder, impede
බාලයා	N5 young one, youngest; pl. බාලයෝ ; stem බාල

බිහි වෙනවා	be born, come forth
බොම්බාය	N2 Bombay (place name)
භාරතය	N2 India (place name); stem භාරත
භේදය	N2 division, difference, dissension, dispute, disparity; pl. භේද
මව්බිම	N2/3 motherland; pl. මව්බිම්
මහජනයා	N2 public ; stem මහජන
මහාත්මා ගාන්ධි	Mahatma Gandhi
මානව	human (adjective)
මැඩපවත්වනවා	bring under control, suppress
මුදාගන්නවා	free, get something released
මුද්‍රණය කරනවා	print
මුහුණපානවා	face
මෝරනවා	grow (gradually), mature
යාච්ඤා කරනවා	pray
යොමු කරවනවා	make one direct to or apply
රඳවාගෙන තියෙනවා	keep (something) for oneself, continue keeping for/with oneself
රාජ්කෝට්	Rajkot (place name)
රැඳී තියෙනවා	be lodged in, be fixed within
රැස්වීම	N2 meeting, gathering; pl. රැස්වීම්
රේඛාගණිතය	N2 geometry; no pl.
ලෝකයා	N5 people, mankind, society; no pl.
වර්ණභේදය	N2 color-bar, discrimination on the basis of color; no pl.
විද්‍යාපීඨය	N2 educational institution, seat of learning; pl. විද්‍යාපීඨ
විරෝධය	N2 objection, opposition; no pl.; stem විරෝධ
විවරණය	N2 analytic explanation, description; pl. විවරණ ; stem විවරණ and විවරණය

විවාහය	N2 marriage; pl. විවාහ
වෛද්‍යවරයා	N5 physician, doctor; pl. වෛද්‍යවරු ; stem වෛද්‍ය
ව්‍රතය	N2 religious vow; pl. ව්‍රත
ශ්‍රීවිභූතිය	N2 glory, wonder; pl. ශ්‍රීවිභූති
ශ්‍රේෂ්ඨාධිකරණය	N2 supreme court; pl. ශ්‍රේෂ්ඨාධිකරණ
සටන	N2 battle, struggle, fight, war; pl. සටන්
සත්‍යග්‍රහය	N2 Satyagraha (holding fast to truth), non-violent protest; no pl.
සදාකල්හි	ever, for ever
සහයෝගතාවර්ජනය	N2 non-co-operation; no pl.; stem සහයෝගතාවර්ජන
සහාය	N2 help, assistance; no pl.; stem සහාය
සහෝදරිය	N5 sister; pl. සහෝදරියෝ
සැලැස්වීම	N2 arrangement, making arrangements for; pl. සැලැස්වීම්
සිඟිති	tender, little (implies affection)
සියැසින්	with one's own eyes
සිරදඬුවම් විඳිනවා	suffer imprisonment
සුදු ජාතිකයා	N5 white-skinned person; pl. සුදු ජාතිකයෝ ; stem සුදු ජාතික
ස්වතන්ත්‍රභාවය	N2 freedom, self-rule, dominion status; no pl.
ස්වරාජ්‍යය	N2 self-rule, dominion; pl. ස්වරාජ්‍ය
හදවත	N2 heart; pl. හදවත්
හැවිරිදි	years old
හෙළාදකිනවා	condemn, scorn, treat with disrespect
ළදරු-විවාහය	N2 child-marriage

READING 2

අධිපතියා	N5 chief, incumbent, lord; pl. අධිපතියෝ ; stem අධිපති
අධ්‍යාත්මය	N2 supreme spirit, spiritual (aspect); no pl.
අනගාරික	Anagarika (adjective and title), not leading a household life, celibate, ascetic

අනගාරික ධර්මපාලතුමා	N5 Anagarika Dharmapala (respectful)
අපවත් වෙනවා	pass away, die (of monks)
අප්‍රමාණ	limitless, inestimable
අවසාන	last, final (adjective)
ආත්ම පරිත්‍යාගය	N2 self-dedication, self-sacrifice; no pl.
ආශිර්වාදය	N2 blessing, greeting; pl. ආශිර්වාද
ඇඳුම්පැළඳුම්	dress and ornaments, adornment; pl. only
ඇමරිකානු	American (adjective)
ඉතාලිය	N2 Italy; stem ඉතාලි
උතුමා	N5 noble person; pl. උතුමෝ ; stem උතුම්
ඒ අතර	then, at that time, meanwhile
කර්නල්. එච්. එස්. ඕල්කට් තුමා	N5 Colonel H.S. Olcott (respectful)
කාරකසභාව	N2 committee; pl. කාරකසභා
චාරිකාව	N2 trip, journey; pl. චාරිකා
ජපානය	N2 Japan; stem ජපන්
ජර්මනිය	N2 Germany; stem ජර්මන්
දේශනා කරනවා	lecture, preach
ධර්මපත්‍රිකාව	N2 religious or doctrinal pamphlet; pl. ධර්මපත්‍රිකා
නාමය	N2 name; pl. නාම
නිරත වෙනවා	be engaged in
පත්‍රිකාව	N2 pamphlet, leaflet; pl. පත්‍රිකා
පරමවිඥානාර්ථ බෞද්ධ සමාගම	N2 Buddhist Theosophical Society
පරිවර්තනය කරනවා	translate
පරිශ්‍රමය	N2 effort; pl. පරිශ්‍රම
පිරිහී සිටිනවා	be degenerate, backward, undeveloped, degraded or deteriorated, having declined
පුනරුත්ථානය	N2 rehabilitation, resuscitation, resurrection; no pl.; stem පුනරුත්ථාන
පෙරළිය	N2 revolution, radical change; pl. පෙරළි

Lesson Fourteen

පොහොසත් වෙනවා	be able, become rich
ප්‍රංශය	N2 France; stem ප්‍රංශ
ප්‍රචාරක	propaganda, propagation (adjective)
ප්‍රචාරය	N2 propaganda, propagation
ප්‍රචාරය කරනවා	propagate, spread
බරණැස්	N2/3 Benares (place name); stem බරණැස
බුද්ධ ශාසනය	N2 Buddha Sasana, Buddhist dispensation, Buddhism; no pl.; stem බුද්ධ ශාසන
බෞද්ධයකු වෙනවා	become a Buddhist
බ්‍රහ්මචාරීවරයා	N5 celibate person (respectful); pl. බ්‍රහ්මචාරීවරු ; stem බ්‍රහ්මචාරී
බ්‍රහ්මචාරී වෙනවා	become a celibate
මතක් කර දෙනවා	remind
මුලදී	at first, in the beginning
ලිපිකරුවා	N5 clerk; pl. ලිපිකරුවෝ ; stem ලිපිකරු
වයස්ගතව	being old
වහල් වෙනවා	be a slave to, to follow slavishly
වැඩිදියුණු කරනවා	develop, further
විවේචනය	N2 criticism; pl. විවේචන
ශ්‍රමය	N2 energy, effort; pl. ශ්‍රම
සංවර්ධනය	N2 development; no pl.; stem සංවර්ධන
සඟරාව	N2 journal, magazine; pl. සඟරා
සමිතිසමාගම	associations, societies, organizations; pl. only
සබඳතාවය	N2 friendship, relation; pl. සබඳතා
සභ්‍යත්වය	N2 civilization; no pl.; stem සභ්‍යත්ව
සහජීවනය	N2 co-existence: no pl.; stem සහජීවන
සියම	N2 Siam, Thailand; stem සියම්
හික්කඩුවේ ශ්‍රී සුමංගල ස්වාමීන්වහන්සේ	N5 Venerable Sri Sumangala of Hikkaduwa

LESSON 15

බුදුසමය ලක්දිව පිහිටුවීම

බුද්ධවර්ෂ 236 පොසොන් මස පුර පසළොස්වක් දින, ලංකා ඉතිහාසයේ වැදගත්ම දිනය වශයෙන් සැලකිය හැක. ලක්දිව බුදුසසුන පිහිටුවීම සිදුවූයේ මෙදිනය. එවක දඹදිව රාජ්‍යය කළ අශෝක අධිරාජයාගේ ආරාධනය පරිදි මහින්දරහතන්වහන්සේ ධර්මදූත මෙහෙවර සඳහා ලංකාවට වැඩියහ. එකල ලක්දිව රජකළ රජතුමා දේවානම්පියතිස්ස නම් විය. එවක ලක්දිව රජකළ දේවානම්පියතිස්ස රජුත් දඹදිව රජකළ අශෝක රජුත් මිත්‍රයෝ වූහ. මහින්දරහතන්වහන්සේ අශෝක රජුගේ පුත්‍රයා ය. ලංකාවෙහි ධර්මදූත කටයුතු සඳහා තම පුත්‍රයා වූ මහින්ද හිමියන්ම ලංකාවට එවන්නට ඇත්තේ, දෙරට රජවරු අතර පැවති මෙම මිත්‍රත්වයද නිසා විය හැක.

මහින්දරහතන්වහන්සේ මෙහි ගෙන ආයේ අලුත් ආගමක් පමණක් නොවේ. අලුත් ශිෂ්ටාචාරයක් ගොඩනැංවීමට අවශ්‍යවන මූලික දැනුමද උන්වහන්සේ ගෙන ආහ. එවකට භාරතයේ මෞර්ය රාජ්‍යයේ ඉතා දියුණුව පැවතුනු මුළුශිෂ්ටාචාරයම පිළිබඳ විශාල අවබෝධයක් උන්වහන්සේට තිබුණි. අධිරාජයකුගේ පුත්‍රයකු වූ උන්වහන්සේ, රජකෙනෙකු විසින් දැනගත යුතුව තිබුණු සෑම කලාශිල්පයක්ම මැනවින් හදාළහ. රාෂ්ට්‍රපාලනය පිළිබඳව මනා අවබෝධයක් උන්වහන්සේට විය. ලක්දිව නව ශිෂ්ටාචාරයක් ගොඩනැංවීම සඳහා එම සියළුම දැනුම උන්වහන්සේ ලාංකිකයින්ට කියාදුන්හ. මහින්දාගමනය සිංහල සභ්‍යත්වයේද මුලපිරීමක් වශයෙන් සැලකිය යුතුය.

මහින්දාගමනයෙහි මූලික පරමාර්ථය වූයේ ලක්දිව බුදුසමය පිහිටුවීමයි. මහින්දහිමියන් ලක්දිවට වඩිනාදිනයෙහි, ලක්දිව රජු වූ දේවානම්පියතිස්ස රජතුමා තම පිරිසද පිරිවරා මුවදඩයමෙහි ගොස් සිටියේය. එතුමා මුවදඩයම සඳහා ගියේ "මිස්සක" නම් පවුව අසල වූ වනපෙදෙසට ය. මහින්ද හිමියන් වැඩියේද මිස්සක පවුවට ය. "මිස්සක පවුව" දැන් "මිහින්තලේ" යනුවෙන් හැඳින්වෙයි. එම ප්‍රදේශයද හැඳින්වෙනුයේ "මිහින්තලේ" යනුවෙනි.

තණ කමින් සිටි මුවකු දුටු රජතුමා, ඌට විදිනු රිසිවුවද, ඌ තණකමින් සිටිහෙයින් නොවිද, ඌ තණ කා ඉවර වනතුරු මඳක් බලා සිටියේය. මේ අතරේදී "තිස්ස !" තිස්ස !" යනුවෙන් කිසිවකු තමා අමතනු රජුට ඇසිණ. " තිස්ස !" යනුවෙන් තමා ඇමතීමට හැකි කිසිවකු තම දිවයිනෙහි නොසිටි බව දත් රජු, එම ආමන්ත්‍රණය ඇසී විස්මයට පත්වූයේ අවට බැලීය. මිස්සකපව්වෙහි සිටි මිහිඳු හිමියන් ඇතුළු පිරිස එතුමාට දක්නට ලැබිණ. රජුගේ විස්මය දුරලනුවස් මිහිඳු හිමියෝ,

" මහරජ, අපි ශ්‍රමණයෝ වෙමු. බුදුරජාණන්වහන්සේගේ ශ්‍රාවකයන්වහන්සේලා වන අපි තොප කෙරෙහි අනුකම්පාවෙන්, දඹදිව සිට මෙහි පැමිණියෙමු"යි වදාළහ.

එය ඇසූ රජතුමා සතුටුව, දුනුහී පසෙක දමා තෙරුන්වහන්සේවෙතට ගියේය. ඔහුගේ පිරිසද ඔහු අනුව ගියහ.

Lesson Fifteen

ධර්මය දේශනා කරන්නට පෙර රජු පරීක්ෂා කළ යුතු යැයි සිතූ මිහිඳු හිමියෝ , ඒ අසල වූ අඹගසක් පෙන්වා රජුගෙන් මෙසේ ප්‍රශ්න කළහ.

"මහ රජ, මේ ගස කුමක්ද?"
"ස්වාමීනි, මේ ගස අඹගසකි."
"මේ හැර තවත් අඹගස් ඇද්ද?"
"ඇත ස්වාමීනි. බොහෝ අඹගස් ඇත."
"මේ අඹගසත් ඒ අඹගසුත් හැරුණුවිට තවත් ගස් ඇද්ද?"
"ස්වාමීනි බොහෝ ගස් ඇත. එහෙත් ඒවා අඹ නොවේ."
"ඒ අඹගසුත්, අඹ නොවන ගසුත් හැර තවත් ගස් ඇද්ද?"
"ඇත ස්වාමීනි. එනම් මේ අඹගස ය."

තමා ඇසූ ප්‍රශ්න රජු විසඳූ ආකාරයෙන්ම මහින්දරහතන්වහන්සේ සතුටුව, තවදුරටත් ඔහු විමසනු සඳහා මෙසේ ප්‍රශ්න කළහ.

"මහ රජ, තොපට නෑයෝ සිටිත්ද?"
"ස්වාමීනි බොහෝ නෑයෝ සිටිති."
"නෑයන් නොවන අය ඇත්ද?"
"ඇත ස්වාමීනි, නෑයන් නොවන බොහෝ අය ඇත."
"ඒ නෑයනුත් නෑයන් නොවන අයත් හැරුණුවිට තවත් කිසිවෙක් ඇද්ද?"
"ඇත ස්වාමීනි. එනම් මම ය."

මෙම ප්‍රශ්න විසඳීමෙන්ම රජතුමා බුද්ධිමත් බව වටහාගත් මිහිඳු හිමියෝ, එතුමාට ධර්මය දේශනා කළහ. රජු සහ පිරිස තිසරණ සහිත පන්සිල් සමාදන් වී බෞද්ධයෝ වූහ. ලක්දිව බුද්ධශාසනය පිහිටුවීමෙහි ආරම්භය ඒ සමග ඇතිවිය.

බුදුසමය මෙහි පිහිටුවීමෙන් පසු, ආගමික අංශයෙන් රටවැසියා ලැබූ දියුණුව ඉමහත් ය. බුද්ධචරිතය හා භික්ෂූන්ගේ ජීවිතය ආදර්ශයට ගත් ඔවුහු අධ්‍යාත්මික වශයෙන් දියුණුවන්නට වන්හ. ආගමික කටයුතුවලදී පමණක් නොව , අධ්‍යාපනික සහ සමාජ කටයුතුවලදීද බෞද්ධ භික්ෂුව විසූ පන්සල කේන්ද්‍රස්ථානය වූයේය. ගිහිපැවිදි දෙපක්ෂයම පන්සලෙහි අධ්‍යාපනය ලැබූහ. භික්ෂූන්ගේ ඇපඋපස්ථාන ගිහියන් විසින් කරන ලද අතර, ගිහියන්ගේ ආගමික, සමාජ ආදී කටයුතුවලදී භික්ෂූන්ගේ අනුශාසනය ලැබුණේය. බෞද්ධ භික්ෂුව කටයුතු කෙරුයේ ගිහියන්ගේ ගුරුවරයකු මෙන්ම හිතවතකුද පරිද්දෙනි. ගිහි පැවිදි දෙපක්ෂය, සහයෝගයෙන් ජීවත්වීම හේතුකොටගෙන සමාජයේ එකමුතු බව හා ආරක්ෂාවද තහවුරු විය.

ආගමික චාරිත්‍ර ගත්තලද, මහිඳු ගමනය නිසා ඇති වූ වෙනස්කම් බොහෝ ය. පිරිත්කීමේ ආගමික චාරිත්‍රය සහ පෙරහැර පැවැත්වීමේ චාරිත්‍රය මීට නිදසුන් වශයෙන් දැක්විය හැක.

ලංකා රාජ්‍ය පාලනයද ක්‍රමයෙන් බෞද්ධ මූලධර්මවලට අනුව හැඩගැසෙන්නට විය. බුද්ධශාසනය ආරක්ෂාකරගැනීම සලකනලද්දේ රජුන්ගේ පරම යුතුකමක් ලෙසිනි.

මහිඳුගමනය මෙරට සංස්කෘතික දියුණුවටද බෙහෙවින් ඉවහල් විය. මිහිඳුහිමියන් මෙරටට පැමිණෙන්නට පෙර ලක්දිව එතරම් දියුණු වූ ගෘහ නිර්මාණශිල්පයක් තුබූ බවට සැහෙන සාක්ෂි නොමැත. උන්වහන්සේගේ පැමිණීම හේතුකොටගෙන ගෘහනිර්මාණය පිළිබඳව තුබූ දැනුම ක්‍රමයෙන් දියුණු වූ අතර අභිනව ගෘහනිර්මාණ ශිල්ප යක්ද මෙරට ඇතිවූයේය. ගොඩනැගිලි

අලංකාර කිරීම සඳහා උපයෝගී කරගන්නාලද චිත්‍රකලාවද මේ සමගම දියුණු විය. බුදුදහම ලක්දිව පැතිරයාමත් සමගම මූර්ති ශිල්පයද මෙහි ඇතිවන්නට විය. ලක්දිව භාෂා සාහිත්‍යයේ දියුණුවටද බුදුදහම පිහිටුවීම නිසා වූ සේවය විශාල ය. ලක්දිව සිරිත්විරිත් ආදියද බුදුදහමෙහි බලපෑම හේතුකරගෙන අලුතුම මුහුණුවරක් ගත්තේය.

බුදුදහම ලක්දිව පිහිටුවීමෙන් පසු ඉන්දියාවත් ලංකාවත් අතර සබඳතාවයද තවතවත් දියුණු විය. පඬිවරුද, වෙළෙන්දෝද, දේශසංචාරකයෝද නිතර ලක්දිව බලා එන්නට වූහ. ඉන්දියාවත් සමග පැවතුණු මෙම සබඳතාවය දිවයිනෙහි සංස්කෘතික දියුණුවටද බෙහෙවින් හේතු විය.

ඉන්දියාවෙන් ලංකාවට ලැබුණු වැදගත්ම සංස්කෘතික දායාදය බුදුදහම යැයි පැවසිය හැක. ලක්දිව සාහිත්‍යය සහ සංස්කෘතිය පිළිබඳ සෑම වැඩිදියුණුවක්ම ඇතිවූයේ මිහිඳුහිමියන් මෙහි පැමිණ බුදුසමය පිහිටුවීමෙන් පසුව ය.

VOCABULARY

අංශය	N2 section, side, part; pl. අංශ
අධිරාජයා	N5 emperor; pl. අධිරාජයෝ ; stem අධිරාජ
අධ්‍යාත්මික	spiritual
අධ්‍යාපනික	educational
අනුශාසනය	N2 advice, admonition; pl. අනුශාසන
අභිනව	new
අඹ ගස	N2 mango tree; pl. අඹ ගස් ; stem අඹ
අශෝක	N5 Asoka (proper name)
ආමන්ත්‍රණය	N2 addressing, calling; pl. ආමන්ත්‍රණ ; stems ආමන්ත්‍රණ, ආමන්ත්‍රණය
ඇපඋපස්ථාන	attendance, looking after someone; pl. only
ඇමතීම	N2 addressing, calling; pl. ඇමතීම්
ඉවහල් වෙනවා	be helpful, be conducive to
උපයෝගී කරගන්නවා	make use of, use
එකමුතු බව	N2 unity, harmony; no pl.
කිසිවෙක්	N5 someone; no pl. See grammar 6.

කේන්ද්‍ර ස්ථානය	N2 central place, chief place, center; pl. කේන්ද්‍ර ස්ථාන
ගත්කල	with regard to. See grammar 11.
ගෘහනිර්මාණශිල්පය	N2 architecture; pl. ගෘහනිර්මාණශිල්ප
ගොඩනැංවීම	N2 building up; pl. ගොඩනැංවීම්
චාරිත්‍රය	N2 custom; pl. චාරිත්‍ර
චිත්‍ර කලාව	N2 art of drawing and painting; pl. චිත්‍ර කලා
තෙරුන්වහන්සේ	N5 elder-monk (honorific); pl. තෙරුන්වහන්සේලා
දඩයම	N2 hunting; pl. දඩයම්
දඩයමෙහි යනවා	go hunting
දඹදිව	N3 India; no pl.
දායාදය	N2 gift, heritage, inheritance, dowry; pl. දායාද
දුන්න	N2 bow; pl. දුනු
දුරලනවා	dispel, ward off, discard
දෙ-	two
දෙරට	the two countries, of the two countries
දේශසංචාරකයා	N5 traveler in a country, tourist; pl. දේශසංචාරකයෝ; stem දේශසංචාරක
ධර්මදූත	missionary (adjective)
පරම	chief, primary, most important, noble
පරිදි	at. See grammar 2.
පවුව	N2 hill, rock; pl. පවු
පැතිරයාම	N2 spread, dissemination; pl. පැතිරයාම්
පැවැත්වීම	N2 holding, carrying on; pl. පැවැත්වීම්
පිරිත් කීම	N2 chanting of Pirit (i.e. Buddhist sutras); pl. පිරිත් කීම්
පිහිටුවීම	N2 establishing, fixing, establishment; pl. පිහිටුවීම්
පුරපසළොස්වක	N2/3 full-moon day; no pl.; stem පුරපසළොස්වක, or පුරපසළොස්වක්
පෙරහැර	N2 procession; pl. පෙරහැරවල්

පොසොන්	month in the lunar calendar. See grammar 1.
ප්‍රදේශය	N2 province, area; pl. ප්‍රදේශ
බලා	to, towards. See grammar 10.
බලාසිටිනවා	watch, wait
බුදුදහම	N2 Buddha's doctrine, Buddhism; no pl.
බුද්ධ චරිතය	N2 deeds of the Buddha, life of the Buddha; no pl.
බුදුසසුන	N2 same as බුද්ධ ශාසනය; no pl.
බුද්ධ වර්ෂ	Buddhist era. See grammar 1.
බුද්ධිමත්	intelligent
භික්ෂුව	N5 Buddhist monk; pl. භික්ෂූහු ; stem භික්ෂු
මනා	good, fine, sound
මහ රජ	great king, "your majesty" (vocative)
මහින්ද	N5 Mahinda (proper name)
මහින්දාගමනය	N2 arrival of Mahinda; no pl.
මිත්‍රත්වය	N2 friendship; no pl.
මිහිඳු	Classical Sinhala form of මහින්ද
මුලපිරීම	N2 starting, beginning; pl. මුලපිරීම්
මුව දඩයම	N2 deer-hunt; no pl.
මූර්ති ශිල්පය	N2 (art of) sculpture; pl. මූර්ති ශිල්ප
මූලධර්මය	N2 fundamental principle, principal doctrine; pl. මූලධර්ම
මෙහෙවර	N2 work, service; no pl.; stem මෙහෙවර
මෞර්ය රාජ්‍යය	N2 Mauryan kingdom; no pl.
යුතුකම	N2 duty; pl. යුතුකම්
රජකරනවා	rule, reign
රටවැසියා	N5 inhabitant of a country; pl. රටවැසියෝ ; stem රටවැසි
රහතන්වහන්සේ	N5 an Arahant, a saint (Buddhist); pl. රහතන්වහන්සේලා ; stem රහත්

රාෂ්ට්‍රය	N2 country; pl. රාෂ්ට්‍ර
වඩිනවා	move, come, go (of monks)
වදාරනවා	say, speak, preach (of Buddhist saints)
වන පෙදෙස	N2 forest area, wooded district; pl. වන පෙදෙස්
විදිනවා	shoot (an arrow), pierce
විස්මයට පත්වෙනවා	be surprised
වෙනස්කම	N2 difference, change; pl. වෙනස්කම්
ශිෂ්ටාචාරය	N2 civilization; pl. ශිෂ්ටාචාර
ශ්‍රමණයා	N5 recluse; pl. ශ්‍රමණයෝ ; stem ශ්‍රමණ
ශ්‍රාවකයන්වහන්සේ	N5 disciple (of Buddha); pl. ශ්‍රාවකයන්වහන්සේලා ; stem ශ්‍රාවක
සංස්කෘතික	cultural
සමාජ	social
හැඩගැසෙනවා	be patterned, be formed
හිතවතා	N5 friend; pl. හිතවත්තු ; stem හිතවත්
හිමියෝ	N5 a Buddhist monk (inflects as plural)
හිය	N2 arrow; pl. හී
හේතුකොටගෙන	having as cause. See grammar 12.

GRAMMAR

1. බුධවර්ෂ

Dates in Sri Lanka are sometimes given in terms of බුධවර්ෂ, the Buddhist era (B.E.), instead of the Christian era. The බුධවර්ෂ is calculated from the traditional date of the demise of the Buddha (483 B.C.). It may be abbreviated as බු: ව: or බු. ව. . Dates given in terms of බුධවර්ෂ usually follow the traditional lunar calendar. The months of this calendar with their approximate western equivalents are as follows:

දුරුතු = දෙසැම්බර්-ජනවාරි December - January
නවම් = පෙබරවාරි February
මැදින් = මාර්තු March
බක් = අප්‍රියෙල් April
වෙසක් = මැයි May
පොසොන් = මැයි-ජුනි May - June
ඇසළ = ජුනි-ජුලි June - July
නිකිණි = ජුලි-අගෝස්තු July - August
බිනර = අගෝස්තු-සැප්තැම්බර් August - September
වප් = සැප්තැම්බර්-ඔක්තෝබර් September - October
ඉල් = ඔක්තෝබර්-නොවැම්බර් October - November
උඳුවප් = නොවැම්බර්-දෙසැම්බර් November - December

Thus: බුධවර්ෂ 236 පොසොන් මස පුරපසළොස්වක දින.....
On the full-moon day of Poson (i.e. May - June) in 236 B.E. (approx. 247 B.C.)

2. පරිදි

With a dependent noun signifying requests, advice, orders, etc. , the postposition පරිදි may have the sense 'at, according to':

ඔහුගේ ඉල්ලීම පරිදි මම එය කෙළෙමි.
I did that at his request.

ගුරුවරයාගේ අවවාදය පරිදි ශිෂ්‍යයෝ නොහැසිරෙති.
The students do not behave according to the advice of the teacher.

ලෙස can also be used in this way.

ඔහුගේ ඉල්ලීම ලෙස මම එය කෙළෙමි.

ගුරුවරයාගේ අවවාදය ලෙස ශිෂ්‍යයෝ නොහැසිරෙති.

3. EMPHATIC PAST

3.1 The Emphatic Past of Class 1 verbs (6,1.2) has an alternate form in -උයේ rather than -උවේ . Optionally, the -උ- in this alternant is lengthened. Thus:

Verb		Emphatic Past	Alternate Forms		
බල-	see	බැලුවේ	බැලුයේ	or	බැලූයේ
කප-	cut	කැපුවේ	කැපුයේ	or	කැපූයේ
මර-	kill	මැරුවේ	මැරුයේ	or	මැරූයේ

3.2 Some irregular verbs have similar alternate forms as follows:

වෙ-	be, become	වුවේ	වූයේ
එ-	come	ආවේ	ආයේ
ක-	eat	කෑවේ	කෑයේ

4. තිබෙනවා AND වෙනවා

4.1 තිබෙනවා 'be, exist' has alternates for some past tense forms as follows:

a. තුබුනි as the third person past tense singular, besides තිබුණේය, තිබුනි , තිබිනි and තිබිණ.

b. තුබුණු as the past tense verbal adjective besides තිබුණු , තිබූ and තුබූ .

4.2 වෙනවා 'be, become' has alternate past tense forms:

a. වනි as the third person past tense singular besides වුණේය , වුවේය , වූයේය , වුනි , විනි and විණ .

b. වන්හ as the third person past tense plural, besides වූවෝය and වූහ .

c. වන් as the past tense verbal adjective besides වූ and වුණු .

5. VERBS IN -ර

Most verbs with a present tense stem ending in -ර , have an alternate past tense stem formed simply by replacing -ර by -ළ , parallel to the form කළ- from කර- (8,1). This past tense stem by itself may serve as a verbal adjective, or the person-number endings may be added in the usual way. Two such verbs occurring in this lesson are හදාරනවා 'study, commit to memory' and වදාරනවා 'say, speak, preach (of monks)'.

Verb	Regular Past Stem	-ළ- Stem	Verbal Adjective	Third Singular
හදාර-	හැදෑරුව්-	හදාළ-	හදාළ	හදාළේය
වදාර-	වැදෑරුව්-	වදාළ-	වදාළ	වදාළේය

6. කිසිවෙක්

කිසි , කිසිවක් and කිසිවෙක් (8,9) have an 'any...at all' sense in negative sentences and questions. They also occur in positive sentences with a 'some...(or other)' sense:

> කිසිවකු තමාට කථාකළ බව සුනිල්ට ඇසිණ.
> Sunil heard someone calling him.
>
> කිසි පුරුෂයකු තමා වෙත එනු කුවේණි දුටුවාය.
> Kuveni saw some man coming toward her.
>
> ඔහුට ලැබුණු එක් ලිපියක විවාහයක් ගැන කරුණු කිසිවක් සඳහන් වී තිබුණි.
> In one of the letters he received, some information about a marriage was mentioned.

7. පෙර

පෙර (5,8.1) can be used with a dependent infinitive to form 'before' clauses.

> ආර්යයන් ලංකාවට එන්නට පෙර ලක්දිව විසූ ජනයාගේ භාෂාව කුමක් දැයි දැනගැනීම අපහසු ය.
> It is difficult to determine what was the language of those who lived in Lanka before the Aryans came there.
>
> ඔබ එහි යන්නට පෙර මා හමුවනු මැනවි.
> Please see me before you go there.

8. INANIMATE NOUNS PLUS - එක්

Inanimate nouns sometimes appear in Literary Sinhala with

-එක් rather than -අක් in the indefinite. This seems to be particularly true where the sense of 'one' or ' a certain' is stressed, and is most common in oblique cases.

දිනෙක	on one day
පසෙක	on one side, etc.

(The use of -එක් with any inanimate noun in any case is found in older Sinhala writing, and there are some modern authors who employ this style).

9. COLLECTIVE NOUNS

A noun expressive of a group composed of animate members can take either a third person singular or plural verb although the noun may be in the singular. Thus:

> කුමරුගේ පිරිස ඔහු සොයා ගියේය or ගියහ.
> The prince's retinue went in search of him.

10. බලා

The postposition බලා has a sense 'to, towards, in the direction of', with verbs of motion such as යනවා 'go', එනවා 'come', පැමිණෙනවා 'arrive', පිටත්වෙනවා 'set forth', etc.

> හෙතෙම එංගලන්තය බලා පිටත් විය.
> He left for England.

11. ගත්කල

ගත්කල (literally 'when one takes') has a sense like English 'when we consider, in reference to' or 'with regard to'. Thus:

> වර්තමාන ලෝකයේ භාෂා ගත්කල ඉංග්‍රීසි භාෂාවට වැදගත් තැනක් හිමිවන බව කිව යුතුය.
> With regard to the languages of the modern world, one must say that the English language occupies an important position.

12. කරගෙන , කොටගෙන

The past participle forms of කරගන්නවා , i.e. කරගෙන or කොටගෙන , are used idiomatically with forms such as හේතු (stem of හේතුව 'reason'), මුල් (stem of මුල 'cause, basis, main thing') and ප්‍රධාන ('chief, principal') to form phrases such as the following with senses like 'having as basis or cause, because of'.

හේතුකොටගෙන	or	හේතුකරගෙන
මුල්කොටගෙන	or	මුල්කරගෙන
ප්‍රධානකොටගෙන	or	ප්‍රධානකරගෙන

These expressions are used with a preceding noun or noun phrase to form the equivalent of English 'because of' or 'on account of' phrases.

ප්‍රේමය හේතුකොටගෙන දුක ඇතිවෙයි.
or ප්‍රේමය මුල්කොටගෙන දුක ඇතිවෙයි.
Grief arises because of love.

ආසාව හේතුකොටගෙන බිය ඇතිවෙයි.
or ආසාව මුල්කොටගෙන බිය ඇතිවෙයි.
Fear arises because of desire.

දෙවැනි ලෝක යුධය හේතුකොටගෙන ඇතිවූ සියළුම කරදර....
All the difficulties that arose because of the second world war...

13. පරිද්දෙන් , ලෙසින් , සෙයින්.

පරිද්දෙන් , ලෙසින් , සෙයින් are the instrumental forms of පරිදි , ලෙස and සේ , and can be used as alternates for them in the sense of 'as, like' (9,18):

තම දරුවන් පරිද්දෙන් (or ලෙසින් or සෙයින්) ගුරුවරු ශිෂ්‍යයන් රැකබලාගනිති.
The teachers look after the students as their own children.

එතුමා මෙහි පැමිණියේ රජයේ විශේෂ අමුත්තකු පරිද්දෙනි (or ලෙසිනි or සෙයිනි).
He came here as a special guest of the government.

14. භික්ෂුව

භික්ෂුව 'Buddhist monk' is one of a very small number of animate nouns that refer to male humans, and end in -උ , In the singular definite and indefinite it inflects like a feminine noun (7,1.1), and usually takes the -හු plural (11,16.2). Thus:

	Singular		Plural
	Definite	Indefinite	
Nominative	භික්ෂුව	භික්ෂුවක්	භික්ෂූහු
Accusative	භික්ෂුව	භික්ෂුවක	භික්ෂූන්
Dative	භික්ෂුවට	භික්ෂුවකට	භික්ෂූන්ට
Genitive	භික්ෂුවගේ	භික්ෂුවකගේ	භික්ෂූන්ගේ
Instrumental	භික්ෂුවගෙන්	භික්ෂුවකගෙන්	භික්ෂූන්ගෙන්

15. නොමැත

නොම (which is actually නො 'negative prefix' + ම 'emphatic particle') is sometimes used as an alternate for the negative prefix නො- in negating verbs. Thus:

නොම + ඇත -> නොමැත is/are not

In current Literary Sinhala නොමැත is the only verb form of this kind which is in common use. නොම with other verbs (නොමවෙයි, නොමකරයි as alternates for නොවෙයි , නොකරයි , etc.) is largely restricted to archaic or poetic language.

SUPPLEMENTARY READINGS

1. සංඝමිත්තා මෙහෙණින්වහන්සේ

දේවානම්පියතිස්ස රජුගේ සහෝදරයකුගේ දේවිය වූ අනුලා දේවි මිහිඳුහිමියන්ගෙන් බණ අසා පැවිදිවනු කැමති වූවාය. තමා ප්‍රමුඛ ස්ත්‍රීන් පන්සියයක් පැවිදිකරවන ලෙස අනුලාදේවි මිහිඳුහිමියන්ගෙන් ඉල්ලා සිටියාය. ඇයගේ ඉල්ලීම පරිදි ඔවුන් පැවිදි කරවීම අවශ්‍යවිය. ස්ත්‍රීන් පැවිදිකිරීම භික්ෂුණීන් විසින්ම කළයුතු වූ හෙයින්, මිහිඳුහිමියෝ, තම නැගණිය වූ සඞ්ඝමිත්තා මෙහෙණිය මෙහි එවන ලෙසද, බුදුරජාණන්වහන්සේ විසින් පරිභෝග කරනු ලැබීමෙන් පූජනීයත්වයට පැමිණි ශ්‍රීමහාබෝධියෙහි ශාඛාවක් ඇය සමග එවන ලෙසද හසුන් දී අරිට්ඨ නම් අමාත්‍යයා දඹදිවට යැවූහ. මෙම හසුන් ලද අශෝක රජතුමා, ලක්දිව බුදුසසුන පිහිටුවනලද බවත්, එය අනුක්‍රමයෙන් දියුණු වී යන බවත් දැන බොහෝ සතුටු වූයේය. ලක්දිව බුද්ධශාසනයෙහි වැඩිදියුණුව දකිනුරිසි වූ එතුමා හසුන් පරිදි, ශ්‍රීමහාබෝධියෙහි දක්ෂිණශාඛාවක් රැගෙන ලංකාවට යන මෙන් සංඝමිත්තා මෙහෙණින්වහන්සේගෙන් ඉල්ලා සිටියේය. ශ්‍රීමහාබෝධියෙහි දක්ෂිණ ශාඛාවද රැගෙන මෙහෙණින්වහන්සේලා දෙලොස් නමක්ද කැටුව සංඝමිත්තා මෙහෙණින්වහන්සේ ලක්දිව බලා පිටත් වූහ. ශ්‍රීමහාබෝධිය ආරක්ෂාකිරීම සඳහා ආරක්ෂක පිරිසක්ද, බෝධීන්වහන්සේට කළයුතු විවිධ සේවා කිරීම සඳහා අවශ්‍යවන ශිල්පීන්ද සංඝමිත්තා මෙහෙණින්වහන්සේ සමග අශෝක රජතුමා එවිය. සංඝමිත්තා මෙහෙණින්වහන්සේ ප්‍රමුඛ පිරිස බුද්ධ වර්ෂ 236 උඳුවප් මස පුරපසළොස්වක් දින ලක්දිවට පැමිණියහ. රජතුමා ප්‍රමුඛ ලක්වැසියන් විසින් ශ්‍රී මහා බෝධීන් වහන්සේද භික්ෂුණී පිරිසද මහෝත්සවයෙන් පිළිගන්නා ලදහ.

මිහිඳුහිමියන්ගේ අනුශාසනා ලද සඞ්ඝමිත්තා මෙහෙණිය විසින් අනුලා දේවිය ප්‍රමුඛ පන්සියයක් පිරිස හා තවත් කුමරියන් පන්සියයක් පැවිදි කරන ලද බව වංශකථාවල සඳහන් වේ. ලක්දිව මෙහෙණිසස්න ඇතිවූයේ මෙතැන් සිටය.

සංඝමිත්තා මෙහෙණින්වහන්සේ පළමුවෙන් "උපාසිකා-විහාර" නම් ආරාමයක විසූහ. උපාසිකාවිහාරය පිහිටා තිබුණේ අනුරාධපුරය සමීපයේය. නිශ්ශබ්දතාවය අගය කළ සඞ්ඝමිත්තා මෙහෙණියෝ උපාසිකාවිහාරයෙහි විසීමට එතරම් කැමැත්තක් නොදැක්වූහ. එතුමියගේ අදහස් දැනගත් රජතුමා "හත්ථාළ්හක-විහාර" නමින් ආරාමයක් එතුමිය සඳහා සාදවා දුන්නේය.

සඞ්ඝමිත්තා මෙහෙණියගෙන් සාමාන්‍යයෙන් ලාංකික ජනතාවටත්, විශේෂයෙන් ලාංකික ස්ත්‍රී-සමාජයටත් සිදුවූ සේවය විශාල ය. ලාංකික වනිතා සමාජය තුළ විශාල පරිවර්තනයක් ඇතිකිරීමේ ගෞරවය හිමිවනුයේ මෙතුමියටයි. ලාංකික කාන්තාවන්ට සමාජයේ උසස් තත්වයක් ලබාගැනීම සඳහා එතෙක් පැවති බාධක ඉවත් කරන ලද්දේ එතුමිය විසිනි. මෙහෙණිසස්න මෙහි පිහිටුවීම නිසා කාන්තාවන්ගේ අධ්‍යාපනයද අළුත් මුහුණුවරක් ගත් බව පැවසිය හැක. සාමාන්‍ය ස්ත්‍රීන් පමණක් නොව, බොහෝ වංශවත් ස්ත්‍රීහුද, උගත් කාන්තාවෝද මෙතුමිය වෙත

පැවිදි වූහ. භික්ෂුණීන්ගේ සංඛ්‍යාව ශීඝ්‍ර ලෙස වැඩිවීම නිසා ලක්දිව බුද්ධශාසනයද වැඩි දියුණු වූයේය.

මහජනයාගේ ගෞරවයට සහ ආදරයට භාජන වූ මේ භික්ෂුණීහු බුද්ධධර්මය මනාසේ හදාළාහු ජනතාවට ධර්මය කියාදෙමින් ඔවුන්ගේ දියුණුව සඳහා කටයුතු කළහ. ධර්මය පිළිබඳ නොයෙක් ග්‍රන්ථ සකස්කිරීමෙහිද යෙදුණු මෙම භික්ෂුණීන් විදේශ ධර්මදූත සේවාවන්හිද යෙදුණු බව සඳහන් වෙයි. වරක් පිරිහී ගිය චීන භික්ෂුණීශාසනය නැවත පිහිටුවීමේ ගෞරවය හිමිකරගත්තේද, ලාංකික භික්ෂුණීන් පිරිසක් විසිනි.

සංඝමිත්තා මෙහෙණින්වහන්සේ මෙහි පැමිණීමෙන් වූ වැදගත්ම ප්‍රතිඵල වශයෙන්, භික්ෂුණීශාසනය ආරම්භ වීමත් ශ්‍රී මහාබෝධීන්වහන්සේගේ දක්ෂිණ ශාඛාව ලක්දිව රෝපණය කරවීමත් සඳහන් කළ හැක. අනුරාධපුරයෙහි "මහමෙව්නා" නම් උයනෙහි රෝපණය කරනු ලැබූ මෙම බෝධි වෘක්ෂය අද දක්වාම ඉතා සරු ලෙස වැඩෙයි. මුළු ලෝකයේම ඇති ඉතා පැරණි ඓතිහාසික වෘක්ෂය ලෙස මෙම බෝධිවෘක්ෂය සලකනු ලැබෙයි. එය ලංකාවට ගෙනදීමේ ගෞරවය හිමිවන්නේ සංඝමිත්තා මෙහෙණින්වහන්සේටය. එතුමියගෙන් ලක්දිව බුද්ධශාසනයේ චිරස්ථිතිය පිණිස වූ සේවය ඉමහත් ය.

2. ඕල්කට් තුමා

සර් හෙන්රි ස්ටිල් ඕල්කට් තුමා, 1832 අගෝස්තුමස 2 වැනි දින ඇමෙරිකාවේ නිව්යෝර්ක් (New York) නගරයේ, ක්‍රිස්තු භක්තික පවුලක උපත ලැබුවේය. තරුණ වියට පත් හෙතෙම ක්‍රිස්තියානි පූජකවරයකුගේ දියණියක හා විවාහ වූයේය. මෙතුමා ලොව ප්‍රකට වීමට පටන්ගත්තේ බුදුදහම ලොව පැතිරවීමටත් සමාජ සේවයටත් කැපවූ පසු ය.

ඕල්කට් තුමාගේ සමාජ සේවා කටයුතුවල ආරම්භය වූයේ "තියොසොෆිකල් සමාගම" (Theosophical Society)යි. 1875 නොවැම්බර් මස පිහිටුවන ලද මෙහි පරමාර්ථය වූයේ බුද්ධිමත් ව සත්‍යය සෙවීමයි. මුල දී මෙහි කටයුතුවලට නොයෙක් කරදර පැමිණියද ස්වල්පකලකින් එය ලොව පුරා ප්‍රසිද්ධ විය.

බෞද්ධ පොතපත කියවීමෙන් බුද්ධධර්මය ගැන පැහැදුණු මෙතුමා වැඩිදුරටත් බුදුසමය පිළිබඳව දැනගැනීම සඳහා 1880 මැයි 17 වෙනිදින ලක්දිව බලා පැමිණියේය. පැමිණ ලක්දිව දී බෞද්ධයකු බවට පත් විය.

එවක ලංකාවේ බෞද්ධජනතාවගේ පරිහානිය දුටු ඕල්කට් තුමා ප්‍රථමයෙන් ම කළේ එම තත්ත්වයෙන් ඔවුන් මුදාගැනීමට කටයුතු කිරීමයි. මේ සඳහා 1880 ජූනි මස 17 වැනි දින ලංකාවේ පරමවිඥානාර්ථ බෞද්ධ සමාගම (Buddhist Theosophical Society of Ceylon) පිහිටුවන ලදී. මෙකල බෞද්ධ අධ්‍යාපනයද පැවතුනේ ඉතා නොදියුණු තත්ත්වයක ය. බුදුදහම දියුණුකිරීමට නම් බෞද්ධ ළමයින්ට ඒ ගැන උසස් අවබෝධයක් දියයුතු බව වටහාගත් මෙතුමා පරමවිඥානාර්ථ බෞද්ධ සමාගමේද සහාය ඇතිව ආනන්ද, නාලන්ද, මහින්ද, ධර්මරාජ ආදි උසස් බෞද්ධ විද්‍යාල පිහිටුවිය. ඕල්කට් තුමාගේ මෙම උත්සාහය නිසා බෞද්ධ

අධ්‍යාපනය යළිත් දියුණුවන්නට විය.

විද්‍යෝදය පිරිවෙනෙහි අධිපති වූ හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන්ගේ ආධාරය ඇතිව, බෞද්ධ කොඩිය මුල්වරටම ලොවට හඳුන්වා දුන්නේද මෙතුමා ය.

බුද්ධාගමේ දියුණුවට ශ්‍රමයත් ධනයත් වැයකළ මෙතුමා ජාතියේ මහත් අඩුවක් සපුරමින් 1889 දෙසැම්බර් මස, බෞද්ධ තොරතුරු දැක්වීම සඳහා "සරසවි සඳ රැස" යන නමින් පත්‍රයක් ආරම්භ කළේය. මෙම පුවත් පත ඉතා ඉක්මනින් දියුණු විය.

එතුමාගේ බෞද්ධ කටයුතු ලංකාවට පමණක් සීමා වූයේ නොවේ. භාරතයට ගිය එතුමා එහිද බුද්ධාගම නගා සිටුවීම සඳහා කටයුතු කෙළේය. 1894 දී මදුරාසියේ "සිල්කට් පුණ්‍ය පාඨශාලාව" පිහිටුවා එතුමා නොමිලයේ අධ්‍යාපනය ලබාදීම සඳහා පහසුකම් සැලැස්වූයේය. ඉන්දියාවේ කුලභේදය නිසා පීඩාවට පත් වූ අයගේ තත්වය නගා සිටුවීම පිණිස එතුමා ගත් උත්සාහය විශාල ය.

ජපානය, ප්‍රංශය යන රටවලටද ගිය එතුමා එහිද බෞද්ධ ප්‍රබෝධයක් ඇතිකිරීමට කටයුතු සැලැස් වූයේය. මෙසේ ලෝකයේ බොහෝ රටවල බුද්ධාගම පැතිරවීම සඳහා එතුමා බෙහෙවින් වෙහෙසුනේය. බුදුසමයෙහි උන්නතිය සඳහාත්, විශේෂයෙන්ම ලක්දිව බෞද්ධ ජනතාව නගා සිටුවීම සඳහාත් මෙතුමාගෙන් සිදු වූ සේවය අනල්පය.

VOCABULARY FOR SUPPLEMENTARY READINGS

READING 1

අමාත්‍යයා	N5 minister; pl. **අමාත්‍යයෝ** ; stem **අමාත්‍ය**
ආරක්ෂකයා	N5 guard, protector; pl. **ආරක්ෂකයෝ** ; stem **ආරක්ෂක**
ආරම්භවීම	N2 beginning; pl. **ආරම්භවීම්**
ආරාමය	N2 monastery, residence (for monks or nuns); pl. **ආරාම**
ඉවත් කරනවා	remove, dispel
උඳුවප්	N(irreg) November - December
ඓතිහාසික	historical, historic
ගෙනදීම	N2 getting for someone else, procurement; pl. **ගෙනදීම්**
ගෞරවය	N2 honor, respect, credit; no pl.; stem **ගෞරව**
චිරස්ථිතිය	N2 stability, longevity, being well established; no pl.
දක්ෂිණ	southern, right(side)
නිශ්ශබ්දතාවය	N2 silence; pl. **නිශ්ශබ්දතා** ; stem **නිශ්ශබ්ද**
පරිභෝගකරනවා	use, enjoy

පරිවර්තනය	N2 change; pl. පරිවර්තන
පිරිහියනවා	deteriorate, decline
පූජනීයත්වය	N2 venerability, quality of being worthy of reverence; no pl.; stem පූජනීය
භික්ෂුණීශාසනය	N2 order of (Buddhist) nuns; no pl.
භික්ෂුණිය	N5 nun (Buddhist); pl. භික්ෂුණීහු or භික්ෂුණියෝ ; stem භික්ෂුණී
මහෝත්සවය	N2 great festivity; pl. මහෝත්සව
මෙතැන් සිට	from this place/point
මෙහෙණිය	N5 nun (Buddhist); pl. මෙහෙණියෝ ; stem මෙහෙණි or මෙහෙණ
මෙහෙණිසස්න	N2 order of nuns; no pl.
රෝපණය කරනවා	plant, place
රෝපණය කරවනවා	cause to plant, have someone plant
වංශවත්	of noble family, high-caste (adjective)
වනිතාව	N5 woman; pl. වනිතාවෝ ; stem වනිතා
වෘක්ෂය	N2 tree; pl. වෘක්ෂ
ශාඛාව	N2 branch; pl. ශාඛා
ශිල්පය	N5 artisan, craftsman, technician; pl. ශිල්පිහු or ශිල්පියෝ
ශීඝ්‍ර	fast, quick
ශ්‍රීමහාබෝධිය	N2 Sacred Bodhi tree; no pl.
ශ්‍රීමහාබෝධීන්වහන්සේ	N5 Sacred Bodhi tree (respectful); no pl.
සංඝමිත්තා, මෙහෙණින් වහන්සේ	N5 the nun Sanghamitta (respectful); no pl.
සාදවා දෙනවා	get (something) built (for someone else)
හසුන	N2 letter, message; pl. හසුන්
හිමි කරගන්නවා	take control of

READING 2

අඩුව	N2 lack, inadequacy, gap; no pl.; stem අඩු

අනල්ප	much, great, large, many
ආනන්ද විද්‍යාලය	N2 Ananda College; no pl.
ඕල්කට් පුණ්‍ය පාඨශාලාව	N2 Olcott Charity School
කටයුතු කරනවා	act, take necessary steps, carry out duties
කොඩිය	N2 flag; pl. **කොඩි**
ක්‍රිස්තු භක්තික	belonging to the Christian faith, Christian
ධර්මරාජ විද්‍යාලය	N2 Dharmaraja College; no pl.
නාලන්දා විද්‍යාලය	N2 Nalanda College; no pl.
නොදියුණු	undeveloped, deteriorated
නොමිලයේ	free (of charge)
පරිහානිය	N2 decline, decadence, deterioration
පීඩාව	N2 affliction, persecution, suffering; pl. **පීඩා**
පුරා	throughout
පූජකවරයා	N5 priest, minister; pl. **පූජකවරු** ; stem **පූජක**
ප්‍රකට වෙනවා	be known, become public
මහින්ද විද්‍යාලය	N2 Mahinda College; no pl.
ලොව	N2/3 world
වැය කරනවා	spend
සත්‍යය	N2 truth; pl. **සත්‍ය**
සඳරැස	moon's rays, moon's light; no pl.
සපුරනවා	fill, fulfill
සරසවි	Saraswati, the goddess of speech and wisdom
හඳුන්වාදෙනවා	introduce

GLOSSARY
Sinhala-English

Alphabetical Order:

The alphabetical order here follows the usual Sinhala practice, and is as follows:

අ, ආ, ඇ, ඈ, ඉ, ඊ, උ, ඌ, ඍ, ඎ, (ඏ) එ, ඒ, ඓ, ඔ, ඕ, ඖ, ං
ක, ඛ, ග, ඝ, ඞ, ඟ, ච, ඡ, ජ, ඣ, ඤ, ට, ඨ, ඩ, ඪ, ණ, ඬ, ත, ථ,
ද, ධ, න, ඳ, ප, ඵ, බ, භ, ම, ඹ, ය, ර, ල, ව, ශ, ෂ, ස, හ, ළ.

(ඏ represents a vowel usually transliterated as ḷ and pronounced ḷu, found in Sanskrit borrowings. It is very rare and has not occurred in this text, but is included for completeness).

Note that half-nasals follow their corresponding regular nasal, so that ඟ follows ඞ, etc., and that ං is alphabetized between the vowels and the other consonants so that ක precedes කං which precedes කග, etc.

In this glossary, combined consonant symbols (other than half-nasals) have been resolved into their component parts. Thus a word appearing as සිද්‍ධස්‍ථානය or සිධස්‍ථානය in a lesson and lesson glossary will appear as සිද්ධ්ස්ථානය here. This will give the student an opportunity to check on combinations of which he is not sure by comparing forms containing them with their equivalents in this glossary.

There is a great deal of fluctuation in the writing of ළ and ල, such that all forms with ළ have possible alternates with ල, but not the reverse. Forms with ළ alternates have, as a general rule, been listed here under ළ, which has been placed at the end of the alphabet following usual Sinhala practice. Thus if a word written with ල is not found in the expected place, the student should look under ළ.

ළු is alphabetized as ළ + උ. Note that words with ලු should also be looked for under ළු.

There is similar fluctuation in the writing of න and ණ, and some modern authors use න in all cases. Here, we have followed traditional practice for the most part, but a student who cannot find a form under one is advised to look under the other. In any case, this will prepare him for similar problems in using a regular Sinhala dictionary.

Class and Occurrence Designations:

The class of a noun is indicated as N1, N2, etc. Where no number appears, the noun will generally be plural only, lacking the necessary singular forms for the classification.

Numbers in parentheses refer to the first occurrence of the form in the text. If a form has been treated in a grammar section, it will be designated as gr. followed by the lesson and grammar section. Thus (gr. 10,2) means Lesson 10, Grammar Section 2. Otherwise, the form will be designated by the lesson number, followed by .0 for main reading, and .1 and .2 for supplementary readings. Thus (10.0) means Lesson 10, Main Reading; (10.2) means Lesson 10, Supplementary 2, etc.

A few words included in this glossary have not appeared in the glossaries for a particular lesson. These are designated as (0.0).

අංශය	N2 section, branch, department (1.2); section, division (3.3); section, side, part; pl. **අංශ; අංශවල්** (15.0)
අකමැති වෙනවා	dislike, disagree (9.2)
අක්කරය	N2 acre; pl. **අක්කර** (2.2)
අක්කා	N5 older sister; pl. **අක්කලා** (2.0)
අග	chief, main (10.2)
අගමැතිනිය	N5 woman prime minister; pl. **අගමැතිනියෝ** (12.0)
අගමැතිවරයා	N5 prime minister; pl. **අගමැතිවරු** ; stem **අගමැති** (11.0)
අගය	N2 value; no pl.; stem **අගය** (7.1)
අගය කරනවා	evaluate, consider as valuable (9.0)
අගල් හරිනවා	make small ditches (2.1)
අග්ගලාව	N2 a sweetball made of flour; pl. **අග්ගලා** (9.0)
අග්‍රාණ්ඩුකාරවරයා	N5 governor-general; pl. **අග්‍රාණ්ඩුකාරවරු** ; stem **අග්‍රාණ්ඩුකාර** (11.0)
අගුටු මිටියා	N5 dwarf; pl. **අගුටු මිටියෝ** ; stem **අගුටුමිටි** (9.2)
අජන්ටා	Ajanta (place name) (13.1)
අටපට්ටම් කූඩුව	N2 eight-sided lantern; pl. **අටපට්ටම් කූඩු** (5.2)
අටවනවා	set, arrange (6.2)
අටසිල්	the 8 precepts; pl. only (5.0)
අට්ටික්කා ගස	N2 fig tree; pl. **අට්ටික්කා ගස්** (10.2)
අඩවිය	N2 domain; pl. **අඩවි** (7.0)
අඩිය	N2 foot; pl. **අඩි** (7.0)
අඩි සටහන	N2 footprint; pl. **අඩි සටහන්** (7.0)
අඩුව	N2 gap, lack, inadequacy; no pl.; stem **අඩු** (15.2)
අඩුවී යනවා	grow less, decrease (12.1)
අඩු වෙනවා	become less, decrease (6.0)
අත	N2 hand; pl. **අත්** (12.0)
අත	in the hands of (11.0)

අත	N2 state, condition, nature; no pl. (12.0)
අතපසු වෙනවා	get delayed, get forgotten (13.2)
අතර	among (0.0)
අතර(දී)	while, during (gr. 10,5)
අතරමගදී	on the way (7.2)
අතරෙහි	among (Coll. අතරේ C. S. 19,10) (4.2)
අතහරිනවා	give up, let go, abandon (9.1)
අතළොස්ස	N5 a handful; no pl. (11.0)
අතින්	by (gr. 13,16)
අතිරේක	additional, supplementary (6.1)
අතුරනවා	spread (10.2)
අතුරෙන්/අතුරින්	among (gr. 3,4.7)
අතෙහි or අතේ	in the hands of (12.0)
අත්ත	N2 branch; pl. අතු (6.2)
අත්දැකීම	N2 experience; pl. අත්දැකීම් (14.1)
අත්පත් කරගන්නවා	bring under one's power/control, take possession of (8.1)
අත්පා	hands and feet; pl. only (10.2)
අත්හරිනවා	give up, abandon (9.2)
අත්හැර දමනවා	discard, give up, cast aside (8.1)
අදහනවා	accept, believe in (a god or religion) (4.2)
අදහස් උදහස්	ideas, etc.; pl. only (11.0)
අදහස් කරනවා	mean, intend (5.0)
අදහස් කර සිටිනවා	be thinking, be intending (13.1)
අදහස් කෙරෙනවා	signify a notion, mean (12.2)
අදාළ වෙනවා	be relevant to (11.0)
අධිපතියා	N5 chief, incumbent, lord; pl. අධිපතියෝ ; stem අධිපති (14.2)

අධිරාජයා	N5 emperor; pl. **අධිරාජයෝ** ; stem **අධිරාජ** (15.0)
අධ්‍යයන පොදු සහතික පත්‍ර පංතිය	N2 General Certificate of Education class (3.0)
අධ්‍යයන පොදු සහතික පත්‍ර ප්‍රවේශය	N2 General Certificate of Education entrance (3.0)
අධ්‍යාත්මය	N2 supreme spirit, spiritual (aspect); no pl. (14.2)
අධ්‍යාත්මික	spiritual (15.0)
අධ්‍යාපන අමාත්‍යාංශය	N2 ministry of education (3.0)
අධ්‍යාපනය	N2 education; no pl.; stem **අධ්‍යාපන** (1.0)
අධ්‍යාපනික	educational (15.0)
අනගාරික	Anagarika (adjective and title), not leading a household life, celibate, ascetic (14.2)
අනගාරික ධර්මපාලතුමා	N5 Anagarika Dharmapala (respectful) (14.2)
අනතුර	N2 trouble, danger, accident; pl. **අනතුරු** (8.0)
අනතුරුව	then, afterwards (9.2)
අනල්ප	much, great, large, many (15.2)
අනාගතය	N2 future; no pl.; stem **අනාගත** (11.0)
අනාවරණය කරනවා	reveal, disclose (9.1)
අනිවාර්ය	compulsory (3.0)
අනුකම්පාව	N2 sympathy, pity; no pl.; stem **අනුකම්පා** (8.0)
අනුක්‍රමයෙන්	in order, gradually (10.1)
අනුගමනය කරනවා	follow (4.1)
අනුගාමිකයා	N5 follower; pl. **අනුගාමිකයෝ** ; stem **අනුගාමික** (12.2)
අනුමැතිය	N2 approval; no pl.; stem **අනුමැති** (11.0)
අනුරාගය	N2 love, affection; no pl.; stem **අනුරාග** (10.2)
අනුරාධපුරය	N2 Anuradhapura (a city in Sri Lanka) (9.0)
අනුව	according (to) (gr. 4,9)

අනුශාසනය N2 advice, admonition; pl. අනුශාසන (15.0)

අනුශාසනා කරනවා admonish, advise (9.0)

අනෙක් other (1.1)

අනෙක the other thing or fact (0.0)

අන්තවාදියා N5 extremist, fanatic; pl. අන්තවාදියෝ ;
stem අන්තවාදි (14.1)

අන්දරේ Andare, a proper name (6.1)

අන්නාසි (ගෙඩිය) pineapple (2.2)

අඳිනවා dress (4.1)

අඳිනවා draw (9.1)

අපමණ boundless, limitless (7.2)

අපවත් වෙනවා pass away, die (of monks) (14.2)

අපහසු difficult (3.0)

අපේක්ෂකයා N5 candidate; pl. අපේක්ෂකයෝ ; stem අපේක්ෂක (12.1)

අප්‍රමාණ limitless, inestimable (14.2)

අප්‍රිකාව N2 Africa; no pl.; stem අප්‍රිකා (14.1)

අභිනව new (15.0)

අභ්‍යාසය N2 exercise, training; pl. අභ්‍යාස (3.1)

අමතක කරනවා forget (intentionally or preventably) (13.1)

අමතක වී යනවා get forgotten (gradually) (9.0)

අමතනවා address, speak to (6.0)

අමතර additional (7.1)

අමතරව in addition to (11.2)

අමාත්‍ය මණ්ඩලය N2 board of ministers, cabinet;
pl. අමාත්‍ය මණ්ඩල (11.0)

අමාත්‍යයා N5 minister; pl. අමාත්‍යයෝ ; stem අමාත්‍ය (15.1)

අමාත්‍යවරයා N5 minister; pl. අමාත්‍යවරු ; stem අමාත්‍ය (11.0)

අමාත්‍යාංශය N2 ministry; pl. අමාත්‍යාංශ (3.0)

අමු	a kind of grain; pl. only (11.2)
අමුණාගන්නවා	see අමුනාගන්නවා (4.2)
අමුතු	new, strange (14.1)
අමුනාගන්නවා	stick through, gather with a hook (4.2)
අඹ (ගෙඩිය)	mango (2.2)
අඹ ගස	N2 mango tree; pl. අඹ ගස් ; stem අඹ (15.0)
අඹුව	N5 wife; pl. අඹුවෝ ; stem අඹු (9.2)
අය කරනවා	charge (fees, etc.) (12.2)
අයත්	belonging (Coll. අයිති) (3.0)
අයත් වෙනවා	have (with dative), belong to (Coll. අයිති වෙනවා) (5.2); belong, get ownership (10.2)
අයිතිවාසිකම	N2 (political) right; pl. අයිතිවාසිකම් (12.0)
අයිති වෙනවා	belong (with dat.) (2.0)
අයියා	N5 older brother; pl. අයියලා (1.0)
අයුක්තිය	N2 injustice; pl. අයුක්ති (14.1)
අයුරු	manner, as, so that (gr. 11,18)
අරගන්නවා	take (for oneself); past participle අරගෙන or ඇරගෙන (9.1)
අරමුණ	N2 target, aim; pl. අරමුණු (12.0)
අරඹනවා	start, begin (14.1)
අර්ථශාස්ත්‍රය	N2 economics; no pl. (13.0)
අලංකාර	beautiful (5.0)
අලංකාර කරනවා	decorate (5.2)
අලවනවා	stick, paste (5.2)
අල්ලාගන්නවා	catch, get hold of, capture (9.1)
අල්වනවා	touch, catch (6.2)
අල්වාගන්නවා	catch, get hold of, capture (9.1)

අවට	neighboring (1.0)
අවදි වෙනවා	wake up, get up (5.0)
අවධානය	N2 attention; no pl. (11.1)
අවධිය	N2 time, period, stage; pl. අවධි (12.0)
අවබෝධ කරගන්නවා	realize, gain comprehension (14.0)
අවබෝධ කර දෙනවා	make someone else realize, explain (14.0)
අවබෝධය	N2 understanding; no pl.; stem අවබෝධ (11.0)
අවවාද කරනවා	advise (9.1)
අවවාදය	N2 advice; pl. අවවාද (7.1)
අවශ්‍ය	wanted, necessary (2.1)
අවශ්‍යතාව	N2 need, necessity; pl. අවශ්‍යතා (11.1)
අවසන් කරනවා	end, conclude, finish (10.2)
අවසරය	N2 permission; pl. අවසර (7.0)
අවසාන	last, final (adjective) (14.2)
අවසාන වෙනවා	end, conclude (11.0)
අවස්ථාව	N2 occasion, time, moment (7.1); occasion, moment, period, stage; pl. අවස්ථා (12.0)
අවිහිංසාව	N2 non-violence, harmlessness; no pl.; stem අවිහිංසා (14.1)
අවුත්	having come (gr. 5,1)
අවුරුද්ද	Sinhala New Year (4.1)
අවුරුද්ද ලබනවා	new year starts/dawns (4.1)
අවුල	N2 confusion, disorder; pl. අවුල් (12.0)
අවුල් කරනවා	disorganize, confuse, upset (11.0)
අව්වේ තබනවා	put in the sun (to dry) (6.1)
අශෝක	N5 Asoka (proper name) (15.0)
අසතුට	N2 unhappiness, displeasure; no pl.; stem අසතුටු (6.0)
අසතුටුදායක	unsatisfactory, unhappy (12.0)

අසනවා	listen (5.0)
අසනවා	ask, hear (7.0)
අසමත්වය	N2 inequality, disparity, dissimilarity; no pl. (12.2)
අසලින්	from, by way of (gr. 7,8)
අසවල්	such and such (specific, adjectival) (10.0)
අසළ	near, in the vicinity (6.2)
අසාගෙන සිටිනවා	remain listening to (7.2)
අසුවෙනවා	fall in (a trap, etc.), be caught (6.2)
අස්කරවනවා	cause to be removed, get one removed (10.1)
අස්රිය	N2 chariot, horse-drawn vehicle; pl. අස්රිය/ අස්රියවල් (14.0)
අස්වසනවා	console (8.1)
අස්වැන්න	N2 harvest; no pl. (2.0)
අස්වෙනවා	leave, resign (12.0)
අහලපහළ	in the neighborhood (7.1)
අහස්යාත්‍රාව	N2 airplane; pl. අහස්යාත්‍රා (5.2)
අහිමි වෙනවා	lose ownership (10.2)
අහෝසි කරනවා	abolish, nullify, invalidate (14.1)
අළුත් අවුරුදු උත්සවය	N2 New Year festival; pl. අළුත් අවුරුදු උත්සව (4.0)
අළුතෙන්	anew, newly (12.1)
ආකාරය	N2 mode, manner; pl. ආකාර (6.2)
ආක්‍රමණය	N2 invasion, attack; pl. ආක්‍රමණ (11.0)
ආගම	N2 religion; pl. ආගම් (4.0)
ආගමික	religious (4.0)
ආ ගිය	visited (literally come and gone) (14.1)
ආචාර මාර්ගය	N2 system of ethics or conduct; pl. ආචාර මාර්ග (14.0)
ආචාර්යවරයා	N5 teacher, scholar; pl. ආචාර්යවරු ; stem ආචාර්ය (10.2)

ආච්චි	N5 grandmother; pl.ආච්චිලා (7.1)
ආඥාපනත	N2 act (of parliament, etc.); pl. ආඥාපනත් (11.0)
ආණ්ඩුකාරතුමා	N5 governor; pl. ආණ්ඩුකාරවරු ; stem ආණ්ඩුකාර (12.0)
ආණ්ඩු ක්‍රමය	N2 system of government; pl. ආණ්ඩු ක්‍රම (11.0)
ආණ්ඩුව	N2 government; pl. ආණ්ඩු (2.0)
ආත්මපරිත්‍යාගය	N2 self-dedication, self-sacrifice; no pl. (14.2)
ආදරණීය	dear, beloved (13.0)
ආදරය	N2 affection, love; no pl.; stem ආදර (7.2)
ආදර්ශමත්	exemplary (14.1)
ආදර්ශය	N2 moral, model, example; pl. ආදර්ශ (9.0)
ආදායම	N2 income; pl. ආදායම් (2.2)
ආදි, ආදිය	etcetera (gr. 5,7)
ආධාර මුදල	N2 grant, financial support; pl. ආධාර මුදල් (3.2)
ආධාරය	N2 help,aid; pl. ආධාර (3.2)
ආධිපත්‍යය	N2 rule, sovereignty, power, domination; pl. ආධිපත්‍ය (12.2)
ආනන්ද විද්‍යාලය	N2 Ananda College; no pl. (15.2)
ආපසු	back (9.0)
ආපසු හැරෙනවා	turn back (7.2)
ආභ්‍යන්තරික	internal, local (11.0)
ආමන්ත්‍රණය	N2 addressing, calling; pl. ආමන්ත්‍රණ ; stems ආමන්ත්‍රණ/ ආමන්ත්‍රණය (15.0)
ආයතනය	N2 institution; pl. ආයතන (3.0)
ආයුධය	N2 weapon; pl. ආයුධ (8.0)
ආයුධ සන්නද්ධව	armed, equipped with weapons (8.0)
ආයුර්වේද වෛද්‍යවරයා	N5 Ayurvedic physician; pl. ආයුර්වේද වෛද්‍යවරු ; stem ආයුර්වේද වෛද්‍ය (12.0)
ආරංචි වෙනවා	get news, get tidings (10.1)

ආරක්ෂකයා	N5 guard, protector; pl. ආරක්ෂකයෝ ; stem ආරක්ෂක (15.1)
ආරක්ෂා කරනවා	protect (1.0)
ආරම්භ කරනවා	begin, start, commence (11.2)
ආරම්භය	N2 beginning; no pl.; stem ආරම්භ (12.1)
ආරම්භවීම	N2 beginning; pl. ආරම්භවීම් (15.1)
ආරාධනය	N2 invitation; pl. ආරාධන (14.1)
ආරාධනා කරනවා	invite (14.1)
ආරාධනා පත්‍රය	N2 invitation-card; pl. ආරාධනා පත්‍ර (13.0)
ආරාමය	N2 monastery, residence (for monks or nuns); pl. ආරාම (15.1)
ආරාවුල	N2 trouble, confusion, disorder; pl. ආරාවුල් (12.0)
ආර්ථික	economic (11.0)
ආර්ථිකය	N2 economy; stem ආර්ථික (12.1)
ආර්ය ජනපදය	N2 Aryan colony; pl. ආර්ය ජනපද (8.0)
ආර්යයා	N5 Aryan; pl. ආර්යයෝ ; stem ආර්ය (8.0)
ආලෝකමත් කරනවා	illumine (5.2)
ආවරණය	N2 shelter, cover; pl. ආවරණ (7.2)
ආශාව	N2 desire, liking, fondness; pl. ආශාවල් or ආශා (13.0)
ආශීර්වාදය	N2 blessing, greeting; pl. ආශීර්වාද (14.2)
ආශ්‍රය	N2 company, association; no pl. (6.0)
ආසනය	N2 seat; pl. ආසන (12.0)
ආසාව	N2 desire, wish; pl. ආසා (9.2)
ආසියාතික	Asian (adjective), Asiatic (11.0)
ආසියානු	Asian (adjective) (14.1)
ආසිරි	blessings, greetings (gr. 13,1.)
ආහාර ගන්නවා	eat food (5.0)

ආහාර පාන	food and drink (10.1)
ආහාරය	N2 food; pl. ආහාර (5.0)
ඇගරැලි ගැසෙනවා	wrinkle, wrinkles (of the body) appear (14.0)
ඇත	there is, are (gr. 1,6)
ඇතා	N5 elephant (tusker); pl. ඇත්තු ; stem ඇත් (7.1)
ඇතැම්	some (Coll. සමහර) (5.2)
ඇතැමෙක්	some (animate); pl. ඇතැමිහු (2.0)
ඇතැම්විට	sometimes (4.2)
ඇතැමිහු	some (people) (gr. 3,11)
ඇතිකරනවා	grow, tend, rear (of animals, etc.) (11.2)
ඇතිවීම	N2 arising, happening, taking place, becoming; pl. ඇතිවීම් (11.1)
ඇතිවෙනවා	arise, happen (7.0)
ඇතුල්වෙනවා	enter (3.0)
ඇතුළ	N2 inside; no pl. (5.2)
ඇතුළත් කරනවා	include, admit, enter (11.0)
ඇතුළත් වෙනවා	enter, be included (3.0)
ඇතුළු	including (gr. 11,6)
ඇතුළෙහි	inside (6.1)
ඇදගන්නවා	pull (for oneself), pull out (9.1)
ඇනගන්නවා	to pierce oneself, to stick (4.2)
ඇඳ	N2 bed, cot; pl. ඇඳන් ; stem ඇඳ (9.0)
ඇඳීම	N2 dressing; pl. ඇඳීම් (4.1)
ඇඳුම	N2 clothes, dress; pl. ඇඳුම් (4.1)
ඇඳුම්පැළඳුම්	dress and ornaments, adornment; pl. only (14.2)
ඇප උපස්ථාන	attendance, looking after someone; pl. only (15.0)
ඇමතීම	N2 addressing, calling; pl. ඇමතීම් (15.0)

ඇමරිකානු	American (adjective) (14.2)
ඇයි(ද)	why (gr. 8,14)
ඇරඹෙනවා	start, begin (14.1)
ඇල්ම	N2 affection, love, liking; no pl.; stem ඇල්ම (10.2)
ඇවිදිනවා	walk (about) (6.2)
ඇස	N2 eye; pl. ඇස් (6.2)
ඇස් උඩ හිඳුවනවා	turn up the eyeballs (6.2)
ඇසුර	N2 company, association with; no pl.; stem ඇසුරැ (14.1)
ඇසෙනවා	hear (7.2)
ඈත් වෙනවා	be away from, get away from (12.0)
ඉංග්‍රීසි	English (1.1)
ඉංග්‍රීසිනු	N5 the English people (pl.); stem ඉංග්‍රීසි (11.0)
ඉගිල්ලෙනවා	fly (of birds, etc.) (7.2)
ඉගෙන	past participle of උගන්නවා (9.0)
ඉගෙනගන්නවා	learn, study (1.0)
ඉගෙනගැනීම	N2 learning; pl. ඉගෙනගැනීම් (3.0)
ඉගෙනීම	N2 learning, education; pl. ඉගෙනීම් (1.0)
ඉඟුරු	ginger; pl. only (11.2)
ඉටිපන්දම	N2 candle; pl. ඉටිපන්දම් (5.2)
ඉටුකරගන්නවා	achieve, fulfill (for oneself) (12.0)
ඉටුකරනවා	fulfill (10.0)
ඉටුකිරීම	N2 fulfilling; pl. ඉටුකිරීම් (13.0)
ඉටුවෙනවා	be fulfilled (12.0)
ඉඩ	space, chance, time (to spare); no pl.; stem ඉඩ (6.2)
ඉඩකඩ	N2 room, space, opportunity; pl. ඉඩකඩ (13.1)
ඉඩම	N2 piece of land; pl. ඉඩම් (2.0)
ඉඩ ලැබෙනවා	to get a chance, get an opportunity (3.0)

ඉඩ සලස්වනවා	make room (for) (10.0)
ඉතා	very (1.0)
ඉතාමත්	the best, most (5.0)
ඉතාලිය	N2 Italy; stem ඉතාලි (14.2)
ඉතිරි	remaining (6.2)
ඉතිරි වෙනවා	be left (8.2)
ඉතිහාසය	N2 history; pl. ඉතිහාස (1.1)
ඉතුරු or ඉතිරි	remaining (adjectival) (10.0)
ඉතුරු වෙනවා	remain, be left over (7.1)
ඉදින්	if, now if (9.0)
ඉදිරිපත් කරනවා	forward, present, put forward (11.0)
ඉදිරිපත් වෙනවා	come forward (14.1)
ඉදිරියට	to the front, forward (8.2)
ඉදිරියෙහි	in front of (8.2)
ඉන්දියන්	Indian (adjective) (14.1)
ඉන්දියා	Indian (13.2)
ඉන්දියානු	Indian (adjective) (11.0)
ඉන්දියා-ස්වාධීනතා පනත	N2 Indian Independence Act; no pl. (14.1)
ඉන්දිය	Indian (adjective) (11.0)
ඉන්පසු	after that (2.1)
ඉපදීම	N2 birth; pl. ඉපදීම් (5.0)
ඉපදෙනවා	be born (7.2)
ඉමහත්	great (13.0)
ඉර	N2 line; pl. ඉරි (9.1)
ඉල්ලා අස්වෙනවා	resign (12.1)
ඉල්ලා සිටිනවා	request, ask for (7.2)

ඉල්ලීම	N2 request, demand; pl. ඉල්ලීම් ; stem ඉල්ලුම් (8.1)
ඉල්ලනවා	ask, request, demand (6.1)
ඉවත/ ඉවතක	out, outside, elsewhere (10.0)
ඉවත් කරගන්නවා	take away, withdraw (11.0)
ඉවත් කරනවා	remove, dispel ([illegible]1)
ඉවත්ව යනවා	go away (8.1)
ඉවසනවා	be patient, tolerate (6.0); bear up with (7.2)
ඉවසිල්ල	N2 patience; pl. ඉවසිලි (5.0)
ඉවහල් වෙනවා	be helpful, be conducive to (15.0)
ඉෂ්ට කරගන්නවා	get (a desire) fulfilled (4.2)
ඉසිනවා/ ඉහිනවා	sprinkle, dash out, pump out (10.1)
ඉස්මතු වෙනවා	become apparent, surface (7.1)
ඉස්වනවා	get one to sprinkle, dash out, or pump out (10.1)
ඉහත	earlier, prior to, above (gr. 10,18)
ඉහලම	highest (1.0)
ඊශ්වර	epithet for god Siva (4.2)
උක්	sugar cane; pl. only (11.1)
උකුස්සා	N5 hawk; pl. උකුස්සෝ ; stem උකුසු (7.2)
උගත්	learned (9.0)
උගතා	N5 scholar, learned one; pl. උගත්තු or උගත්තූ ; stem උගත් (12.1)
උගන්නවා	learn (3.0)
උගන්වනවා	teach (1.1)
උගහට	difficult (11.0)
උගුල	N2 trap, noose; pl. උගුල් (6.2)
උග්‍ර වෙනවා	be acute, be serious (12.2)
උඩ	on (7.2)

උණ	bamboo (plural and stem) (5.2)
උතුමා	N5 noble person; pl. උතුමෝ , stem උතුම් (14.2)
උත්තරය	N2 answer; pl. උත්තර (10.0)
උත්සවය	N2 festival, ceremony; pl. උත්සව (4.0)
උත්සාහ කරනවා	make efforts, strive, attempt, try (5.1)
උත්සාහය	N2 effort; no pl.; stem උත්සාහ (11.0)
උත්සුක වෙනවා	be intent on, strive for (14.0)
උදය	N2 morning; no pl. (5.0)
උදයෙන්ම	(in the) early morning (5.0)
උදාර	exalted, noble, distinguished (14.1)
උදාව	N2 rise, origin; no pl.; stem උදා (12.1)
උදෑසන	N3 early morning; no pl. (5.1)
උද්ඝෝෂණය	N2 uproar, demand (etc.); pl. උද්ඝෝෂණ ; stems උද්ඝෝෂණ/ උද්ඝෝෂණය (12.1)
උද්‍යානය	N2 park, pleasure park; pl. උද්‍යාන (10.2)
උනන්දු කරවනවා	make one interested in, encourage (11.2)
උනන්දුව	N2 eagerness; stem උනන්දු (4.0)
උනන්දු වෙනවා	be interested in, make efforts, be eager for, apply oneself (12.0)
උන්නතිය	N2 development, upliftment, eminence; no pl.; stem උන්නති (12.1)
උඳුවප්	N November - December (15.1)
උපකරණය	N2 implement, tool; pl. උපකරණ (11.1)
උපකාර කරනවා	help, assist (14.1)
උපකාරය	N2 help, assistance; pl. උපකාර (14.1)
උපකාරී වෙනවා	help, be helpful (12.0)
උපත	N2 birth; pl. උපත් (14.0)
උපදවනවා	generate, give birth to, cause to arise (6.1)

උපදිනවා	bring forth, be born (12.0)
උපන්	born (gr. 14,4)
උපයෝගි කරනවා	use, make use of (13.0)
උපයෝගි කරගන්නවා	make use of, use (15.0)
උපරිම	superior, high (3.2)
උපහාසය	N2 satire; pl. උපහාස (6.1)
උපහාසාත්මක	satirical, sarcastic (6.1)
උපාධිය	N2 (academic) degree; pl. උපාධි (3.0)
උපාය	N2 trick, cunning (6.1); method, device; pl. උපා / උපායවල් (7.0)
උපාසක අය	N5 lay devotees (especially when they observe sil); pl. only (5.0)
උයන	N2 park; pl. උයන් (14.0)
උරුම වෙනවා	be inherited, become an inheritance (6.1)
උල	N2 skewer, spear; pl. උල් (4.2)
උවදුර	N2 harm, obstacle; pl. උවදුරු (4.2)
උවදුරු කරනවා	do harm to (4.2)
උවමනා කරනවා	want, require, be necessary (9.0)
උස	tall, high (9.2)
උසස්	high, higher, upper, respectable (12.2)
උසාවිය	N2 court of law; pl. උසාවි (14.1)
උසුලනවා	bear, carry (5.1); bear, hold (12.0)
ඌ	he, it (gr. 10,14)
ඌරුව	N2 character, touch, shape; no pl. (12.1)
එංගලන්තය	N2 England; no pl. (11.0)
එකඟ වෙනවා	agree (6.2)
එකතු කරනවා	add, put together, gather (something) (10.0)
එකතු වෙනවා	gather, come together (6.2)

එකමුතු කරනවා	put together, unite (12.0)
එකමුතු බව	N2 unity, harmony; no pl. (15.0)
එකමුතු වෙනවා	get together, unite (2.0)
එක් එක්	(the) various, (the) different (gr. 4,8)
එක්තරා	a certain, some (6.2)
එක්සත්	united (14.1)
එක්සත් ජාතික පක්ෂය	N2 United National party; no pl. (12.0)
එතරම්	that (much) (Coll. එච්චර) (2.0)
එතර වෙනවා	cross (a river, etc.) (9.2)
එති	come (3rd per. pl.) (gr. 1,4)
